ඇස්. බී. දිසානායක

## සිරගත නොවූ සිතුවිලි II



4

ශ්‍රී ලාංකේය දේශපාලනයේ

# බණ්ඩාරනායක ත්‍රිත්වය

සහ වෙනත් ලිපි

# ශ්‍රී ලාංකේය දේශපාලනයේ බණ්ඩාරනායක ත්‍රිත්වය සහ වෙනත් ලිපි

28 SEP 2009

පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

571

පුස්තකාලය
ප්‍රවේශ අංකය 3587
වර්ග අංකය 320.954 93

**එස්. බී. ගේ වෙනත් කෘති**

- මා අත්සන් කළ දෝෂාභියෝගය
- විපතින් උපතක් (සංස්.)
- සිරගත නොවූ සිතිවිලි I -
  ජනතා විමුක්ති පෙරමුණ 71 කැරැල්ලෙන් ඔබ්බට
- විශ්වයේ ආරම්භය, මිනිසාගේ සම්භවය සහ සමාජ පරිණාමය
- යුද්ධය, සාමය හා බලය බෙදීම
- සමාජවාදය, ජනතා විමුක්ති පෙරමුණ හා විශ්වවිද්‍යාල අර්බුදය
- විමසා බලමු - දේශපාලන මතවාද
- විමසා බලමු - ආර්ථික මතවාද

**Translations**

- On War Peace & Devolution of Power
- The Bandaranaike Trio & their unholy Duo
- யுத்தமும்,சமாதானமும்அதிகாரப்பகிர்வு செயற்பாடுகளும்

| | |
|---|---|
| පරි. අංක | 3587 |
| වර්ග අංකය | 320.9 |
| දිනය | 2009.09.29 |

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

3587

සිරගත නොවූ සිතිවිලි - 11

# ශ්‍රී ලාංකේය දේශපාලනයේ බණ්ඩාරනායක ත්‍රිත්වය සහ වෙනත් ලිපි

එස්. බී. දිසානායක

සංස්කරණය

පූජ්‍ය තිනියාවල පාලිත හිමි
රංජිත් අමරකීර්ති පලිහපිටිය

සුරක්ෂා

සුරක්ෂා ප්‍රකාශන

2009. 09. 29

සිරගත නොවූ සිතුවිලි II -
ශ්‍රී ලාංකේය දේශපාලනයේ බණ්ඩාරනායක ත්‍රිත්වය සහ වෙනත් ලිපි

© එස්. බී. දිසානායක

ප්‍රථම මුද්‍රණය : 2009

ISBN 978-955-0211-02-9

මුද්‍රණය : ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.

ප්‍රකාශනය : සුරක්ෂා ප්‍රකාශන
1070/2, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

# පිදුම

දියතිලක පුර ගිරි දුර්ග
ළඳු දෙනි කැලෑවල
පිපී හිනැහුණ
දුර්ලභ මලක් මෙන් අඹර යට
ඒ අහස යට
උත්තුංග ලෙස
පැණෑසරව නැඟී සිටි
වනස්පතියකි ඔබ අපට
දෙමාපිය පාමුල
තබමි මේ වනපස මල . . .

# පෙරවදන

2004 දෙසැම්බර් 07 දින අපේ ශ්‍රේෂ්ඨාධිකරණය මා බරපතල වැඩ ඇතිව වසර දෙකක සිර දඬුවමකට යටත් කළේය. මේ පොත මා ලියුවේ සිරමැදිරියේ සිටයි. මට දඬුවම් කළේ මා උසාවියට අපහාස කළ බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කිරීමෙනි.

ගාල්ල - හබරාදුව ගොවිහමුවේ දී මා ,ඔින බලු තීන්දුවක, යනුවෙන් කළ ප්‍රකාශයක් මත මට නඩු පැවරුණි.

මගේ නඩුව එවකට ජනපති ව සිටි චන්ද්‍රිකා කුමාරතුංග ගේ උපදෙස් මත නිර්මාණය වූවකි. එම නඩු තීන්දුවට එරෙහිව මම ජිනීවාහි අන්තර් ජාතික මානව හිමිකම් කොමිසමට අභියාචනයක් කළෙමි. එම කොමිසමට නීත්‍යනුකූලව අපගේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවලට එරෙහි අභියාචන විභාග කළ හැකිය. එසේම එහි තීන්දු අප රට විසින් පිළිගැනීමට බැඳී සිටී. අන්තර් ජාතික මානව හිමිකම් කොමිසම, එක්සත් ජාතීන්ගේ රටවල් පිළිගත් මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර අධිකරණයයි. එම අධිකරණය මා සියලුම චෝදනාවලින් නිදහස් කළ අතර, අපේ රජයට මට වන්දි ගෙවීමට ද නියම කෙරුණි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගැන මා දැක්වූ භක්තිය හා අදත් පවතින ගෞරවයත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග කෙරෙහි එදා මා තුළ පැවති පිළිකුලත් මා මේ පොත ලිවීමට පොළඹවා ලූ බව කිය යුතුය. පොත සම්පූර්ණ කිරීම සඳහා මම දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ගැන ද ගැඹුරු අධ්‍යයනයක යෙදුණෙමි.

සිරගෙදර සිට ලියූ සමහර ආවේගශීලී වාක්‍ය පසුව මා විසින් ම වෙනස් කිරීමට යෙදුණි.

සිංහලයෝ සහ ලාංකිකයෝ, යන පරිච්ඡේදය මා මේ පොත ආරම්භයට එක් කළේ, මා දමිළ ජනතාව පහත් කර සලකන්නේ යැයි ඒ අය තුළ ඇතිවිය හැකි සැකයක් පහකරලීමටයි.

බලය වෙනුවෙන් ජාතිය මාරු කිරීම, ආගම මාරු කිරීම, නම් ගම් වාසගම් මාරු කිරීම, තමන්ගේ ම ජනතාවට හතුරු වීම, බල වියරුවේ කුරිරු බව ගැන යමක් ඔබට මේ පොතෙන් දැකගත හැකි වේ යයි මම සිතමි.

**එස්. බී. දිසානායක**

කොළඹ:
1070/2, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

හඟුරන්කෙත:
රත්නවල, මාදන්වල, හඟුරන්කෙත.

දුරකථන : 011-2864484/ 081-2369583/ 081-2205125
ෆැක්ස් : 081-2369583/ 011-2864484/ 081-2205125
විද්‍යුත් තැපැල : dmsbd@sltnet.lk

# එස්. බී. ග්‍රන්ථ දශකය එළිදක්වන මොහොතේ දී...

එස්. බී. දිසානායකයන් ගේ දේශපාලන රංගාවතරණය සුපතළ කරුණකි. ඔහු ගේ ලේඛක භූමිකාව දේශපාලන භූමිකාව හා සාපේක්ෂව ප්‍රකට නො වූවත් ඔහු විසින් ලියැවෙන තීරු ලිපි ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යයන්හි ප්‍රචලිත ය.

එස්. බී. ගේ ලේඛක භූමිකාව ඔහු ගේ විශ්වවිද්‍යාල ජීවිතය තෙක් ඈතට දිවෙන්නකි. එවක ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ, ජාතික ශිෂ්‍ය සංගමයේ නායකයකු මෙන් ම අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපතිවරයා වූ හෙතෙම, පක්ෂයේ නිල පුවත්පත වූ "මවුබිම" සහ "ඇත්ත" පුවත්පත් ඇසුරෙන් පුවත්පත් කලාවට අත් පොත් තැබුවේ ය. එච්. ජී. එස්. රත්නවීර "මවුබිම" පුවත්පතෙහි ද බී. ඒ. සිරිවර්ධන "ඇත්ත" පත්‍රයේ ද කතුවරු වූ හ. එස්. බී. දේශපාලන භූමිකාව ප්‍රකට වීමත් සමඟ ඔහු ගේ ලේඛක භූමිකාව යටපත් විණ.

එස්. බී. විද්‍යෝදය (ශ්‍රී ජයවර්ධනපුර) විශ්වවිද්‍යාලයෙන් නික්ම, 1977 මහ මැතිවරණයේ දී වාමාංශික එක්සත් පෙරමුණේ අපේක්ෂකයෙක් ලෙස හඟුරන්කෙත ආසනයට තරග වැදුණේ ය.

මාර්ග ආයතනයේ පරීක්ෂණ නිලධරයකු ලෙසත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධරයකු ලෙසත් වසර අටක් පුරා වෘත්තීයවේදියකු ලෙස ඔහු ලද අත්දැකීම් ඔහු ගේ දේශපාලන භූමිකාවට මෙන් ම ලේඛක භූමිකාවට ද ආශිර්වාදයක් වන්නට ඇත.

පසු ව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් වූ එස්. බී. එහි තරුණ සංවිධානයන්හි ක්‍රියාධරයෙක් වූයේ ය. ජනතා විමුක්ති පෙරමුණේ දෙ වැනි කැරැල්ල රට පුරා බිහිසුණු අත්දමින් මතු වෙමින් පැවැති

1987 වසරේ දී එස්. බී. ශ්‍රී.ල.නි.ප. තරුණ වැඩමුළු මෙහෙය වූ ජනප්‍රිය කථිකයෙක් ද සංවිධායකවරයෙක් ද විය. තරුණයන් පක්ෂයේ වැඩමුළුවල දී නැගූ ප්‍රශ්න ඇතුළත් කොළ කෑලි ඔහු සතු ව පැවතිණ. ඒ ඔස්සේ හඹා ආ රහස් පොලීසිය, ඔහුට එරෙහි පරීක්ෂණ ආරම්භ කළේ ය. 1987 නොවැම්බර් 10 වැනි දා එස්. බී. අත්අඩංගුවට ගැනිණි. ඒ නිට්ටඹුව පොලීසියෙනි. ඔහු මැගසින් බන්ධනාගාරයෙහි රඳවා තබන ලදි. ඒ සිරගෙදර මහින්ද විජේසේකර, ඉන්දික ගුණවර්ධන, ජයතිලක සිල්වා, සේරුවිල ගුණවර්ධන හා වාස් තිලකරත්න ද වූ හ. ඔවුන් සියල්ලන් රඳවා තබන ලද්දේ 71 අප්‍රේල් කැරැල්ලේ සිරකරුවන්ට විශේෂයෙන් තනන ලද සිර කුටිවල ය.

එස්. බී. රඳවන ලද්දේ රෝහණ විජේවීර රඳවා සිටි සිර කුටියේ ය.

අඳින්, දෙ විසි වසරකට පෙර එම සිර කුටියේ හිඳ එස්. බී. ග්‍රන්ථකරණයට අත්පොත් තැබී ය. එම මුල් පොත (සිරගත නොවූ සිතිවිලි 1 - ජනතා විමුක්ති පෙරමුණ 71 කැරැල්ලෙන් ඔබ්බට) මෙම ග්‍රන්ථ දශකයට ඇතුළත් වීම විශේෂයකි.

එස්. බී. ගේ පොතක් මුල් වරට ප්‍රකාශයට පත් වනුයේ ශ්‍රී ලාංකේය දේශපාලනයේ අතිශය ආන්දෝලනාත්මක සංසිද්ධියක් පාදක කර ගනිමිනි. එනම්, 1992 දී ප්‍රකාශිත, "මා අත්සන් කළ දෝෂාභියෝගය" යි. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාට එරෙහි ව, පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ බලවේග ඒකාබද්ධ ව එල්ල කළ දෝෂාභියෝගය ශ්‍රී ලාංකේය දේශපාලනයේ ගමන් මඟ මුළුමනින් වෙනස් කිරීමට මුල පිරුවකි. එහි, පසු කාලීන ප්‍රතිඵල පිළිබඳ නොයෙක් මති මතාන්තර විග්‍රහ පැවැතුන ද එය ශ්‍රී ලාංකේය දේශපාලනයේ නො මැකෙන ගමන් ලකුණකි.

1988 දී මුල් වරට නුවරඑළිය දිස්ත්‍රික් ශ්‍රී.ල.නි.ප. මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවට පත් තරුණ මන්ත්‍රීවරයා එයින් තෙ වසරකට පසු පළ කළ "මා අත්සන් කළ දෝෂාභියෝගය" නමැති ග්‍රන්ථය, දේශපාලන විද්‍යාව හදෑරීමේ දී අදත් වැදගත් මූලාශ්‍රයක් වෙයි.

අතිශය කාර්ය බහුල දේශපාලන ක්‍රියාධරයකු ලෙස ප්‍රබල කැබිනට් අමාත්‍ය ධූර දරමින් හුන් එස්. බී. ගේ පෑන දශකයක් පමණ කල් නිහඬ වන සැටියක් දිස් වෙයි.

එස්. බී. ගේ පෑන යළි පණ ලබනුයේ, දෙ වන වර හිරේ විලංගුවේ වැටුණු කල්හි ය. ඒ කෙසේ ද යත් අපි ඔහු ගේ ම කටහඬට සවන් දෙමු.

"2004 දෙසැම්බර් 07 දින අපේ ශ්‍රේෂ්ඨාධිකරණය මා බරපතළ වැඩ ඇති ව වසර දෙකක සිර දඬුවමකට යටත් කළේ ය. මේ පොත මා ලියුවේ සිරමැදිරියේ සිට යි. මට දඬුවම් කළේ මා උසාවියට අපහාස කළ බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කිරීමෙනි.

එම නඩු තීන්දුවට එරෙහි ව මම ජිනීවාහි අන්තර් ජාතික මානව හිමිකම් කොමිසමට අභියාචනයක් කළෙමි. එම කොමිසමට නීත්‍යානුකූල ව අප ගේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවලට එරෙහි අභියාචන විභාග කළ හැකි ය. එසේ ම එහි තීන්දු අප රට විසින් පිළිගැනීමට බැඳී සිටී. අන්තර් ජාතික මානව හිමිකම් කොමිසම, එක්සත් ජාතීන් ගේ රටවල් පිළිගත් මානව හිමිකම් පිළිබඳ අන්තර් ජාතික අධිකරණය යි. එම අධිකරණය මා සියලු ම චෝදනාවලින් නිදහස් කළ අතර, අපේ රජයට මට වන්දි ගෙවීමට ද නියම කෙරුණි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කෙරෙහි මා දැක්වූ භක්තිය හා අදත් පවතින ගෞරවයත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග කෙරෙහි එදා මා තුළ පැවැති පිළිකුළත් මා මේ පොත ලිවීමට පොළඹවා ලූ බව කියයුතු ය. පොත සම්පූර්ණ කිරීම සඳහා මම දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ගැන ද ගැඹුරු අධ්‍යයනයක යෙදුණෙමි.

සිරගෙදර සිට ලියූ සමහර ආවේගශීලී වාක්‍ය පසු ව මා විසින් ම වෙනස් කිරීමට යෙදුණි.

"සිංහලයෝ සහ ලාංකිකයෝ" යන පරිච්ඡේදය මා මේ පොත ආරම්භයට එක් කළේ, දමිළ ජනතාව මා පහත් කර සලකන්නේ යැයි ඒ අය තුළ ඇතිවිය හැකි සැකයක් පහකරලීමට යි."

"බලය වෙනුවෙන් ජාතිය මාරු කිරීම, ආගම මාරු කිරීම, නම් ගම් වාසගම් මාරු කිරීම, තමන්ගේ ම ජනතාවට හතුරු වීම,

බල වියරුවේ කුරිරු බව ගැන යමක් ඔබට මේ පොතෙන් දැකගත හැකි වේ යයි මම සිතමි." (සිරගත නොවූ සිතිවිලි 2 - ශ්‍රී ලාංකේය දේශපාලනයේ බණ්ඩාරනායක ත්‍රිත්වය සහ වෙනත් ලිපි)

"ශ්‍රී ලාංකේය දේශපාලනයේ බණ්ඩාරනායක ත්‍රිත්වය සහ වෙනත් ලිපි" මැයෙන් පළ කෙරෙන "සිරගත නොවූ සිතිවිලි" දෙ වැන්න ලියන අතරතුර, එස්. බී. ග්‍රන්ථ සංස්කරණ කාර්යයට අහම්බෙන් මෙන් අවතීර්ණ වූයේ ය. ඒ සුනාමි ඛේදවාචකය අළලා රනිල් වික්‍රමසිංහයන් කළ කතා ඇසුරින්, සංස්කරණිත "විපතින් උපතක්" (2005) ග්‍රන්ථය යි. එකී කතා සංගෘහිත වූයේ එස්. බී. එක් කළ කාව්‍යමය පෙරවදන් ද කැටිව ය.

පුවත්පත් තීරු ලිපි රචකයකු ලෙස සති පතා සමකාලීන සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ප්‍රස්තුත අරභයා එස්. බී. ලියූ ලිපි ගොන්නක් එක්රැස් වෙමින් තිබිණි.

සිරගත ව සිටිද්දී තමා ලියූ පොත් පළ කිරීමට ඔහු දැක්වූයේ උකටලීභාවයකි. එහෙත් එස්. බී. ලියූ පොත් කෙරෙහි ආන්දෝලනාත්මක ඉල්ලුමක් පාඨක සමාජය වෙතින් පැනනැඟෙමින් පැවැතිණි.

එස්. බී. සිරගත ව සිටිද්දී ලියූ ග්‍රන්ථ ද්වයය හා සෙසු තීරු ලිපි ප්‍රකාශයට පත් කළ යුතු බව අපි ඇතුළු හිතවතුන් සුමිතුරු එස්. බී. දිසානායකයන්ට නොයෙක්වර යෝජනා කළෙමු. මෙසේ එළිදකින ග්‍රන්ථ දශකය, එම යෝජනාවන්හි ඵල ගැන්වීමකි.

මේ ග්‍රන්ථ දශකයේ දී අපට මුණගැසෙන්නේ, ජාතික නායකත්වයෙන් ජාතියක නායකත්වය කරා ගමන් ඇරැඹූ දේශපාලනඥයකු තුළ වෙසෙන සොඳුරු ගත්කතුවරයෙකි. මේ දිගු ගමනක ආරම්භයක් පමණි.

මතු යම් දිනෙක ග්‍රන්ථ කර්තෘවරයකු ලෙස සම්භාවනාවට පාත්‍ර වීමේ මූලබීජ මේ ලේඛන කෙරෙන් ප්‍රකට කෙරේ.

ග්‍රන්ථ කර්තෘවරයකු, ලේඛකයකු, තීරු ලිපි රචකයකු ලෙස මතු දිනෙක එස්. බී. ජය ටැඹ වෙත ළඟා වූ දිනෙක, අර්ථවත් වෙති යි, අපට නැඟුණු සිතිවිල්ලක් මෙසේ සනිටුහන් කරමු.

ලොව කොතැනක හෝ සෑම පුරවැසියෙක් ම, සේවයෙන් විශ්‍රාම ලද කල්හි "හිටපු" යන විශේෂණයට හිමිකම් කියති. එහෙත් ප්‍රාමාණිකත්වයට පත් ගත්කතුවරුන්, කවීන්, සංගීතඥයන්, රංගධරයන් බඳු කලාවේදීහු "විශ්‍රාමලත්" හෝ "හිටපු" යනුවෙන් හඳුන්වනු නො ලබන්නා හ. ගත්කතුවරයකු, කලාවේදියකු ලෙස අභිෂේක ලැබීම රාජාභිෂේකයට වඩා සදාකාලික ය.

ස්වදේශෙ පූජ්‍යතෙ රාජා
විද්වාන් සර්වත්‍ර පූජ්‍ය තෙ

(රජු සිය දේශයේ දී පිදුම් ලබයි. විද්වතා විශ්ව සුපූජිත වෙයි.)

වියත් දස දෙස
පුදත් හැම කල්.

අපේ හිතමිත්‍ර එස්. බී. දිසානායක ලේඛකයාණන් පෙදෙන් පෙද ඒ ගිරිහිස තරණය කරනු දැක්ම අපේ ඉත පැතුම යි.

පූජ්‍ය තිනියාවල පාලිත හිමි
රංජිත් අමරකීර්ති පලිහපිටිය

පූජ්‍ය තිනියාවල පාලිත හිමි
සාමවිනිසුරු (දිවයිනටම)
නියෝජ්‍ය ලේකම් ශ්‍රී ලංකා මහා බෝධි සමාගම
මදුරාසි මහා බෝධි මධ්‍යස්ථානාධිපති
විහාරාධිපති, නාලන්දාරාමය,
නාලන්දාරාම පාර, නුගේගොඩ.
දුරකථන : 2852595 / 2626852

රංජිත් අමරකීර්ති පලිහපිටිය
මැද කීඹිය.
දුරකථන : 071-6010099 / 011-4574919

# ස්තුතිය

පොත් දහයක් එකවර එළිදැක්වීම අභියෝගයකි. එම අභියෝගය ජය ගැනීම සඳහා අපේ අතිගෞරවනීය තිනියාවල පාලිත හාමුදුරුවෝ සමඟ රංජිත් පලිහපිටිය මහතා මට ලබාදුන් සහයෝගය අතිවිශාල ය. මා විසින් ලියන ලද මෙම පොත් සංස්කරණය කළ අතිගෞරවනීය තිනියාවල පාලිත ස්වාමින් වහන්සේටත්, රංජිත් අමරකීර්ති පලිහපිටිය මහතාටත් මගේ හද පිරි ස්තුතිය පළ කරමි.

මේ පොත් දහයෙන් දෙකක් ඉංග්‍රීසියට පරිවර්තනය කර ඇත. එය පරිවර්තනය කළ අප මිත්‍ර නීල් ක්‍රිස්ටෝපර් මහතාට මම තුති පුදමි. එම පරිවර්තන කාර්යයේ දී සහාය දුන් නීතිඥ මිල්ටන් ඊ. ජයසූරිය මහතාට සහ එල්මෝ ගුණරත්න මහතාටත් ගංගා සංජීවනී සෙවුවන්දි මෙනවියටත් මගේ විශේෂ ස්තුතිය හිමි වේ.

එක් පොතක් ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කර ඇත. එම කාර්යය නිවැරැදි ව හා කඩිනමින් කර දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ ෆර්ඩවුසියා ඒ. රහුමාන් මෙනවියට ද මගේ විශේෂ ස්තුතිය හිමි වේ.

එමෙන් ම පසු වදන් සපයා දුන් විද්වත් සියලුදෙනාට ද මාගේ ස්තුතිය පුද කරමි.

පොත් පිටපත් පරිගණක ආශ්‍රයෙන් සැකසූ සුමුදු ලක්මලී මෙනවිය, සෝදුපත් බැලූ එච්. එල්. සමරසේන මහතා, සුමිඳු මදුරංග මහතා යන අය ද දිවා රාත්‍රී වෙහෙසී කැපවීමෙන් මේ කාර්යයේ නිරත වූහ. ඒ අයට ද නන් අයුරින් මෙම කාර්යයට අත දුන් සියලු දෙනාට ද කෘතවේදීව ස්තුති කිරීමට මම කැමැත්තෙමි.

එස්. බී. දිසානායක

# පටුන


| | | |
|---|---|---|
| 01. | සිංහලයෝ සහ ශ්‍රී ලාංකිකයෝ | 01 |
| 02. | බණ්ඩාරනායක පරපුර | 07 |
| 03. | මහ මුදලි දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායක | 13 |
| 04. | අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක | 17 |
| 05. | සිරිමාවෝ බණ්ඩාරනායක | 41 |
| 06. | මහ ඇමැතිනි-අගමැතිනි-ජනපතිනි වූ චන්ද්‍රිකා ගේ ආගමනය හා බල වියරුවේ කුරිරු බව | 85 |
| 07. | චන්ද්‍රිකා ගේ ඒකාධිපති වියරුව හා යෝජිත ජනමත විචාරණය | 117 |
| 08. | ජනාධිපතිනිය වෙත . . . | 137 |
| 09. | ජනපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ, ඔහුගේ ආර්ථික හා සාම ව්‍යායාමය සහ මගේ අනාගත යෝජනා | 151 |
| 10. | මේ ලක් දෙරණේ උරුමය ලද ඔබටයි මේ ආයාචනය... | 167 |

# 01

# සිංහලයෝ සහ ශ්‍රී ලාංකිකයෝ

බණ්ඩාරනායක පරපුර ගැන කතා කිරීමට ප්‍රථම සිංහලයන් ගැන කතා කිරීම වැදගත් වනු ඇත.

උතුරු ඉන්දියාවේ සිංහපුර රාජධානියේ සිට විජය කුමරු අප රටට පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ "යක්ෂ" හා "නාග" නමින් ගෝත්‍රික කණ්ඩායම් දෙකක් විසූ බව කියැවේ. මෙකල ද උතුරේ වෙන ම ගෝත්‍රික ජන කොටසක් විසූ බව ද පෙනේ. ඔවුන් ඉන්දියාවේ වත්මන් ද්‍රවිඩ ගෝත්‍රිකයන්ට සම්බන්ධ මුල් කොටසක් යැයි සිතිය හැකි ය. බුදුන් ලක්බිමට වැඩම කළ අවධියේ උතුරු ප්‍රදේශයේ චූලෝදර, මහෝදර නමින් රජවරුන් පාලනය කළ බව කියැවේ. මේ රජවරුන් පසු කාලයේ චෝල රජ පරපුර ලෙසට ව්‍යාප්ත වූ ද්‍රවිඩ ගෝත්‍රික රජ පරපුරේ මූලයක් ලෙස ද අනුමාන කෙරේ. එසේ ම එකල කැලණි ප්‍රදේශය පාලනය කළ මණිඅක්ඛිත නාග වංශයේ ම කොටසක් එදා උතුර පාලනය කළ බවට ද මතයක් ඇත. කෙසේ නමුත් විජය කුමරු අප රටට පැමිණීමට පෙර සිට ම මෙහි මනුෂ්‍යයන් වාසය කළ බව ඉතා පැහැදිලි ය.

විජය කුමරු ශ්‍රී ලංකාවට පැමිණ යක්ෂ ගෝත්‍රික කාන්තාවක වන කුවේණි හා විවාහ වූ බවත් එයින් පැවැත එන දරුවන් ගෙන් වත්මන් වැදි ජනතාව සෑදී ඇති බවත් කියැවේ. විජය කුමරු ලංකාවට එන විට සිටි අනෙකුත් යක්ෂ හා නාග ගෝත්‍රිකයන් බොහෝ දෙනකු විජය ඇතුළු පිරිස විසින් විනාශ කරන ලද බව ද ඉතිහාසයේ සඳහන් වේ.

ඒ අනුව අප රටේ ආදි මුතුන් මිත්තන් වන වැද්දන් ද උතුරු ඉන්දීය ආර්ය ගෝත්‍රිකයන්ට සම්බන්ධ පාරම්පරික මිශ්‍ර ජාතියක් බව පෙනේ. ඒ අනුව ඔවුන් ගේ මූලාරම්භය ද ඉන්දියාවට සම්බන්ධ වේ.

වත්මන් ලංකාවේ ජීවත් වන අනෙකුත් ජන කොටස් වන සිංහල, ශ්‍රී ලංකා ද්‍රවිඩ, ඉන්දීය ද්‍රවිඩ හා මුස්ලිම් යන අය ගෙන් බහුතර ජනතාව ගේ ආරම්භය ඉන්දියාව යි. මුස්ලිම් ආගම අදහන මැලේසියාවෙන් මෙහි පැමිණ ඇති මැලේ වශයෙන් හඳුන්වන 50,000 පමණ ජනතාවක් මීට අමතර ව අප රටේ සිටිති. ප්‍රධාන ජන කොටස සිංහලයෝ වෙති.

සිංහලයෝ විජය කුමරු ගෙන් පැවැත එන්නෝ ලෙස සැලකෙති. විජය, යක්ෂ ගෝත්‍රික කුවේණිය අත්හැරීමෙන් පසු මදුරා පුරයෙන් කුමරියක් ගෙන්වා ගෙන විවාහ කර ගත් බව කියැවේ. එහෙත් මේ බිසවට දරුපල නො වූ බව පැවසේ. එනිසා විජය ගෙන් පසු අප රටේ රජකමට විජය ගේ මලණුවන් කෙනකු වන සුමිත්ත කුමරු (පඬුවස්දෙව්) සිංහ පුරයෙන් ගෙන්වාගත් බව මහාචාර්ය ගණනාථ ඔබේසේකර පෙන්වා දෙයි. විජය ගෙන් පසු ඔහු ගේ නෑයන්, හිතවතුන් හා ඔහු ගේ පියා ගේ රාජධානියේ විවිධ ජනකොටස් ද විටින් විට ලංකාවට පැමිණ ඇත.

විජය කුමරුට මදුරා පුරයෙන් ද්‍රවිඩ කුමරියක් ගෙන එන විට විජය ගේ පිරිවරට ද කුමරියන් ගෙනාවා දැයි නො දනී. සුමිත්ත කුමරු (පඬුවස් දෙව් රජු ලෙස) රජ වීමෙන් පසු ඔහු විවාහ කර ගත්තේ බුදුරජාණන් වහන්සේටත් ඥාතී වූ පණ්ඩු ශාක්‍ය කුමරු ගේ දියණිය භද්දකච්ඡායනා කුමරිය යි. මෙම කුමරියට දීඝ නම් සහෝදරයකු සිටි බවත්, ඔහුත් අප රටේ පදිංචියට පැමිණි බවත් ඔහු ගේ පුත් දීඝගාමිණී බවත් ඉතිහාසය කියයි. පඬුවස් දෙව් රජුට හා භද්දකච්ඡායනා බිසවට පිරිමි දරුවන් අට දෙනකු හා එක් දියණියක ලැබුණි. දියණිය අප ඉතිහාසයේ සුප්‍රසිද්ධ චිත්‍රා කුමරිය යි.

උන්මාද චිත්‍රා හා දීඝගාමිණී කුමාරයාට දාව ඉපැදුණු කුමරු සිය මාමාවරුන් මරා පණ්ඩුකාභය ලෙස අනුරාධපුර නගරය ගොඩනඟා එය අගනුවර කර ගෙන රජ වූ බවත්, ශාක්‍ය වාංශික කුමරකු වූ පණ්ඩුකාභය සිංහල රාජධානියේ ආරම්භකයා බව පසු කාලීන අප රජවරුන් ගේ ද විශ්වාසය වූ බවත් මහාචාර්ය මැන්දිස් රෝහණදීර කිය යි.

කෙසේ නමුත් විජය ඉන්දු ආර්ය ගෝත්‍රිකයකු නිසා සිංහලයන් ආර්යයන් ලෙස හැඳින්වුවත් විජය ගේ පටන් ම ආර්ය සිංහලයන් දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ ගෝත්‍රිකයන් සමඟ බද්ධ වූ බව ඉතා පැහැදිලි

ය. මීට අමතර ව ඉතිහාසය පුරා ම නො කඩවා අප රටට දකුණු ඉන්දියානු ද්‍රවිඩ ගෝත්‍රික විවිධ ජන කොටස් සංක්‍රමණය වූ බව ද පැහැදිලි ය.

වෙළෙඳාමට හෝ වෙනත් සමාජ ආර්ථික හේතු නිසා හෝ එසේ නැති නම් යම් විශේෂ වෘත්තීන්ට මෙරටට දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ ගෝත්‍රික විවිධ ජන කොටස් බොහෝ අය සිංහල පවුල් සමඟ ආවාහ විවාහ වීමෙන් ද සිය නම් ගම් හා වාසගම් වෙනස් කර ගනිමින් ද කෙටි මාර්ගවලින් සිංහලයන් වූ බව පෙනේ.

මේ අනුව අප රටේ පාරම්පරික උරුමකරුවන් වන වැදි ජනතාව සෑදී ඇත්තේ ප්‍රධාන ජනවර්ග තුනක සම්මිශ්‍රණයෙනි.

1. පාරම්පරික නාග ගෝත්‍රිකයන්
2. පාරම්පරික යක්ෂ ගෝත්‍රිකයන්
3. ඉන්දියානු ආර්ය ගෝත්‍රිකයන්

ලංකාවේ සිංහලයන් නිර්මාණ වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ගෝත්‍ර හතරක සම්මිශ්‍රණයෙනි. එනම්;

1. පාරම්පරික නාග ගෝත්‍රිකයන්
2. පාරම්පරික යක්ෂ ගෝත්‍රිකයන්
3. ඉන්දියානු ආර්ය ගෝත්‍රිකයන්
4. දකුණු ඉන්දියානු ද්‍රවිඩ ගෝත්‍රිකයන්

මීට අමතර ව අප රටේ ශ්‍රී ලංකා ද්‍රවිඩ, ඉන්දීය ද්‍රවිඩ, ශ්‍රී ලංකා මුස්ලිම් හා බර්ගර් ජාතිකයෝ ද වෙති. ශ්‍රී ලංකා ද්‍රවිඩ ජනතාව සියල්ලෝ දෙමළ නො වෙති. ඔවුන් ද්‍රවිඩ ගෝත්‍රයට අයත් විවිධ ජනවර්ගවලින් සැදුම් ලත් ජන කොටසකි. මේ අය ගෙන් විශාල පිරිසක් ද්‍රවිඩ ගෝත්‍රයට අයත් කේරළියානු ජනතාව ගෙන් සමන්විත ය. මෙයට හොඳ ම උදාහරණය වන්නේ, උතුරේ කතා කරන ද්‍රවිඩ භාෂාව, දකුණු ඉන්දීය දෙමළ භාෂාව නො වීම යි. උතුරේ දෙමළ භාෂාවෙහි විශාල වශයෙන් කේරළ භාෂාවේ වචන ඇතුළත් ව ඇත. ඉපැරණි උතුරේ සිටි ද්‍රවිඩ ජනතාව ගෙන් බහුතරයක් කේරළ ජනතාව ලෙස සැලකිය හැකි ය.

ඉන්දීය ද්‍රවිඩ ජනතාව බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ලංකාවට ගෙන් වූ දකුණු ඉන්දියානු ද්‍රවිඩ ගෝත්‍රිකයෝ වෙති. ඔවුහු සියල්ලෝ ම ද්‍රවිඩ ගෝත්‍රිකයන් වුව ද දෙමළ නො වෙති. ඉන්දීය ද්‍රවිඩ ජනතාව අතර දෙමළ, මලයාලම්, කේරළ, ආන්ද්‍රා ජාතිකයෝ වෙති. එහෙත් අද ඔවුන් සියල්ලන් ම දමිළ ජනතාව ලෙස අපි හඳුනා ගනිමින් සිටිමු.

ශ්‍රී ලංකා මුස්ලිම් ජනතාව ප්‍රධාන ජන වර්ග පහක සම්මිශ්‍රණයෙන් ගොඩනැඟී ඇත. එනම්;

1. ඉන්දියාවෙන් හා ඉන්දියාව හරහා පැමිණි අරාබි ජනතාව
2. සිංහල ජනතාව
3. ඉන්දීය ද්‍රවිඩ ජනතාව
4. ශ්‍රී ලංකා ද්‍රවිඩ ජනතාව
5. මැලේසියාවෙන් පැමිණි මැලේ ජනතාව

අරාබිවරුන් නැති නම් මුස්ලිම්වරුන් අප රටට කිසි දිනෙක කාන්තාවන් රැගෙන පැමිණ නැත. ඔවුන් විවාහ වූයේ මෙහි සිටි සිංහල හා ද්‍රවිඩ කාන්තාවන් සමඟ ය. එපමණක් නො ව ඔවුහු සිය දරුවන්ට සිංහල, ද්‍රවිඩ බිරින්දෑවරුන් ගේ වාසගම් ද එකතු කළ හ. එනිසා අදත් බොහෝ මුස්ලිම් අය ගේ වාසගම් සිංහල හෝ ද්‍රවිඩ ය.

මීට අමතර ව දකුණු ඉන්දියාවෙන් හා දකුණු ඉන්දියානු දූපත්වලින් පැමිණි වෙට්ටි, පන්නර, පඩත්තල, තින්නර වැනි කුඩා ද්‍රවිඩ ගෝත්‍රික ජනතාවක් ද ලංකාවේ වෙසෙති. ඔවුහු සිංහල, වෙට්ටි, කොළම්බු වෙට්ටි හෝ සම්පූර්ණ සිංහල ජනතාව ලෙසට අද අප රටෙහි ජීවත් වෙති.

ශ්‍රී ලංකාවේ මීට අමතර ව ජීවත් වන ප්‍රධාන ජන කොට්ඨාසය වන්නේ බර්ගර් ජනතාව යි. 1960 ගණන්වලට ප්‍රථම මුළු ජනගහනයෙන් 2-3% පමණ සිටි බර්ගර් ජනතාව ගෙන් වැඩි දෙනෙක් 1960 ගණන්වල ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ හ. අද ලංකාවේ බර්ගර් ජනතාව සිටින්නේ 0.4%ක පමණ ප්‍රමාණයකි. මේ බර්ගර් ජනතාවත් අද සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනතාවට විශාල ලෙස සම්මිශ්‍රණය වී ඇත.

ඉහත සඳහන් සියලු ජනතාව දැන් ශ්‍රී ලංකිකයෝ වෙති. මේ සියලු දෙනා දැන් පරම්පරා 5-10ක් හෝ ඊට වඩා අප රටේ වාසය කරන්නෝ වෙති. එනිසා සියලු දෙනා අප රටේ පාරම්පරික උරුමකරුවන් වන අතර, ඔවුහු ලාංකිකයෝ වෙති.

ඒ අනුව අද අප රටේ ජීවත් වන බර්ගර් ජනතාව හැර, අන් සියලු දෙනා ඉන්දියාවෙන් පැමිණි හෝ තම ජන්මයට ඉන්දියානු සම්බන්ධයක් ඇති හෝ අය වෙති. වෙනත් ලෙසකින් කිව හොත් ශ්‍රී ලාංකිකයෝ 99.9%ක් ම ඉන්දියානුවන් හෝ ඉන්දීය සම්බන්ධයක් ඇති ජන කොටසක් වෙති. මෙයිනුත් අතිබහුතරයක් ලාංකික ජනතාව දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ ගෝත්‍රයට සම්බන්ධකම් ඇති ජන කොටස් ය. සිංහල ජනතාව උතුරු ඉන්දියානු ආර්ය ගෝත්‍රිකයෝ ලෙස හඳුනා ගත් හ. මේ ජනතාව ද අතිවිශාල ලෙස දකුණු ඉන්දියානු ද්‍රවිඩ ගෝත්‍රික ජන කොටස්වලට සම්මිශ්‍රණය වී ඇත. දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩයන් විශාල පිරිසක් නම්, ගම් හා ආගම් වෙනස් කර ගනිමින් සිංහලයෝ වී සිටිති.

මා, මේ කොටස විශේෂයෙන් ලිව්වේ මී ළඟ මාතෘකාවෙන් බණ්ඩාරනායක පරපුර ගැන කතා කරන විට ඔවුන්ටත් විශේෂයෙන් ද්‍රවිඩ ජනතාවටත් කිසිදු අසාධාරණයක් සිය ජනවර්ගය නිසා සිදු නො විය යුතු යැයි මා තරයේ විශ්වාස කරන හෙයිනි.

# 02

# බණ්ඩාරනායක පරපුර

බණ්ඩාරනායක පරපුරේ මූලාරම්භය ඉතා පැහැදිලි ව දකුණු ඉන්දීය දෙමළ ජනවර්ගයට අයත් ය. මේ පරපුරේ මුල් තැනැත්තා දකුණු ඉන්දියාවෙන් ලංකාවට පැමිණි නීලපෙරුමාල් නම් දමිළ පුද්ගලයෙකි. ඔහු ඉතා ම පැහැදිලි ව දකුණු ඉන්දියානුවකු නො වේ. ඔහු ද්‍රවිඩ ගෝත්‍රයේ කේරළ හෝ ආන්ද්‍රා වැසියකු ද නො වේ. එසේ ම ඔහු දකුණු ඉන්දියානු දූපත්වල ජීවත් වූ පන්නර, පත්තලී, කින්නර, පඩත්තර වැනි අයකු ද නො වේ. ඔහු වෙට්ටි ජනවර්ගයට අයත් වූවෙක් ද නො වේ.

නීලපෙරුමාල්, ද්‍රවිඩ ගෝත්‍රයට අයත් දෙමළ ජාතිකයෙකි. ජේම්ස් ටී. රත්නම් හා වික්ටර් අයිවන් කියන්නේ මොහු 15 වැනි සියවස මුල දී හෝ 14 වැනි සියවස අග භාගයේ දී ශ්‍රී ලංකාවට පැමිණි බව යි. ඔහු මෙරටට ගෙන්වා ඇත්තේ කඩුවෙල නවගමුව දේවාලය හැදීමට යි.

දකුණු ඉන්දියාවේ "පෙරුමාල්වරු" දේවාල භාරකරුවෝ වෙති. පෙරුමාල් යන්නේ තේරුම කපුවා යන්න යි. ඉහත කී නීලපෙරුමාල් ද දකුණු ඉන්දියාවෙන් ලංකාවට පැමිණ නවගමුව පත්තිනි දේවාලය නිර්මාණය කර එහි පළමු කපුවා ලෙස සේවය කර ඇත. මොහු ගේ බිරිය ද දකුණු ඉන්දියානු ද්‍රවිඩ කාන්තාවකි. මේ දෙපළ හින්දු හැටියට සිටිමින් ම බෞද්ධ භික්ෂූන් හා සමඟ ඉතා සමීප ඇසුරක් ගොඩනඟා ගත් අතර, ඉතා ම ඉක්මනින් හින්දු මෙන් ම බෞද්ධ වත් පිළිවෙත් ද අනුගමනය කිරීමට පටන් ගත් බව කියැවේ. නවගමුවට පැමිණ නීලපෙරුමාල් ගේ පියා සබරගමුවේ සමන් දේවාලයේ නායක පණ්ඩාරම් ලෙස සිටි බව යැස්මින් ගුණරත්නන ගේ "Relative Merits" නම් කෘතියේ සඳහන් වේ.

මේ නිලපෙරුමාල් කපුරාල ගේ දරුවන් නීලපෙරුමාල් නාමය සිංහලට පරිවර්තනය කර ගෙන "කළු කපුගේ" යන නම භාවිත කර ඇත.

කළු කපුගේ කපුරාල ද පසු කලෙක නවගමුව දේවාලයේ ප්‍රධාන භාරකරු නොහොත් නායක පණ්ඩාරම් වී ඇත. නායක පණ්ඩාරම් යන නාමය සිංහලට පරිවර්තනය කර "කළු කපුගේ" ඊ ළඟ පරපුර බණ්ඩාරනායක නාමය භාවිත කිරීමට පටන් ගෙන ඇත. දකුණු ඉන්දීය හින්දු ආගමික චාරිත්‍ර අනුව දේවාලයේ පූජාව තබන ප්‍රධානියා පූසාරි වෙයි. දේවාලයේ භාරකරු පණ්ඩාරම් වෙයි දෙවියන් නාවා, ඇඳුම් අන්දවන්නේ ද දෙවියන් සරසන්නේ ද, දෙවියන් ගේ ආහාර පිසින්නේ ද මේ පණ්ඩාරම්වරුන් ය.

1720 මුල්වරට ලන්දේසීන් මුදලි තනතුරු දෙන විට දොන් ෆ්‍රැන්සිස්කෝ බණ්ඩාරනායකට හේවාගම් කෝරළයේ මුදලි තනතුර ලැබී ඇත. ඔහු ගේ පියා සහ මව ද බණ්ඩාරනායක නම ගත් ද්‍රවිඩ මවුපිය දෙපළකි. ෆ්‍රැන්සිස්කෝ බණ්ඩාරනායක විවාහ වූයේ සිංහල කාන්තාවක් සමඟ යි. ඇය පෙරේරා කෙනෙකි. මේ දෙපළ ගේ පුතා වූ දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායක සියනෑ කෝරළයේ මුදලි විය. එය ඔවුනට ලැබුණේ ද ලන්දේසීන් ගෙනි. මොහු විවාහ වූයේ ජර්මන් කාන්තාවක සමඟ යි. ඔහු ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය වූ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ගේ පියා ගේ සීයා ගේ පියා ය.

ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ යුගයේ මේ බණ්ඩාරනායක පවුල ඇදහූයේ රෙපරමාදු ආගම යි. කතා කළ භාෂාව වූයේ ලන්දේසි භාෂාව යි. ඔවුන් කෑවේ බීවේ හා ඇන්දේ ද ලන්දේසි ක්‍රමයට යි.

මේ බණ්ඩාරනායකවරු ලන්දේසීන්ට සිය ආධිපත්‍යය අප රටෙහි ප්‍රචලිත කර ගැනීමට අවශ්‍ය සියලු උදවු උපකාර කළ හ. ලාංකිකයන් ගෙන් බදු අය කර ගැනීම ද ඔවුන් ගේ ඉඩකඩම් පාලන කටයුතු කිරීම ද ලන්දේසීන් විසින් පත් කරන ලද මේ මුදලිවරු ඉටු කළ හ.

බණ්ඩාරනායක පවුලේ උදවිය ලන්දේසීන්ට උඩරට ආක්‍රමණය කිරීමට උඩරට රජවරුන්ට හා සිංහලයන්ට එරෙහි ව නො කළ දෙයක් නැත. උඩරට අත්පත් කර ගැනීමට උත්සාහ දරන අවස්ථා ගණනාවකදී ම ලන්දේසීහු සිංහල ජනතාව දහස් ගණනින් මරා

දැමූ හ. ඔවුන් ගේ ගම්-බිම්, හරක-බාන, ගෙවල්-දොරවල් සහමුලින් ම විනාශ කර දැමූ හ. මේ සියලු කටයුතු සඳහා ඔවුනට අනුපමේය සේවයක් කළ ප්‍රබල ම පරපුර වූයේ බණ්ඩාරනායක පරපුර ය.

මවාගත් මහා රදලකමක් ආරූඪ කර ගෙන සිටි මේ බණ්ඩාරනායකවරුන් සීමා සහිත පවුල් ගණනකට සීමා වූ ජීවිතයක් ගත කර ඇත. එනම් ඔබේසේකර, ඩී.සේරම්, ලිවේරා, පිලිප්ස්, ඉලංගකෝන්, ජයකොඩි, ඩයස් ආදී පවුල්වලට ඔවුහු සීමා වූ හ. මොවුන් විවාහ ගනුදෙනු ඇතුළු සියලු කටයුතු කළේ මේ පවුල් සමඟ පමණි.

එහෙත් මොවුන් ලන්දේසි පාලන කාලයේ ලන්දේසීන් තමන් ගේ හාම්පුතුන් ලෙස සලකා ඔවුන් ඉදිරියේ භය පක්ෂපාතී ව හැසුරුණු අතර ඕනෑ ම ලන්දේසියකුට ඔවුහු ඉතා ඉහළින් සැලකූ හ.

එසේ ම ඉංග්‍රීසින් අප රටේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් වහා ම බණ්ඩාරනායකවරු ලන්දේසීන්ට දැක්වූ පුද සත්කාර හා යටහත් පහත් පක්ෂපාතී බව ඉංග්‍රීසීන්ට පූජා කළෝ ය.

ඉංග්‍රීසීන්ට මුහුදුබඩ ප්‍රදේශවල තම පාලනය තහවුරු කර ගැනීමටත්, ලාංකිකයන් ගෙන් තලා පෙළා වැඩ ගැනීමටත්, උඩරට අල්ලා ගැනීමටත් බණ්ඩාරනායකවරු අනුපමේය සේවයක් ඉටු කළ හ.

ලන්දේසීන් උඩරට අල්ලා ගැනීමට ගත් සියලු උත්සාහයන් ව්‍යර්ථ කිරීමට ලාංකිකයෝ සමත් වූහ. මේ සඳහා සිංහලයන්ට අමතර ව මඩකළපුව වැනි ප්‍රදේශවලින් ද්‍රවිඩ ජනතාව ද සිංහලයන් ගේ සහායට පැමිණි බව කියැවේ. මඩකළපු ද්‍රවිඩ ජනතාව තුළ අතිවිශේෂ සටන්කාමී බවක් හා එඩිතරකමක් තිබූ බව එදා උඩරට රජවරුන් විශ්වාස කළ බව පෙනේ.

මේ සියලු අවස්ථාවල බණ්ඩාරනායකවරුන් ලන්දේසීන් හා එක් ව සිංහලයන්ට එරෙහි ව, ශ්‍රී ලංකාද්වීපයට එරෙහි ව ලන්දේසීන්ටත් එහා යමින් අපරාධ කළ බව ඉතා පැහැදිලි ය. ඒ සියල්ලට බණ්ඩාරනායකවරුන්ට තාන්න-මාන්න, කඩු-කස්තාන, ඉඩ-කඩම් හා මිල-මුදල් ලැබුණි.

මේ බණ්ඩාරනායකවරුන්ට කිසිදු පැකිළීමක් නැති ව සිංහලයන්ට, ලාංකිකයන්ට එරෙහි ව හතුරුකම් කිරීමට හැකි වූයේ, ඔවුන් සාමාන්‍ය සිංහල ජනතාව සමඟ කිසිදු සම්බන්ධකමක් නො පැවැත්වූ නිසා ය.

ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගත් වහා ම බණ්ඩාරනායකවරු ඉතා ඉක්මනින් ඉංග්‍රීසීන් ගේ විශ්වාස වන්ත උදවුකාරයෝ බවට පත් වූහ. ඒ සමඟ ඔවුහු තම භාෂාව ඉංග්‍රීසි භාෂාව බවට මාරුකර ගත් අතර ඉංග්‍රීසීන් ගේ ආගම වූ එංගලන්ත සභා ආගම වැළඳ ගැනීමටත් උත්සුක වූ හ.

ඉන් පසු ඉංග්‍රීසීන් ගෙන් ලාංකිකයන්ට ලැබෙන ඉහළ ම තාන්නමාන්න ලබාගැනීමේ භාග්‍යය බණ්ඩාරනායකවරුන්ට හිමි විය. එසේ ඉංග්‍රීසින් ගේ විශ්වාසය දිනා ගැනීමේ එක ම රහස වූයේ බණ්ඩාරනායකවරුන් ඉංග්‍රීසින්ට අප රට තුළ බලය තහවුරු කිරීමට සියලු උදවු උපකාර කිරීම හා ලාංකිකයන්ට, සිංහලයන් ට එරෙහි ව ඕනෑ ම දෙයක් කිරීමට ද ඔවුන් සූදානම්ව සිටීම යි.

උඩරට රජු හා උඩරට නිලමේවරුන් අතර මතභේද ඇති කිරීමේ කාර්යය ඉංග්‍රීසින් වෙනුවෙන් මෙහෙය වූයේ ජෝන් ඩොයිලි ය. උඩරට රජු බේබද්දකු කළේ ද මේ ඩොයිලි ම ය. අවසානයේ සිංහලයේ අන්තිම රජු උඩරට රදලයන් මරා දමමින් පවුල් පිටින් ඝාතනය කරමින් කළ මහා විනාශය පසු පස සිටියේ ද ජෝන් ඩොයිලි ය.

සිංහල ජනතාව අදත් වීරත්වයෙන් සිහි කරන වීර මද්දුම බණ්ඩාර දරුවා ගේ හිස ගසා දැමීම, ඇහැලේපොළ කුමාරිහාමි මහනුවර වැවේ ගිල්වා මරා දැමීම, ඇගේ අත දරුවා කෑලි කෑලිවලට කපා වංගෙඩියකට දමා කෙටීමට ඇහැලේපොළ කුමාරිහාමිට බල කිරීම වැනි සියලු තිරිසන් දෑ සිදු වූයේ මේ වකවානුවේ ය. මේ සියල්ල ජෝන් ඩොයිලි ගේ කුමන්ත්‍රණවල ප්‍රතිඵල විය.

ඩොයිලි මේ සියලු කටයුතු මෙහෙය වීමට යොදා ගත් සිංහලයන් ගෙන් බණ්ඩාරනායකවරු ප්‍රධාන වෙති. එනම් ප්‍රධාන වශයෙන් දිවංගත අගමැති බණ්ඩාරනායක ගේ පියා ගේ සීයා ය. ඒ වන විට ඔහු සියනෑ කෝරළයේ මුදලිඳු වූයේ ය.

උඩරට රජු කුණ්ඩසාලේ දී ඉංග්‍රීසීන් අතට හසු වන විටත් මේ බණ්ඩාරනායක මුදලිඳු ද ඉංග්‍රීසීන් සමඟ එම ස්ථානයේ සිටි බව ඉතිහාසය කියයි.

1818 උඩරට කැරැල්ල මර්දනය කිරීමට ද මේ බණ්ඩාරනායක විසින් (එස්.ඩබ්.ආර්.ඩී. ගේ පියා ගේ සීයා) ඉංග්‍රීසීන්ට අතිවිශාල මෙහෙයක් කරන ලදි. සිංහල කැරලිකරුවන් අත්අඩංගුවට ගැනීමට රදළ නායකයන් විනාශ කිරීමට, සිංහල ගම්මාන විනාශ කිරීමට, කැරලි නායකයන් කොටු කර ගැනීමටද මේ බණ්ඩාරනායක ඉංග්‍රීසීන්ට අනුපමේය සේවයක් කළේ ය. ඉංග්‍රීසීන් ගේ අනුදැනුම ඇති ව හදාගත් සිංහල හොරිකඩ හමුදාවක් ද ඔවුන්ගේ සහායට ගත් ඉංග්‍රීසි හමුදාවක් ද එදා මේ සොලමන් බණ්ඩාරනායකට උදවුවට සිටි බව කියැ වේ. මේ හමුදාව අනුකම්පා විරහිත ව සිංහලයන් හා සිංහල ගම්මාන විනාශ කරමින් ඉංග්‍රීසීන් හා සමානව ම කෲර අයුරින් උඩරට කැරැල්ල මර්දනය කිරීමට කටයුතු කර ඇත.

පහත රට ලන්දේසීන්ට පාවාදීමටත්, ඉන් පසු ඉංග්‍රීසින්ට පාවාදීමටත්, උඩරට පරදේසීන්ට යටත් කර දීමටත් එදා බණ්ඩාරනායකවරුන් සිය උපරිම කැපවීම් කළ බව පැහැදිලි ය. ඒ වෙනුවෙන් ලැබුණ තාන්න මාන්න, නම්බු නාම වරප්‍රසාදවලින් ඔවුහු ධනවත් බලවත් වංශවත් පරපුරක් බවට පත් වූ හ.

පහත රට සිංහලයන්ට එරෙහි වත්, උඩරට සිංහලයන්ට එරෙහි වත්, ලන්දේසීන්ට හා ඉංග්‍රීසීන්ට උපකාර කළ මේ අය 1818 දී ඉංග්‍රීසීන්ට එරෙහි ව නැඟී සිටි ස්වදේශිකයන්ට එරෙහි වත් සියලු ද්‍රෝහිකම්වල යෙදුනා හ. ඉංග්‍රීසීන් ගේ වරප්‍රසාද මත ධනවත් හා බලවත් වූහ.

# 03

# මහ මුදලි දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායක

සියනෑ කෝරළයේ මුදලි දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායක ගේ පුතා ක්‍රිස්ටෝපර් හෙන්රිකස් බණ්ඩාරනායක ය. ඔහු ගේ පුතා මහ මුදලි දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායක ය. ඔහු ගේ සම්පූර්ණ නම රජ කුමරුන් කඩු කරලූ දොන් සොලමන් ඩයස් අබේවික්‍රම ජයතිලක සෙනෙවිරත්න බණ්ඩාරනායක යි. ඔහු දිවංගත හිටපු අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ගේ පියා යි. ඔහු විවාහ වූයේ ඔබේසේකර පරපුරේ ඩේසි අසිලින් ඔබේසේකර සමඟ ය.

බණ්ඩාරනායක පවුලේ මහ මුදලි තනතුර ලැබූ පළමු තැනැත්තා මොහු ය. මොහු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයාට සමීපතම සිංහලයා වූයේ ය. ඔහු ස්වදේශිකයන් ආශ්‍රය කළේ ඉතා ම අඩුවෙනි. සිංහල කතා කළේ ම නැත. බෞද්ධ හා හින්දු ආගම්වලට එරෙහි ව සිටි අයෙකි. බුදුන් වහන්සේට, හාමුදුරුවරුන්ට, දෙවියන්ට, හින්දු පූජකවරුන්ට කිසිදු ගරු සරුවක් නො දැක්වූ අයෙකි.

මහ මුදලි බණ්ඩාරනායක නිතර ම සිටියේ ආණ්ඩුකාරවරයා ගේ නිවසේ ය. ඔහු ආණ්ඩුකාරවරයා ගේ භාෂා පරිවර්තකයා ද වූයේ ය.

ලාංකිකයන් ගේ ඇසුර නොරිස්සූ මොහු ඉංග්‍රීසීන් ගේ සමාගම දැඩි ලෙස ප්‍රිය කළේ ය. සිංහලයන් ඉදිරියේ මහා අහංකාර, ගම්භීර චරිතයක් රඟ පෑ මොහු ඉංග්‍රීසීන් ඉදිරියේ යටහත් පහත් සුවච කීකරු අයකු ගේ චරිතය රඟපෑවේ ය. ඉංග්‍රීසි නිලධරයකු ගේ නිවෙසට ගොඩවන විට සිය පාවහන් ගලවා යෑමට තරම් මොහු දීන වූ බව කියැවේ.

මොහුට හොරගොල්ලේ මහ වලව්වට අමතර ව කොළඹ ද සුවිසල් මන්දිරයක් විය. අද බණ්ඩාරනායකවරුන් සතු ව ඇති රොස්මිඩ් නිවෙස මොහු පසු කාලයක මිල දී ගත් ගෙයකි.

එදා හොරගොල්ල මහ වලව්ව අත්තනගල්ලේ සාමාන්‍ය මිනිසුන්ට විවෘත නො වී ය. එය සිංහල පවුල් කිහිපයකට පමණක් විවෘත වී තිබිණි. එහෙත් සුද්දකු වුව ද පාවාඩ එළා පිළිගැනීමට බණ්ඩාරනායකවරුන් ගේ හොරගොල්ල මහ වලව්ව නිතර සැදී පැහැදී සිටි බව නො රහසකි.

මහ මුදලි සොලමන් ඩයස් බණ්ඩාරනායක අහිංසක සිංහලයන් තලා පෙළා ඔවුනට වධ හිංසා පැමිණ වූ අයකු ලෙස ප්‍රසිද්ධ ය. ඔහු, අසු පිට යන විට පාරේ සිටින සියලු දෙනා පාරෙන් ඉවත් විය යුතු ය. නැති නම්, ඔහු අශ්ව කසයෙන් ඒ අසරණයන්ට පහර දුන් බව කියැවේ.

හොරගොල්ල මහ වලව්ව අවට සිටි බෞද්ධයන් තම පන්සල්වල ස්වාමීන් වහන්සේලා සමඟ මහ මුදලි හමු වී තම වෙහෙර විහාර දියුණු කර ගැනීමට උපකාර ලබා ගැනීමට උත්සාහ කළත් මොහු කිසි දිනෙක එම අය මුණ ගැසීමට වත් කැමැති වී නැත. මේ මහ මුදලි ගම්පහ දිස්ත්‍රික්කයේ කිසිදු බෞද්ධ සිද්ධස්ථානයකට කිසිදු උපකාරයක් කර නැත.

මහ මුදලි සොලමන් ජීවත් වූයේ රදල වංශාධිපති සුදු ජාතිකයකු ලෙසිනි. ඔහු ඇන්දේ සම්පූර්ණයෙන් ම බ්‍රිතාන්‍ය වංශාධිපතියකු ලෙසයි. ඔහු ගෙදරට ද ටයි කෝට් ඇන්දේ ය. ඔහු ගේ සියලු ඇඳුම් පැළඳුම් එංගලන්තයෙන් නැති නම් ප්‍රංශයෙන් ගෙන්වා ගත් ඒවා ය. ඔහු ගේ සපත්තු තොප්පි සියල්ල ලන්ඩන් නගරයේ ඇති වැඩි ම වටිනාකමක් ගත් ඒවා ය. ඔහු අසුන් පිට යෑමට දැඩි ලෙස ප්‍රිය කළේ ය. සියලු අශ්වයන් ගෙන්වා ගත්තේ එංගලන්තයෙන් ය. ඔහු දඩයමටත් ප්‍රිය කළ අයෙකි. ඔහු සුද්දන් සමඟ අලි ඇතුන් දඩයමේ ද ගිය බව කියැවේ.

ඉංග්‍රීසි ආණ්ඩුකාරයා ගේ සමීපතම ස්වදේශිකයා වූයේ මේ මහ මුදලි දොන් සොලමන් ය. 1892 එංගලන්ත රජු ගේ 50 වැනි රාජාභිෂේක මහෝත්සවයට ආරාධනා ලැබූ එක ම ස්වදේශිකයා වූයේ මොහු යි. 1902 එංගලන්තයේ පැවැති එඩ්වඩ් රජු ගේ රාජාභිෂේක උත්සවයට මොහු සහභාගි වූයේ ය.

දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායකට පරම්පරාවෙන් අතිවිශාල බූදලයක් හිමි වී තිබුණි. ඒ සියල්ල ඔහුට ලැබුණේ ඔවුන් ගේ මුතුන් මිත්තන් ලන්දේසීන්ට හා ඉංග්‍රීසීන්ට කළ ජාතිද්‍රෝහී ක්‍රියාවලට යි.

බණ්ඩාරනායකවරුන් පිරිසිදු දමිළ පරපුරකින් පැවැත එමින් නම් ගම් හා වාසගම් ද ආගම් ද කතා කරන භාෂාවද වෙනස් කර ගනිමින් සිංහල වෙස් ගෙන කළේ සියලු සිංහලයන්ට, සියලු ස්වදේශිකයන්ට මෙන් ම අපගේ මාතෘ භූමිය වන ශ්‍රී ලංකාද්වීපයට ද හතුරුකම් කිරීම යි. එනිසා ම ඔවුනට ගම්බිම් මෙන් ම තාන්නමාන්න ද නො අඩුව ලැබිණි.

දොන් සොලමන් ඩයස්, මහ මුදලි ලෙස සියලු මුදලිවරුන් ගේ ප්‍රධානියා ද වූයේ ය. සර් වෙස්ට් රිජ්වේ ලංකාණ්ඩුකාරවරයා ගේ භාෂා පරිවර්තකයා ද වූයේ ය. ඔහු ගේ ස්වදේශික උපදේශකයා ද වූයේ ය.

මොහු කිසි විට ශ්‍රී ලංකාව වෙනුවෙන් කතා කළේ නැත. සිංහලයන් වෙනුවෙන් පෙනී සිටියේ ද නැත. තම සැබෑ ජන්මයට සම්බන්ධ ද්‍රවිඩ ජනතාව සමඟ ද ඔහුට කිසිදු සම්බන්ධතාවක් නො වී ය. ඔහු කිසි විටෙක බෞද්ධ, හින්දු, මුස්ලිම් ජනතාව වෙනුවෙන් පෙනී සිටියේ නැත. ඔහු ගේ සියලු කැපවීම් තිබුණේ ඉංග්‍රීසි කිරීටය රැක දීමට පමණි.

දොන් සොලමන් විවාහ වූයේ එවකට ව්‍යවස්ථා දායක සභාවේ සාමාජිකයකු වූ සර් ක්‍රිස්ටෝපර් ඔබේසේකර ගේ වැඩිමහල් දියණිය සමඟයි.

විවාහයට අත්සන් කළේ සර් වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා හා හැරී ඩයස් ඔබේසේකර යන අයයි.

මේ යුවළට 1899 ජනවාරි 08 වැනි දා උපන් දරුවා වූයේ, දිවංගත අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක යි. දොන් සොලමන් තම පුත්‍රයාට තැබූ සම්පූර්ණ නම වූයේ ද සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක යන්න ය. සොලමන් යනු තමන් ගේ පරම්පරාවෙන් පරම්පරාවට ගෙනා නමකි. වෙස්ට් රිජ්වේ යනු එවකට සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරයා ගේ නම යි.

දොන් සොලමන් මොනතරම් පරගැති පුහු පුරාජේරු හිස් මිනිසකු ද යන්න ඔහු සිය පුතාට තැබූ මේ නමින් ම තේරුම් ගත හැකි ය.

එමෙන් ම ඔහු මොන තරම් පරගැතියෙක් ද කිව හොත්, ඔහු සිය පුතා ස්වදේශික දරුවන් හා එක් වනවාට ප්‍රිය කළේ නැත. තම දරුවාට ස්වදේශික ගුරුවරුන් උගන්වනවාට ද කැමැති වූයේ නැත. එනිසා ඔහු සිය පුතාට ගෙදර සිට ඉගැන් වීමට ඒ. සී. රුඩ්පර්ඩ් නම් ඉංග්‍රීසි ජාතිකයකු එංගලන්තයෙන් ගෙන්වා ගෙන ඇත.

මේ රුඩ්ෆර්ඩ් නමැති ඉංග්‍රීසි ජාතිකයා උගතෙක් හෝ අධ්‍යාපන විශේෂඥයෙක් හෝ නො වූයේ ය. ඔහු ළදරු අධ්‍යාපනය ගැන කිසිදු අවබෝධයක් තිබූ අයෙක් ද නො වී ය.

මේ නිසා ම අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකට මිය යන තුරු ම සිංහල ලිවීමට හෝ කියවීමට හෝ නො හැකි විය. ඔහු කිසි දා සිංහල හෝඩිය ඉගෙන ගෙන තිබුණේ නැත.

# 04

# අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක

1899 ජනවාරි 08 වැනි දා දොන් සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක උපන්නේ ය. ඔහු ඉපදුණේ බණ්ඩාරනායක-වරුන්ට හිමි ව තිබූ මෝදර එළිහවුස් මන්දිරයේ ය.

මේ ළදරු බණ්ඩාරනායක නොහොත් මහ මුදලි දොන් සොලමන් ගේ පුතා අලුත්කඩේ සියලු ශාන්තුවරයන් ගේ දේවස්ථානයේ දී බෞතිස්ම කරන ලදි. ඔහු ගේ ආගමික පිතෘවරයා වූයේ ද එදා ලංකාවේ ආණ්ඩුකාරවරයා වූ සර් ජෝශප් වෙස්ට් රිජ්වේ ය.

කලක් රූඩ්ෆර්ඩ් නම් ඉංග්‍රීසි ජාතිකයා යටතේ නිවසේ ම මූලික අධ්‍යාපනය ලැබූ බණ්ඩාරනායක ළදරුවා 1904 දී ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළු කරන ලදි.

1915 වසරේ පැවැති කේම්බ්‍රිජ් සීනියර් විභාගයෙන් සමත් වූ මොහු 1919 ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළු වූයේ ය. භාෂා සාහිත්‍ය හා නීතිය ඔහු හැදෑරීමට තෝරා ගත් විෂයන් ය.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල උපාධිධරයකු ලෙස තරුණ බණ්ඩාරනායක 1925 පෙබරවාරි 24 වැනි දා නැවත අප රටට සේන්දු වූයේ ය. මේ තරුණ බණ්ඩාරනායක උපදින විට බණ්ඩාරනායකවරු මේ රටේ සිටි බලවත් ම ස්වදේශීය පරපුර වූහ. එහෙත් ඔහු ගේ ළමා විය ආරම්භ වන්නේ ම එම පවුල් බලය බිඳ වැටීමෙනි.

1835 - 1911 දක්වා පහතරට සිංහලයන් වෙනුවෙන් ව්‍යවස්ථා දායක සභාවට නාමකරණයෙන් පත් වූ නව දෙනා අතුරෙන් 1865 - 1875 කාලය නියෝජනය කළ ඊ. එච්. දෙනගම හැරුණු විට අන් සියලු දෙනා බණ්ඩාරනායක පරපුරට අයත් වූවෝ වූ හ.

ඒ මෙසේය;

1. 1835 - 1843 - ජේ. ජී. පිලිප්ස් පණ්ඩිතරත්න
2. 1843 - 1860 - ජේ. සී. ඩයස්
3. 1861 - 1865 - එච්. ඩයස්
4. 1865 - 1875 - ඊ. එච්. දෙනගම
5. 1875 - 1878 - ජේම්ස් අල්විස්
6. 1878 - 1881 - ජේ. පී. ඔබේසේකර
7. 1881 - 1888 - ඒ. ඩී. අල්විස්
8. 1888 - 1900 - ඒ. ඩී. අල්විස් සෙනෙවිරත්න
9. 1900 - 1911 - එස්. සී. ඔබේසේකර

මෙහි ඊ. එච්. දෙනගම මහතා බණ්ඩාරනායක පවුල් සංගමයට අයත් නො වූවත් ඔහු ද බණ්ඩාරනායකවරුන්ට හය පක්ෂපාත ව සිටි පවුලක අයෙකි.

1911න් පසු සීමා සහිත ඡන්දයකින් උගත් ලාංකිකයකු තෝරා ගැනීමේ ඉඩකඩ විවෘත කර දීමට බ්‍රිතාන්‍ය පාලකයන්ට සිදු විය. මේ අරගලය ඉදිරියට ගෙනාවේ සර් ජේම්ස් පීරිස් මැතිතුමා යි.

එතෙක් කල් තිල නො ලත් මන්ත්‍රීන් වීමේ භාග්‍යය උඩ රට-පහත රට වංශාධිපතියන්ට පමණක් හිමි වීමේ තත්ත්වය උඩ මේ සීමා සහිත ඡන්ද ඉල්ලීම මතු වූයේ ද එකල උගත් ප්‍රබල පිරිසක් ව සිටි කරාවේ කුලයෙනි. සර් ජේම්ස් පීරිස් එහි ප්‍රධානියා වූයේ ය.

1911 උගත් ලාංකිකයා තේරීමේ තරගයේ දී ඡන්ද බලය ලැබුණේ කේම්බ්‍රිජ් කනිෂ්ඨ විභාගය සමත් අයට පමණි. ඒ අනුව ඡන්ද බලය ලැබුණු මුළු පිරිස 2938කි. ඉන් 1659ක් සිංහල වූ අතර 1072ක් දෙමළ වූ හ. සිංහල අය ගෙන් බහුතරය ප්‍රභූ කරාවේ කුලයට අයත් වූ හ.

මේ තත්ත්වය තේරුම් ගත් සිංහල වංශාධිපතියන් කළේ කරාවේ කුල අපේක්ෂකයා ලෙස තරග වැදුණු මාක්ස් ප්‍රනාන්දු මැතිතුමාට එරෙහි ව ද්‍රවිඩ අපේක්ෂකයා වූ පොන්නම්බලම් රාමනාදන්ට උපකාර කිරීම යි.

එ නිසා ශ්‍රී ලංකාවේ පැවැති පළමු මැතිවරණය කුල පොරයක් බවට පත් විය.

මේ සීමා සහිත ඡන්ද ක්‍රමය පටන් ගැනීමත් සමඟ එතෙක් ලංකාවේ බණ්ඩාරනායකවරුන්ට හිමි ව තිබූ ව්‍යවස්ථාදායක බලය ක්‍රමයෙන් දියවෙමින් සේනානායකවරු ඉස්මතු වූ හ.

තරුණ බණ්ඩාරනායක 1925 දී ලංකාවට එන විට බණ්ඩාරනායකවරුන්ට තිබුණ මහා බල පරාක්‍රමය බිඳ වැටී තිබිණි. එකල ව්‍යවස්ථාදායක සභාවේ බණ්ඩාරනායක පරපුරෙන් සිටියේ එෆ්. ඒ. ඔබේසේකර පමණි. ඒ වන විට රටේ ප්‍රබලයන් වී සිටියේ සේනානායක පරපුර යි.

මේ තත්ත්වය බණ්ඩාරනායකවරුන්ට විශාල පරාජයක් විය. නැති වූ බල පරාක්‍රමය තරුණ බණ්ඩාරනායක හරහා නැවත ලබා ගැනීමේ වුවමනාව බණ්ඩාරනායකවරුන්ට තදින් තිබුණු බව මේ තරුණයා ගේ ලංකාගමනය සංවිධාන කළ අයුරින් ම ඉතා ම පැහැදිලි ය.

තරුණ බණ්ඩාරනායක පැමිණි "ලැන්කැෂියර්" නැව කොළඹ වරායට සේන්දු වන විට බණ්ඩාරනායක පරපුරේ සියලු ප්‍රධානයන් ඔහු පිළිගැනීමට වරායට ගොස් තිබිණි. මහ මුදලි සොලමන් හා ආර්යාව, මුදලිඳු වෝල්ටර්, දොස්තර සේරම්, රොහාන් ඩයස් බණ්ඩාරනායක හා හියු පෙරේරා යන අය එදා තරුණ බණ්ඩාරනායක පිළිගැනීමට ගිය අය අතර වූහ.

ඉන් පසු ඔහු පෙරහැරින් කැඳවා ගෙන ගියේ අලුත්කඩේ සියලු ශාන්තුවරයන් ගේ දේවස්ථානයට යි. එහි වූ විශේෂ දේව මෙහෙය ද ඉතා උසස් ලෙස සංවිධාන කර තිබිණි. දේව මෙහෙය පැවැත් වූ දේවගැති ජී. බී. ඒකනායක පියතුමා මෙන්ම වාදනයෙන් සහාය වීමට පැමිණ සිටි කීර්තිමත් අමරසේකර මැතිතුමන් ද හොඳින් තෝරා බේරාගෙන තිබූ බව පෙනේ.

එදින රාත්‍රියේ ඔහුගේ කොළඹ නිවහන වූ හිල් කාසල් මන්දිරයේ දී පැවැති ප්‍රිය සම්භාෂණයට ද අතිවිශාල ප්‍රභූ පිරිසකට ආරාධනය කර තිබිණි. මේ සම්භාෂණයේ බණ්ඩාරනායකවරුන් මෙන්ම සේනානායකවරුන් ද වෙනත් කුල ප්‍රභූවරුන් ගණනාවක් ද සිටීම සුවිශේෂ කාරණයක් විය. මේ තත්ත්වය බණ්ඩාරනායක වරුන් තුළ මීට පෙර නොදුටු දසුනකි. එම ප්‍රිය සම්භාෂණයෙන් ද පෙනුණේ තරුණ බණ්ඩාරනායක දේශපාලනය සඳහා සූදානම් කිරීමට සර් සොලමන් වැඩකටයුතු ආරම්භ කළ බවයි .

පසු දා මේ තරුණ නීතිඥයා හොරගොල්ල වලව්වට කැඳවා ගෙන යන ලදි. ඒ සඳහා ද විශාල පෙරහැරක් හා උත්සව මාලාවක් සංවිධාන කර තිබුණි. මාර්ගයේ තැන තැන පිළිගැනීමේ උත්සව ද සැරසිලි හා තොරන්වලින් පිරී තිබිණි. මේ සියල්ල බණ්ඩාරනායක පවුල් සංස්ථාවේ අය බෙදා ගෙන එකිනෙකා තරගයට මෙන් ඉතාමත් උසස් ලෙස සංවිධාන කර තිබිණි. තැනින් තැන අලි ඇතුන් සහිත පෙරහැර ද විය.

තරුණ බණ්ඩාරනායක තමා පිළිගැනීමට පැමිණ සිටි උඩගම්පත්තුවේ ජනතාව ඇමතී ය. ඒ ඉංග්‍රීසි භාෂාවෙනි.

මහ මුදලි ඇතුළු බණ්ඩාරනායක පරපුරේ ප්‍රධානීන් තරුණ බණ්ඩාරනායක පිළිගැනීම ප්‍රාදේශීය නායකයන්ට පවරා තිබුණි.

තරුණ බණ්ඩාරනායක ද උඩගම්පත්තුවේ කළ කතාව සර් සොලමන් ඇතුළු බණ්ඩාරනායකවරුන් ගේ අරමුණ ඉතා මත් පැහැදිලි ව විදහා පායි.

එම කතාවේ සාරාංශය මෙසේ යි.

"මා පිළිගැනීම ගැන ස්තුති යි. මට ඉංග්‍රීසියෙන් කතා කිරීමට සිදු වීම ගැන සමාවන්න. මම මේ වරද ඉක්මනින් හදා ගනිමි. මම හද පත්ලෙන් ම සිංහල බව ඔබට සහතික කොට කියමි. ඔබ ගේ මේ පිළිගැනීම මට කාරණා දෙකක් නිසා වැදගත් වෙනවා. පළමුවෙන් අපේ රට වැසියන් ගෙන් මෙ තරම් විශාල සංඛ්‍යාවක ගේ හොඳ හිත මා කෙරෙහි පැවැතීම මට ආඩම්බරයක්. මේ ජනතාව මගේ මුතුන්මිත්තන් ජීවත්වුණු ඔවුන් සේවය කළ ප්‍රදේශවල ජනතාව වීම දෙ වැනි වැදගත් කාරණය යි."

"ඔබේ නායකයන් ගෙන් කෙනකු හැටියට මගේ නම සඳහන් කිරීමට තරම් ඔබතුමන්ලා කාරුණික වූයෙහි ය. මේ දෙය සිහියේ රඳවා ගන්නා හැටියට මම ඔබෙන් ඉල්ලා සිටිමි. මා හිතන්නේ මාත් ඔබ වැනි කෙනකු හැටියට යි. යම් කිසි දෛවෝපගත සිද්ධියකින් මට ඔබ අතර වැදගත් තැනක් හිමිවන්නේ නම් ඒ ඔබේ ස්වාමියකු හැටියට නො ව සේවකයකු හැටියට බව සිහි තබා ගත මැනවි."

මේ වන විට තරුණ බණ්ඩාරනායකයන් ගේ වයස අවුරුදු 26යි. මේ කාලයේ දී ඔහුට උඩගම්පත්තුවේ මිනිසුන් සමඟ කිසිදු සම්බන්ධතාවක් නො වී ය. බණ්ඩාරනායකවරු ද සිංහල බෞද්ධ

මිනිසුන් තලා පෙළමින් ඉංග්‍රීසීන් හා ලන්දේසීන් සමඟ ජීවත් වූ පිරිසකි. ඔවුන් සිංහලයන්ට හෝ බෞද්ධයන්ට හෝ එතෙක් කල් කිසිදු සේවයක් හෝ පරිත්‍යාගයක් හෝ කර නැත. බණ්ඩාරනායකවරුන් මුළු ඉතිහාසය පුරා සේවය කර ඇත්තේ ලන්දේසීන්ට හා ඉංග්‍රීසින්ට පමණි.

බණ්ඩාරනායකවරුන් ගේ මේ මහා හදිසි පෙරළියේ රහස තරුණ බණ්ඩාරනායක උඩගම්පත්තුවේ ජනතාව අමතා කළ කතාවෙන් මනා ව හෙළිදරවු විය.

මේ තරුණ බණ්ඩාරනායක සිය රටට පැමිණ නොබෝ දිනෙකින් තරුණ බෞද්ධ සමිතියක ආරාධනයෙන් "ශිෂ්ටාචාරයක් තෝරා ගැනීම" යන මාතෘකාව යටතේ දේශනයක් පැවැත් වූයේ ය.

මුළු දේශනය පුරා තිබුණේ ජාති හිතෛෂිභාවය හා දේශප්‍රේමීත්වය යි. එම සභාවේ මූලාසනය දැරූ ඩී.බී. ජයතිලක මහතා සිය මූලාසන කතාව කරමින් බණ්ඩාරනායක ගේ ජාති හිතෛෂිභාවය ගැන ඉතා ඉහළින් වර්ණනා කරමින් ඔහු අනාගතයේ අප රටේ ජනනායකයකු වන බව කීවේ ය.

මෙම දේශනය ද බණ්ඩාරනායකවරුන් විසින් සැලසුම් සහගත ව සංවිධාන කෙරුණකි.

මෙවැනි මහා ක්ෂණික පරිවර්තනයකට අවශ්‍ය ජානමය ශක්තිය මේ බණ්ඩාරනායකවරුන්ට යහමින් ඇති බව ඉතා මත් පැහැදිලි ය.

"නීලපෙරුමාල්" "කළු කපුගේ" වී පසු ව "පණ්ඩාරම්" වී එතැනින් බණ්ඩාරනායක වීම මේ සඳහා එක් සහතිකයකි.

සම්පූර්ණයෙන් දමිළ ජාතික පවුලක් නම වෙනස් කළ පමණින් දමිළකම සහමුලින් ම අමතක කිරීමට සමත් වීමත් පසු ව සිංහලයන් ලෙස පෙනී සිටිමින් ම ලන්දේසීන්ට හා ඉංග්‍රීසින්ට සම්පූර්ණයෙන් ගැති ව ජීවත් වීමට පටන් ගැනීමත් මේ සඳහා දැක්විය හැකි තවත් ජාන සහතිකයකි.

එතැනින් ද නො නැවතුණ බණ්ඩාරනායකලා සිංහලයන්ට ද්‍රවිඩයන්ට පමණක් නො ව සමස්ත ලාංකිකයන්ටත් ශ්‍රී ලංකාද්වීපයටත් එරෙහි ව ඉංග්‍රීසින් ගේ පැත්ත ගැනීම තුන් වැනි ජාන සහතිකය යි.

ලංකාවට පැමිණි බණ්ඩාරනායක සිය බ්‍රිතාන්‍ය අධ්‍යාපනයෙන් හා අප රටේ මතුවෙමින් තිබූ නිදහස් සටන් තුළින් බලය සඳහා ගත යුතු මඟ නිවැරැදි ව තේරුම් ගෙන තිබිණි. පළමු වැනි ලෝක යුද්ධයෙන් පසු මතුවෙමින් පැමිණි ලෝක සමාජවාදී ව්‍යාපාරය ගැනත් යටත් විජිත විරෝධී අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර ගැනත් මොහුට නිවැරැදි තක්සේරුවක් තිබූ බව පෙනුණි.

තරුණ බණ්ඩාරනායක කොළඹ වරායට සේන්දු වූ අවස්ථාවේ සිට බණ්ඩාරනායක පවුල් සංගමය තම නැති වූ බලය යළි තහවුරු කර ගැනීමේ ව්‍යාපෘතිය මේ තරුණයා ගේ නායකත්වයෙන් ආරම්භ කිරීම නිවැරැදි තීරණයකි.

බණ්ඩාරනායක තරුණයා වහා ම දේශපාලනයට ඇතුළු කිරීමත් දේශප්‍රේමී හා දේශානුරාගී සටන් පාඨ හරහා ඔහු ඉදිරියට යැවීමටත් බණ්ඩාරනායකවරුන් තීරණය කර තිබිණි. ඒ වන විට පොදු ජන ඡන්ද බලය තීරණාත්මක වෙමින් ඉදිරියට පැමිණ තිබුණ නිසා බණ්ඩාරනායක සාමාන්‍ය ජනතාව අතරට යැවීමට ද ඔවුන් තීරණය කර තිබිණි. තව දුරටත් ඉංග්‍රීසි ආණ්ඩුකාරයාට හා සුද්දන්ට ගැතිකම් කිරීම හරහා සහ ස්වදේශිකයන්ට එරෙහි වීම හරහා බලය අත්පත් කර ගැනීමට නො හැකි බව ඔවුන් තේරුම් ගෙන තිබිණි.

බණ්ඩාරනායක තමන් ඉගෙන ගත් නීති වෘත්තියේ වසරක් වත් යෙදී නො සිටියේ ය. ඒ වෙනුවට ඔහු රටේ පැවැති ලොකු කුඩා සියලු මහජන සංවිධානවලට ඇතුළත් වීමට කටයුතු කළේ ය.

එවකට එෆ්. ආර්. සේනානායක ගේ සභාපතිත්වයෙන් පැවැති ලංකා මහජන සභාවට ඔහු එක්විය. 1926 වන විට ලංකා ජාතික සංගමයෙහි ලේකම් ලෙස පත්වීමට ඔහුට හැකි විය.

ස්වරාජ්‍යය දිනා ගැනීමේ අභිලාෂයෙන් පිහිටු වූ ජාති හිතෛෂී පක්ෂයේ සභාපති වූයේත් මේ තරුණ බණ්ඩාරනායක ය. 1926 සැප්තැම්බර් 04 වැනි දා පැවැති ජාති හිතෛෂීන් ගේ රැස්වීමක කතා කළ බණ්ඩාරනායක, දැන් අප ස්වරාජ්‍යය ඉල්ලිය යුතු බව පැවැසුවේ ය.

බණ්ඩාරනායක මේ වන විට අප රටේ ක්‍රියාත්මක වූ ගාන්ධි සංගමයටත් කම්කරු සංවිධානවලටත් බැඳුණි.

ස්වරාජ්‍යය ලබාගැනීම මෙන් ම කම්කරු අයිතීන් ගැන ද ඔහු කතා කළේ ය. බණ්ඩාරනායක තරුණයා ඉතා ඉක්මනින් ඒ

වන විට දේශපාලන හා වෘත්තීය සමිති ව්‍යාපාරවල ඉදිරියෙන් සිටි අය හා සමීප සම්බන්ධතා ඇති කර ගත්තේ ය. මේ අතර බණ්ඩාරනායක ගේ පියා මහ මුදලි ලංකා යූනියනිස්ට් සංගමය හරහා ඉහළ සමාජයේ සම්බන්ධතා ගොඩනඟා ගත් අතර මව වන ඩේසි ඇසිලින් කාන්තාවන්ට ඡන්ද අයිතිය ඉල්ලීමේ ව්‍යාපාරයක් අරඹමින් "කාන්තා ඡන්ද සංගමය" නමින් සංවිධානයක් හදා එහි සභාපතිනිය වී දේශපාලන උනන්දුවක් ඇති කාන්තාවන් හා එක් වූවා ය.

ජී. එස්. කොරයා, පී. ද. එස්. කුලරත්න, ටී. බී. ජයා, ආර්. එස්. එස්. ගුණවර්ධන, ඒ. ඊ. ගුණසිංහ, වැලන්ටයින් එස්. පෙරේරා, මොහොමඩ් රියාල්, දොස්තර එස්. මුණසිංහ වැනි අය සමඟ තරුණ බණ්ඩාරනායක නොයෙකුත් සමාජ හා දේශපාලන සංවිධාන හරහා එක් වී සිටියේ ය.

1926 දෙසැම්බර් 14 වැනි දා කොළඹ මරදාන නාගරික මන්ත්‍රී ආසනයට අතුරු මැතිවරණයක් පැවැත්වී ය. තරුණ බණ්ඩාරනායක ද එම තරගයට එක් වූයේ ය. ඔහු හා සටන් වැදුණේ ඒ. ඊ. ගුණසිංහ යි. තරුණ බණ්ඩාරනායක මේ සටනින් ඉවත් කරවීමට නිදහස් සටනේ ඉදිරියෙන් සිටි බොහෝ දෙනෙක් උත්සාහ කළ හ. එහෙත් ගුණසිංහට එරෙහි ව බණ්ඩාරනායක තරග වැදීම කොළඹ ප්‍රභූ පන්තියේ සතුටට කරුණක් විය. එනිසා ම බණ්ඩාරනායක ඉල්ලා අස් වූයේ නැත. ඒ ඡන්දයෙන් ඔහු ජය ලැබී ය. ගුණසිංහ පරාජය වූයේ ය.

බණ්ඩාරනායක මහතා 1927 දී එෆ්. ආර්. සේනානායක ගේ මෙහෙයවීමෙන් පැවැති ලංකා මහජන සභාවේ සභාපති වූයේ ය.

1929 ජූලි 20 වැනි දා ටවර් හෝල්හි දී පැවැති "කම්කරු එක්සත් මහා සංගමයේ" ද බණ්ඩාරනායක තරුණයා සභාපති වූයේය.

බණ්ඩාරනායක පවුල් සංගමයට නැති වූ බලය නැවත අත්පත් කර ගැනීමේ හදිසි වුවමනාවෙන් මෙසේ හැසිරුණු බණ්ඩාරනායක ඒ වන විටත් පැවැති පාරම්පරික අධිරාජ්‍ය ගැති සිතුම් පැතුම්වලින් ඉවත් වී සිටි බවක් නො පෙනුණි.

ඩොනමෝර් කොමිසමට ලංකා ජාතික සංගමයේ යෝජනා ලෙස බණ්ඩාරනායක ගේ අත්සනින් යැවූ සංදේශයේ ප්‍රධාන යෝජනා හතරක් විය.

1. ආරක්ෂක කටයුතු බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය යටතේ තව දුරටත් තබා ගැනීම.
2. මන්ත්‍රී මණ්ඩලයේ සම්මත වන ව්‍යවස්ථා පිළිබඳ ව ආණ්ඩුකාරවරයාට නිෂේධ බලය තිබීම.
3. සීමා සහිත ඡන්දයක් ඉල්ලා සිටීම.
4. කාන්තාවන්ටත් වඩාත් සීමා සහිත ඡන්දයක් ඉල්ලා සිටීම.

ඉහත යෝජනාවල ජනතා විරෝධී හා අධිරාජ්‍ය ගැති බව පැහැදිලි කර ගැනීම අපහසු කාරණයක් නො වේ.

බණ්ඩාරනායක ගේ මුළු ජීවිත කාලය ම දැකිය හැකි වූ වැනෙනසුලු බව හා අවස්ථාවාදය ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා පැමිණි විට මනාව විද්‍යමාන විය.

එනම් මුලින් ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වන බණ්ඩාරනායක පසු ව එයට පක්ෂපාතීව කතා කිරීමට පටන් ගත්තේ ය.

ඔහු ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වූයේ ප්‍රධාන හේතු දෙකකට යි.

1. ආණ්ඩුකාරවරයාට හිමි වන නිෂේධ බලය.
2. බ්‍රිතාන්‍ය ඉන්දියාවට ප්‍රදානය කරන ආණ්ඩුක්‍රමය කුමක් දැයි විමසිලිමත් වී පසු ව අපේ ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ය යන අදහස.

මේ විරෝධතාවේ තිබෙන ලොකු ම හාස්‍යජනක දෙය නම් ආණ්ඩුකාරවරයාට එවැනි නිෂේධ බලයක් තිබිය යුතු යැයි යෝජනා කළේ ද බණ්ඩාරනායක වීම යි.

එදා නිදහස් සටනේ සිටි ප්‍රධානීහු වැඩි දෙනෙක් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ප්‍රමාණ වත් නො වේ යැයි කියූ වහා ම බණ්ඩාරනායක කළේ සියල්ලට පෙර ඉදිරියට පැමිණ විරුද්ධ වීමයි.

දෙ වැනි ව ආණ්ඩුකාරවරයා ගේ අදහස හා යටත් විජිත භාර ලේකම් ගේ අදහස දැන ගත් වහා ම බණ්ඩාරනායක කළේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට පක්ෂපාතී වීම යි.

බණ්ඩාරනායක ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණවලට පක්ෂපාතී වෙමින් ද කරුණු 4ක් ඉදිරිපත් කළේ ය.

1 නිදහස් ආණ්ඩුවකට අවශ්‍ය අත්තිවාරම දමා තිබීම.

2. සර්වජන ඡන්දය.

3. තිබෙන බලයට වඩා වැඩි බලයක් ලැබීම.

4. බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ සිටින තුරු ඒ ස්වෛරී බලයට අප යටත් විය යුතු වීම.

මේ අතර 1929 දී ම බණ්ඩාරනායක වේයන්ගොඩ එගොඩපොත පේරුවේ ගම් කාර්ය සභාවේ සභාපති ධූරයට ද පත් වූයේ ය. ඒ වසරේ ම ඔහු සමස්ත ලංකා ගම් සභාපති සම්මේලනයේ සභාපති ලෙස ද පත් වූයේ ය.

මේ වන විට ඔහු ඇත ගමක ගම්සභාවක සභාපති විය යුතු නැත. එහෙත් ඔහු එය දඅත හැරියේ නැත. ඒ බණ්ඩාරනායකවරුන්ට තිබූ හදිසි බල තණ්හාව යි.

1931 මැයි හතර වැනි දා තරුණ බණ්ඩාරනායක වේයන්ගොඩ ආසනයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට නිතරගයෙන් තේරී පත් වූයේ ය. මැතිවරණය පැවැත්වූයේ 1931 ජුනි මාසයේ යි.

මේ මැතිවරණයෙන් සිංහල මන්ත්‍රීහු 38 දෙනෙක් ද ලාංකික ද්‍රවිඩ තිදෙනෙක් ද ඉන්දීය ද්‍රවිඩ දෙ දෙනෙක් ද යුරෝපීයයෝ දෙ දෙනෙක් ද එක් මුස්ලිම් ජාතිකයෙක් ද තේරී පත් වූ හ.

ජාතීන් අනුව මන්ත්‍රීන් තේරීමේ ඉල්ලීම ඩොනමෝර් ප්‍රතිසංස්කරණ විසින් ප්‍රතික්ෂේප කෙරුණු නිසා උතුරේ මැතිවරණ වර්ජනයක් ක්‍රියාත්මක විය.

මෙම වර්ජනයට නායකත්වය දුන්නේ ජී. ජී.පොන්නම්බලම් මහතා යි. 1934 දී වර්ජනය නිම කර යාපනය, පේදුරුතුඩුව, කයිට්ස් හා කන්කසන්තුරේ යන ආසනවලින් ජී. ජී.පොන්නම්බලම්, එන්. සෙල්වදොරේ, අරුණාචලම් මහදේව හා එස්. නඩේසන් තේරී පත් වූ හ.

ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාවට දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා ජාතික ඇඳුමින් සැරසී පැමිණීමට සූදානම් බව රටේ ප්‍රසිද්ධ විය. බණ්ඩාරනායක මහතා එය නොකළ යුතු දෙයක් ලෙස ප්‍රසිද්ධියේ විරෝධය පළ කළේ ය. එහෙත් දොස්තර ආර්. සරවනමුත්තු ද ජාතික ඇඳුමින් එන බව ආරංචි වූ විට බණ්ඩාරනායක හා සී. ඩබ්.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ඩබ්. කන්නන්ගර ද එදින ජාතික ඇඳුමින් සැරසී රාජ්‍ය මන්ත්‍රණ සභාවට පැමිණිය හ.

පළමු රාජ්‍ය මන්ත්‍රණ සභාව විධායක කාරක සභා හතකට බෙදා සභාපතිවරු හත් දෙනෙක් පත් කෙරිණි. මේ සභාපතිවරු හත් දෙනා එම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අදාළ විෂයයන් භාර අමාත්‍යවරු වූ හ.

බණ්ඩාරනායක මහතා පළාත් පාලන විධායක සභාවේ සභාපති වීමට උත්සාහ කළත් එය අසාර්ථක විය. එදා පත් වූ සභාපතිවරු මෙසේ ය.

1. ස්වදේශ කටයුතු පිළිබඳ විධායක කාරක සභාව - ඩී. බී. ජයතිලක
2. පළාත් පාලන කටයුතු පිළිබඳ විධායක කාරක සභාව - චාල්ස් බටුවන්තුඩාව
3. කම්කරු කර්මාන්ත හා වෙළෙඳ කාරක සභාව - පැරී සුන්දරම්
4. කෘෂිකර්ම හා ඉඩම් කාරක සභාව - ඩී. එස්. සේනානායක
5. සෞඛ්‍ය කටයුතු කාරක සභාව - ටී. බී. පානබොක්කේ
6. අධ්‍යාපන කටයුතු කාරක සභාව - සී. ඩබ්. ඩබ්. කන්නන්ගර
7. මංමාවත් හා කර්මාන්ත කාරක සභාව - එච්. ඇම්. බාකීර් මාකර්

මෙම ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභානායක වූයේ ද ඩී. බී. ජයතිලක මහතා යි. එහි සභාපති නොහොත් කථානායකවරයා වූයේ ඒ. ඇෆ්. මොලමූරේ මහතා යි.

සභානායක ජයතිලක මහතා, මන්ත්‍රීවරයකුට, ඇමැතිවරයකුට, සභාපතිට හා උපසභාපතිට පිළිවෙළින් මසකට රු. 400, රු. 1000, රු. 1000, හා රු. 750 ද බැගින් දීමනා ලබා දීමට යෝජනා කළ අතර ආර්ථිකය දියුණු වූ පසු පිළිවෙළින් රු. 500, රු. 1500, රු.1500 හා රු.1000 ලෙස වැඩි කිරීමට ද යෝජනා කළේ ය.

බණ්ඩාරනායක මහතා මේ යෝජනාවට අතුරු යෝජනාවක් ගෙන එමින් හැම වැටුප් තලයකින් ම රු.100 බැගින් අඩු කළ යුතු බව කීවේ ය. ඔහු එයට හේතුව ලෙස දැක්වූයේ රටේ විශාල පිරිසක් දුප්පත්කමින් පීඩා විඳින බව යි. එම යෝජනාව පරාජයට පත් විය.

එදා රටේ සිටි ප්‍රධාන කම්කරු නායකයා වූ ඒ. ඊ. ගුණසිංහ බණ්ඩාරනායක මහතා ගේ මේ යෝජනාව ප්‍රසිද්ධියේ ම විවේචනයට ලක් කළේ ය.

1925 දී බැරිස්ටර්වරයකු ලෙස ලංකාවට පැමිණි බණ්ඩාරනායක 1933 වන තුරු ම එංගලන්ත සභා ලබ්ධිකයෙක් වූයේ ය. ඔහු පළමු ව රාජ්‍ය මන්ත්‍රණ සභා මන්ත්‍රීවරයකු වූයේ ද එංගලන්ත සභා ලබ්ධිකයකු ලෙස යි. ඔහු බෞද්ධයකු වූයේ 1933 අත්තනගල්ල රජමහා විහාරයේ දී ය.

මේ වන විට බණ්ඩාරනායක නියෝජනය වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ද බෞද්ධයන් ගේ ශක්තිය වැඩෙමින් පැවැතිණි. ගම් සභාපතිවරු 90%ක් ම බෞද්ධයෝ වූ හ.

ලංකාවේ බෞද්ධ සංවිධාන ද මේ වන විට ශක්තිමත් වෙමින් පැවැතිණි.

ඉන්දියානු නිදහස් අරගලය තුළ ද සුදු අධිරාජ්‍යවාදීන්ට මෙන් ම කතෝලික ආගමට ද එරෙහි අදහස් මතුවෙමින් පැවැතිණි.

ඒ තත්ත්වය ලංකාවේ ද ගොඩනැගෙමින් පවතින බවත් බෞද්ධ ස්වාමීන් වහන්සේලා හා ගිහි බෞද්ධ නායකයන් වේගයෙන් නිදහස් සටනේ ඉදිරියට එන බවත් පැහැදිලි ව පෙනුණි.

එනිසා බණ්ඩාරනායක ද ජාතික ඇඳුමට මාරුවෙමින් තම ඇඳුම් තමා ම වියාගන්නා ලෙස ලංකාවේ සියලු දෙනා ගෙන් ම ඉල්ලීමක් ද කළේ ය. "චරකය හා ගොයම් කෙත" නමින් ඔහු පොතක් ද ලියුවේ ය.

බණ්ඩාරනායක මහතා ගාන්ධි ක්‍රමයේ අහිංසාවාදී සටන් ගැන ද කතා කිරීමට පටන් ගත්තේ ය. වානේ කැබැල්ල සඟවා ගෙන කැත්ත සාදවා ගන්නාක් මෙන් ජාතික නිදහස ලබාගත නොහැකි බවත් ඒ සඳහා දැඩි පරිත්‍යාගයෙන් කටයුතු කළ යුතු බවත් හැම දෙනා ම ලංකාවේ නිපද වූ ඇඳුම් අඳිනවා නම් වාම

දිවිපෙවෙතක් ගතකරත් නම් සිත් සතන් තුළ නිරායාසයෙන් උතුම් අදහස් උපදින බවත් සභාපතිවරුන් අමතා බණ්ඩාරනායක ප්‍රකාශ කළේ ය.

බණ්ඩාරනායක ක්‍රිස්තියානි ආගම ගැන කලකිරී බෞද්ධයකු වූවා නම් එය සිදුවිය යුතු ව තිබුණේ ඔහු අධ්‍යාපනය ලබන විට හෝ අධ්‍යාපනය අවසන් කර මෙරටට පැමිණි විගස ය. එහෙත් එසේ වූයේ නැත. ඔහු බෞද්ධයකු වීමට සිතුවේ බෞද්ධ ජනතාව සංවිධානාත්මක ව ඉදිරියට එන බව දකින විට යි.

එහෙත් ඔහු ක්‍රිස්තියානි ආගම අතහැරීම ගැන කතා කරමින් බොරු තොගයක් ඇද බෑවේ ය. ඔහු ක්‍රිස්තුන් වහන්සේ ඇදහුවත් පීතෘ දෙවියන් කෙරෙහි විශ්වාසයක් නො තැබූ බව කීය.

"දෙවියන් වහන්සේ කර්තෘ වශයෙන් නො ව කර්මය වශයෙන් මට පෙනී ගියේ ය" යයි බණ්ඩාරනායක විසින් ප්‍රකාශ කරන ලදි.

"දෙවියන් වහන්සේ විසින් මිනිසා මවන ලදැයි යන කතාව නො ව මිනිසා විසින් දෙවියන් වහන්සේ මවන ලදැයි යන කතාව සත්‍ය වශයෙන් මට වැටහුණි" යැයි බණ්ඩාරනායක විසින් බෞද්ධයකු වීමෙන් පසු ප්‍රකාශ කරන ලදි.

මොනවා කීවත් බණ්ඩාරනායක කිසි දින සැබෑ බෞද්ධයකු නො වූ බව ඔහු ගේ සමකාලීනයන් ගේ අදහස යි. ඔහු කෑම ගැනීමට පෙර ඉතා හොර රහසේ සිය පපුවේ කුරුස ඇඳ ගන්නා බව ද කියැවේ.

මොහු හොඳ බෞද්ධයකු නො වුණා සේ ම කිසි දින හොඳ ක්‍රිස්තියානිකාරයෙකු ද නො වී ය. ඔහු ලංකාවේ දීත් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ දීත් නො කඩවා පල්ලි යෑම නො කළ අයෙකි. ඔහු බෞද්ධයකු වූ පසු වත් වුවමනාවෙන් බුදුන් වැන්ද අයකු හෝ බෞද්ධ වත් පිළිවෙත් ඉගෙන ගත්තෙක් හෝ නො වූයේ ය.

කොටින් ම බණ්ඩාරනායක වුවමනාවෙන්, හැඟීමෙන් ආගම දහම ඇදහූ අයෙක් නො වූයේ ය. ඔහු ලංකාවේ දී පරපුරෙන් ක්‍රිස්තයානි වූ අතර දේශපාලන අවශ්‍යතාව නිසා බෞද්ධ වූයේ ය. බණ්ඩාරනායක චරිතයේ තිබුණු විශේෂ ලක්ෂණයක් වූයේ කිසි දෙයක් පිළිවෙළකට, වෙලාවට, කලාවට නො කිරීම ය. ඔහු ගේ ආගමික ළැදියාව ද එසේ ම විය. එනිසා ඔහු කිසි දින ආගමට ළැදි ව දැහැමි ජීවිතයක් ගත කළ අයෙක් නො වූයේ ය.

1933 බෞද්ධ වීමට බලපෑ සැබෑ කරුණු අතර එකල රට තුළ බෞද්ධ පුනර්ජීවයක් ඇතිවෙමින් තිබීම ප්‍රධාන විය. කර්නල් ඕල්කට්, අනගාරික ධර්මපාල, බ්‍රහ්මචාරි වලිසිංහ හරිස්චන්ද්‍ර, එෆ්. ආර්. සේනානායක, සර් ඩී. බී. ජයතිලක, ඩබ්. ඒ. ද සිල්වා වැනි අය බෞද්ධ සිද්ධස්ථාන දියුණු කරමින් බෞද්ධ අධ්‍යාපනය දියුණු කරමින්, දහම් පාසැල් දියුණු කරමින්, බෞද්ධ දර්ශනය අන් හැම දර්ශනයකට ම වඩා උතුම් යැයි ද කතෝලික, හින්දු, මුස්ලිම් සියලු ආගම් අවිද්‍යාත්මක මිථ්‍යාදෘෂ්ටික ආගම් යැයි, ප්‍රසිද්ධියේ කියන්නට ද වූ හ.

මේ ව්‍යාපාරය සමඟ බෞද්ධයන් තුළ කිසි යම් අභිමානයක් ඇතිවෙමින් එය ජාතිකාභිමානයක් ලෙස ඉස්මතු වෙමින් පැවැතිණි.

බණ්ඩාරනායක 1934 දී සිංහල මහා සභාව හදමින් කළේ ඒ සිංහල බෞද්ධ පුනර්ජීවනයේ නායකයා වීමට උත්සාහ ගැනීම යි.

සිංහල මහා සභාව ගැන ඔහු විටින් විට කියූ දේවල් ගැන ටිකක් විමසා බලමු.

"සිංහල වර්ගයා ගේ අභිවෘද්ධියට ක්‍රියා කිරීමක් ගැන කල්පනා කරන කල අවශේෂ ජාතීන් ගේ නීත්‍යනුකූල හා යුක්ති සහගත අයිතීන්ට හානි කිරීමට සිංහල මහා සභාව කිසි දා කටයුතු නොකරනු ඇත."

"බෙදී වෙන් වී සිටින සිංහල ජනතාව මුලින් එකතු කර පසු ව සියලු ශ්‍රී ලාංකිකයන් එක්සත් කිරීම මගේ බලාපොරොත්තුව යි."

"බුද්ධාගම පුනර්ජීවනයට ගෙන ඒම අපේ ප්‍රධාන බලාපොරොත්තුව වන අතර අන්‍ය ආගම් අදහන අපේ සිංහලයන්ටත් අපි ගෞරව කරමු."

"පළමු ව සිංහල බෞද්ධයන් ගේ දියුණුව ද දෙ වනුව සිංහල අන්‍යාගමිකයන් ගේ දියුණුව ද තෙ වනුව මෙරට ජීවත් වන සියලු ජාතීන් ගේ දියුණුව ද ඇති කිරීම මගේ බලාපොරොත්තුව ය."

"අප ගේ ව්‍යාපාරවලට එකඟ වන භික්ෂූන් වහන්සේලාත් උන්වහන්සේලා ගේ පන්සල් ද ආගම ධර්මය ඉගැන් වීමට අප භාවිත කළ යුතු ය. අන්‍ය ආගම් අදහන සිංහලයන් ද තම ආගමික ස්ථාන මේ සඳහා පාවිච්චි කළ යුතු ය."

"බෞද්ධ අධ්‍යාපනය, ජාතික භාෂාව හා ජාතික ඉතිහාසය පුහුණු කළ යුත්තේ අපේ ළමයින් තුළ ජාතික අභිමානයක් ඇති වන අයුරිනි."

"ලංකාවේ ආර්ථිකය ගොඩනැඟිය යුත්තේ සමානාත්මතා ධර්මයට අනුව ය. ධර්මානුකූල ව ය. මනුෂ්‍ය වුවමනාවන්ට සමාජ-ආගමික මූලධර්ම යෝග්‍ය පරිදි භාර ගත යුතු ය. සමුපකාර ව්‍යාපාරය දියුණු කළ යුතු වේ."

බණ්ඩාරනායකට සිංහලයන් බෞද්ධයන් එකතු කර ගත යුතු ය. ඒ සඳහා සිංහල ජාතිවාදී හැඟීම් හා බෞද්ධ ආගම්වාදී හැඟීම් ඇවිස්සිය යුතු ය. ඒ අතර අන්‍ය ආගමිකයන් හා අන්‍ය ජාතිකයන් ද අමනාප නොකර ගත යුතු ය. බණ්ඩාරනායක ගේ ඉහත උපුටා ගැනීම්වලින් අපට තේරුම් ගත හැකි දේ එය යි.

බණ්ඩාරනායක, ගාන්ධි ගේ ප්‍රතිපත්තිවලින් දේශීයත්වය තමා ගේ ප්‍රතිපත්තිවලට එකතුකර ගත්තේ ය. ඔහු ගාන්ධි ගොඩනැඟූ ඉන්දීය ජාතිකත්වය වෙනුවට ලංකාවේ සිංහල ජාතිකත්වය ගොඩනැඟී ය. ගාන්ධි සැබෑ හින්දු භක්තිකයකු ලෙස හින්දු ආගමික පුනර්ජීවය ගොඩනඟමින් මුස්ලිම්, සීක්, හින්දු සමගියට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ අතර බණ්ඩාරනායක කිසි දිනෙක සැබෑ බෞද්ධයකු ද නො වෙමින් බෞද්ධ ආගම්වාදය මතු කරමින් බෞද්ධයන් අනෙක් ආගමිකයන් ගෙන් ඈත් කළේ ය.

බණ්ඩාරනායක මහතා වරෙක මෙසේ කීය. "ලංකා ජාතික මමත්වය කියා දෙයක් නැත. සිංහල හෝ දෙමළ හෝ ජාතික මමත්වය කියා දෙයක් ඇත. සිංහල අප සිංහල ජාතික මමත්වයක් ඇති කර ගත යුතු ය. දෙමළ හා මුස්ලිම් ජනතාවත් ඔවුන් ගේ ජාතික අභිවෘද්ධියට කටයුතු කළාට අප විරුද්ධ නැත."

බණ්ඩාරනායකට සිය දේශපාලන බල ව්‍යාපෘතියට සිංහලයන් වෙන් කර ගැනීමට අවශ්‍ය වූයේ ය. එය තවත් ඉදිරියට ගෙන යමින් සිංහල බෞද්ධයන් වෙන්කර සංවිධානය කිරීමට ඔහුට අවශ්‍ය විය. එහෙත් මේ බණ්ඩාරනායක සැබෑ සිංහලයකු නො වූ අතර ඔහු බෞද්ධ වූයේ ද සිංහල මහා සභාව හැදීමට මාස කිහිපයකට පෙරයි.

බණ්ඩාරනායක, ගාන්ධි ගේ චරිතය කොපි කළේ ය. දේශීය ඇඳුම් කොපි කළේ ය. නිදහස් අරගලයේ කොටස් තැනින් තැනින් කොපි කළේ ය. ඔහු බොරුවට බෞද්ධ වූයේ ය. බොරුවට සිංහල විය. ගොඩනැංවිය යුතු වූ ශ්‍රී ලංකා ජාතිකත්වය වෙනුවට සිංහල ජාතිවාදයක් ගොඩනැඟී ය.

බණ්ඩාරනායක ලංකා ජාතික මමත්වයක් කියා දෙයක් නැත කියන විට ගාන්ධි ඉන්දීය ජාතිකත්වය ගොඩනැඟීමට මාරාන්තික සටනක් ගෙන යමින් සිටියේ ය. ඇමෙරිකා එක්සත් ජනපදය ඒ වන විට ඇමෙරිකානු ජාතිකත්වයක් ගොඩනඟා තිබිණි. රුසියානුවන් රුසියන් ජාතිකත්වයක් ගොඩනඟා තිබිණි. එහෙත් බණ්ඩාරනායක සිය බල ව්‍යාපෘතිය වෙනුවෙන් අප රටේ ජාතීන් බෙදා වෙන් කළේ ය.

මේ බණ්ඩාරනායක ව්‍යාපෘතියේ නරුම ගතිය වූයේ ඔහුට උරුම සිංහලකමක් හෝ බෞද්ධකමක් හෝ නැති ව ආරූඪ කර ගත් සිංහලකමකින් හා බෞද්ධකමකින් මේ අපරාධය කිරීම යි.

1936 දෙ වැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවට ද බණ්ඩාරනායක නිතරඟයෙන් තේරී පත් වූයේ ය. ඔහු එවර පළාත් පාලන කාරක සභාවේ සභාපති විය. එනම් පළාත් පාලන ඇමැති විය.

මේ දෙ වැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවට මාක්ස්වාදී මතධාරීන් වූ ආචාර්ය එන්. එම්. පෙරේරා සහ පිලිප් ගුණවර්ධන පත් වූ හ. එවර දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ පරාජයට පත් වූයේ ය. බණ්ඩාරනායක සිය ජාතිවාදී ආගම්වාදී මත තුළ සිටිමින් සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, මැලේ, බර්ගර් ජනතාව බෙදා වෙන් කිරීමේ බලකාමී ව්‍යාපෘතිය දිගට ම ක්‍රියාත්මක කළේ ය.

1936 දෙ වැනි රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇරැඹූ කාලයේ ම බණ්ඩාරනායක සිංහල බෞද්ධයා පුවත්පතට මෙසේ කියා තිබිණි.

"ඉංග්‍රීසි ස්කොට් වේල්ස් අයිරිෂ් ලෙස වෙන් ව සිටි ජාතීන් මත ඉංග්‍රීසීන් විසින් යුද්ධ බලයෙන් තම ඉංග්‍රීසි භාෂාව, සිරිත් විරිත්, ආගම ධර්මය බලෙන් පටවා බ්‍රිතාන්‍ය ජාතිකත්වයක් ඇති කළ බවත් සිංහලයන් ද සමගි සම්පන්න ව නැඟී සිට සිය භාෂාව, ආගම හා සිරිත් විරිත් අප රටේ සෙසු ජනතාවට පිළිගැන් විය යුතු ය."

## සිංහල බෞද්ධයා පුවත්පතට බණ්ඩාරනායක දුන් තවත් පිළිතුරක්

සිංහලයන් වෙන් වී තනිව ම දේශපාලන කටයුතුවල යෙදෙන්නට වූ විට ලාංකික ජාතීන් අතර දැනට ඇති සමගිය බිඳවැටීම, එය රටේ පොදු දියුණුවටත් නිදහස් අරගලයටත් බාධාවක් නො වේ දැයි නැඟූ ප්‍රශ්නයට බණ්ඩාරනායක ගේ පිළිතුර මෙසේ යි.

"මම එසේ නො සිතමි. සිංහලයන් මෙන් ම අනෙක් ජාතීන් ද තමන් ඉපදී ජීවත් වන තමන් ගේ මාතෘ භූමියට ආදරය කරන්නේ නම් රටේ දියුණුවට, නිදහසට, අවංක ව වැඩ කිරීමට කැමැති නම්, භේදයක් ඇති විය හැක්කේ කෙසේ ද?"

මෙරටෙහි ලාංකික ජාතිකත්වයක් ඇති නො වීමටත් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජනතාව බෙදා වෙන් කිරීමටත්, වගකිව යුත්තා බණ්ඩාරනායක බව තේරුම් ගැනීමට තවත් අටුවා ටීකා අවශ්‍ය ද?

සිංහල මහා සභාවේ දෙ වැනි සම්මේලනයේ දී එහි නම ස්වදේශ මහා සභාව ලෙස වෙනස් කිරීමට බණ්ඩාරනායක යෝජනා කළේ ය. එහෙත් එයට වැඩි දෙනා විරුද්ධ වූ හ. එනිසා බණ්ඩාරනායක විසින් සිය යෝජනාව අත්හැර දැමිණි. එහෙත් මෙයින් ගම්‍ය වන කාරණය වන්නේ තමන් මේ කරන දේශද්‍රෝහි කටයුත්තේ භයානකකම ගැන බණ්ඩාරනායකට ද යම් අවබෝධයක් තිබුණ බව යි.

1940 ලංකා ජාතික සංගම් කාරක සභාව තුළ වැදගත් යෝජනා දෙකක් මතුවිය. එනම්;

1. ලංකා ජාතික සංගමයේ අය ජාති භේද ප්‍රතිපත්ති ඇති දේශපාලන සංගම්වලින් ඉල්ලා අස්විය යුතු ය.
2. බණ්ඩාරනායක මහතා සිංහල මහා සභා රැස්වීමක කළ කතාවකින් ඔහු ලංකා ජාතික සංගමයට විරුද්ධ බව ඇඟවෙන නිසා ඔහු ලංකා ජාතික සංගමයෙන් නෙරපා හැරිය යුතු ය.

දෙ වැනි යෝජනාව ගෙනෙන ලද්දේ ජේ. ආර්. ජයවර්ධන විසින් ය. මෙයින් ඇඟවෙන්නේ ඒ වන විටත් බණ්ඩාරනායක

කරන දේශද්‍රෝහී ක්‍රියාවට එරෙහි ව ජනමතයක් ගොඩනැගෙමින් තිබුණු බව යි.

බණ්ඩාරනායක සිංහලයන්, බෞද්ධයන් එකතු කරමින් ජාතිවාදී ආගම්වාදී බලයක් තමන් වෙත ලබාගැනීමට උත්සාහ කරමින් සිටියත්, ඔහු නිතර ම ජාතිවාදී නො වන ආගම්වාදී නො වන ප්‍රතිපත්තියක සිටීමට උත්සාහ ගත් බව පෙනුණි.

ඔහුට අවශ්‍ය වූයේ සිංහලයන් සිංහල ජාති මමත්වයෙනුත් බෞද්ධයන් බෞද්ධ මමත්වයනුත් තමන් වටා ඒකරාශි කර ගනිමින් හැකිතාක් ජාතිවාදී නො වූ ආගම්වාදී නො වූ ස්ථාවරයක සිටීම ය.

1951 ජූලි 9 වැනි දා පැවැත් වූ සිංහල මහා සභාවේ මාදම්පා යෝජනාවල ද සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කළ යුතු යැයි කියමින් ද්‍රවිඩ භාෂාව ද රාජ්‍ය භාෂාවක් කිරීමට විරුද්ධ නැති බව කියයි.

බුද්ධ ශාසනයේ ආරක්ෂාවට විශේෂ ව්‍යවස්ථාවක් පැනවිය යුතු යැයි කියන මාදම්පා යෝජනා අනෙක් ආගම්වලට ද සාධාරණය ඉටු කළ යුතු බව කියයි.

තව දුරටත් එක්සත් ජාතික පක්ෂයේ සිටීමෙන් තමා ගේ අභිමතාර්ථය ඉටු කර ගැනීමට නො හැකි බව තේරුම් ගත් බණ්ඩාරනායක 1951 ජූලි 12 දා රජයෙන් ඉවත් වූයේ ය.

ඉන් පසු 1951 සැප්තැම්බර් 2 දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුව යි. එය සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජාතීන් ගේ ද පක්ෂයක් ලෙස පිහිටු වීමට බණ්ඩාරනායක පරිස්සම් වූයේ ය.

එහි පළමු නිලධාරි මණ්ඩලය මෙසේ ය.

| | | |
|---|---|---|
| සභාපති | - | එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක |
| සමලේකම් වරුන් | - | බර්නාඩ් අළුවිහාරේ |
| | - | බද්යුදීන් මහමූද් |
| | - | එස්. නාගරාජා |
| භාණ්ඩාගාරික | - | ජෝර්ජ් ආර්. ද සිල්වා |

බණ්ඩාරනායක තම පක්ෂය සියලු ප්‍රධාන ජාතීන් ගේ හා අඩු කුල ජනතාව ගේ පක්ෂය ලෙසට පෙන්වීමට ඉහත ලෙස

ප්‍රධාන ජාතීන් තුනෙන් සමලේකම්වරුන් තිදෙනකු හා සුළු කුල අයකු භාණ්ඩාගාරික ලෙස ද පත්කර ගත් බව පෙනේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළමු නිල ප්‍රකාශනයේ සියලු ජනතාවට සිය මවු බසින් අධ්‍යාපනය ලැබීමට ඉඩදිය යුතු බවත්, සිංහල හා දෙමළ භාෂා අප්‍රමාද ව රජයේ භාෂා කළ යුතු බවත් කියයි.

එම ප්‍රකාශනයේ බුද්ධාගම රාජ්‍ය ආගම කිරීමක් ගැන හෝ එයට විශේෂ තැනක් රැකවරණයක් ආරක්ෂාවක් දීම ගැන හෝ නො කිය යි.

ඇත්ත වශයෙන් ම සමාජවාදයට බර වූ ප්‍රජාතන්ත්‍රවාදී බහු ජාතික, බහු ආගමික රටකට ගැළපෙන බුද්ධිමත් ප්‍රකාශනයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තම ප්‍රථම නිල ප්‍රකාශනයෙන් එළිදක්වයි.

බණ්ඩාරනායක එ. ජා. ප. රජයෙන් ඉවත් වන විට එක්සත් ජාතික පක්ෂයේ සිටි සිංහල මහා සභාවේ දහ අට දෙනා ගෙන් පස් දෙනෙක් පමණක් ඔහු සමඟ විපක්ෂයට එක් වූ හ.

බණ්ඩාරනායක මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හදාගත් වහා ම ඔහුට 1952 මහ මැතිවරණයට මුහුණ දීමට සිදු වූයේ ය. එහි දී ඔහු බලාපොරොත්තු නො වූ පරාජයකට මුහුණ දීමට ඔහුට සිදු වූයේ ය. එනිසා ඔහු සමඟ සිටි ඇතැම් ප්‍රබලයෝ නැවත එ. ජා. ප. යට එක් වූ හ.

1955 වන විට එක්සත් භික්ෂු පෙරමුණ බිහි වී බෞද්ධ ඉල්ලීම් දිනා ගැනීමට බෞද්ධ ආණ්ඩුවක් හදා ගත යුතු යැයි මතයක් රට තුළ මතුවෙමින් තිබිණි. හේන්පිටගෙදර ඤාණසීහ හිමි එන්.ක්‍යු. දියෙස් වැනි අය මේ ව්‍යාපාරයේ ඉදිරියෙන් වූ හ.

බණ්ඩාරනායක මහතා වහා ම මේ ව්‍යාපාරයේ සියලු ඉල්ලීම්වලට එකඟවෙමින් එහි නායකත්වය භාර ගත්තේ ය. ඒ අනුව ඔහු සිංහලවාදී, බෞද්ධවාදී ස්ථාවරයකට වැටිණි.

1955 ඔක්තෝබර් 30 දා සර් ජෝන් කොතලාවල යාපනයේ දී ප්‍රකාශයක් කරමින් සිංහල, ද්‍රවිඩ භාෂා දෙකට ම සම තැන දෙන වගන්තියක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කරන බව කීවේ ය. තමන් අගමැති තනතුරින් පන්නා දැමීමත් තම ජීවිතය තිබෙන තුරු සිංහල, දෙමළ, සමගියට කටයුතු කරන බවත්, ඔහු විසින් තව දුරටත් ප්‍රකාශ කරන ලදි.

මේ සමඟ ම එල්. එච්. මෙත්තානන්දලා ගේ සිංහල පමණක් ව්‍යාපාරයත්, එක්සත් භික්ෂු පෙරමුණත් විසින් කොතලාවල ගේ මේ ප්‍රකාශයට විරුද්ධ ව රට පුරා දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

වහා ම කරළියට එන බණ්ඩාරනායක තමන් බලයට පත් වී පැය 24ක් තුළ සිංහලය රාජ්‍ය භාෂාව කරන බව ප්‍රකාශ කළේ ය.

ඉන් පසු බණ්ඩාරනායක ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ භාෂා ප්‍රතිපත්තිය එතැනින් වෙනස් විය.

1956 මහ මැතිවරණයෙන් බණ්ඩාරනායක පිහිටු වූ මහජන එක්සත් පෙරමුණු රජය ද මුලින් උත්සාහ කළේ, සිංහලය රාජ්‍ය භාෂාව කරන ගමන් ද්‍රවිඩ භාෂාවත් රාජ්‍ය භාෂාවක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ දෙන පනතක් ගෙන ඒමට යි. එහෙත් මහාචාර්ය ජයසූරිය ගේ උපවාසය නිසා එය ඉවත් කර ගෙන 1956 ජූලි 5 වැනි දා බණ්ඩාරනායක සිංහල පනත පමණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ය.

එය 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත නමින් හැඳින්විණ.

"සිංහල භාෂාව ශ්‍රී ලංකාවේ එක ම රාජ්‍ය භාෂාව වන්නේ ය" යයි එම පනතේ හැඳින්වේ. බලය ගැනීමට හා බලය රැකගැනීමට බණ්ඩාරනායක මෙසේ මේ පනත ගෙනාවත් එහි භයානකකම ඔහුත් තේරුම් ගෙන සිටි බව පෙනේ. ඒ නිසා ම ඔහු බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම අත්සන් කළේ ය.

එහි මූලික කරුණු පහත පරිදි විය.

1. මවු භාෂාවෙන් ඉහළට ම ඉගෙනීමේ අයිතිය තහවුරු කිරීම.
2. රාජ්‍ය සේවයේ විභාගවලට ද්‍රවිඩ භාෂාවෙන් ඉදිරිපත් වීමේ හැකියාව.
3. මහා ආණ්ඩුව සමඟ ද්‍රවිඩ භාෂාවෙන් ගනුදෙනු කිරීමේ හැකියාව.
4. රට සභා ක්‍රමයක් ඇති කිරීම (ෆෙඩරල් පාලන ක්‍රමයක් නොහොත් පළාත් සභා ක්‍රමයක්)

5. රට සභා බල ප්‍රදේශ උපලේඛනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම.
6. උතුරු පළාත එක රට සභාවක් බවට පත් කිරීම.
7. නැගෙනහිර පළාත රට සභා දෙකකට හෝ වැඩි ගණනකට බෙදීම.

මේ ගිවිසුමට ද්‍රවිඩ සංගමයේ ජී. ජී. පොන්නම්බලම් විරුද්ධ වූයේ ය. ඒ ද්‍රවිඩ ජනතාවට හා ද්‍රවිඩ භාෂාවට ලැබෙන තැන ප්‍රමාණ වත් නො වන බව කියමිනි.

එසේ ම සිංහල අන්තවාදී පිරිස් කිහිපයක් ද මෙයට විරුද්ධ වූහ. ඒ ද්‍රවිඩ භාෂාවට හා ද්‍රවිඩ ජනතාවට විශාල බලයක් එම ගිවිසුමෙන් ලැබෙන බව කියමිනි.

එහෙත් මෙම ගිවිසුමට එක්සත් භික්ෂු පෙරමුණ හා සිංහල මහා සභාව ද බොහෝ දුරට එකඟ වී ඇතැයි බණ්ඩාරනායක මහතා ප්‍රකාශ කළේ ය.

මේ අතර ශ්‍රී ලංකා සංඝ සභාවේ පූජ්‍ය හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි මෙන් ම එක්සත් භික්ෂු පෙරමුණේ පූජ්‍ය බඹරැන්දේ සිරි සීවලී යන හිමිවරු ද්‍රවිඩ ජනතාවට සාධාරණය ඉටුකිරීම ගැන සතුට පළ කළ හ.

එහෙත් 1958 අප්‍රේල් 9 වැනි දා භික්ෂූන් වහන්සේලා හා ගිහියන් 500 - 600 පමණ පිරිසක් අගමැතිවරයා ගේ රොස්මීඩ් පෙදෙසේ නිවස ඉදිරිපිට මේ ගිවිසුමට එරෙහි ව උපවාසයක් ආරම්භ කළ හ. බද්දේගම විමලවංශ නාහිමියෝ එහි ඉදිරියෙන් ම සිටිය හ.

අගමැතිවරයා මේ පිරිස සමඟ සාකච්ඡා කොට ඔවුන් ගේ බල කිරීම උඩ ගිවිසුම රැගෙන ඇවිත් ඔවුන් ඉදිරියේ දී ම ඉරා දැමුවේ ය.

එදා අගමැති බණ්ඩාරනායක මහතා මේ විරෝධය නො තකා තම හදවතට එකඟ ව කටයුතු කළේ නම් උතුරේ ප්‍රශ්නය එතැනින් අවසන් වීමට ඉඩ තිබිණි.

බණ්ඩාරනායක මහතා භාෂා ප්‍රශ්නයත් ජනවාර්ගික ප්‍රශ්නයත් මුල සිට ම නිවැරදි ව දුටු බව පෙනේ. එහෙත් ඔහුට ඉතා ඉක්මනින්

රටේ බලය අත්පත් කර ගැනීමට අවශ්‍ය වූයේ ය. එනිසා ඔහු අන්ත ජාතිවාදීන්, ආගම් වාදීන් ගොඩනැගූ සංවිධානවලට යටවිය. බලය සඳහා ඔහු මේ සංවිධානවලට එකඟ වී කටයුතු කිරීමට පෙළඹුණි.

කුඩා විරෝධතාවකට වත් මුහුණ දීමට ශක්තියක් එදා බණ්ඩාරනායකට නො වී ය. එනිසා ඔහු ශ්‍රී ලංකාව තුළ අනන්තය කරා ඇදී යන යුද්ධයකට මුල් ගල් තබා තමන් ගේ ම සගයන් ගෙන් විනාශයට පත් වූයේ ය.

බණ්ඩාරනායක මහතා ගේ මේ අසංවිධානාත්මක හදිසි භාෂා ප්‍රතිපත්තිය නිසා ද්‍රවිඩ ජනතාව මෙන් ම ගැමි සිංහල ජනතාව ද අතරමං කර දැමූ බව වික්ටර් අයිවන් මහතා සිය "නිදහස, ජාතික ඒකාග්‍රතාව හා දේශපාලන පවුල් පොරය" යන පොතින් මනාව විග්‍රහ කර පෙන්වයි.

එදා රටේ සියලු රාජ්‍ය කටයුතු ඉංග්‍රීසියෙන් සිදුවිය. උසස් අධ්‍යාපනය ද ඉංග්‍රීසියෙන් සිදුවිය. වරප්‍රසාද ලත් රජයේ විද්‍යාලවල ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සිදු වූයේ ද ඉංග්‍රීසියෙනි. රටේ පාලන භාෂාව ද ව්‍යාපාරික භාෂාව වූයේ ද ඉංග්‍රීසිය යි. සියලු ම කතෝලික පාසැල්වල සියලු අධ්‍යාපන කටයුතු කෙරුණේ ඉංග්‍රීසි භාෂාවෙනි. සිංහලෙන් හා දෙමළෙන් ඉගෙන ගත් අයකුට ලබා ගත හැකි රජයේ එක ම රැකියාව වූයේ සිංහල, දෙමළ ගුරු තනතුරක් පමණි.

මෙවැනි තත්ත්වයක් යටතේ රාජ්‍ය භාෂාව වහා ම සිංහල කිරීමෙන් සිදු වූයේ ගමට ඉංග්‍රීසි අධ්‍යාපනය යෑම නතර වීම යි. අමාරුවෙන් නගරයේ ප්‍රධාන පාසැලකට ඇතුළු වී ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබීමට තිබූ ඉඩකඩ ද මධ්‍යම පාන්තික හා පහළ මධ්‍යම පාන්තිකයන්ට මේ නිසා නැතිවිය.

මෙයින් සිදු වූයේ වරප්‍රසාද ලද පන්තිය හා නො ලද පන්තිය දත් හා නො දත් අය ලෙස වර්ග වීම යි.

උසස් අධ්‍යාපනය සිංහල වූ විගස සිදු වූයේ රජයේ පාඨශාලාවල තත්ත්වය කනගාටුදායක ලෙස පහත වැටීම යි.

අතලොස්සක් වූ වරප්‍රසාද ලත් ධනපති පන්තියේ දරුවන් ඉන් පසු ද ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබූ අතර නැගිටිමින් පැමිණි

ගම්බද මධ්‍යම හා පහළ මධ්‍යම පාන්තික දරුවන්ට අකැමැත්තෙන් සිංහල හෝ දෙමළ හෝ අධ්‍යාපනයට යෑමට සිදු විය.

වික්ටර් අයිවන් පෙන්වා දෙන පරිදි ප්‍රභාකරන් කෙනකු හා විජේවීර කෙනකු බිහිවීමට මෙය ද හොඳ ආරම්භයක් විය. 71 කැරැල්ලටත් උතුරේ තරුණ කැරැලි කණ්ඩායම්වලට නායකත්වය දෙන ලද්දේ සිංහලෙන් ඉගෙන ගත් ගමේ සිංහල දරුවන් හා දෙමළෙන් ඉගෙන ගත් ගමේ දමිළ දරුවන් විසිනි.

බණ්ඩාරනායක මහතා උතුරේ ජනවාර්ගික ප්‍රශ්නයට තමා තුළ තිබූ නිවැරැදි විසඳුම ක්‍රියාත්මක නොකර පසුබැසීම නිසා අද උතුරු-නැඟෙනහිර ද්‍රවිඩ දරුවෝ කෙළවරක් නො පෙනෙන ඊළාම් රාජ්‍යයක් බිහිකර ගැනීමේ මරාගෙන මැරෙන යුද්ධයකට පැටලී සිටිති.

බණ්ඩාරනායක ගේ හදිසි බලකාමී ව්‍යාපෘතියත් වැනෙනසුලු පාලනයත් තීරණයක් මත පිහිටා සිටීමට දැක් වූ නො හැකියාවත් මේ සියලු කැරැලි මතු වීමට අවශ්‍ය මාවත විවෘත කර දුන් බව ඉතා ම පැහැදිලි ය.

බණ්ඩාරනායක අගමැතිවරයා වෙඩි කෑවේ තමන් ගේ ම උදවුකාරයන් ගෙනි. ඒ අන් කිසිවක් නිසා නො ව ඉක්මනින් බලය ගැනීමට ඕනෑ ම අන්තවාදී ඉල්ලුම්කරුවකුට එකඟ වීමේ දුර්වල උපාය ඔහු අනුගමනය කළ හෙයිනි. එසේ ම පාලකයකු ලෙස හදවතට එකඟ ව නිවැරැදි තීරණයක් ගැනීමට ඔහුට ශක්තියක් නො තිබීම ද නිසා ය.

බණ්ඩාරනායක මහතාට බොහෝ ප්‍රශ්න නිවැරැදි ව දැකීමට ශක්තිය තිබිණි. ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම ඔහු නිවැරැදි ව දුටුවේ ය. භාෂා ප්‍රශ්නයට විසඳුම ඔහු නිවැරැදි ව දුටුවේ ය. එදා ලෝකයේ පැවැති සමාජ, ආර්ථික හා දේශපාලන සුළඟ ඔහු නිවැරැදි ව හඳුනා ගත්තේ ය.

තම මතය ජනතාවට ඒත්තු ගැන්වීමේ ශක්තිය ද ඔහු තුළ නො අඩුව තිබිණි. ඔහු ගේ කථිකත්වය, දැනුම, ලිවීමේ හැකියාව ඉතා ඉහළ මට්ටමක විය.

එහෙත් ඔහු රටේ අන්තවාදී මත පරාජය කිරීමට සැලසුම් සහගත උත්සාහයක් ගත්තේ නැත. තම නිවැරැදි මතය ජනතාව

අතරට ගෙන යැමට කැපවීමෙන් කටයුතු කළේ නැත. වැරැද්ද දැක දැක එයට විරුද්ධ වනවා වෙනුවට ඒවාට අනුගත වෙමින් ඔවුන් ගේ සහාය ලබාගැනීම හෝ ප්‍රශ්නය යටපත් කිරීම හෝ ඔහු ගේ උපාය විය.

බණ්ඩාරනායක දක්ෂ සංවිධායකයෙක් නො වූයේ ය. ඔහු ගේ ජාති හිතෛෂී පක්ෂය ලත් තැන මිය ඇදුණි. ඔහු ගේ සිංහල මහා සභාව යටකරමින් එක්සත් භික්ෂු පෙරමුණ ඉදිරියට ආවේ ය. ඊට කලින් ලංකා ජාතික සංගමය ශක්තිමත් ව තිබිණි. බණ්ඩාරනායක ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද කිසි දා සංවිධානාත්මක පක්ෂයක් නො වී ය. එනිසා ම එය යටකරමින් මහජන එක්සත් පෙරමුණ මතු විය.

ඔහු කිසි දින වෙලාවට වැඩ නො කළ කෙනකි. ඔහු ගේ දර්ශනය ඉදිරියට නො යැමට ප්‍රධාන හේතුවක් වූයේ මේ අසංවිධානාත්මක බව හා ප්‍රමාදය යි. ඔහු ගේ ප්‍රමාදය අස්වාභාවික විය. පැය 2-3 ප්‍රමාද වීම සාමාන්‍ය දෙයක් වී තිබිණි.

බණ්ඩාරනායක මහතාට බොරු කීමට හා බොරු පොරොන්දු දීමට පුදුමාකාර හැකියාවක් තිබිණි. ඔහු තර්කානුකූල ව හා නිවැරැදි ව මතුකරන කරුණක් වුව ද නිමේෂයකින් වෙනස් කර වෙනත් මතයක් ඉදිරිපත් කිරීමට ඔහුට කිසිදු දුෂ්කරතාවක් නො වී ය.

මේ තත්ත්වය තුළ බණ්ඩාරනායකට තමන්ගේ ම දර්ශනයක් මත තමන් විසින්ම ගොඩනගා ගත් සංවිධානයක් තුළින් රටේ බලය ලබා ගැනීමට නොහැකි විය.

එනිසා ඔහු අනුන් ගේ කරත්තයක නැඟී අනුන් ගේ මතවාද අහුලා ගෙන රටක් පාලනය කිරීමට ගොස් විනාශ වූයේ ය.

අප රටේ අඩු ම ආර්ථික සංවර්ධන වේගයක් පැවැති යුගයත් බණ්ඩාරනායක යුගය විය.

මේ සියල්ල තුළ බණ්ඩාරනායක අප රටේ ජනතාවට යුද්ධය කැරැලිකාරීත්වය නිර්මාණය කර දුගී බව ඉතිරි කර මිය ගියේ ය. අදත් තවත් පරම්පරා ගණනාවක් ජනතාවට මහා බරක් වන රාජ්‍ය ආයතන ගණනාවක් බිහිකර මිය ගියේ ය. නැඟිටිමින් සිටි ග්‍රාමීය මධ්‍යම පන්තිය හා පහළ මධ්‍යම පන්තිය මිටියකින් තළා දැමී ය.

ගැමි සිංහල තරුණයන් ගේ හා ද්‍රවිඩ තරුණයන් ගේ සමාජ අසහනය පහසුවෙන් සුව කළ නොහැකි රෝගයක් බවට පත්කර භාෂා ප්‍රශ්නය අච්චාරුවක් කළේ ය. සිංහල-ද්‍රවිඩ ජනතාව තුළ තිබූ අවිශ්වාසය සැකය වෛරයක් බවට පත් කළේ ය. බෞද්ධයා අනෙකුත් ආගමිකයන් ගෙන් ඈත් කර තැබී ය.

බලය ලබා ගැනීමට සිංහල ජාතිවාදය හා බෞද්ධ ආගම් වාදය ඇවිස්සූ බණ්ඩාරනායක සැබෑ සිංහලයකු හෝ සැබෑ බෞද්ධයකු නො වීම අප විග්‍රහ කරගත යුත්තේ කෙසේ ද? ත්‍රී සිංහලය, සිංහලයා-බෞද්ධයා පමණක් නො ව සියලු ලාංකිකයන් ලන්දේසීන්ට හා ඉංග්‍රීසීන්ට පාවාදීමේ මටුනු පලන් බණ්ඩාරනායක පරපුරේ අයකුට ම සිංහල බෞද්ධයන් බේරා ගැනීමට පහළ වූ දියසේන කුමාරයා වීමට හැකි වූයේ කෙසේ ද?

වියරු බල ව්‍යාපෘතියක නරුම ස්වරූපය මෙය ද? අපේ නූගත්කම අපට මෙහෙම කළා ද? අපේ දූප්පත්කම අපට මෙහෙම කළා ද? අප රැවටුණා ද?

# 05

# සිරිමාවෝ බණ්ඩාරනායක

1959 සැප්තැම්බර් 25 උදේ ඇමෙරිකානු තානාපති බර්නාඩ් ගජ්ලර් මහතා හමුවීමෙන් පසු අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා තම නිවෙසේ ආලින්දයේ අසුන් ගෙන සිටි භික්ෂූන් වහන්සේලා දෙනමට වැඳ නමස්කාර කරනවාත් සමඟ එක් භික්ෂුවක් සිවුර තුළින් ගත් පිස්තෝලයකින් අගමැතිවරයාට වෙඩි තැබී ය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් වෙඩි වැදුණු බණ්ඩාරනායක අගමැතිවරයා ගේ හිස සිය උකුල මත තබා ගෙන ඔහු ආරෝග්‍ය ශාලාවට ගෙන යන ලදි. ඔහු රෝහලට යන තුරුත් රෝහලේ දීත් ශල්‍යකර්මයට භාජන කරන තුරුත් හොඳ සිහියෙන් කතා කරමින් සිට ඇත.

බණ්ඩාරනායක ඝාතනයට සැකපිට අත් අඩංගුවට ගත් සියලු දෙනා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ වූ හ. තාවකාලික අගමැති වශයෙන් දහනායක පත් විය.

අගමැති බණ්ඩාරනායක ඝාතනයත් සමඟ පැවැත්වීමට නියමිත වූ අත්තනගල්ල අතුරු මැතිවරණයට සිරිමාවෝ මැතිනිය 1959 නොවැම්බර් 19 වැනි දා නාමයෝජනා භාර දුන්නා ය.

එහෙත් දෙසැම්බර් 5 වැනි දා රජය විසුරුවා හැරියේ ය. එනිසා අත්තනගල්ල අතුරු මැතිවරණය ද අහෝසි විය.

1960 මාර්තු මැතිවරණය පැවැත්වුණි. ඒ වන විට එක්සත් පෙරමුණත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කැලි ගණනාවකට කැඩී තිබිණි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, බෝසත් බණ්ඩාරනායක පෙරමුණ, ජාතික විමුක්ති පෙරමුණ, සමාජවාදී

මහජන පෙරමුණ, ශ්‍රී ලංකා ජාතික පෙරමුණ පක්ෂ වශයෙන් පැවැති අතර තව කිහිපදෙනෙක් ස්වාධීන ව ද සිටිය හ. දහනායක අගමැතිවරයා ද ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නමින් නව පක්ෂයක් පිහිටුවා ගත්තේ ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිරිමාවෝ මැතිනිය ගේ අනුශාසනයෙන් සී. පී. ද සිල්වා ගේ නායකත්වයෙන් මැතිවරණයට ඉදිරිපත් වූයේ ය.

ඒ මැතිවරණය පැවැත්වෙන්නේ 1959 මැයි 7 වැනි දා නීතිගත කළ නව මැතිවරණ සංශෝධිත පනත අනුව යි. ඒ අනුව මැතිවරණ කොට්ඨාස 145ක මැතිවරණය මුළු රට පුරා එක් දිනෙක පැවැත්වීමට කටයුතු යෙදී ය.

මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය වෙනුවෙන් බණ්ඩාරනායක මැතිනිය ප්‍රකාශයක් නිකුත් කර ප්‍රචාරක රැස්වීම් ඇමතීමට නො යැමට තීරණය කර තිබුණත් අවසාන සතියේ ඇය රැස්වීම් ඇමතීමටත් ඇයට එරෙහි ව නැඟුණු චෝදනාවලට පිළිතුරු දීමටත් ඉදිරිපත් වූවා ය.

ඇය සිය කතාවල දී දහනායකට, පිලිප් ගුණවර්ධනට, එන්. එම්. පෙරේරාට හා ජේ. ආර්. ජයවර්ධනට පිළිතුරු දීමටත් පෙරළා ඒ අය ගෙන් ප්‍රශ්න කිරීමටත් පෙළඹුණා ය.

බණ්ඩාරනායක මැතිනිය වේදිකාවට පැමිණීමත් සමඟ ජයග්‍රාහී ලෙස ඉදිරියෙන් සිටි එ.ජා.ප.ය දුෂ්කර තත්ත්වයකට පත්කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් වීමට පටන් ගත් බව ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් ම පිළිගෙන ඇත. (මේ බව ජේ. ආර්. ජයවර්ධන චරිතාපදානයෙහි සඳහන් ව ඇත.)

මැතිවරණ ප්‍රතිඵල අනුව එක්සත් ජාතික පක්ෂයට ආසන 50ක් ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 46ක් ද ලැබුණි. ලංකා සමසමාජ පක්ෂයට ආසන 10ක් ද මහජන එක්සත් පෙරමුණට ආසන 10ක් ද ලැබුණි. ෆෙඩරල් පක්ෂයට ආසන 15ක් ලැබුණු අතර කොමියුනිස්ට් පක්ෂයට ආසන 3ක් ලැබිණි. දහනායක ගේ ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී පක්ෂයට ආසන 4ක් ලැබුණි.

එක්සත් ජාතික පක්ෂය රජයක් පිහිටු වූ අතර එම රජය කථානායක තේරීමේදීත් රාජසභා කථාවේ දීත් පරාජයට පත් විය.

ඒ අනුව 1960 ජුලි 20 වැනි දා නැවත මහා මැතිවරණයක් තැබීමට දින නියම විය.

එම මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 75ක් දිනා රජයක් පිහිටු විය. මේ මැතිවරණයේ දී සම සමාජ, කොමියුනිස්ට් පක්ෂ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ නිතරග ගිවිසුමකට එළැඹිණි. මේ මැතිවරණයේ දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ආසනයක් තරග නොකළ අතර ඇය උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සිට රජය මෙහෙය වූවා ය.

බණ්ඩාරනායක ඝාතන අවස්ථාවේ දීත් 60 මාර්තු හා ජූලි මැතිවරණවල දීත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ශක්තිමත් නායකත්වයක් දීමටත් විපක්ෂ දේශපාලන පක්ෂවලට එඩිතර ව මුහුණ දීමටත් ඇය සතු මහා ශක්තිය පෙන්වූවා ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වෙන්වූ අයත් මහජන එක්සත් පෙරමුණේ අයත් පක්ෂ ගණනාවක් හදාගෙන මැතිවරණයේ දී මැතිනියට පහර පිට පහර දෙද්දී ඇය ඒ සියල්ලට ම නො සැලී මුහුණ දුන්නා ය.

ඒ සමඟ ම ඇය එක්සත් ජාතික පක්ෂයටත් මුහුණ දුන්නාය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රාජ්‍ය නායිකාව ලෙසත් පක්ෂ නායිකාව ලෙසත් බණ්ඩාරනායක මහතාට වඩා කාර්යක්ෂම බවක් සැලසුම් සහගත බවක් හා එඩිතර බවක් පෙන්වූවා ය.

එසේ ම ඇය තුළ බණ්ඩාරනායකට වඩා සැබෑ සිංහලකමක් හා බෞද්ධකමක් තිබිණි. ඊටත් එහා යන උඩරට රදලකම ද ඇය තුළ තිබිණි. මේ සිංහලකම බෞද්ධකම උඩරටකම රදල ගතිය සැබෑ ලෙස ඇය තුළ විය. ඒ කිසිවක් බලය සඳහා මවා ගත් දෙයක් නො වී ය.

සිරිමාවෝ මැතිනිය බණ්ඩාරනායක මෙන් උගත් තැනැත්තියක් නො වූවා ය. එහෙත් ඇය සහජයෙන් බුද්ධිමත් කාන්තාවක් වූවා ය. එනිසා ම ඇය ඕනෑ ම උගතකු බුද්ධිමතකු සමඟ සාකච්ඡා කිරීමටත් වාද විවාද කිරීමටත් උනන්දුවෙන් හා ආශාවෙන් පෙළඹුණා ය. ඇයට ඕනෑ ම ගැඹුරු න්‍යායක් තර්කයක් තේරුම් ගැනීමේ හැකියාවක් තිබිණි.

නො තේරෙන දේ හාර හාරා ප්‍රශ්න කරමින් තේරුම් ගැනීමේ නිහතමානි ගුණයක් ද ඇය තුළ පැවැතිණි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය උගතුන්ට බුද්ධිමතුන්ට බලවතුන්ට මෙන් ම අන්ත අහිංසක අසරණ නූගත් දුප්පත් අයට පවා ඇහුම්කන්දීමේ පුදුමාකාර ඉවසීමක් හා උනන්දුවක් ද තිබිණි.

මැතිනිය හතර පෝයට සිල්ගත් කාන්තාවකි. එහෙත් එය ප්‍රසිද්ධකර එයින් දේශපාලන වාසියක් ලැබීමට ඇයට අවශ්‍ය වූයේ නැත.

බණ්ඩාරනායක මැතිනිය 62 කුමන්ත්‍රණයට ඉතා ශක්තිමත් ව මුහුණ දුන්නා ය. 64 කුමන්ත්‍රණයෙන් ඇගේ රජය පෙරළිණි. මේ ගැන කල්යල් බලා තේරුම් ගත් මැතිනිය සමසමාජ පක්ෂය රජයට එකතු කර ගෙන රජය රැක ගැනීමට උත්සාහ ගත්තත් එය ද සාර්ථක නො වී ය. එහෙත් ඇගේ රජය පෙරළන විට ද පාර්ලිමේන්තු බහුතරය ඇය සතු විය. එහෙත් ඒ සියල්ල ඡන්දයට ගෙන්වා ගැනීමට ඇයට නොහැකි විය. රජය විසුරුවා නො හැර බහුතරය පෙන්වීමට නැවැත පාර්ලිමේන්තුව කැඳවිය යුතු යැයි සම සමාජ පක්ෂයෙන් යෝජනා ආවත් ඇය වහා ම පාර්ලිමේන්තුව විසුරුවා මැතිවරණයට මුහුණ දුන්නා ය.

60-64 කාලයේ දී බණ්ඩාරනායක මැතිනිය කළේ රජය වැඩි වැඩියෙන් නිෂ්පාදනයට බෙදා හැරීමට හා සේවාවන්ට යොමු කිරීම හරහා රාජ්‍ය ව්‍යවසාය ශක්තිමත් කිරීම යි. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය වූයේ එය යි. එදා ලෝකයේ ප්‍රධාන ප්‍රවණතාව වූයේ ද එය යි. මේ සියලු කටයුතු අතර ඇය අතිවිශේෂ උනන්දුවකින් ග්‍රාමීය අධ්‍යාපනය දියුණු කිරීමට කටයුතු කළ බව පෙනුණි.

බණ්ඩාරනායක මැතිනිය ගේ කාලයේ දීත් 56-59 මෙන් ම රටේ ආර්ථිකය කඩා වැටුණි. රාජ්‍ය ව්‍යාපාර විශාල වශයෙන් අලාභ ලබමින් රජයට විශාල බරක් වීම එන්න එන්න ම වැඩි විය.

65-70 කාලයේ දී විපක්ෂ නායිකාව ලෙස කටයුතු කළ මැතිනිය 1968 වන විට සම සමාජ කොමියුනිස්ට් පක්ෂ හා එක් ව සමගි පෙරමුණ ගොඩනඟා ගත්තා ය. මේ පක්ෂ තුන අතර පොදු සම්මුතියකට පැමිණියේ 1968 ජූනි 5 වැනි දා ය.

සමගි පෙරමුණු රජයේ පරමාර්ථය වූයේ ද ශක්තිමත් රාජ්‍ය ව්‍යවසායක් ගොඩනැඟීම යි. පෞද්ගලික අංශය හා තරගකාරී ලෙස සමුපකාර හා සංස්ථා ශක්තිමත් කිරීම සමගි රජය විසින් නො කඩවා කරන ලදි. රාජ්‍ය සුබ සාධනය විශාල වශයෙන් වැඩි කෙරිණි. විදේශ රටවලින් මෙරට ගෙන් වූ ආහාර ඇඳුම් පැළඳුම් ආදිය තදින් සීමා කෙරිණි.

70 - 77 කාලයේ දී ද රටේ ආර්ථිකය ඉතා ම භයානක ලෙස කඩා වැටුණි. ආර්ථික සංවර්ධනයක් නැති තරමට ආර්ථික සංවර්ධන වේගය 1% - 2% අතරට වැටුණි. කිරි පිටි හිඟයක් හා රෙදි හිඟයක් රටේ විශාල වශයෙන් ඇති විය.

රටේ ආර්ථිකය එලෙස කඩා වැටුණත් රාජ්‍ය පාලිකාවක ලෙස බණ්ඩාරනායක මැතිනිය තීරණ ගැනීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් තමා තුළ වූ විශේෂ හැකියාව මනා ව ප්‍රදර්ශනය කළා ය.

ඇය වෙනත් පක්ෂවල එන්. එම්, කොල්වින්, කේනමන්, දොස්තර වික්‍රමසිංහ වැනි නායකයන්ටත් තම පක්ෂයේ දැවැන්ත නායකයන්ටත් ශක්තිමත් නායකත්වයක් සැපයූවා ය. ජනරජ ව්‍යවස්ථාව, රාජ්‍ය භාෂාව හා බෞද්ධාගම පිළිබඳ ගැටලුව, ඉඩම් ජනසතුව, 71 නැඟිටීම, ආහාර හිඟය වැනි ප්‍රශ්නවල දී ඇය බරපතළ තීන්දු ගත් අතර ඒ තීන්දු සමඟ නො සැලී සිටීමේ ශක්තිය ඇය සතු විය. ඇතැම් තීන්දු මගේ මතයේ හැටියට රටට ම බරපතළ හානි ගෙන දුන් තීරණ වෙයි. එහෙත් එවැනි තීරණ ගැනීමටත් එම තීරණ ක්‍රියාත්මක කිරීමටත් ඇයට තිබූ ආත්ම ශක්තිය අගේ කළ යුතු ය.

62 කුමන්ත්‍රණයේ දී හමුදාවේ හා පොලීසියේ දැවැන්තයන් අත්අඩංගුවට ගෙන අරලිය ගහ මන්දිරයට ගෙන්වා ගැනීමට තරම් ඇය එඩිතර වූවා ය.

1971 කැරැල්ලේ දී 14,000ක් අත්අඩංගුවට ගන්නා ලද හ. ඉන් 4200ක් පොදු සමාව යටතේ භාර වූ අය යි.

එම අරගලයෙන් 1200ක් මිය ගිය හ. එම අරගලයේ තරුණයෝ පොලිස් ස්ථාන 90කට පහර දුන්හ. එම සටන මැඩ පැවැත්වීමේ දීත් බණ්ඩාරනායක මැතිනිය ගේ නායකත්වය කැපී පෙනුණි.

70 - 77 පාලන යුගය සම්පූර්ණයෙන් ම සමාජවාදය දෙසට යන ආර්ථික වැඩ සටහනකින් සමන්විත විය. රන්පවුම්, වතු

ජනසතුව, අපනයන සීමාව, ධන බද්ද, රාජ්‍ය ව්‍යවස්ථා ශක්තිමත් කිරීම, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා පිට රටින් ගෙන්වීම සීමා කිරීම, විදේශ ආයෝජන අධෛර්යවත් කිරීම, දේශීය මහා පරිමාණ පෞද්ගලික ආයෝජකයන්ට ද නොයෙකුත් බාධා පැනවීම ආදී සියලු කරුණු නිසා සිදු වූයේ රටේ ආර්ථිකය සහමුලින් කඩා වැටීම යි. රාජ්‍ය ව්‍යාපාර 90%ක් ම රජයට මහා බරක් වෙමින් පාඩු ලැබී ය. බණ්ඩාරනායක මැතිනියට සිය මුළු කාලය ම රට පාලනය කිරීමට සිදු වූයේ හදිසි නීතිය උපයෝගී කරගෙන යි.

මේ සියල්ලේ ප්‍රතිඵලය වූයේ 1977 මහා මැතිවරණයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අලුතෙන් පිහිටු වූ වාමාංශික එක්සත් පෙරමුණත් අන්ත පරාජයක් ලැබීම ය. ජේ. ආර්. ජයවර්ධන ගේ නායකත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂය විසින් 5/6ක පාර්ලිමේන්තු බලයක් ලබා ගැනිණි.

1971 කලබලවල දී මැතිනිය ගේ නියමයෙන් ජේ. ආර්. ජයවර්ධන ගේ පුත් රවි ජයවර්ධන අත්අඩංගුවට ගන්නා ලදි. ජේ. ආර්. රජය මැතිනිය ගේ ප්‍රජා අයිතිය නැති කිරීමට මේ කාරණය විශාල ලෙස බලපා ඇති බවට සාධක තිබේ.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට එරෙහි ව පාර්ලිමේන්තුවේ 5/6ක බලය පාවිච්චිකර පවතින නීති රීති අධිකරණ තීන්දු පසෙක දමා ඇයට දඬුවම් කිරීමේ පරම අභිලාෂයෙන් ජේ. ආර්. කටයුතු කළ බව ඉතා පැහැදිලි ය. මේ පිළිබඳ ව ඔහු ගේ සමීප හිතවතුන් කිහිපදෙනෙකු විමසූ අවස්ථාවල දී ජේ. ආර්. කියා ඇත්තේ "සිරිමාවෝ මගේ එක ම පුතා හිරේ දාලා බෙලෙක් පිඟානේ කන්න දුන්න බව යි."

බණ්ඩාරනායක මැතිනිය දැඩි අධිෂ්ඨානයකින් යුතු ව ඇයට එරෙහි ව විශේෂ ජනාධිපති කොමිසමක විභාග වූ නඩුවට මුහුණ දුන්නා ය. ඇය කොමිසමට එරෙහි ව උසාවි ගියා ය. කොමිසම ඉදිරියේ පෙනී සිටි ඇය විශේෂ ප්‍රකාශයක් කරමින් කොමිසමේ නීත්‍යානුකූලභාවයට අභියෝග කළා ය. තමන්ට මේ පරීක්ෂණය ගැන කිසිදු විශ්වාසයක් නැති බව කීවා ය. මෙය පැහැදිලි සැලසුම් සහගත පලිගැනීමක් බව කීවා ය. ඇය දේශපාලන වශයෙන් ඝාතනය කිරීමට කරන නීති විරෝධී සදාචාර විරෝධී කුමන්ත්‍රණයක් බව කීය.

ප්‍රජා අයිතිය අහෝසි කරමින් ඇය ගේ මන්ත්‍රී ධූරය ද අහෝසි කරමින් පාර්ලිමේන්තුව සම්මත කළ යෝජනාව ඉදිරියේ ද ඇය නො සැලී සිටියා ය.

ප්‍රජා අයිතිය අහෝසි වූ මැතිනිය රට පුරා යමින් නැවත ජනතාව සංවිධාන කිරීමේ කටයුතු ඇරැඹුවා ය. ප්‍රජා අයිතිය අහෝසි වූ කෙනෙක් පක්ෂ නායකත්වයේ තබා ගත නොහැකි යැයි සිය පක්ෂය ඇතුළතින් ම හඬක් මතුවිය. එම හඬ පිටුපස අනුර බණ්ඩාරනායකත්, මෛත්‍රීපාල සේනානායකත් වූ හ. ඔවුහු සමඟ පක්ෂ මධ්‍යම කාරක සභාවේ බහුතරයක් හෙවත් 13ක් වූ හ.

මැතිනිය වහා ම හොරගොල්ලේ හදිසි පක්ෂ සම්මේලනයක් පවත්වා ඔවුන් ගේ අනුමැතියෙන් 13 කල්ලිය පක්ෂයෙන් නෙරපා හැරියා ය.

ඒ සමඟ ම මෛත්‍රීපාල - අනුර කණ්ඩායම හෙවත් 13 කල්ලිය පක්ෂයේ මහ ලේකම් ඉවත් කර අනුර බණ්ඩාරනායක ලේකම් ලෙස පත් කරන ලද හ. ඉන් පසු ඔවුන් විසින් පක්ෂ කාර්යාලය බලහත්කාරයෙන් අල්ලා ගන්නා ලදී.

බණ්ඩාරනායක මැතිනිය මෙය දැනගත් වහා ම පක්ෂ කාර්යාලයට කඩා වැදී අලුත් පිරිස් එළවා නැවත පක්ෂ කාර්යාලය තම අණසක යටතට ගත්තා ය.

එහෙත් අනුර බණ්ඩාරනායක මහතා පොලීසියට කළ පැමිණිල්ලක් අනුව ජනාධිපතිවරයා ගේ උපදෙස් පරිදි පක්ෂ කාර්යාලයත් දිනකර පුවත්පත් කාර්යාලයත් වසා දමා සීල් තබන ලදී.

මැතිනියට බොරැල්ලේ තාවකාලික කාර්යාලයක් ආරම්භ කිරීමට සිදු විය.

මේ සටනේ දී අනුර බණ්ඩාරනායක, මැතිනියට එරෙහි ව එක්සත් ජාතික පක්ෂයේ නො මඳ සහාය ලබාගත් අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අතිබහුතරයක් ජනතාව සිටියේ බණ්ඩාරනායක මැතිනිය සමඟ යි. එදා මැතිනියට සහායට චන්ද්‍රිකා හා විජය කුමාරතුංග ද වූ හ. විජය-චන්ද්‍රිකා ශක්තිය මැතිනියට මෛත්‍රීපාල - අනුර කණ්ඩායම පරාජය කිරීමට දැවැන්ත පිටුවහලක් විය. එහෙත් ඒ සැමට වඩා මැතිනියට ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් තුළ තිබූ

මහා ආදරය තීරණාත්මක විය. එක්සත් ජාතික පක්ෂය ඇගේ ප්‍රජා අයිතිය නැති කිරීමත් සමඟ මැතිනිය ගෙන් මතු වූ අයෝමය එඩිතර භාවය ඒ ආදරය තව තවත් වැඩි කිරීමට සමත් විය. එසේ ම මැතිනියට එරෙහි වූ අනුර - මෛත්‍රීපාල කල්ලියට ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් තුළත් පොදුවේ එ.ජා.ප. විරෝධීන් තුළත් අතිවිශාල විරෝධයක් හා පිළිකුලක් මතු විය.

අනුර බණ්ඩාරනායක ගේ ඉල්ලීම මත සීල් තැබූ පක්ෂ කාර්යාලය ඉතා කෙටි කාලයකින් පොලීසිය විසින් අනුර බණ්ඩාරනායකට ම භාර දෙන ලදි.

බණ්ඩාරනායක මැතිනිය සිය පක්ෂය බොරැල්ලේ තාවකාලික කාර්යාලයක සිට මෙහෙය වන විට අනුර, බැසිල් රාජපක්ෂ හරහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මූලස්ථානය අනුර - මෛත්‍රී පිල වෙනුවෙන් මෙහෙයැවී ය.

සිය ප්‍රජා අයිතිය අහිමි වූ තත්ත්වයක් මෙන් ම පක්ෂයේ ඉහළ තලයේ බහුතරයක් හා සිය එක ම පුතා ද තමන්ට එරෙහි ව යද්දීත් නො සැලී සිය දේශපාලන කටයුතු ඉදිරියට ගෙන ගිය මැතිනිය ඉතා කෙටි කලකින් එ.ජා.ප. රජයේ රැකවරණය යටතේ වැඩුණු අනුර-මෛත්‍රී පිල දිය කර හැරීමට සමත් වූවා ය.

අනුර ඇතුළු ප්‍රබල පිරිසක් මෛත්‍රීපාලගෙන් කැඩී නැවත මැතිනියට එක් වූහ. මේ තත්ත්වයට චන්ද්‍රිකා - විජය - ඉලංගරත්න එතරම් සතුටු වූයේ නැත. මෛත්‍රීපාල විසින් තම පක්ෂයේ ලේකම් එස්. කේ. කේ. සූරිආරච්චි පත් කර ගන්නා ලදි. මේ දෙ පිල ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලෙස තම කණ්ඩායම් හඳුන්වා ගත් හ. අනුර කණ්ඩායම මැතිනියට එක්වීමත් සමඟ මෛත්‍රීපාල අන්ත අසරණ භාවයට පත් වූයේ ය. අවසානයේ කර කියා ගැනීමට කිසිත් නො වූ මෛත්‍රී ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනතා විමුක්ති පෙරමුණේ ආධාරයෙන් අසාර්ථක සම්මේලනයක් පවත්වා නව නිලධාරී මණ්ඩලයක් පත් කර ගත්තේ ය.

අනුර සමඟ ශ්‍රී ලකා නිදහස් පක්ෂයට බැඳුණු ආසන සංවිධායකයන් ටී. බී. ඉලංගරත්න මහතා ප්‍රධාන කමිටුවක් විසින් සම්මුඛ පරීක්ෂණයට භාජන කරන ලදි. එහි දී චන්ද්‍රිකා-විජය-ටී. බී. කණ්ඩායමට අවශ්‍ය වූයේ ඉන් වැඩි දෙනකු කපා හැරීමට යි. එහෙත් බණ්ඩාරනායක මැතිනිය එයට ඉඩ හැරියේ නැත. අනුර සමඟ පැමිණි වැඩි පිරිසකට ආසන සංවිධායක තනතුරු නැවත ලැබුණි.

ඊට අමතර ව අනුර ගේ ඉල්ලීම මත තව අලුත් පිරිසකටත් සංවිධායක තනතුරු ලැබුණි.

විජය-චන්ද්‍රිකා-ටී. බී. කණ්ඩායම එතැන් සිට මැතිනිය සමඟ ගැටුම් ඇති කර ගැනීම ආරම්භ විය.

82 ජනාධිපතිවරණය ආරම්භ වන විට මේ ගැටුම ප්‍රබල ලෙස මතු විය. අනුර, කොබ්බෑකඩුව හා ටී. බී. ඉලංගරත්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකත්වය බලාපොරොත්තු වූ හ.

මැතිනියට අවශ්‍ය වූයේ අනුර අපේක්ෂකයා කිරීමට යි. එහෙත් ඇය පක්ෂය තුළ විශාල ප්‍රශ්නයක් ඇති කර ගැනීමට අකැමැති වූවා ය. ඒ වන විට පක්ෂයේ බලවත් ව සිටියේ විජය-චන්ද්‍රිකා ය. එනිසා ඔවුන් ගේ තීරණය මත කොබ්බෑකඩුව අපේක්ෂකයා වූයේ ය. ඒ වන විටත් මැතිනිය අනුර ජනාධිපති අපේක්ෂකයා බව ප්‍රකාශයට පත් කිරීමේ අරමුණින් නුවරඑළියේ සංවිධාන කළ මහා රැලියක මුලසුන ගනිමින් සිටියා ය. කොබ්බෑකඩුව නම් කළ බව දැන ගත් වහාම මැතිනිය අනුර අපේක්ෂකයා ලෙස ප්‍රකාශයට පත් නො කළා ය. මැතිනිය වහා ම කොළඹ පැමිණි අතර ඒ වන විට කොබ්බෑකඩුව, චන්ද්‍රිකා, විජය. ටී. බී. ආදීන් විශාල පිරිසක් මැතිනිය ගේ ගෙදර රැඳී සිටි අතර තව විශාල පිරිසක් අනුර ගේ නිවසේ ද රැඳී සිටිය හ. මැතිනිය පැමිණි විගස කොබ්බෑකඩුව බුලත් හුරුල්ලක් දී මැතිනියට ආචාර කළ අතර අනෙක් සියලු දෙනා මත් මැතිනියට වැඳ ආචාර කර මැතිනිය ගේ ආශිර්වාදය පැතූහ.

මැතිනිය විසින් අනුර ගේ නිවෙසට රැස්වී සිටි පිරිස සමඟ කළ දීර්ඝ සාකච්ඡාවකින් පසු කොබ්බෑකඩුවට උපකාර කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව අනුර සමඟ ඔවුහු මැතිනිය ගේ නිවෙසට ගොස් කොබ්බෑකඩුවට ආචාර කළ හ. ඒ අවස්ථාවේ කොබ්බෑකඩුව මහින්ද රාජපක්ෂට බැණ වදිමින් ඔහු ගේ සහාය අවශ්‍ය නැති බවත් 21 වැනි දායින් පසු මහින්ද ගැන බලා ගන්නා බවත් ප්‍රකාශ කළේ ය. ඊටත් හේතුවක් තිබිණි. නුවරඑළියේ සිටි මැතිනියට කොබ්බෑකඩුව නම් කළ බව ආරංචි වූ විගස ඇය කළේ ඔහු අත ලකුණ නො දෙන බව තීරණය කරමින් රෝදය ලකුණ නො දෙන ලෙස මහින්ද අත දිනේෂ් ගුණවර්ධනට පණිවිඩයක් එවීම යි. වහා ම ඒ පණිවිඩය දිනේෂ්, කොබ්බෑකඩුවට කියා තිබිණි.

අනුර වහා ම කොබ්බෑකඩුවට එරෙහි ව මඩ ප්‍රහාර ව්‍යාපාරයක් ඇරැඹුවේ ය. ඔහුට අවශ්‍ය වූයේ කෙසේ හෝ

කොබ්බෑකඩුව පරාජය කිරීමට යි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ද කොබ්බෑකඩුව ගේ පරාජය පැතූ බව පෙනුණි. එහෙත් එය නො හැඟ වීමට ඇය පරිස්සම් වූවා ය.

ඒ ජනාධිපතිවරණයෙන් ජේ. ආර්. ජයවර්ධන ජය ගත්තේ ය. එහෙත් ඒ මැතිවරණ ප්‍රතිඵලය ගැන ඔහු එතරම් සතුටු නො වී ය. ඒ මැතිවරණයේ දී මෛත්‍රීපාල සේනානායක ද කොබ්බෑකඩුවට සහයෝගය දැක්වී ය. මෛත්‍රී පිලේ කිහිප දෙනෙක් එ. ජා. පයට එකතු වූ හ. ඒ ජනාධිපතිවරණ ප්‍රතිඵලවලින් ඉතා මත් සතුටට පත් වූයේ අනුර බණ්ඩාරනායක යි.

1982 ඔක්තෝබර් 20 වැනි දා පැවැති ජනාධිපතිවරණයේ ප්‍රතිඵල මෙසේය.

| | ලැබුණ ඡන්ද ගණන |
|---|---|
| ජේ. ආර්. ජයවර්ධන | 34,50,811 |
| හෙක්ටර් කොබ්බෑකඩුව | 25,48,438 |
| රෝහණ විජේවීර | 27,34,39 |
| කුමාර් පොන්නම්බලම් | 17,3934 |
| කොල්වින් ආර්. ද සිල්වා | 57,532 |
| වාසුදේව නානායක්කාර | 17,005 |

මේ මැතිවරණ ප්‍රතිඵලයත් සමඟ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා පාර්ලිමේන්තු මැතිවරණයක් නො පවත්වා ජනමත විචාරණයක් තබා සිටින මන්ත්‍රීවරුන් ගේ කාලය වසර හය කින් දීර්ඝ කරගැනීමට තීරණය කළේ ය.

ජනමත විචාරණයෙන් පසු නැවැත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ බල අරගලයක් මතු විය. එයත් සැබෑ ලෙස මතු වූයේ චන්ද්‍රිකා හා අනුර කණ්ඩායම් අතර යි.

මේ වන විට පක්ෂය තුළ අනුර කණ්ඩායම ශක්තිමත් වී සිටි අතර මැතිනිය ද චන්ද්‍රිකා-විජයට වඩා අනුර සමඟ සමීප ව වැඩ කරන බව පෙනුණි. මේ තත්ත්වය නො කඩවා වර්ධනය වූ අතර ක්‍රමානුකූල ව චන්ද්‍රිකා-විජය-ටී. බී. ඇතුළු ප්‍රබල කණ්ඩායමක් පක්ෂයෙන් ඉවත් වෙන තත්ත්වයක් මතුවිය. මේ තත්ත්වය තව තවත් වර්ධනය කරමින් කටයුතු කළ අනුර ඒ සඳහා අවශ්‍ය සහාය එක්සත් ජාතික පක්ෂයෙන් ද ලබා ගැනීමට කටයුතු කළේ ය.

ජනමත විචාරණයෙන් එ.ජා.ප.ය පරාජය වූ ආසනවල අතුරු මැතිවරණ පැවැත්වීමට හදිසියේ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන තීරණය කළේ ය. ඒ අනුව 1983 මැයි 18 වැනි දා ආසන 16ක අතුරු මැතිවරණය පැවැත් වුණි.

ඒ මැතිවරණයේ දී විජය කුමාරතුංග ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මහර ආසනයට තරග කළේ ය. විජය කෙසේ හෝ පරාජය කිරීමට එදා එ. ජා. පය තීරණය කර තිබිණි. විජය පරාජය වූයේ ඡන්ද 43කිනි. ඡන්දය දින විජයට වෙඩි තබන ලදි. එදින මහර ආසනයේ උඟුරුවෙල් පේරුව හා මහපේරුව චන්ද්‍රිකාට භාර දී තිබිණි. එහි ඡන්ද මධ්‍යස්ථාන 22ක ඡන්ද පළ නිලධරයන් ඡන්දපොළවලට ඇරලීමට භාරගත් චන්ද්‍රිකා විසින් ඔවුන්ට කලින් දින හොරගොල්ල වලව්වේ නතර වීමට උපදෙස් දෙන ලදි. ඇය පසු ව එනම් ඡන්ද දින පාන්දර 5.00ට පැමිණ ඔවුන් ඡන්ද පොළවලට ගෙන යෑමට පොරොන්දු වුවත් සුපුරුදු ලෙස ඇය උදේ 9.00 වන තුරු පැමිණියේ නැත. මේ අතර චන්ද්‍රිකා බලාපොරොත්තුවෙන් පාරට පැමිණ ඡන්දපොළ නිලධරයන් නිට්ටඹුව පොලීසියෙන් අත්අඩංගුවට ගන්නා ලදි. ඔවුන් නිදහස් කර ගැනීමට දවල් 12 වන තුරු නො හැකි විය. ඒ වන විට ඒ හැම ඡන්ද මධ්‍යස්ථානයක ම හොර ඡන්ද විශාල වශයෙන් දමා තිබිණි. එදා විජය පරාජය වීමට ප්‍රධාන හේතුව වූයේ එය යි. වේලාවට හොරගොල්ලට වාහන එවූ බව කියමින් වාහන ප්‍රමාද කළේ චන්ද්‍රිකාට ද විජය පරාජය කිරීමට අවශ්‍ය වී තිබුණු නිසා යැයි එදා පක්ෂයේ වැඩි දෙනෙකු දැරූ මතය යි.

1984 ඔක්තෝබර් පැවැති මින්නේරිය අතුරු මැතිවරණයට විජය නැවත මහජන පක්ෂයෙන් තරග කළේ ය. එහි දී ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපසභාපතිවරයකු වූ රත්න දේශප්‍රිය සේනානායක තුන් වැනි තැනට දමා දෙ වැනි ස්ථානය ලබා ගත්තේ ය. මෙහි දී ද මින්නේරිය ආසනය තරග කිරීමට චන්ද්‍රිකාට අවශ්‍ය වී තිබිණි. එහෙත් මහජන පක්ෂයේ බහුතරය එයට එකඟ නොවූ හ. මින්නේරිය මැතිවරණයේ දී චන්ද්‍රිකා භාරගත් රැස්වීම් කිසිවකට නො ගියා ය.

චන්ද්‍රිකා - විජය මහජන පක්ෂය පිහිටු වීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් ව යන විට එතෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ

දිනකර පුවත්පත මුද්‍රණය කළ ප්‍රධාන මුද්‍රණ යන්ත්‍ර ටික ද රැගෙන යෑමට චන්ද්‍රිකා අමතක නො කළා ය.

බණ්ඩාරනායක මැතිනියට තම පක්ෂයෙන් පිරිසක් ඉවත් ව යෑම එතරම් ප්‍රශ්නයක් නො වී ය. එහෙත් ඇයට ඉවසුම් නො දුන් කාරණය වූයේ සිය දියණිය චන්ද්‍රිකා තමා ගේ මුද්‍රණ යන්ත්‍ර ටික සොරා ගෙන යෑම යි. එනිසා මැතිනිය මහජන පක්ෂයට කීවේ "මංකොල්ල පක්ෂය" කියා යි.

ඉතා ශක්තිමත් පදනමකින් ආරම්භ වූ ශ්‍රී ලංකා මහජන පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මහා තර්ජනයක් වේ යැයි කවුරුත් සිතූ හ. එහෙත් බණ්ඩාරනායක මැතිනිය දැඩි ආත්ම විශ්වාසයකින් හා කැපවීමකින් තම පක්ෂය ඉදිරියට ගෙන ගියා ය. එනිසා ම වසරක් ගත වීමත් සමඟ මහජන පක්ෂයේ පරිහානිය ආරම්භ විය.

මහජන පක්ෂයේ ප්‍රධානීන් එකිනෙකා ඉවත් වීමට හා අක්‍රිය වීමට පටන් ගැනුණි. 1986 දී පක්ෂ සභාපති ටී. බී. ඉලංගරත්න මහතා ද පක්ෂයෙන් ඉවත් වූයේ ය. ඒ සමඟ ම මහජන පක්ෂයේ සභාපති තනතුරට චන්ද්‍රිකා පත් වූවා ය. චන්ද්‍රිකා සභාපති වීම ගැන විජය කුමාරතුංග ගේත් පක්ෂයේ බහුතරයක ගේත් එකඟත්වයක් නො වී ය. එය සිදු වූයේ චන්ද්‍රිකා ගේ කුමන්ත්‍රණයකින් ය. පසු ව නැවත මේ ගැන කතා කළ මහජන පක්ෂය චන්ද්‍රිකාට සභාපති තනතුරින් ඉවත් වීමට කීවත් ඇය එයට එකඟ නො වූවා ය. අවසානයේ විජය කුමාරතුංග පක්ෂයේ ජාතික සංවිධායක කර ජාතික සංවිධායකවරයා පක්ෂයේ නායකයා බව ප්‍රකාශයට පත් කෙරිණි. එයට චන්ද්‍රිකා එකඟ නූනත් ඇයට කළ හැකි දෙයක් නො වී ය. මහජන පක්ෂ ව්‍යවස්ථාව ද ඒ අනුව වෙනස් කරමින් ජාතික සංවිධායක පක්ෂ නායකයා ලෙස නම් කෙරිණ.

1988 වන විට මහජන පක්ෂය ඉතා මත් දුර්වල මට්ටමක පැවැතිණි. චන්ද්‍රිකා පක්ෂ සභාපතිනිය ලෙස කිසිවක් කළේ නැත. ජේ.වී.පී. භීෂණය ඉතා තදින් පැවැති අතර විජය සහභාගී වූ ගල්කිස්ස, පානදුර, මීගමුව මහජන රැස්වීම්වලට ජේ.වී.පී.ය බෝම්බ ගැසී ය.

මහජන පක්ෂයේ රැස්වීම්වලට බෝම්බ වැදුණු කිසිදු වේලාවක චන්ද්‍රිකා වේදිකාවේ සිටියේ නැත. එනිසා මහජන පක්ෂය

එදා කල්පනා කළේ ජේ.වී.පී.ය චන්ද්‍රිකාට බෝම්බ ගසන්නේ නැති බව ය. එනිසා මහජන පක්ෂය සිය මධ්‍යම කාරක සභාවේ මේ ගැන කතා කර විජය ප්‍රසිද්ධ රැස්වීමක කතා කරන සෑම අවස්ථාවක ම චන්ද්‍රිකා වේදිකාවේ සිටිය යුතු යැයි තීරණයක් ගැනිණි.

1988 පෙබරවාරි 16 වැනි දා ජනතා විමුක්ති පෙරමුණේ ඝාතකයන් විසින් විජය මරා දමන ලදි. විජයට මිඳුලේ වෙඩි තැබූ විට චන්ද්‍රිකා නිවෙස ඇතුළේ සිටියත් එළියට ආවේ නැත. ගෙදර සිටි සේවක සේවිකාවන් විජය ආරෝග්‍ය ශාලාවට ගෙන ගියත් චන්ද්‍රිකා එළියට ආවේ නැත. විජය එතැනින් රැගෙන ගිය පසු චන්ද්‍රිකා සිය දරුවන් රෝස්මිඩ් නිවෙසේ නතර කර විවේකීව ආරෝග්‍ය ශාලාවට ගියා ය.

පෙබරවාරි 21 වැනි දා විජය ගේ ආදාහනය පැවැත්විණි. අප්‍රේල් 5 වැනි දා චන්ද්‍රිකා කිසිවකුට නො දන්වා රටින් පිට වූවා ය. ඇය රටින් පිට වූයේ ජේ.වී.පී. මිනීමරුවන් ඇය ද මැරීමට උත්සාහ දරමින් සිටින බව කියා වුවත් චන්ද්‍රිකාට ජේ.වී.පී.යෙන් කිසිදු මරණ තර්ජනයක් නො වූ බව එදා කවුරුත් දැන සිටිය හ. කෙසේ වුව ද විජය ගේ තුන් මාසයේ දානය දීමට වත් චන්ද්‍රිකා ලංකාවේ සිටියේ නැත.

විජය ගේ ඝාතනය සිදුවීමත් සමඟ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වහා ම විජය බැලීමට ගොස් අවමංගල කටයුතු ඇතුළු සියලු කටයුතුවලට සහභාගි වූවා ය. එහෙත් අනුර ඒ කිසිවකට සහභාගී වූයේ නැත.

1988 වන විට ජනතා විමුක්ති පෙරමුණේ භීෂණය රට පුරා වෙළා ගෙන තිබිණි. ඒ අතර ම 88 ජනාධිපතිවරණය කැඳවිණි. ආර්. ප්‍රේමදාස මැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් ද සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ද ඔසී අබේගුණසේකර මහජන පක්ෂයෙන් ද එම ජනාධිපතිවරණයට තරග වැදුණා හ.

මැතිවරණ ප්‍රචාරක කටයුතු කිරීම, රැස්වීම් පැවැත්වීම, මැතිවරණ රාජකාරී කිරීම, මැතිවරණ නියෝජිතයන් හැටියට වැඩ කිරීම ආදී සියලු කටයුතු ජේ.වී.පී.ය විසින් තහනම් කරන ලදි. විශාල පිරිසක් මරා දමන ලද හ. රැස්වීම්වලට බෝම්බ ගැසීම නිසා තුවාල වූ අයත් බොහෝ ය.

බොහෝ ප්‍රචාරක රැස්වීම්වලට කිසිවෙක් නො පැමිණිය හ. කථිකයෝ හිස් පිට්ටනිවලට කතා කළ හ.

මැතිවරණ දින ද විශාල පිරිසක් මරා දමන ලද හ. මේ සියලු තර්ජන මැද මැතිවරණය පැවැත්විණි.

**ප්‍රතිඵල පහත ලෙස විය.**

| | |
|---|---|
| ආර්. ප්‍රේමදාස | 25,69,199 |
| සිරිමාවෝ බණ්ඩාරනායක | 22,89,860 |
| ඔසී අබේගුණසේකර | 23,57,19 |

ආර්. ප්‍රේමදාස මැතිතුමා ජය ගත්තේ නූලෙනි. එදා මැතිනියට චන්ද්‍රිකා ඇතුළු මහජන පක්ෂය ආධාර කළේ නම් ඇයට ජය ගැනීමට ද ඉඩකඩ තිබිණි. නමුත් චන්ද්‍රිකා එදා මැතිනියට ආධාර නො කළ අතර මහජන පක්ෂයෙන් අපේක්ෂකයෙක් ද ඉදිරිපත් වූයේ ය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය භීෂණය මැද්දේ නො බිය ව මැතිවරණයට මුහුණ දුන්නා ය. අනුර මැතිනියට උපකාර කළ අතර ඔහු එල්. ටී. ටී. ඊ.යේ ආධාර ගැනීමට ද උත්සාහයක් කළේ ය. එහෙත් අනුර ද බොහෝ ප්‍රචාරක රැස්වීම්වලට යෑමෙන් වැළකිණි.

බණ්ඩාරනායක මැතිනියට ජනාධිපතිවරණයට තරග නොකරන ලෙස ජනතා විමුක්ති පෙරමුණ තර්ජනය කළේ ය. එහෙත් ඇය එය ප්‍රතික්ෂේප කර තර්ජන නො තකා තරග කිරීමට පෙළඹුණා ය.

ජනාධිපතිවරණය දින රාත්‍රී 12.00ට ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ ය. එනිසා 1989 පෙබරවාරි 15 වැනි දා නැවත මහා මැතිවරණයකට මුහුණ දීමට සිදු විය.

ඒ මැතිවරණයට එ.ජා.ප ය මුහුණ දුන්නේ ජයග්‍රාහී මානසිකත්වයේ උද්දාමයෙනි. එහෙත් ශ්‍රී. ල. නි. ප.ය මුහුණ දුන්නේ පරාජයේ අමිහිරි අත්දැකීම් සමඟ ය. ඒ මැතිවරණයේ දී ජේ. වී. පී. භීෂණයට මෙන් ම එ. ජා. ප. තර්ජනවලට ද මුහුණ දීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිදු විය.

බණ්ඩාරනායක මැතිනිය ඒ මැතිවරණයට ද එඩිතර ව මුහුණ දුන් අතර ඇයට පක්ෂයට මන්ත්‍රීවරුන් 67ක් ලබාගැනීමට ද ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඡන්ද 214390ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පිවිස විපක්ෂ නායිකාව වීමට ද හැකි විණි.

මේ කිසිවකට ද චන්ද්‍රිකා සහභාගී නො වූ අතර ඇය ගෙන් සිය මවට හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ කිසිදු ආධාරයක් හෝ අනුබලයක් ද නො ලැබුණි.

1989 නව පාර්ලිමේන්තුවේ අගමැතිවරයා ලෙස ඩී. බී. විජේතුංග මහතා පත් වූයේ ය. බණ්ඩාරනායක මැතිනිය විපක්ෂ නායිකාව වූවා ය. දස දහසක් තර්ජන ගර්ජන හා අර්බුදවලින් තමා ද බේරී සිය පක්ෂය ද බේරාගෙන බණ්ඩාරනායක මැතිනිය යළි තම පක්ෂය ගොඩනැඟීමේ කටයුතු ආරම්භ කළා ය.

පක්ෂයටත් තමාටත් අතිවිශාල හානියක් කළ අනුර බණ්ඩාරනායක, මෛත්‍රීපාල සේනානායක වැන්නන් නැවත තමන් ළඟ තබා ගෙන පක්ෂය ශක්තිමත් කරමින් සිටියා ය. ජේ. ආර්. පී. සූරියප්පෙරුම පක්ෂයේ මහ ලේකම් තනතුරට පත් කර පක්ෂයට නව ජවයක් එක් කළා ය.

ආචාර්ය නෙවිල් කරුණාතිලක, මහාචාර්ය ඩබ්ලිව්. ඩී.ලක්ෂ්මන් පී. බී. උනන්තැන්න යන අයගෙන් සමන් විත කමිටුවකට පක්ෂයේ අනාගත ප්‍රතිපත්තිය හැදීමට භාරදෙන ලදී.

එහි ලේකම් වශයෙන් කටයුතු කිරීමේ වගකීම මට පවරන ලදී.

1980 දශකයේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් මතු වූ ශිෂ්‍ය නායකයකු වූ කීර්ති මාවැල්ලගේට පක්ෂයේ තරුණ අංශය භාර දී මා ද එහි උපදේශකයකු බවට පත් කෙරිණි.

වෘත්තීය සමිති අංශයේ ද කාන්තා හා ශිෂ්‍ය අංශවල ද කැපී පෙනෙන වෙනස් කම් කළ මැතිනිය ඉතා උනන්දුවෙන් පාර්ලිමේන්තු කටයුතු මෙහෙය වූවා ය.

89-90 වසරවල ද රටේ උතුරේත් දකුණේත් භීෂණය ඉහවහා ගොස් තිබිණි. විජේවීර, ගමනායක ඇතුළු ජේ.වී.පී. නායකයන් සියලු දෙනා ම වාගේ ඝාතනය කිරීමත් සමඟ ම දකුණෙහි භීෂණය

ක්‍රමයෙන් අඩු විය. 1991 මැද භාගය වන විට දකුණේ භීෂණ තත්ත්වය සහමුලින් ම අවසන් විය.

ඒ සමඟ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ ද එක්සත් ජාතික පක්ෂය තුළ ද තීරණාත්මක අභ්‍යන්තර ගැටුම් දෙකක් මතු විය. එ.ජා.ප.ය තුළ මතු වූයේ ජනාධිපති ප්‍රේමදාසට එරෙහි සටනකි. එහි පසුබිමේ සිටියේ ගාමිණී දිසානායක, ඇතුලත්මුදලි, ප්‍රේමචන්ද්‍ර, එම්. එච්. මොහොමඩ්, සමරවීර වීරවන්නි වැනි අය යි. 1991 අගෝස්තු 28 වැනි දා ප්‍රේමදාසට එරෙහි ව දෝෂාභියෝගයක් කථානායකවරයාට භාර දෙන ලදි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අභ්‍යන්තර අරගලය මෙහෙය වන ලද්දේ අනුර බණ්ඩාරනායක විසිනි. ඔහු ගේ අරගලය වූයේ දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැතිනිය විසින් තමාට භාරදිය යුතු යැයි පක්ෂය තුළ මතවාදයක් ගොඩනැඟීම යි.

මැතිනිය ගේ තර්කය වූයේ අනුරට දැන් පක්ෂය දුන්නොත් ඔහු එය විනාශ කරනු ඇතැයි යන්න යි. ඊ ළඟ මැතිවරණයෙන් පසු ව තම පක්ෂය අනුර භාර ගත යුතු යැයි මැතිනිය තදින් විශ්වාස කළ අතර එහෙත් 1994 මහා මැතිවරණය දක්වාත් 1995 ජනාධිපතිවරණය දක්වාත් පක්ෂය තමා යටතේ තිබිය යුතු බවත් මී ළඟ ජනාධිපතිවරණයට තමන් තරඟ කළ යුතු බවත් ඇය සිතුවා ය.

මේ වන විට අනුර වැඩක් භාරගෙන කිසිවක් පිළිවෙළකට කර තමන්ට පක්ෂ නායකත්වය භාරගත හැකි යැයි ඔප්පු කර නො තිබිණි. ඒ වෙනුවට ඔහු කර තිබුණේ සිය මව පක්ෂ කාර්යාලයෙන් එළවා දමා තමාට එ.ජා.ප.යේ සහාය ඇති බව පෙන්වීම යි.

එ.ජා.ප. ය සිය මව ගේ ප්‍රජා අයිතිය අහෝසි කළ විට ඔහු කළේ තම මව පක්ෂයෙන් පන්නා පක්ෂයේ බලය ඇල්ලීමට උත්සාහ කිරීම යි. තම මව එනම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකාව 9 වරක් උසාවියට ගෙනයෑම යි. මෛත්‍රීපාල සේනානායකත් තවත් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් 13 දෙනකුත් සමඟ මවට එරෙහි ව පක්ෂයේ බලය උදුරා ගැනීමට ගොස් පක්ෂය දෙකකට කැඩීම යි. ඔහු ගැන විශ්වාසය තබා මැතිනියට එරෙහි වූ සියලු ජ්‍යෙෂ්ඨයන් අතරමං කර නැවත ඉතා ටික කලෙකින් මැතිනියට එක්වීම යි. ඉතා දුෂ්කර මොහොතක මැතිනිය ඒකගත් විජය පක්ෂයෙන් පන්නා දැමීමට කටයුතු කිරීමත් අනුර ගේ තවත් වික්‍රමයකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයා

ලෙස කොබ්බෑකඩුව ජනාධිපතිවරණයට තරග කරන විට ඔහුටත් පක්ෂයටත් එරෙහි ව කටයුතු කරමින් ශ්‍රී.ල.නි. පක්ෂය පරාජය කර වීමට දායක වීමත් අනුර ගේ තවත් අත්දුටු හපන්කමක් විය. තමන් ගේ බලකාමී ව්‍යාපෘතිය වෙනුවෙන් පක්ෂයටත් තම මවටත් සහෝදරයන්ටත් එරෙහි ව අනන්ත අප්‍රමාණ කෙනෙහිලිකම් කළ අනුර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්ටත් ඒ හැන්දෙන් ම බෙදූ වාර අනන්ත අප්‍රමාණ ය. මෛත්‍රීපාල සේනානායක, එස්. කේ. කේ. සූරිආරච්චි, ටී. බී. ඉලංගරත්න, වී. ඩබ්. කුලරත්න, බද්උද්දීන් මහමුද්, පී. බී. ජී. කලුගල්ල, ස්ටැන්ලි තිලකරත්න වැනි අය පක්ෂයෙන් ඈත් වූයේ අනුරට සාප කරමිනි.

අනුර සිය දේශපාලනය පටන් ගත්තේ ම පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් සමඟ ගැටෙමින් පක්ෂය තුළ අර්බුද හදමිනි.

අනුර ගේ පළමු දේශපාලන ක්‍රියාමාර්ගය වූයේ 1974 දී කලාවැව අතුරු මැතිවරණයට ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ගේ ආධාරයෙන් නිතරගයෙන් පත්වීමට උත්සාහ කිරීම යි. එයට එක්සත් ජාතික පක්ෂයේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් දැඩි විරෝධයක් මතු විය. එනිසා එය අසාර්ථක වූයේ ය.

ඉන් පසු ඔහු "අද" නමින් පුවත්පතක් ආරම්භ කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් සමගි පෙරමුණේත් නායකයන්ට ඉතා මත් නින්දනීය ලෙස අපහාස කළේ ය.

මේ සඳහා එදා අනුරට චන්ද්‍රිකා ගේ ද නොමඳ සහාය ලැබුණි.

අනුර-චන්ද්‍රිකා ගේ දෙ වැනි හවුල් දේශපාලන ව්‍යාපෘතිය වූයේ ඔවුන් ගේ වැඩිමහල් සොයුරිය සුනේත්‍රාට හා ඇගේ පළමු ස්වාමිපුරුෂයා වූ කුමාර් රූපසිංහට පහර ගැසීම යි.

එදා කුමාර් - සුනේත්‍රා යුවළ ජනවේගය නමින් සංවිධානයක් හදා ගෙන වැඩකරන ජනතාව හා තරුණයන් දේශපාලනමය වශයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කළ හ. එය චීන මාඕ වාදයට බරව ක්‍රියාත්මක විය. 1973 - 74 - 75 ගණන්වල එම සංවිධානය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ වමට බර ප්‍රගතිශීලි ස්ථාවරයක් ගැනිණි.

අනුර - චන්ද්‍රිකා යුවළ මේ ව්‍යාපාරයට එරෙහි ව නො කඩවා හතුරුකම් හා කෙනෙහිලිකම් කළ හ.

එසේ ම එදා මේ දෙදෙනා ම සමසමාජ, කොමියුනිස්ට් පක්ෂවලටත් එරෙහි ව මැතිනිය උසි ගැන්වීමේ ව්‍යාපාරයක ද යෙදී සිටිය හ.

අනුර තරුණ සංවිධානය භාරගෙන අසාර්ථක වූයේ ය. නුවරඑළිය-මස්කෙලිය ආසනය භාරගෙන අසාර්ථක වූයේ ය. දොම්පේ ආසනයෙහි ද ඔහු අසාර්ථක වූයේ ය.

1991 මැද භාගය වන විට අනුරට පක්ෂය භාරදිය යුතු යැයි යන මතයේ සිටි අය අතර මහ ලේකම් ජේ. ආර්. පී. සූරියප්පෙරුම, මහින්ද රාජපක්ෂ, හලීම් ඉෂාක්, සී. වී. ගුණරත්න, අමරසිරි දොඩන්ගොඩ, ජිනදාස නියතපාල, අනිල් මුණසිංහ, දි. මූ. ජයරත්න වැනි අය සහ අලුත් පරපුරේ එදා බර්ටි දිසානායක, හේමකුමාර නානායක්කාර, තිලක් කරුණාරත්න වැනි අයත් වූ හ.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ වයස් ගත තත්ත්වය නිසා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයෝ පවා අනුරට අනුගත වී සිටියෝ ය. එනිසා අනුර පිල ක්‍රමානුකූල ව ශක්තිමත් වෙමින් පැවතිණි.

එදා මැතිනිය තව දුරටත් පක්ෂ නායකත්වයේ රැඳී සිටීමට තදබල ලෙස තීරණය කර තිබිණි. එසේ ම පක්ෂය ප්‍රතිසංවිධානය කිරීමට ඇය කැපවීමෙන් වැඩ කළා ය.

මේ අතර අනුර කළේ දින පතා තම ගොඩ වැඩිකර ගැනීමට කටයුතු කිරීම යි.

1992 වන විටත් මැතිනියට පක්ෂයට නායකත්වය දීමට අවශ්‍ය ආත්ම ශක්තියත් ශාරීරික සෞඛ්‍යයත්, ජනතා පිළිගැනීමත් හොඳ හැටි තිබිණි. එනිසා ම එදා පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් වූ කේ. බී. රත්නායක, ධර්මසිරි සේනානායක, අලෙවි මවුලානා, රිචඩ් පතිරණ, අනුරුද්ධ රත්වත්ත, මෛත්‍රීපාල සේනානායක, අ. ම. කරුණාරත්න වැනි අය අනුර ගේ මතය එකහෙලා ප්‍රතික්ෂේප කළෝ ය. එහෙත් ඔවුහු ද එළිපිට අනුරට එරෙහි වීමට බිය වූ හ.

එසේ වීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ මැතිනිය මී ළඟ මැතිවරණයෙන් පසු පක්ෂ නායකත්වය අනුරට දෙන බව සියලු දෙනා දැන සිටීම යි. එසේ ම අනුර කොතරම් සිය මවට එරෙහි වුව ද මැතිනියට අනුර සිය පක්ෂය තුළ ඊ ළඟ නායකයා ලෙස තබා

ගැනීමේ වුවමනාව ද විය. අවාසනාවට අනුර මෙය තේරුම් ගත්තේ නැත. ඔහු සිතුවේ අම්මා සියලු බණ්ඩාරනායකවරුන්ටත්, තමාටත් විරුද්ධ බව යි.

මේ සියලු තත්ත්වයන් තුළ පක්ෂය තුළ මැතිනිය ගේ ශක්තිය ක්‍රමයෙන් දුර්වල වෙමින් පැවතිණි.

පක්ෂයේ වෘත්තීය සමිති සියල්ල අනුරට පක්ෂපාති ස්ථාවරයක විය. 1992 තරුණ සමිති සම්මේලන නිලවරණයේ දී මැතිනිය නම් කළ අපේක්ෂකයන් පරාජය වී අනුර ඉදිරිපත් කළ දෙදෙනා ම ජය ලැබූ හ. එම නිලවරණයේ දී අනුර කණ්ඩායම ප්‍රසිද්ධියේ ම මැතිනියට එරෙහි ව තරුණයන් සංවිධාන කිරීමට පෙළඹුණි. එම තරුණ සමිති සම්මේලනයේ නැවත පක්ෂය බෙදෙන තැනට ම තල්ලු විය. බණ්ඩාරනායක මැතිනිය මූලාසනයේ තබා ගෙන අනුර මැතිනිය ගේ අපේක්ෂකයන් සියලු දෙනා පරාජය කළේ ය. කාන්තා සම්මේලනය ද අනුරට හිතවාදී ස්ථාවරයකට පෙරළී තිබුණි. පක්ෂයේ මහ ලේකම් වරයා වූ ජේ. ආර්. පී. සූරියප්පෙරුම ද තදින් අනුරට පක්ෂපාතී ස්ථාවරයක සිටීම ප්‍රධාන ගැටලුවක් විය. එහෙත් මැතිනිය නො සැලී පක්ෂයට නායකත්වය දීමටත් අනුරට එකඟ නො වීමටත් තීරණය කර තිබිණි. එදා මැතිනියට ඉතා සමීප ව සිටි. අනුරුද්ධ රත්වත්තට අනුර ප්‍රසිද්ධියේ දෝෂාරෝපණය කළේ ය. ඔහු කීවේ අම්මා නරක් කරන්නේ අනුරුද්ධ කියා ය. එසේ ම අනුර බණ්ඩාරනායකට හිස එසවීමට ඉඩ නො දෙන්නේත් අනුරුද්ධ බව ඔහු ප්‍රසිද්ධියේ කීවේ ය. ප්‍රසිද්ධ සාකච්ඡාවල දීත් පුවත්පත් සාකච්ඡාවල දීත් අනුර, අනුරුද්ධ විවේචනය කළේ ය.

එහෙත් අනුරුද්ධට, අනුරට පෙරළා පහර දීමට ශක්තියක් නො වී ය. ඔහු කළේ රහසිගත ලෙස අනුර ගේ ක්‍රියාමාර්ගවලට එරෙහි ව මැතිනිය මෙහෙය වීම යි.

හේමසිරි ප්‍රනාන්දු, ලැනරෝල් මැතිනිය, මැතිනිය ගේ සහෝදරයන් හා දරුවන්, අ. ම. කරුණාරත්න පක්ෂයේ පරිපාලනය භාර ව සිටි විජේකෝන්, තරුණ හා ශිෂ්‍ය අංශයේ වැඩ කළ මොන්ටේගු සරත් චන්ද්‍ර ඇතුළු තරුණයන් කිහිපදෙනකු ද කෙළින් ම මැතිනියට පක්ෂ ව සිටි බව පෙනුණි.

කේ. බී. රත්නායක, ධර්මසිරි සේනානායක, මෛත්‍රීපාල සේනානායක (පක්ෂයේ නියෝජ්‍ය නායකයා ලෙස සිටි මෛත්‍රීපාල

පක්ෂය කඩා ගෙන ගොස් නැවත පක්ෂයට පැමිණ සිටි නිසා ඔහු මේ වන විට පක්ෂය තුළ දුර්වල වී සිටියේ ය.) අනුරුද්ධ රත්වත්ත, අලෙවි මවුලානා, රිචඩ් පතිරණ වැනි අය මැතිනියට පක්ෂපාතී ව සිටියත් අනුරට ප්‍රසිද්ධියේ එරෙහි වන ස්ථාවරයක නො වී ය.

මේ අවස්ථාවේ මා ඇතුළු නිමල් සිරිපාල ද සිල්වා, නන්දිමිත්‍ර ඒකනායක, ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ වැනි නවක මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මැතිනියට පක්ෂව ඉදිරියට පැමිණිය හ. මම ප්‍රසිද්ධියේ ම අනුර විවේචනය කිරීමට පටන් ගතිමි. අනුරට පක්ෂය භාර දුන්නොත් ස්ථිර ලෙස ම පක්ෂය විනාශ වන බව මම ප්‍රසිද්ධියේ ම කීමට පටන් ගතිමි. මේ අතර මංගල සමරවීරත් අපේ පිලට එක් වූයේ ය.

බණ්ඩාරනායක මැතිනිය විසින් මාත්, නිමල් සිරිපාල ද සිල්වාත් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඇතුළු කර ගන්නා ලදි. ඒ සමඟ ම අනුර ගේ ඉතා සමීප මිතුරකු වූ අලෙවි මවුලානා ද ප්‍රසිද්ධියේ මැතිනියට එක් වූයේ ය.

එදා අනුර ගෙන් මැතිනියට පැමිණි මේ තර්ජනය එලෙස ම මීට කලින් චන්ද්‍රිකා හා විජය හරහා ද පැමිණියේ ය.

අනුර - මෛත්‍රී පිලට එරෙහි ව මැතිනිය ආරක්ෂා කරන විට විජය - චන්ද්‍රිකා කළේත් පක්ෂයේ සියලු සංවිධානවලට තමන් ගේ සමීප හිතවතුන් ඇතුළත් කර ගනිමින් පක්ෂයේ බලය මැතිනිය ගෙන් තමන් අතට ගැනීමේ සූක්ෂ්ම ව්‍යාපාරයක් දියත් කිරීම යි.

මේ නිසා 82 දී ජනාධිපතිවරණයට පක්ෂයේ ශිෂ්‍ය අංශය, තරුණ අංශය හා ඇතැම් වෘත්තීය සමිති සමඟ විජය-චන්ද්‍රිකා විශාල ගැටුමකට ගිය හ.

වරක් විජය ගේ සියලු අපේක්ෂකයන් පරාජය කර ශිෂ්‍ය අංශයේ බලය අල්ලා ගැනීමට කීර්ති මාවැල්ලගේ, මහින්ද අබේකෝන් වැන්නෝ සමත් වූ හ. එනිසා ම ඔවුන් චන්ද්‍රිකා ගේ මැරයන් ගේ තර්ජනවලට ද ගොදුරු විණි.

1992 මුල් භාගය ගෙවෙමින් තිබිණි. අපි එක්සත් පෙරමුණක් හැදීමේ ව්‍යාපාරයක් මැතිනිය ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළෙමු. මේ වන විට රාජිත සේනාරත්න, රෙජිනෝල්ඩ් කුරේ ආදී කිහිප දෙනෙක් එකතු වී බහුජන නිදහස් පෙරමුණ ගොඩනඟා ගත්හ. වයි. පී. සිල්වා ඇතුළු පිරිසක් මහජන පක්ෂය ද නාමික ව පවත්වා

ගෙන යමින් තිබිණි. එක්සත් පෙරමුණක් ගොඩනැඟීමේ කටයුතු මැතිනිය සමඟ එක් ව සම්බන්ධීකරණය කිරීම මට භාර කෙරිණි.

මැතිනිය ගේ ප්‍රධානත්වයෙන් පැවැති පළමු සාකච්ඡාවට ශ්‍රී ලංකා මහජන පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, දේශ විමුක්ති ජනතා පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, සම සමාජ පක්ෂය, බහුජන නිදහස් පෙරමුණ යන පක්ෂ එක් වූ හ.

එක්සත් පෙරමුණක් ගොඩනැඟීමේ උත්සාහය පටන් ගත් විට අනුර දැඩි විරෝධයක් පළ කළේ ය. මැතිනිය බෝඩ් ලැලි ටිකක් එක්ක කතා කරන බව ඔහු කීවේ ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එකතු වීමට එන සියලු පක්ෂ ත්‍රී වීලර් එකක දාගෙන යා හැකි බව කීවේ ය. මුළු ලෝකය ම සමාජවාදය අතහරිද්දී මැතිනිය නාකි සමාජවාදීන් ටිකක් එකතු කර ගැනීමට හදන බව කීවේ ය.

මේ කිසිවෙකින් නො සැලුණ මැතිනිය සමගි සාකච්ඡා දිගට ම කර ගෙන යෑමට තීරණය කළා ය.

මැතිනිය වමේ ප්‍රගතිශීලී පක්ෂ සමඟ පෙරමුණක් ගොඩනඟා ගැනීමට උත්සාහ ගනිද්දී අනුර කණ්ඩායම සිංහල දේශප්‍රේමී සංවිධානයක් ගොඩනැඟී ය. එය "මවුබිම සුරැකීමේ සංවිධානය" නම් විය.

පසු කලෙක පොදු ජන එක්සත් පෙරමුණ ගොඩනඟමින් එහි ලේකම් කරගත් දි. මු. ජයරත්න මුලින් කීවේ අපට පෙරමුණක් අවශ්‍ය නැති බවත් අපට අවශ්‍ය වන්නේ අනුර පක්ෂයේ නියෝජ්‍ය නායකයා කර ඔහුට බලතල පැවරීම බවත් ය. දි. මු. මවුබිම සුරැකීමේ සංවිධානයේ උපසභාපති වූයේ ය.

මේ සියලු අපහාස මැද කොමියුනිස්ට් පක්ෂයේ කේ. පී. සිල්වා හා රාජා කොල්ලුරේත්, සමසමාජ පක්ෂයේ බර්නාඩ් හා බැටී වීරකෝන්නුත්, මහජන පක්ෂයේ වයි. පී. සිල්වා හා නවරත්නත්, බහුජන නිදහස් පෙරමුණේ රාජිතත්, දේශවිමුක්ති ජනතා පක්ෂයේ නිහාල් පෙරේරා හා අප්පුහාමිත් ඉතා උනන්දුවෙන් පෙරමුණ ගොඩනැඟීමට කටයුතු කළ හ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ධර්මසිරි සේනානායක සහ මැතිනිය එක්වුණු අතර සම්බන්ධීකරණය කරන ලද්දේ මා විසිනි.

දිනේෂ් ගුණවර්ධන මහතා අනුර කණ්ඩායම සමඟ කම්වූ සම්බන්ධතා ගොඩනඟමින් මේ පෙරමුණු සාකච්ඡාවලට එතරම් උනන්දුවක් දක්වන බව නො පෙනුණි.

මේ කිසි ම දෙයකට චන්ද්‍රිකා ගේ කිසිදු සහභාගිත්වයක් නො වූ අතර ඇය ලංකාවට ඒමට උත්සාහයක් ගන්නා බවක් ද නො පෙනුණි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ද චන්ද්‍රිකා ගේ නො පැමිණීම ගැන සතුටින් සිටි බව පෙනුණි.

මේ අතර කේ. බී. රත්නායක හා අනිල් මුණසිංහ, මැතිනිය සහ අනුර අතර පැවැති මතභේද සමථයකට පත් කිරීමේ සාම සාකච්ඡා වටයක් ආරම්භ කළ හ. මේ සාම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස මැතිනිය පක්ෂ නායිකාව ලෙස සිටීමටත් සභාපති තනතුර හා විධායක බලය අනුරට පැවරීමටත් හදිසියේ මැතිනිය විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරන ලදි. මේ එකඟතාවේ මූලික කොන්දේසියක් වූයේ ලබන ජනාධිපති අපේක්ෂිකාව බණ්ඩාරනායක මැතිනිය විය යුතු බව ය.

මේ සමඟ ම අනුර කණ්ඩායම පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතු ඇරැඹී ය.

පෙරමුණු සාකච්ඡා ලත් තැන ලොප් විය. සමසමාජ පක්ෂය හා මහජන පක්ෂය සමඟ සාකච්ඡා අතහැර දැමී ය. කොමියුනිස්ට් පක්ෂය, දේශ විමුක්ති ජනතා පෙරමුණ හා බහුජන නිදහස් පෙරමුණ සමඟ නො කඩවා සාකච්ඡා ගෙන යැමට මම මැතිනිය ගෙන් අවසර ලබා ගතිමි. එතෙක් සාකච්ඡාවලට පැමිණි ශ්‍රී.ල.නි.ප.යේ නිමල් සිරිපාල ද සිල්වා හා ධර්මසිරි සේනානායක ද නො දන්වා ම සාකච්ඡා මඟ හරින බව පෙනුණි. එහෙත් හැකි හැම විටක ම මැතිනිය අපේ සාකච්ඡාවලට සහභාගී වූවා ය.

දැන් අනුර පක්ෂයේ මන්ත්‍රීවරුන් සංවිධායකයන් වෘත්තීය සමිති හා තරුණ සමිති ප්‍රධානීන් මුණ ගැසෙමින් ප්‍රතිසංවිධාන කටයුතු අරඹා ඇත. ඔහු දිස්ත්‍රික් රැස්වීම් වටයක් ද ආරම්භ කර තිබිණි. අනුර සමඟ මහින්ද රාජපක්ෂ ද රටපුරා යමින් සිටි බව පෙනුණි. අනුර ගේ මේ කිසි ම රැස්වීමක මැතිනිය ගැන කිසිදු සඳහනක් නො කියැවේ. හදිසියේ හරි කෙනෙක් මැතිනිය ගැන මතක් කළොත් එය අනුර ගේ අප්‍රසාදයට හේතුවක් වේ.

අනුර ගේ ප්‍රතිසංවිධානයේ පළමු වටයේ ම ඔහු ජනාධිපති අපේක්ෂක බවත්, අනාගත ජනාධිපති අනුර බණ්ඩාරනායක බවත් කියැවෙන්නට පටන් ගැනුණි.

මේ තත්ත්වය බණ්ඩාරනායක මැතිනිය ගේ දැඩි කෝපයට හේතු විය. ඇය කේ. බී. රත්නායක හා අනිල් මුණසිංහ හරහා අනුරට සාම ගිවිසුමේ කොන්දේසි මතක් කර යැවුවත් පලක් වූයේ නැත.

මේ වන විට මැතිනිය වටා සිටි අයත් මැතිනියට පක්ෂපාතී ව ඉදිරියට ඇවිත් අනුර ගේ වෛරයට පාත්‍ර වී සිටි මමත් මීට අමතර ව නිමල් සිරිපාල, මංගල, අලෙවි මවුලානා, අ. ම. කරුණාරත්න, නන්දිමිත්‍ර වැනි අයත් සම්පූර්ණ නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටිය හ.

මේ අතර පක්ෂ මූලස්ථානයේ තරුණ අංශයේ වැඩ කළ මොන්ටේගු සරත්චන්ද්‍ර නමැති තරුණයෙක් අප හමුවී මැතිනියට නැවත වහා ම ශක්තිය දී මැතිනිය අනුර සාම ගිවිසුම අවලංගු කළ යුතු යැයි යෝජනා කළේ ය. ඔහු ගේ පෙරත්තය නිසා හේමසිරි ප්‍රනාන්දුත්, මමත් මැතිනිය හමු වී කතා කිරීමට තීරණය කර ගතිමු.

ඒ හමුවීමට අප සමඟ මොන්ටේගු රැගෙන ගියත් මැතිනිය ඔහු සිටින තැන අප සමඟ කතා කිරීමට එකඟ නො වූ නිසා මොන්ටේගු එළියට යවා අපි මැතිනිය සමඟ පවතින තත්ත්වය ගැන කතා කළෙමු.

ඒ වන විටත් මැතිනිය අනුර සමඟත්, ඔහු ගේ ගෝළබාලයන් සමඟත්, සාම ගිවිසුමේ මැදිහත්කරුවන් වූ කේ. බී. හා අනිල් සමඟත් දැඩි කෝපයකින් සිටි බව පෙනුණි. මැතිනිය, අනුර-මැතිනිය සාම ගිවිසුම විසි කර දමා පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතු ඇය ගේ ප්‍රධානත්වයෙන් පටන් ගැනීමට සූදානම් ව සිටි බව පෙනුණි.

මේ තත්ත්වය යටතේ වහා ම කළ යුතු වන්නේ පක්ෂ මධ්‍යම කාරක සභාවේ මැතිනියට හිතවත් අය හා තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනකු කැඳවා සාකච්ඡා කර වැඩ ආරම්භ කිරීම බව මම යෝජනා කළෙමි. ඒ අනුව මැතිනිය පසු ව දා ම රැස්වීමක් කැඳවූවා ය. එයට කේ. බී. රත්නායක, ධර්මසිරි සේනානායක, අලෙවි මවුලානා, රිචඩ් පතිරණ, විශ්වා වර්ණපාල, අ. ම. කරුණාරත්න, නිමල් සිරිපාල,

මංගල සමරවීර, ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ, නන්දිමිත්‍ර, අනුරුද්ධ රත්වත්ත, ලැනරෝල් මැතිනියත්, මමත් සහභාගී වීමු.

එහි දී අනුර-මැතිනි සාම ගිවිසුම ගැන දීර්ඝ විස්තරයක් කළ මැතිනිය පටන්ගත් තැන ම අනුර හා පිරිස එම ගිවිසුම කඩා දමා ඇති බවත්, මැතිනිය සහමුලින් ඇත්කර දමා අනුර කණ්ඩායම පක්ෂය සහමුලින් අත්පත් කර ගැනීමට කටයුතු කරන බවත් පෙන්වා දෙන ලදි. මෙහෙම ගියොත් අනුර පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් හා වැදගත් බුද්ධිමත් අය කපා දමා කොල්ලන් කුරුට්ටන් හා රස්තියාදුකාරයන් ටිකක් එක්ක පක්ෂය ගෙන යෑමට ඉඩ ඇති බව ඇය කීවා ය.

සාකච්ඡාව අවසානයේ තීරණය වූයේ වහා ම පක්ෂය තුළත්, මධ්‍යම කාරක සභාව තුළත්, පාර්ලිමේන්තු කණ්ඩායම තුළත් මැතිනිය ගේ තත්ත්වය ශක්තිමත් කළ යුතු බව ය. මේ සඳහා පෙරමුණ ගොඩනැඟීම ද ඉක්මන් කළ යුතු බවට තීරණය විය. එදා රැස්වූ මේ පිරිස පසු දා ද රැස්වී මහ ලේකම් සූරියප්පෙරුම මැතිතුමා ලේකම් තනතුරින් ඉවත් කිරීමටත්, ඒ වෙනුවට ධර්මසිරි සේනානායක මහතා පත් කිරීමටත් තීරණය කර ගත් හ.

ධර්මසිරි ගේ නම කේ. බී. රත්නායක යෝජනා කිරීමටත්, රිචඩ් පතිරණ ස්ථිර කිරීමටත් තීරණය විය.

ඒ අනුව වහා ම මධ්‍යම කාරක සභාවක් කැඳවිණි. ඊට දින දෙකකට පෙර මැතිනිය විසින් මහ ලේකම් සූරියප්පෙරුම එම තනතුරින් ඉවත් කරන ලදි.

මේ සෑම අවස්ථාවක ම මැතිනිය තුළින් දිවංගත බණ්ඩාරනායක මහතාට නැති පුදුමාකාර හැකියාවක්, දක්ෂතාවක් හා එඩිතරකමක් ප්‍රදර්ශනය විය. ඇය ගැටලු ගැන ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කළා ය. අන් අය ගේ අදහස්වලට ඉතා හොඳින් ඇහුම්කන් දුන්නා ය. ඕනෑ ම බරපතළ තීන්දුවක් ගැනීමටත්, එහි වගකීම භාර ගැනීමටත්, ඒ වෙනුවෙන් ඉදිරිපත් වීමටත් ඇය කිසිදු පැකිළීමක් නො දැක්වූවා ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් සූරියප්පෙරුම මහතා ඉවත් කර පැවැත්වූ මධ්‍යම කාරක සභාව දැඩි උණුසුම් ස්වරූපයක් ගත්තේ ය.

සංවිධානාත්මක ව පැමිණි අනුර කණ්ඩායම සූරියප්පෙරුම මහතා ඉවත් කිරීම ගැන දිගින් දිගට ම විරෝධය පළ කළ හ. මුලින්

ම කතා කළ අනුර, සූරියප්පෙරුම ඉවත් කිරීම ගැන මැතිනියටත්, අනුරුද්ධ රත්වත්තටත් තදින් දෝෂාරෝපණය කළ අතර ඔහු මට තර්ජනය කළේ ය. මහින්ද රාජපක්ෂ, සී. වී. ගුණරත්න හා හලීම් ඉසාක් යන අය ද මේ තීරණය වෙනස් කරන ලෙස මැතිනියට කරුණු කී හ.

මැතිනිය කිසි සේත් තම තීරණය වෙනස් නො කරන බව කීවා ය.

"මැතිනිය තම තීරණය වෙනස් කරන්නේ ම නැත්නම් අපේ අලුත් මහලේකම්වරයා ලෙස අනුර බණ්ඩාරනායක යෝජනා කිරීමට මම කැමතියි" යනුවෙන් හදිසියේ ම මහින්ද රාජපක්ෂ යෝජනා කළේ ය. හලීම් ඉෂාක් මහතා එය ස්ථිර කළේ ය.

වහා ප්‍රතිචාර දැක් වූ බණ්ඩාරනායක මැතිනිය අනුර සමඟ ඇයට වැඩ කිරීමට නො හැකි බවත්, තමා ඒ යෝජනාවට එකඟ නොවන බවත් කීවා ය. දැන් කලින් කතා කර ගත් පරිදි කේ. බී. රත්නායක, ධර්මසිරි සේනානායක ගේ නම යෝජනා කළ යුතු ය. එහෙත් ඔහු නිහඬ ව සිටියේ ය. මේ අතර නැවත මහින්ද රාජපක්ෂ කීවේ "මහ ලේකම් තනමට වෙනත් යෝජනා නැති නිසා අනුර ලේකම් කර ගනිමු" කියා ය.

තවත් ප්‍රමාද නො විය යුතු බව තීරණය කළ මම, ධර්මසිරි සේනානායක ගේ නම මහ ලේකම් තනතුරට යෝජනා කළෙමි. වාසනාවට මෙන් අලෙවි මවුලානා එය වහා ස්ථිර කළේ ය. එවිට අනුර "එසේ නම් අපි ඡන්දයක් පවත්වමු" යැයි කීවේ ය.

ඒ සමඟ ම ධර්මසිරි සේනානායක "මම බණ්ඩාරනායකලා සමඟ ඡන්ද පොරයකට යන්න සූදානම් නැහැ. ඒ නිසා මම ඉල්ලා අස්වෙනවා" යනුවෙන් කීවේ ය.

ඒ අවස්ථාවේ නැවත නැවත මැතිනිය කීවේ ඇය අනුර ලේකම් වෙනවාට කිසි සේත් එකඟ නැති බව ය. අනුර නැවතත් මැතිනියට වේගවත් වාග් ප්‍රහාරයක් එල්ල කළේ ය.

මෙහි දී කතා කළ රිචඩ් පතිරණ කීවේ මේ ප්‍රශ්නය මැතිනිය හා අනුර සමඟ තනි තනි ව කතා කර විසඳා ගත යුතු බවත්, එතෙක් දින කිහිපයකට ධර්මසිරි තාවකාලික වැඩ බලන ලේකම් ලෙස පත් කර ගත යුතු බවත් ය. නැවත විශාල උණුසුම් වාදයකින්

පසු, දින දෙකකට ධර්මසිරි ලේකම් කිරීමට අනුර එකඟ වූයේ ය. එම දින දෙක තීරණයක් නැතිව ම ඇදී ගොස් ධර්මසිරි මිය යන තුරු ම ඔහු පක්ෂයේ මහ ලේකම් වූයේ ය.

දැන් නැවත පක්ෂය පැහැදිලි ව දෙ පිලකට බෙදී අවසන් ය. මැතිනියට එරෙහි ව අනුර මෙහෙය වූ පෙළපාළියක් බොරැල්ලේ සිට මැතිනිය සිටින රොස්මිඩ් නිවෙස ළගට පැමිණ මැතිනියටත්, අනුරුද්ධටත්, මටත් ස්වාමීන් වහන්සේ නමක් ලවා ත්‍රීවීලර් රථයක බැඳගෙන ආ ශබ්ද විකාශන යන්ත්‍රයකින් තදින් බැණ වැදුණි. ශබ්ද විකාශන යන්ත්‍රයකින් නො කිව යුතු, විශේෂයෙන් ස්වාමීන් වහන්සේ නමක් නො කිව යුතු තරම් අසභ්‍ය කතා කියමින් එම ස්වාමීන් වහන්සේ අපට බැණ වැදුණි. හදිසියේ එතැනට පැමිණි අලෙවි මවුලානාට පාතාලයේ සොත්ති උපාලි ගේ අයියා වන චන්දරේ පිහියක් පෙන්වා කමිසය පිහියෙන් කපා පහරදීමට තැත් කළේ ය.

දැන් අනුර ගේ ප්‍රතිසංවිධානය නතර වී ඇත. අපි මැතිනිය සමඟ රට වටේ යන රැස්වීම් වටයක් සංවිධාන කළෙමු.

මේ අවස්ථාවේ පෙරමුණ ගොඩනැඟීමේ කටයුතු ඉක්මන් කිරීමට ද මැතිනිය උනන්දු වූවා ය.

මේ වන විට මැතිනිය ගේ පිල ශක්තිමත් කර ගැනීමට චන්ද්‍රිකා මැතිනිය රටින් ගෙන්වා ගෙන පක්ෂයට ගත යුතු යැයි අපි කිහිප අවස්ථාවක ම මැතිනියට යෝජනා කළත්, ඇය එයට එකඟ නො වූවා ය. ඇය කීවේ චන්ද්‍රිකා සමඟ නැවත දේශපාලනය කිරීමට මැතිනිය සූදානම් නැති බව යි. මැතිනිය චන්ද්‍රිකා නැවත පක්ෂයට ගැනීමට එරෙහි ව කරුණු ගණනාවක් ඉදිරිපත් කළා ය.

එයින් පහත කරුණු ප්‍රධාන වේ.

1. චන්ද්‍රිකා විජය සමඟ එක් වී පක්ෂය දෙකට කැඩීම
2. චන්ද්‍රිකා පක්ෂයේ පුවත්පත මුද්‍රණය කළ මුද්‍රණ මැෂින් හොරකම් කිරීම
3. බොරු කීම
4. වේලාවට වැඩ නො කිරීම
5. ජනාධිපතිවරණයේ දී 81 මහා මැතිවරණයේ දී හා ජනමත විචාරණයේ දී චන්ද්‍රිකා කිසිවක් නො කිරීම ආදිය යි.

මැතිනිය මොනවා කීවත් ඇයට හිතවත් වැඩිදෙනා ගේ අදහස වූයේ මේ අවස්ථාවේ චන්ද්‍රිකා පක්ෂයට ගැනීම ඉතා ම වැදගත් බව ය. මේ වන විට 1992 අගභාගයට ළඟා වෙමින් තිබිණි.

චන්ද්‍රිකා පක්ෂයට ගත යුතු බවට මැතිනියට මුලින් ම යෝජනා කළේ 1991 මුල් භාගයේ යි. එනම් අනුර මැතිනිය ගෙන් පක්ෂය උදුරා ගැනීමේ උත්සාහය පටන් ගැනීමත් සමඟ යි.

ඒ අවස්ථාවේ මැතිනිය, චන්ද්‍රිකා ගැන කතා කිරීමට වත් කැමැත්තක් නො දැක්වූවා ය. මැතිනිය ගෙන් මේ ගැන විමසූ විට ඇගේ පිළිතුර කෙටි හා සරල එකක් විය. "එයා මගේ දුව. මවක ගෙන් කෙරෙන්න ඕනෑ දේ මා අදත් කරනවා. ඒ දරුවන්ට මා ආදරෙයි. ඒත් මා එයා සමඟ නැවැත දේශපාලනය කරන්න කැමැති නැහැ."

මැතිනිය මොනවා කීවත් 1992 අග භාගය වන විට අනුර කණ්ඩායම පක්ෂය තුළ විශාල බලයක් ගොඩනඟා ගෙන තිබිණි. සූරියප්පෙරුම මහ ලේකම් තනතුරින් ඉවත් කිරීමෙන් පසු ව ද අනුර කණ්ඩායමේ ශක්තිය අඩු නො වී ය. ඔවුහු නො කඩවා මැතිනියටත්, පක්ෂයටත් විශාල හානි සිදු කරමින් සිටිය හ.

මේ තත්ත්වය යටතේ හේමසිරි ප්‍රනාන්දුත්, මමත් චන්ද්‍රිකා පක්ෂයට ගැනීමේ අවශ්‍යතාව නො කඩවා මැතිනියට කීමට තීරණය කළෙමු. මංගල සමරවීර ද මේ සඳහා අප හා එක් විය. අලෙවි මවුලානා ද මේ ගැන නිතර ම මැතිනියට කරුණු කීමට ඉදිරිපත් වූයේ ය.

අනුර මොන තරම් මැතිනියට හා පක්ෂයට හානි කළත් ඇය ගෙන් පසු පක්ෂය අනුරට බාරදිය යුතු බව ඇගේ සිතේ තදින් පැවතුණි. චන්ද්‍රිකා නැවත පක්ෂයට ගැනීමට ඇය එකඟ නො වූ සැඟවුණ කරුණ වූයේ එය යි.

හේමසිරි ප්‍රනාන්දු බණ්ඩාරනායක පවුලේ සියලු දෙනා ගේ හඳහන් බලමින් නිතර ම මැතිනියට කීවේ මැතිනිය ගෙන් පසු පක්ෂය ගෙන යා හැක්කේත්, රටේ බලය ලබාගත හැක්කේත් චන්ද්‍රිකාට බව යි. මේ කිසිවකින් මැතිනිය වෙනස් කිරීමට නො හැකි විණි. ඇය ගේ පැහැදිලි ස්ථාවරය වූයේ ඇගෙන් පසු පක්ෂය අනුර භාර ගත යුතු බව යි.

කෙසේ නමුත් 1992 අගභාගය වන විට අනුර කණ්ඩායම ප්‍රසිද්ධියේ මැතිනියට පහර දීමට පටන් ගත් හ. අනුර විසින් ප්‍රසිද්ධ පුවත්පත් සාකච්ඡාවලින් මැතිනියටත්, අනුරුද්ධටත්, මටත් පහර දීමට පටන් ගන්නා ලදි. අනුර ළඟ සිටි මැරවර පිරිස් මැතිනිය ගේ හිතවතුන්ටත්, මැතිනියට හිතවත්කම් දැක්වූ මාධ්‍යවේදීන්ටත් මරණ තර්ජන එල්ල කරමින් සිටිය හ.

මෙසේ තර්ජනයට ලක් වූ මාධ්‍යවේදීන් අතර චූලවංශ සිරිලාල් හා වික්ටර් අයිවන් ප්‍රධාන ය.

මේ සිදු වීම මෙසේ සිදු වන අතර චන්ද්‍රිකා ද දෙවරක් ලංකාවට පැමිණ ආපසු එංගලන්තයට ගියා ය. ඇගේ අදහස වුණේ ද පෙරමුණ හරහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු වීම වඩා ප්‍රායෝගික බව ය. ඇය ගේ විශ්වාසය වුණේ ද අනුර ඇයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නැවැත ඒමට ඉඩ නො දෙන අතර මැතිනිය ද ඇය පක්ෂයට නො ගනු ඇති බව ය.

1991 සැප්තැම්බර් වන විට මැතිනිය චන්ද්‍රිකා ඇතුළු ඇගේ පිරිස පක්ෂයට ගැනීමට එකඟ වූවා ය. එහෙත් ඊට පෙර මැතිනියට චන්ද්‍රිකා සමඟ බේරා ගැනීමට කරුණු කාරණා ගණනාවක් තිබිණි.

එනිසා මැතිනිය ගේ උපදෙස් පරිදි මම මේ ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට ඉඩ කඩ ලබා ගැනීමට නුවරඑළියේ ජෙනරල් හවුස් නිවෙස වෙන් කර ගතිමි. 1992 අගෝස්තු දෙ වැනි සති අන්තය මේ සඳහා වෙන් විය. එම සෙනසුරාදා සවස 4.00ට සාකච්ඡාව ආරම්භ කිරීමට මැතිනිය දින වෙන් කළා ය. එම සාකච්ඡාවට කේ. බී. රත්නායක, ධර්මසිරි සේනානායක, අනුරුද්ධ යන අයට ආරාධනා කිරීමට මැතිනිය උපදෙස් දුන් අතර මංගල සමරවීරට ද ආරාධනා කිරීමට මම අවසර ගතිමි. චන්ද්‍රිකාටත් ඇය ගේ පක්ෂයේ කිහිපදෙනකු ගෙන ඒමට අවශ්‍ය වුණත් මැතිනිය එයට එකඟ නො වූවා ය.

මැතිනියත්, මමත්, මගේ බිරිඳ තමරාත් අදාළ දිනයේ උදේ ම නුවරඑළිය ජෙනරල් හවුස් නිවෙසට ළඟා වීමු. දවල් වන විට මංගල පැමිණියේ ය. 4ට තිබුණ රැස්වීමට චන්ද්‍රිකා ආවේ රාත්‍රී 11 ට ය. කේ. බී. ධර්මසිරි, අනුරුද්ධ පැමිණියේ නැත. මැතිනිය ඒ ගැන කීවේ ඒ අය අනුරට භය නිසා ආවේ නැති බව යි. පසු දා දීර්ඝ සාකච්ඡාවකින් පසු මැතිනිය චන්ද්‍රිකා අත්තනගල්ලෙන් ගැනීමට

එකඟ විය. චන්ද්‍රිකා ගේ අනෙක් අයට අදාළ ආසනවලින් පක්ෂයට ඇතුළුවීමට උපදෙස් ලැබුණි.

මැතිනිය ගෙන් පසු අනුර බණ්ඩාරනායක යටතේ පක්ෂය තුළ සිටීමට ද බණ්ඩාරනායක මැතිනිය චන්ද්‍රිකා, එකඟ කර ගත්තා ය.

චන්ද්‍රිකා ඇතුළු පිරිස පක්ෂයට ගැනීමට එකඟ වූ බව දැන ගත් අනුර නැවත එයට එරෙහිව විශාල විරෝධයක් මතු කළේ ය.

චන්ද්‍රිකා අත්තනගල්ලෙන් පක්ෂයට ඇතුළු වූ අතර අනෙක් අය පක්ෂයට ගැනීමට අදාළ ආසනවල අය එකඟ නො වූ හ. අනුරාධපුරයේ බර්ටි ප්‍රේමලාල් දිසානායක පමණක් ශාන්ත ප්‍රේමරත්න ගැනීමට එකඟ වූ අතර චන්ද්‍රිකා සමඟ පැමිණි ඩිලාන් පෙරේරා, ජීවන් කුමාරතුංග, රෙජිනෝල්ඩ් කුරේ, කුසුම්සිරි සූරියප්පෙරුම, සාලින්ද වැනි අය හඟුරන්කෙත හා මාතර ආසනවලින් පක්ෂයට ඇතුළු වූ හ.

චන්ද්‍රිකා පක්ෂයට ගත් මැතිනිය එකවර ම ඇය පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ගැනීමට එකඟ නො වූවා ය. එහෙත් 1992 සැප්තැම්බර් වන විට ඇයට අත්තනගල්ල සංවිධාන කටයුතු පවරන ලදී.

චන්ද්‍රිකා විසින් අත්තනගල්ල සංවිධාන කටයුතු ඇරඹීමට ප්‍රථමයෙන් මැතිනිය ගේ ප්‍රධානත්වයෙන් එහි විශාල රැළියක් සංවිධාන කෙරිණි. ඒ රැළියට අනුරට ද ආරාධනය කෙරිණි. අනුර රැළියට ආවේ විශාල රථ පෙරහරකිනි. මර්වින් සිල්වා, කැලණිය නන්දසේන පෙරටු කර ගත් පාතාලේ මිනීමරුවකු වූ සොත්ති උපාලි ගේ මල්ලී එම පෙරහරේ පැමිණියා හ. ඔවුහු රැස්වීම් භූමියට පැමිණි විගස ම මාධ්‍යවේදී චූලවංශ සිරිලාල්ට පහර දුන්හ. තව ද වේදිකාව වටා සිටි චන්ද්‍රිකා හිතවතුන් කිහිපදෙනකු ගේ කමිස අත් ඔවුන් ගේ අත තිබුණු තියුණු පිහිවලින් කපා දමන ලදී. වේදිකාව යටට නිරන්තරයෙන් පළාත ම ගිගුරුවන වෙඩි දැමූ හ. ඒ අවස්ථාවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මූලාසනයේ සිටියා ය.

එදා එම රැස්වීමට පැමිණ සිටි සාලින්ද දිසානායකට, රෙජිනෝල්ඩ් කුරේට, අලෙවි මවුලානාට, මංගලට සහ මට ද ඔවුහු නො සැහෙන ලෙස බැණ වදිමින් තර්ජනය කළ හ.

අනුර සභාව අමතමින් සිය මැණියන්ටත්, චන්ද්‍රිකාටත් නො සෑහෙන ලෙස දෝෂාරෝපණය කළේ ය. චන්ද්‍රිකා පසු ගිය මහා මැතිවරණයේ දී හා ජනමත විචාරණයේ දී ලංකාවේත් නො සිටි බව කීවේ ය.

බණ්ඩාරනායක මැතිනිය චන්ද්‍රිකාට අත්තනගල්ල සංවිධාන කටයුතු පැවැරීමට යන ආරංචියෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ සියලු සංවිධායකයෝ ෆීලික්ස් පෙරේරා ගේ ගෙදරට රැස් වී චන්ද්‍රිකා ගම්පහට නො එවන ලෙස ඉල්ලා පෙත්සමක් අත්සන් කර මැතිනියට එවූ හ. එදා එයට අත්සන් නො කළේ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ පමණි. උඩින් ම අත්සන් කර තිබුණේ ලක්ෂ්මන් ජයකොඩි ය.

එම රැලියේ දී අනුර හා අනුර ගේ මැරයන් හැසුරුණු ආකාරය ගැන මැතිනිය තදින් කෝප වී සිටියා ය. පසු දා උදේ මැතිනිය හමු වුණු මාත්, හේමසිරි ප්‍රනාන්දුත් චන්ද්‍රිකාව මධ්‍යම කාරක සභාවට ගැනීමේ වැදගත්කම ගැන කතා කළෙමු. පුරප්පාඩුවක් නොමැති ප්‍රශ්නය මැතිනිය මතු කළ අතර, ඒ වන විට මධ්‍යම කාරක සභාවේ සිටි මහාචාර්ය විශ්වා වර්ණපාල ටික කලකට විදේශ ගත වීමේ අදහසකින් සිටින බව මම පෙන්වා දුනිමි. ඒ අනුව විශ්වා වර්ණපාල සමඟ කතා කරන ලෙස මැතිනිය අපට දැන්වූවා ය. මහාචාර්ය විශ්වා වර්ණපාලට මේ ගැන කතා කර ඔහු ගේ ඉල්ලා අස්වීම ලබා ගැනීම වික්ටර් අයිවන්ට භාර කෙරිණි. එය එලෙස ම ඉටු වූයේ ය. ඒ අනුව මැතිනිය විසින් 1992 නොවැම්බර් වන විට චන්ද්‍රිකා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට පත් කෙරිණි.

මේ වන විටත් අනුර කණ්ඩායම පක්ෂය තුළ ශක්තිමත් ව සිටියත් මැතිනිය ද දිනෙන් දින ශක්තිමත් වෙමින් නො සැලී ඉදිරියට ඒමට පටන් ගෙන තිබිණි.

1993 මැයි 17 වැනි දා පැවැති පළාත් සභා මැතිවරණයට චන්ද්‍රිකා ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග වැදුණා ය. මුල දී ඇය මෙයට අකැමැති වුවත් පසු ව එකඟ වූවා ය. අනුර ඇය මහ ඇමැති අපේක්ෂිකාව කරනවාටත් ගම්පහ දිස්ත්‍රික් කණ්ඩායම් නායිකාව කරනවාටත් තදින් විරුද්ධ වූයේ ය.

1993 මාර්තු 16 පළාත් සභා විසුරු වන විට ඒ මස 12 වැනි දා අපි පොදුජන එක්සත් පෙරමුණ ගොඩනඟා අවසන් කළෙමු.

93 පළාත් සභා මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වූ ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ ද තරග වැදුණි. මේ පක්ෂයට නායකත්වය දුන්නේ ලලිත් ඇතුලත්මුදලි වන අතර ඔහු ද කොළඹ දිස්ත්‍රික්කයට තරග වැදුණි. පොදු ජන එක්සත් පෙරමුණ හා එක්සත් ජාතික පෙරමුණ එක් වී පළාත් සභා බලය ගැනීමට එකඟත්වයක් විය.

චන්ද්‍රිකා පළාත් සභා මහ ඇමැතිනිය කිරීමට අපේ බලාපොරොත්තුවක් තිබූ අතර ලලිත් මහ ඇමැති කිරීම ඒ අය ගේ බලාපොරොත්තුව විය. ලලිත් ඇතුලත්මුදලි පළාත් සභා මැතිවරණ වේදිකාවේ දී ඝාතනය කෙරිණි. පොදුජන එක්සත් පෙරමුණ හා එක්සත් ජාතික පෙරමුණ එක් ව පළාත් සභා 3ක බලය ලබා ගැනීමට හැකි විය. ඒ දකුණ, බස්නාහිර හා වයඹ යි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදු ජන එක්සත් පෙරමුණ දකුණ හා බස්නාහිර පළාත් සභා මහ ඇමැති තනතුරු ලබා ගත් අතර වයඹ එක්සත් ජාතික පෙරමුණේ ප්‍රේමචන්ද්‍රට ලබා දීමට සිදු විය. ලලිත් ඝාතනයට ලක් නො වුණා නම් බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැති තනතුර ලලිත්ට දීමට සිදු වනු ඇත. එසේ වූවා නම් එය චන්ද්‍රිකා ආගමනයේ ආරම්භක පසුබෑසීමක් වනු ඇත. ලලිත් ගේ අභාවය ද චන්ද්‍රිකා ගේ වාසියට හේතුවක් වූ අතර එහි අලාභය එස්. බී. නාවින්නට විඳීමට සිදු විය. එනම් වයඹ මහ ඇමැති තනතුර එක්සත් ජාතික පෙරමුණට දීමට සිදු වීම යි.

ජේ. ආර්. පී. සූරියප්පෙරුම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් තනතුරින් ඉවත් කිරීමේ අරගලයේ දී අනුර ගේ පහත් දෝෂාරෝපණයට ලක් වූ මැතිනිය ඒ තීරණාත්මක මධ්‍යම කාරක සභා රැස්වීමෙන් පසු අසනීප වූවා ය. එතැන් සිට මැතිනිය අර්ධ අංශභාග තත්ත්වයෙන් පෙළුණා ය.

මේ තත්ත්වය යටතේ මැතිනිය වෙනුවෙන් චන්ද්‍රිකාට ලංකාව පුරා යෑමට සිදු විය.

අනුර මේ තීරණාත්මක මැතිවරණ සටන මඟහැර සිටි අතර චන්ද්‍රිකාට එරෙහි ව ගම්පහ දිස්ත්‍රික්කයෙන් ෆීලික්ස් පෙරේරාට සහාය දැක්විය. ඔහුට වුවමනා වූයේ චන්ද්‍රිකා ගම්පහ දිස්ත්‍රික්කයෙන් දෙ වැනි තැනට ගෙන ඒම ය. එහෙත් චන්ද්‍රිකා ෆීලික්ස් පෙරේරාට වඩා ඡන්ද ලක්ෂ ගණනක් ලබා ජය ගත්තා ය.

චන්ද්‍රිකා ලලිත් ගේ අභාවය නිසා ගැටලුවක් නැති ව ම බස්නාහිර මහ ඇමැති වූ අතර එය අනුර බණ්ඩාරනායක ගේ විශාල පරාජයක් විය.

එසේ ම මේ වන විට මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට සහභාගී වීමට හැකි තත්ත්වයක් මැතිනියට නො වූ අතර චන්ද්‍රිකාට පොදු පෙරමුණේ විකල්ප නායිකාව ලෙස නැඟී සිටීමට එයත් විශාල පිටු වහලක් විය.

මේ පළාත් සභා මැතිවරණය පැවැත් වූයේ 1993 මැයි 17 වැනි දා යි. මැයි 01 වැනි දා ජනාධිපති ප්‍රේමදාස ඝාතනයට ලක් විය. ඉන් පසු ජනාධිපති වූයේ ඩී. බී. විජේතුංග යි. ප්‍රේමදාස ජනාධිපතිවරයා ගේ අභාවය එක්සත් ජාතික පක්ෂයට කියා නිම කළ නො හැකි තීරණාත්මක පසු බැසීමක් උදාකර දුණි. එයත් චන්ද්‍රිකා ආගමනයේ වාසියට හේතු විය.

චන්ද්‍රිකා මහ ඇමැතිනිය වීමත් මැතිනිය ගේ අසනීපයත් පළාත් සභා මැතිවරණයේ දී අනුර චන්ද්‍රිකා විරෝධී ව්‍යාපාරයක දියත් කිරීම හා ඉන් ඔහුට අත් වූ පරාජයත් නිසා 1993 මැයි මාසයෙන් පසු චන්ද්‍රිකා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් පොදු ජන එක්සත් පෙරමුණේත් නියෝජ්‍ය නායිකාව කරන ලෙස අපට පහසුවෙන් ඉල්ලීමට හැකි විය.

මුලින් ම මම මේ යෝජනාව පෞද්ගලික ව මැතිනියට ඉදිරිපත් කළෙමි. මැතිනිය එයට එකඟ නැති බව වැටහුණේ ය. එනිසා මම නිහඬ වීමි. එහෙත් මේ යෝජනාව පොදු ජන එක්සත් පෙරමුණේ අනෙක් පක්ෂ ද ඉදිරිපත් කිරීමට පෙළඹුණි.

මේ සමඟ අනුර කළේ මැතිනිය සිංගප්පූරුවට ගෙන ගොස් ඇය ගේ තරමක් අප්‍රාණික ව තිබූ පාදයේ හැකිලී තිබූ ඇඟිලි ශල්‍යකර්මයකින් කෙළින් කිරීමට උත්සාහ කිරීම යි. ඔහු එය කළේ කෙසේ හෝ ඊ ළඟ මහා මැතිවරණයට මැතිනිය සූදානම් කර ගැනීමට ය. අනුර ඒ උත්සාහය ගත්තේ මැතිනියට හෝ පක්ෂයට හෝ තිබුණ ආදරයකට නො වේ. ඔහුට අවශ්‍ය වූයේ චන්ද්‍රිකා ඉදිරියට ඒම කෙසේ හෝ වැළැක්වීම යි. එහෙත් එම ශල්‍යකර්මයෙන් පසු මැතිනිය ගේ පාදයේ තවත් අසනීප වැඩි විය.

දැන් චන්ද්‍රිකා පක්ෂයේ හා පෙරමුණේ නියෝජ්‍ය නායිකාව වීමත් ඊ ළඟ මැතිවරණවලට ඇය නායකත්වය දීමත් කිසි සේත් වැළැක්විය නො හැකි තත්ත්වයට පත් විය.

මේ අතර අපි ළඟදී ම චන්ද්‍රිකා පක්ෂයේ හා පෙරමුණේ නියෝජ්‍ය නායිකාව කරන බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට පටන් ගතිමු. "ලංකාදීප" පත්‍රයට මම දුන් පුවත්පත් සාකච්ඡාවකින් මෙය ප්‍රසිද්ධියට පත් කළෙමි. මේ වන විට අනුර, එක්සත් ජාතික පක්ෂයේ සිරිසේන කුරේ සමඟ සාකච්ඡා කරන බව අපි දැන සිටියෙමු. අපට අවශ්‍ය වූයේ අනුර එ.ජා ප.යට යෑම ඉක්මන් කිරීම යි. මට " ලංකාදීප" සම්මුඛ සාකච්ඡාව සංවිධාන කරන ලද්දේ චූලවංශ සිරිලාල් විසිනි.

ඒ සතියේ රාවය පත්‍රය ද චන්ද්‍රිකා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් පොදු ජන එක්සත් පෙරමුණේත් නියෝජ්‍ය නායිකාව කිරීමට මැතිනිය තීරණය කර ඇතැයි ප්‍රවෘත්තියක් පළ කළේ ය.

එයත් අපේ ම මෙහෙය වීම යටතේ සිදු විය. මේ ආරංචිය පැතිරයත් ම අනුර බණ්ඩාරනායක ගේ බලාපොරොත්තු සියල්ල අවසානය කරා ළඟා විය. ඔහු වහා ම කළේ සිරිසේන කුරේ හරහා එක්සත් ජාතික පක්ෂයට යෑම ඉක්මන් කිරීම යි.

මෙතෙක් කල් අනුර සමඟ සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අතිවිශාල පිරිසකට යන එන මං නැති විය. ඇතැම්හු දේශපාලනයෙන් සමු ගත් හ. තිලක් කරුණාරත්න වැනි අය සිංහල සංවිධානයන් ගොඩනැඟීම හරහා ජාතිවාදී පැත්තට තල්ලු වූ හ. තවත් සමහරු එ.ජා.ප.යට ඇතුළු වීමේ උත්සාහයක නිරත වූ හ. එහෙත් අතිබහුතරයක් අනුරවාදීන් අන්ත අසරණ වී මැතිනිය ළඟට චන්ද්‍රිකා ළඟට නැවත යෑමට උත්සාහ දරනු පෙනුණි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරගහගෙන පරම්පරා ගණනාවක් දේශපාලනය කළ පවුල් පරම්පරා පුද්ගලයන් විශාල පිරිසක් හතර වන වතාවටත් අනුර බණ්ඩාරනායක විසින් අනාථ කර දමන ලදී.

මේ මහා පාවාදීමෙන් පසු චන්ද්‍රිකා ගෙන් බැට නො කෑ එක ම වාසනාවන්තයා සී.වී. ගුණරත්න යි. එයට එක ම හේතුව සී.වී. ගේ කුලය හා චන්ද්‍රිකා ගේ දරුවන් ගේ කුලය එකක් වීම යැයි මට සිතේ. අනාගතයේ දී සී. වී. සිය දරුවන්ට අවශ්‍ය බව ඇය සිතූ බව පෙනේ.

අනුර 1993 දෙසැම්බර් මාසයේ එක්සත් ජාතික පක්ෂයට එක් වී එම රජයේ උසස් අධ්‍යාපන ඇමැතිවරයා වූයේ ය.

අනුර එක්සත් ජාතික පක්ෂයට යෑමට සූදානම් වෙමින් මැතිනියත් පක්ෂයත් තදින් විවේචනය කරමින් කර තිබූ පුවත්පත් සාකච්ඡා කිහිපයක් විය. ඒවා පදනම් කරගෙන ඔහු ගේ පාක්ෂිකත්වය තහනම් කිරීමට මැතිනිය පෙළඹුණි.

අනුර එ.ජා.ප යට එක් වූ පසු නැවත මා විසින් මැතිනියට චන්ද්‍රිකා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය නායිකාව (නියෝජ්‍ය සභාපතිනිය) කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලද්දෙමි. ඒ අවස්ථාවේ මා සමඟ මංගල සමරවීර ද හේමසිරි ප්‍රනාන්දු ද වූ හ. එම යෝජනාව කළේ චන්ද්‍රිකා සමඟ ද දීර්ඝ වශයෙන් කතා කිරීමෙන් පසුව යි.

මේ යෝජනාව ධර්මසිරි, අනුරුද්ධ, කේ.බී. වැනි අය ලවා ද කිරීමට අප උත්සාහ ගත් නමුදු ඔවුහු එය මඟ හැරිය හ.

මේ යෝජනාව මැතිනියට කරන ලෙස රිචඩ් පතිරණට ද අපි දැන්වීමු. ඔහු කීවේ පක්ෂයට නියෝජ්‍ය නායිකාවක් අවශ්‍ය නැති බවය. එහෙත් දීර්ඝ සාකච්ඡාවකින් පසු ඇය චන්ද්‍රිකා පොදුජන එක්සත් පෙරමුණේ නියෝජ්‍ය නායිකාව කිරීමට එකඟ වූවා ය.

ඒ අනුව අනුර එ.ජා.ප යට ගොස් මාසයක් ගතවීමට පෙර මහ ඇමතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක පොදුජන එක්සත් පෙරමුණේ නියෝජ්‍ය නායිකාව වූවා ය. 1994 වසර ආරම්භ වූයේ රටේ අනාගත නායිකාව බවට චන්ද්‍රිකා පත්වන බවට සියලු පෙරනිමිති පහළ කරමිනි.

ඒ වසර ඇරඹුණේ මහ මැතිවරණ වසර ලෙස යි.

මේ වන විටත් පක්ෂයේ සියලු කටයුතු මෙහෙය වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය යි. පක්ෂයේ ප්‍රතිපත්ති සම්පාදක කමිටුව සමඟ ද ප්‍රචාරක කමිටුව සමඟ ද මැතිනිය නිරන්තරයෙන් මුණ ගැසෙමින් කතා කරයි.

සංවිධාන කටයුතු ගැන ද ඇය සොයා බලයි. දුර්වල තැන්වල සංවිධායකයින් වෙනස් කිරීමට ද ඇය කටයුතු කරයි. සංවිධායකයින් තේරීමේ දී චන්ද්‍රිකා, බණ්ඩාරනායක මැතිනියට තදින් බලපෑම් කළ අතර ඇයට අවශ්‍ය ලෙස සංවිධායකයින් පත්කර ගැනීමට මැතිනිය ඉඩ නොදුන්නා ය.

පක්ෂයේ ප්‍රචාරක කමිටුවක් ද මැතිවරණ ප්‍රකාශන කමිටුවක් ද පත් කළ මැතිනිය ඒ කටයුතුවලට ද නායකත්වය ලබා දුන්නා ය. චන්ද්‍රිකා ද මේ කමිටුවල සිටියත් බොහෝ විට ඇය එන විට කමිටු රැස්වී තීරණ ගෙන අවසාන ය. මේ කමිටු දෙකේ ම සම්බන්ධීකරණ කටයුතු කළ මම ඒවායේ කටයුතු ගැන විටින් විට චන්ද්‍රිකා දැනුවත් කළෙමි. මේ කමිටුවලට අනුරුද්ධ රත්වත්ත ඉතා උනන්දුවෙන් සහභාගී විය. මැතිවරණ ප්‍රකාශනය මමත් ආචාර්ය ගාමිණී ප්‍රනාන්දුත් සකස් කරමින් සිටි අතර ඒ සඳහා විවිධ අංශවල සහාය හා අදහස් ලබා ගතිමු. නීතිය හා ව්‍යවස්ථාමය කරුණු මහාචාර්ය ජී.එල්. පීරිස් අතින් ලියැවිණි.

අප ලියා අවසන් කළ කොටස් චන්ද්‍රිකාට ලැබෙන්නට සැලැස්සුව ද ඇය කිසිදාක ඒවා කියවා තිබුණේ නැත. එනිසා විටින් විට ඇය මුණ ගැසී වැදගත් කරුණු දැනුම් දීමට මම පෙළඹුණෙමි.

මැතිනිය චතුකරයේ ප්‍රශ්න ගැන චන්ද්‍රසේකරන් සමඟත් උතුරේ දේශපාලන පක්ෂ සමඟත් නිතර නිතර සාකච්ඡා කරමින් මැතිවරණයට ඔවුන් ගේ සහාය ගැනීමට කටයුතු කළා ය. මේ අතර පොදු ජන එක්සත් පෙරමුණ විසින් උතුරේ දේශපාලන පක්ෂ සමඟ ද සාකච්ඡා ආරම්භ කරන ලදි. මේ සෑම කමිටුවක ම චන්ද්‍රිකා ද සාමාජිකාවක් වුවත් කිසිදු රැස්වීමකට වේලාවට සහභාගී වීමක් සිදු වූයේ නැත. ඒ සියල්ල සිදු වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අතිනි.

මේ සියල්ල කෙසේ සිදු වුවත් බණ්ඩාරනායක මැතිනිය ගේ අසනීප තත්ත්වය නිසා විශේෂයෙන් ඇයට ඇවිදීමට තිබුණ අපහසුව නිසා ඒ වන විට ඊ ළඟ අගමැති අපේක්ෂිකාවත් ජනාධිපති අපේක්ෂිකාවත් චන්ද්‍රිකා බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පොදු ජන එක්සත් පෙරමුණත් රටත් සැකයෙන් තොර ව තේරුම් ගෙන තිබුණි.

1994 ජූනි 24 වැනි දා පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ ය. නාම යෝජනා භාර ගැනීම ජූලි 4-11 අතර විය. අගෝස්තු 16 දා මැතිවරණය පැවැත් වුණි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳුරට ජනතා විමුක්ති පෙරමුණෙන් තරග කර චන්ද්‍රසේකරන් ද ජය ගත් නිසා ඔහු ද රැගෙන මම කොළඹට පැමිණියෙමි. ඔහුත් සමඟ මන්ත්‍රීවරුන් 113ක් හදාගත් අපි පොදුජන එක්සත් පෙරමුණු රජය පිහිටු වීමු.

ඒ රජයේ අගමැති වීමටත් එසේ ම ඉන් පසු පැවැති ජනාධිපතිවරණයට ජනාධිපති අපේක්ෂිකාව වීමටත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ අපේක්ෂාව වී තිබිණි. එහෙත් අපි ඒ ගැන බණ්ඩාරනායක මැතිනිය සමඟ කතා නොකර ම චන්ද්‍රිකා මැතිනිය අගමැතිනිය ලෙසත් ජනාධිපති අපේක්ෂිකාව ලෙසත් තීරණය කළෙමු.

ජනාධිපතිවරණයෙන් පසු චන්ද්‍රිකා සිතුවේ ධර්මසිරි සේනානායක අගමැති කිරීමට යි. අනුරුද්ධ හා රත්නසිරි ද අගමැති තනතුර පැතූ හ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ද ඇය අගමැති විය යුතු බව සිතුවා ය. එහෙත් චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය අගමැති කිරීමට තදින් විරුද්ධ වූවා ය.

අවසානයේ ඇගේ විරෝධය නො තකා මමත් මංගල සමරවීරත් සියලු මන්ත්‍රීවරුන් ගෙන් පෙත්සමක් අත්සන් කර ගතිමු. ඒ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය කරන ලෙස ජනාධිපති චන්ද්‍රිකා ගෙන් ඉල්ලා සිටීමට යි. අප පළමුවෙන් ම ඒ පෙත්සමට අත්සන් කර ගත්තේ ධර්මසිරි සේනානායක ගෙනි. ඊ ළඟට අනුරුද්ධගෙන් හා රත්නසිරි ගෙන් අත්සන් ලබා ගතිමු.

අවසානයේ එම පෙත්සමේ සියලු පොදු පෙරමුණු මන්ත්‍රීවරු ඇමැතිවරු අත්සන් තැබූ හ.. කළ හැකි කිසිවක් නො වූයෙන් මටත් මංගලටත් දොස් තබමින් චන්ද්‍රිකා විසින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැති තනතුරට පත් කරන ලදි..

එහෙත් චන්ද්‍රිකා රජය මැතිනිය ගේ ඉල්ලීම් ඉටු කළේ නැත. ඉටු කළ අයටත් චන්ද්‍රිකා මැතිනිය ගෙන් දෝෂාරෝපණ එල්ල විය. මැතිනිය ගේ සමීප හිතවතුන්ට චන්ද්‍රිකා රජය උදවු කළේ නැත. කිසි ම ඇමැතිවරයකුට මැතිනිය ගේ අයට උපකාර කිරීමට ඉඩ දුන්නේ ද නැත. එනිසා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය චන්ද්‍රිකා රජය ගැන සිටියේ දැඩි කලකිරීමකිනි. වේදනාවකිනි.

විජය ඝාතනය, ඇතුළත් මුදලි ඝාතනය, ප්‍රේමදාස ජනාධිපති ගේ ඝාතනය, ගාමිණී දිසානායක ඝාතනය ආදී ඝාතන විසින් චන්ද්‍රිකා කෙටි කාලයකින් ශ්‍රී ලංකාවේ මහ ඇමතිනි, අගමැතිනි ජනාධිපතිනි කෙරිණි.

අනුරට සිය මව එලවා පක්ෂ නායකත්වය ගැනීමට තිබූ හදිසිය චන්ද්‍රිකා ගමනේ මාර්ගය එළිපෙහෙළි කර දෙන ලදි.

අනුර නිසා ම ඔත්පළ වූ මැතිනියටත් චන්ද්‍රිකාට බලය දීම හැර වෙනත් විකල්පයක් නො වී ය.

අනුර විසින් හතර වතාවක් පක්ෂයේ සියලු ජ්‍යෙෂ්ඨයන් පක්ෂයට අහිමි කර තිබූ නිසා පක්ෂයටත් චන්ද්‍රිකා හැර වෙනත් විකල්පයක් නො වී ය.

හරිහැටි අධ්‍යාපනයක් ලබා නො ගත්

කිසිම වැඩක් පිළිවෙළට නො කරන

කවරදා වත් වේලාවට වැඩ කරන්න බැරි

කිසි ම ලැජ්ජාවක් නැති ව බොරු කිව හැකි

විලිබිය-හිරිඔතප් කිසිවක් නො දන්නා

චන්ද්‍රිකා බණ්ඩාරනායකට

අපේ මාතෘ භූමියේ ඉරණම්කාරිය වීමට

හැකිවූයේ මෙලෙස යි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය නැවත අග්‍රාමාත්‍යවරිය කරමින් ජාතික යුතුකමක් හා මානව යුතුකමක් ඉටු කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් සමත් වුව ද බණ්ඩාරනායක මැතිනියටත් ඇගේ හිතවතුන්ටත් චන්ද්‍රිකා රජයෙන් සිදු වූ කෙනෙහිලිකම් අනන්ත ය. අප්‍රමාණ ය. චන්ද්‍රිකා ඇතැමුන් කපා දැම්මේ ඇතැමුන් ගෙන් පලිගත්තේත් ඒ අය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට පක්ෂපාත ව මුළු ජීවිත කාලය ම වැඩ කළ නිසා ම ය.

ලෝකයේ පළමු අග්‍රාමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක නමැති ඒ අසහාය නායිකාව සිය අවසාන භාගයේ අනේක දුක් කම්කටොලු විඳ සිය ස්වාමියා නිර්මාණය කළ පක්ෂය රැකගත්තා ය.

1959 එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා ගේ අභාවයෙන් පසු ඇයට පක්ෂ නායකත්වය ලබා ගැනීමටත් විශාල අරගලයක් නො වී ය. මැතිනිය පක්ෂ නායකත්වයට ඒමට එරෙහි වූ පිරිසක් පක්ෂය තුළ නො සිටියා නො වේ. ඒත් අතිබහුතරය සිටියේ මැතිනිය පක්ෂය භාරගත යුතු ය යන ස්ථාවරයේ ය. එනිසා 1960 ජූලි මැතිවරණයෙන් මැතිනිය ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය

වූවාට පසු 1973 පමණ වන තුරු ම ඇයට තම පක්ෂ අභ්‍යන්තරයේ විශාල අර්බුද, දෙදරීම්, තර්ජන මතු වූයේ නැත. 1964 පක්ෂයේ පිරිසක් එ.ජා.ප යට කඩාගෙන ගොස් ආණ්ඩුව කඩා වැටුණත් එය පක්ෂ අභ්‍යන්තරයේ මතු වූ අර්බුදයක ප්‍රතිඵලයක් නො වේ. 1970 බණ්ඩාරනායක මැතිනියට සිය දරුවන් ගෙන් උපකාරයක් නො ලැබුණි. අනුර 70 මැතිවරණය අවසාන භාගයේ අත්තනගල්ල ආසන්නයේ රැස්වීම් කිහිපයකට ගොස් එදා එහි එ.ජා.ප අපේක්ෂක සූරියප්පෙරුම ගෙන් හොඳ හැටි සංග්‍රහ ලැබුවේ ය. ඔහු අනුරගෙන් ඉල්ලුවේ අ.පො.ස සාමාන්‍ය පෙළ සහතිකය යි. අනුර තම සාමාන්‍ය පෙළ ප්‍රතිඵල කවරදා වත් කීවේ නැහැ. එහෙත් ඔහු ගේ අධ්‍යාපන පැටිකිරිය නො දන්නා අයෙකු ද නැත.

1970 සමගි රජය පිහිටුවීමෙන් වසරක් ගත වන විට අනුර හා ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨයන් අතර යම් යම් ගැටලු මතු විය. අනුර ගේ නො මේරූ ගතිය හා උද්දච්චකම මේ බෝහෝ ප්‍රශ්නවලට හේතු විය. ඒවා බණ්ඩාරනායක මැතිනියට අනවශ්‍ය කරදරයක් විය.

1973 වන විට මැතිනියට සිය දරුවන් නිසා ප්‍රධාන ප්‍රශ්න තුනකට මැදිවීමට සිදු විය.

එනම්;

1. අනුර, කලාවැව අතුරු මැතිවරණයට එ.ජා.ප යේ ද උපකාරයෙන් නිතරගයෙන් පත්වීමට උත්සාහ කිරීම.
2. සුනේත්‍රා-කුමාර රූපසිංහ ජනවේගය නමැති සංවිධානයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළත හැදීම හා ඒ තුළින් පක්ෂය දෙ පිලකට බෙදීම.
3. අනුර "අද" නමින් පත්‍රයක් පටන් ගනිමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් සමගි පෙරමුණේත් ජ්‍යෙෂ්ඨයන්ට පහරදීම.

නැවැත 1977 මහ මැතිවරණයට අනුර බණ්ඩාරනායක නුවරඑළිය-මස්කෙළිය බහු මන්ත්‍රී ආසනයෙන් තරග කිරීමත් සමඟ නැවත පක්ෂයේ අභ්‍යන්තර ගැටුමක් මතු විය.

1977 එ.ජා.ප ජයග්‍රහණයෙන් පසු මැතිනිය ගේ සිවිල් අයිතිවාසිකම් නැති වීමත් සමඟ මතු වූ ගැටුම් මේ පරිච්ඡේදයේ මුලින් විස්තර කර ඇත.

කෙසේ නමුත් බණ්ඩාරනායක මැතිනියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රැක ගැනීමට සිය දරුවන් හා බෑණාවරුන් සමඟ විශාල සටනක් කිරීමට සිදු විය. එයිනුත් මැතිනියට වඩාත් ම වධ දුන්නේ චන්ද්‍රිකා හා අනුර යි.

මේ සියලු දස දුක් විඳ මැතිනිය තම පක්ෂය 1994 වන විට නැවත බලයට ගෙන ඒමට සමත් වූවා ය. එහෙත් ඒ වන විට දරුවන් නිසා ම මැතිනියට ඇවිදීමට පවා නො හැකි විණි.

මේ හේතුව මත, මහ ඇමැතිනිය, අගමැතිනිය, ජනාධිපතිනිය වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග යි.

චන්ද්‍රිකා අගමැති වූ මොහොතේ පටන් බණ්ඩාරනායක මැතිනියටත් ඇගේ බලාපොරොත්තු හා අපේක්ෂාවන්ටත් කණකොකා හැඬී ය. චන්ද්‍රිකා, මැතිනිය ගේ ළඟ ම සිටි අය ගෙන් පලිගැනීමට ද පටන් ගත්තා ය.

බණ්ඩාරනායක මැතිනිය චන්ද්‍රිකා යුගය ඇරැඹීමත් සමඟ වේදනාවෙන් හා කළකිරීමෙන් ජීවත් වූ බව කිව යුතු ය. එයට හේතු වූ ප්‍රධාන කරුණු කිහිපයක් පහත ලෙස දැක්විය හැකි ය.

1. රජයේ මැති ඇමැතිවරුන් පත්කිරීමේ දී මැතිනිය ගේ අදහස් නො සලකා හැරීම.
2. මැතිනිය බෞද්ධ කටයුතු හෝ නීතිය සාමය පිළිබඳ කිසි යම් අමාත්‍යාංශයක් බලාපොරොත්තුවෙන් සිටීම හා එවැන්නක් නො ලැබීම.
3. මැතිනිය ගෙන් නො විමසා කාර්‍ය්‍ය නියමයක් නැති ඇමැති තනතුරක් දීම.
4. පක්ෂයට මුල පටන් ම කැපවීමෙන් වැඩ කළ අයට කිසිදු තනතුරක් නො දීම.
5. මැතිනිය නම් කළ කිසිවකුට කිසිදු තනතුරක් නො දීම.
6. මාධී විජේතිලකට තනතුරක් ලබාදෙන මෙන් මැතිනිය චන්ද්‍රිකා ගෙන් පෞද්ගලික ව කිහිප විටක් ඉල්ලා සිටියත් එය ඉටු නො වී ය.
7. එච්. ජී. සිරිසේන (අකුරැස්සේ ශ්‍රී.ල.නි.ප සංවිධායක) ට තනතුරක් දෙන ලෙස මැතිනිය ඉල්ලා සිටියත් එය ඉටු නො කිරීම

8. මැතිනිය ගේ සහෝදරයා දොස්තර සීවලි රත්වත්තට තනතුරක් නො දීම.

9. සුනේත්‍රා බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය කාර්යාලයට ඒමත් නවතන ලෙස මැතිනිය ගෙන් ඉල්ලා සිටීම.

10. තමන්ට ලැබී ඇති දේපළ ප්‍රමාණ වත් නැති බව කියමින් හොරගොල්ල නිවෙස, නුවරඑළිය නිවෙස හා රොස්මිඩ් නිවෙස තම දරුවන්ට ලබා දෙන ලෙස මැතිනියට නිතර ම කරදර කිරීම.

11. මැතිනිය චන්ද්‍රිකාට හදා දුන් ගේ සඳහා මිලියන 16ක් වැය කළත් එය මිලියන 8ක් වත් වටින්නේ නැති බව කියමින් මැතිනියට දොස් නැඟීම.

12. මැතිනිය ගේ ගෙදර සිටි කිසිවකුට තනතුරක් නො දීම.

13. අනුර නැවත පක්ෂයට ගැනීමට මැතිනියට අවශ්‍ය වුවත් චන්ද්‍රිකා එයට එකඟ නො වීම.

14. අනුරට ඇමෙරිකාවේ හා කැනඩාවේ තානාපති තනතුරක් ලබා දීමට චන්ද්‍රිකා අකැමැති වීම.

15. චන්ද්‍රිකා ගේ දරුවන් අනුර සමඟ මිත්‍රව සිටියත් ඔවුනට අනුර හමු වීමට ඉඩ නො දීම.

16. හේමසිරි ප්‍රනාන්දු ටෙලිකොම් සභාපති තනතුරින් ඉවත් කිරීම.

17. කීර්ති මාවැල්ලගේ දකුණු පළාත් සභා ඡන්දයේ දී ගාල්ල දිස්ත්‍රික්කයෙන් පළමු තැනට ආවත් කිසිදු තනතුරක් නො දීම (ඒ වන විටත් මොහු අග්‍රාමාත්‍යතුමිය ගේ පෞද්ගලික ලේකම් විය)

18. හේමසිරි ප්‍රනාන්දු අග්‍රාමාත්‍ය ලේකම් තනතුරින් ඉවත් කිරීම.

19. මැතිනිය ගේ රන් ආභරණ ඉල්ලා රණ්ඩු කිරීම.

20. අගමැති තනතුර මුලින් නො දීමට උත්සාහ කිරීම.

21. අප අත්සන් කළ පෙත්සම ලැබුණ පසු වත් මැතිනිය පත් නොකර සිටීමට උත්සාහ කිරීම.

22. කිසි ම තානාපති තනතුරකට මැතිනියට හිතවත් කිසිවකු යැවීමට නො හැකි වීම.

23. මැතිනිය ගේ ප්‍රධාන ආරක්ෂක නිලධර පොලිස් අධිකාරී ජයසිංහට නියමිත උසස්වීම් නො දීම.

24. 2000 මහ මැතිවරණයට පෙර අනුර බණ්ඩාරනායක නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගෙන ඔහු පොදුජන එක්සත් පෙරමුණෙන් තරග කරවීමට හෝ තානාපති තනතුරක් දී පිටරට යැවීමට හෝ බණ්ඩාරනායක මැතිනියට අවශ්‍ය වී තිබිණි. එයට අනුර ගේ එකඟත්වයක් ද විය. එහෙත් චන්ද්‍රිකා ඒ ගැන මැතිනිය සමඟ කතා කිරීමට වත් සූදානම් නො වූවා ය.

25. විජය කුමාරතුංග ගේ මව ගේ නමට තිබූ නිවෙස විජය මැරුණු පසු බලහත්කාරයෙන් චන්ද්‍රිකා තමට ලියාගෙන එය විකුණා දැමීම ගැන ද මැතිනිය ගේ දැඩි විරෝධයක් හා කලකිරීමක් තිබිණි.

26. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිති ව තිබූ මුද්‍රණාලයේ මැෂින් ටික හොරකම් කර ගත් චන්ද්‍රිකා ඒවා ගෙන ගොස් තැබූ ප්‍රේමසිරි ගේ (ඔටෝ ලයිට් අධිපති) කඩ කාමරය ඔහුට නැවැත නො දී ජනාධිපති වරප්‍රසාද යටතේ ප්‍රේමසිරිට පවරා තිබූ නඩුවෙන් ද මඟ හැර සිටීම ගැන ද මැතිනිය දැඩි කලකිරීමෙන් හා ලැජ්ජාවෙන් කතා කළා ය.

27. චන්ද්‍රිකාට පක්ෂ කාර්යාලය විකුණා දැමීමට දැඩි වුවමනාවක් තිබිණි. අලුත් පක්ෂ කාර්යාලයක් හදන තුරු එය විකුණා දැමීමට දරන උත්සාහය ගැන මැතිනිය තදින් විරුද්ධ වූ අතර චන්ද්‍රිකා ගේ හිතුවක්කාර වැඩ ගැන ඇය ඉතා තදින් දුක් වූවා ය.

28. පියදාස මුදලාලි නොහොත් දාස මුදලාලි ගේ බැංකු ප්‍රශ්න විසඳා දෙන ලෙස මැතිනිය චන්ද්‍රිකා ගෙන් ඉල්ලූ වාර ගණන අනන්ත ය. අප්‍රමාණ ය. දාස මුදලාලිට රොනී ද මැල් මුදල් ඇමැති කාලයේ එළව එළවා පහර දෙන ලදි. ඒ දේශපාලන පළිගැනීම නිසා දාස මුදලාලි

ගේ ව්‍යාපාරික කටයුතු කඩා වැටී තිබිණි. නමුත් චන්ද්‍රිකා ද දාස මුදලාලිට රොනී මෙන් ම පහර දෙන ප්‍රතිපත්තියක් අනුගමනය කළා ය. ඒ මහජන පක්ෂයට උපකාර කිරීමට නම් මැතිනිය ඔහුට කිව යුතු බව වරක් දාස මුදලාලි ගෙන් මුදල් ආධාරයක් ඉල්ලූ විට ඔහු චන්ද්‍රිකාට කියා ඇත. එනිසා චන්ද්‍රිකා ද දාස මුදලාලිට කිසිදු සහනයක් දුන්නේ නැත. මේ ගැන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මිය යන තුරු ම දැඩි හිත්වේදනාවකින් සිටියාය.

29. මැතිනිය පී. අයි. පියදාස ගේ දරුවන්ට චන්ද්‍රිකා උදවු නො කිරීම ගැන ද දැඩි වේදනාවෙන් සිටියා ය.

30. මෛත්‍රීපාල සේනානායක මැතිතුමා 1994 ඡන්දයෙන් පසු ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගැනීමට මැතිනිය බලාපොරොත්තු වුවත් චන්ද්‍රිකා එයට ඉඩ නො දුන්නා ය. එනිසා වසර 50ක් නො කඩවා පාර්ලිමේන්තුවේ සිට ලෝක වාර්තාවක් පිහිටුවීමට ඔහුට තිබුණ අවස්ථාව නැති විය. මැතිනිය මිය යන තුරු ම ඒ ගැන කනගාටු වූවා ය.

31. චන්ද්‍රිකා මැතිනියට අග්‍රාමාත්‍ය තනතුරින් ඉවත් වන ලෙස චන්ද්‍රිකා කියන විට තව දින කිහිපයකින් එතුමිය ගේ තුන් වැනි අග්‍රාමාත්‍ය කාලය වසර 6 සම්පූර්ණ වීමට තිබිණි. එනිසා ඇයට ඉල්ලා අස්වීම දින කිහිපයකින් ප්‍රමාද කර ගැනීමට අවශ්‍ය විය. චන්ද්‍රිකා එයට අනුමැතිය නො දුන්නා ය. මැතිනිය වහා ම ඉල්ලා අස් විය. එහෙත් ඒ නිහඬ හදවත මොනතරම් වේදනා විඳින්නට ඇද්ද ?

32. ඉවසීමේ සීමාව ඉක්ම වූ මැතිනිය වරක් චන්ද්‍රිකාට දීර්ඝ ලිපියක් ලීවා ය. එය ඉවර කළේ, "නගෝ උඹ මට දැන් සනත් ගුණතිලකට තරම් වත් උපකාර නො කරයි" යනුවෙන් ප්‍රකාශ කරමිනි. එහි "උඹලා මේ පක්ෂය කඩාගෙන ගොස් පක්ෂය විනාශ කරන්න දඟලද්දී එය රැකගෙන ආවේ මම යි", යනුවෙන් ද සඳහන් කර තිබිණි.

සිය සැමියා ගේ අකල් මරණයෙන් පසු
ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරට ගත් මැතිනිය
අනන්ත නින්දා අපහාස විඳිමින්
පක්ෂය 'රැකගෙන ඉදිරියට ආවා ය.
පක්ෂය හතර වරක් දෙකකට කැඩුවේ
ඇගේ ම දරුවන් ය.

ඇයට යෝධ ශක්තියක් වූ
ඇය ආදරය කළ ඇය ගෞරවය කළ
සිය ගණනක් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයෝ
ඇයටත් පක්ෂයටත්
හතර වතාවක් අහිමි වී ගියෝ ය.

ඒ අන් කිසිවක් නිසා නො ව
සිය දරුවන් ගේ බලකාමී- ඔලමොට්ටල
වැඩ නිසාම ය.

ඒ සියල්ල ඉදිරියේ නො සැලුණු මැතිනිය
අවසානයේ දී
පක්ෂයත් බලයත් සිය දියණිය අත තැබුවේ
පුතාගේ මෝඩ කුලප්පුව ගැන ද
වේදනාවෙන් සිහි කරමිනි.
බලය ගත් දියණිය ඉදිරියේ
මේ ලක් මාතාව හඬන්නට වූවා ය.
කලකිරෙන්නට වූවා ය.
ඇගේ බලාපොරොත්තු බොඳවී ගියේ ය.

තමන් පැමිණි අති දුෂ්කර දිගු ගමනේ
තමන්ට අත දුන් පිහිට වූ අයට
තමන්ට පිහිට වූ නිසා ම
තම දියණියන් ගේ වෛරයට ගොදුරු වන සැටි බලා
ඇය කඳුළු සැලුවා ය.

තමා 9 සැරයක් උසාවි ගෙන ගිය අනුර,
තමා පක්ෂයෙන් එළවීමට දෙ වරක් සැරසුණු අනුර
ඇගේ එකම පුතා ය.

තමා ගේ එක ම පුතා අනුරට එරෙහි ව
2000 මහා මැතිවරණයේ දී
මැතිනිය පක්ෂයට ඡන්දය දුන්නේ
ගැහෙන හදින් කඳුළු පිරි දෙනෙතින් වෙවුලන
ඇඟිලි තුඩුවලිනි.

බණ්ඩාරනායක මැතිනිය ජීවත් වූ
අවසාන විනාඩියේ දීත්
තමන් ගැන අචල විශ්වාසයෙන් හැඬූ
ජනතාව දෙසට හැරුණා ය.

එහෙත්
මවක ගේ අපරිමිත දරු සෙනෙහස
ඇය මෙලොවින් සමු ගැන්වී ය.

# 06

# මහ ඇමැතිනි-අගමැතිනි-ජනපතිනි වූ චන්ද්‍රිකා ගේ ආගමනය හා බල වියරුවේ කුරිරු බව

## විජය ඝාතනයෙන් පසු

විජය කුමාරතුංග ඝාතනයෙන් පසු ව චන්ද්‍රිකා සිය දරුවන් සමඟ එංගලන්තයේ පදිංචියට ගියා ය. විජය ඝාතනය වන විටත් ඇය විජය ගෙන් බොහෝ දුරට වෙන් වී සිටියා ය. ඒ වන විට ඇය ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් මෙන් ම තමන්ට ආදරය කළ පාක්ෂිකයන් ගෙන් ද බොහෝ දුරට ඈත් ව සිටියා ය. චන්ද්‍රිකාට හා විජයටත් මහජන පක්ෂයටත් විශාල වශයෙන් ආධාර උපකාර කළ ව්‍යාපාරිකයෝ හා ළඟ ම හිතවත්තු ද ඒ වන විට චන්ද්‍රිකා අතහරිමින් සිටිය හ.

1989 වසරේ මා පාර්ලිමේන්තුවට එන විටත් චන්ද්‍රිකා සිටියේ එංගලන්තයේ යි. ඒ වන විටත් දරු දෙදෙනා එහි අධ්‍යාපන කටයුතු අරඹා තිබිණි.

චන්ද්‍රිකා රටින් පිට වී ටික කලකින් මහජන පක්ෂයේ බලය ඇයට අහිමි විය. විජය ජීවත් වූ අවසාන කාලය වන විටත් මහජන පක්ෂය තරමක් දුර්වල වී තිබුණත් සමසමාජ කොමියුනිස්ට් පක්ෂ හා සන්සන්දනය කළ විට ඉදිරියෙන් විය. එසේ ම මහජන පක්ෂයට විශාල පළාත් සභා මන්ත්‍රීවරු පිරිසක් ද සිටිය හ.

ටී.බී. ඉලංගරත්න මහතා පක්ෂ සභාපති තනතුරෙන් ඉවත් වූයේ 1986 වසරේ දී ය. ඉන් පසු උප සභාපති ලෙස සිටි චන්ද්‍රිකා සභාපති විය. පසු ව මහජන පක්ෂය සිය පක්ෂ ව්‍යවස්ථාව වෙනස් කර විජය ජාතික සංවිධායක කර, ජාතික සංවිධායකවරයා

පක්ෂයේ නායකවරයා ලෙස නම් කරන ලදි. එයින් පැහැදිලි වන්නේ ඒ වන විටත් මහජන පක්ෂය චන්ද්‍රිකා පිළිබඳ ව බලාපොරොත්තු අතහැර තිබූ බව යි.

විජය ඝාතනය කළේ 1988 පෙබරවාරි 16 වැනි දින යි. ඝාතකයා ජනතා විමුක්ති පෙරමුණ යි. මිනී මරුවා හසු විය. ඔහු ගේ පොලිස් කට උත්තරයෙන් ඔහු විජය ඇතුළු තවත් ඝාතන විශාල ගණනක වගකීම භාර ගෙන ඇත.

විජය ඝාතනය වූයේ ය. චන්ද්‍රිකා රටින් පැන ගියා ය. ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායකත්වයට ඔසී අබේගුණසේකර පත් වූයේ ය. ඉන් පසු චන්ද්‍රිකා රාජිත හා රෙජිනෝල්ඩ් කුරේ එක් ව බහුජන නිදහස් පෙරමුණ නමින් නව පක්ෂයක් පිහිටුවා ගත් හ. රාජිත හා කුරේ බහුජන නිදහස් පෙරමුණ ගොඩනැඟීමට විශාල වෙහෙසක් දැරූ හ. රත්නසිරි වික්‍රමනායක මහතා ද මේ නව පක්ෂයට එකතු විය. ඒ වන විට ශ්‍රී ලංකා මහජන පක්ෂය අනුර බණ්ඩාරනායක ගේත් ආර්.ප්‍රේමදාස අගමැතිවරයා ගේත් ආධාර ලබමින් ශක්තිමත් ව තිබිණි

88 ජනාධිපතිවරණයට මහජන පක්ෂයෙන් ඔසී අබේගුණසේකර තරග වැදුණි. ඔසී තරග කළේ එ.ජා.ප අපේක්ෂක ප්‍රේමදාස මහතා ගේ පූර්ණ අනුග්‍රහය යටතේ යි. ඔසී තරග කරවීමේ එක ම අරමුණ වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ ඡන්ද කැඩීම යි. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ටත්, රාජිත, කුරේ, රත්නසිරි වික්‍රමනායක වැනි අයටත් මැතිනිය ගේ සහායට චන්ද්‍රිකා ගෙන්වා ගැනීමට අවශ්‍ය විය. එහෙත් අම්මා ගේ සහායට චන්ද්‍රිකා පැමිණියේ නැත. එම මැතිවරණයෙ 'දී මැතිනිය පරාජය කිරීමේ තීරණාත්මක සාධකය වූයේ ජේ.වී.පී භීෂණය හා ඔසී අබේගුණසේකර තරග කිරීම යි.

ජනාධිපති මැතිවරණයෙන් පසු ඔසී ජනාධිපති ප්‍රේමදාස මහතා ගේ ප්‍රධාන ආධාරකරුවෙක් බවට පත් වූයේ ය.

1990 වන විට ජනතා විමුක්ති පෙරමුණේ භීෂණ යුගය අවසන් වෙමින් පැවැතිණි. ප්‍රේමදාස රජය ශක්තිමත් වෙමින් පැවැතිණි.

මේ වන විට මම ශ්‍රී.ල.නි.ප පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්මි. ජනාධිපතිවරණය අවසාන වීමත් සමඟ මැතිනිය ගේ ලියකියවිලි කටයුතුවලට උපකාර කරමින් සිටි කීර්ති මාවැල්ලගේ මරණ තර්ජන

නිසා ම රටින් පිට විය. එනිසා මම නිතර මැතිනිය මුණගැසී ඇයට උදවු උපකාර කිරීමට පුරුදු වීමි.

1990 වන විටත් මැතිනිය පක්ෂයට නව ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු ආරම්භ කර තිබිණි. එසේ ම එ.ජා.ප විරෝධී පුළුල් පෙරමුණක් හැදීමේ උත්සාහයක ද ඇය නිරත වූවා ය. මම ඇය වෙනුවෙන් බොහෝ සංවිධාන කටයුතු මෙහෙය වීමි.

මැතිනිය ගේ පෙරමුණු අදහස ඒ අවස්ථාවේ අප කළ යුතු ප්‍රධාන ම දේ ලෙස මම ද විශ්වාස කෙළෙමි. එනිසා සමසමාජ, කොමියුනිස්ට්, මහජන පක්ෂය, බහුජන නිදහස් පෙරමුණ, දේශවිමුක්ති ජනතා පක්ෂය, මහජන එක්සත් පෙරමුණ ආදී පක්ෂ නායකයන් පෞද්ගලික ව මුණගැසෙමින් මේ සඳහා මම කැපවීමි. මේ සඳහා අලෙවි මවුලානා, අ. ම. කරුණාරත්න, නන්දිමිත්‍ර ඒකනායක, ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ ද විශාල වෙහෙසක් ගත් හ. ධර්මසිරි සේනානායක, අනුරුද්ධ රත්වත්ත, කේ.බී. රත්නායක, ලක්ෂ්මන් කිරිඇල්ල වැනි අය ද පෙරමුණ ගොඩනැඟීමට මැතිනියට පක්ෂපාති මතයක වූ හ. අනුර බණ්ඩාරනායක මහතා පෙරමුණ හැදීමට සම්පූර්ණයෙන් විරුද්ධ වූයේ ය. එවකට පක්ෂයේ මහ ලේකම් ව සිටි ජේ.ආර්.පී.සූරියප්පෙරුම මහතා පෙරමුණ ගොඩනැඟීමට පක්ෂ ස්ථාවරයක සිටියේ ය. එහෙත් අනුර නිසා ඔහු අපට සහායක් නො දැක්වූයේ ය. මහින්ද රාජපක්ෂ මහතා ද පෙරමුණට පක්ෂ ස්ථාවරයක විය. එහෙත් ඔහු ද අනුරට විරුද්ධ ව නො යන ලෙස අපට ද තදින් අවවාද කළේ ය. දි.මු. ජයරත්න, සී.වී.ගුණරත්න, හේමකුමාර නානායක්කාර, හලීම් ඉෂාක්, අනිල් මුණසිංහ වැනි අය පෙරමුණ හැදීමට සම්පූර්ණයෙන් විරුද්ධ මතයක වූ හ. එසේ ම මේ සියලු දෙනා අනුරට දැඩි පක්ෂපාතී බවක් දැක්වූ හ.

1990 මැද භාගය වන විට මැතිනිය සමඟ අපි පෙරමුණ හැදීමට වෙහෙසුණෙමු. ඒ අතර අනුර විසින් මැතිනිය ගෙන් පක්ෂ නායකත්වය ඉල්ලා සටනක් ආරම්භ කරන ලදි. ඒ සටනට පක්ෂ මහ ලේකම් සූරියප්පෙරුම ද, මහින්ද රාජපක්ෂ ඇතුළු අනුරවාදියෝ සම්පූර්ණයෙන් පක්ෂ වූ හ.

අනුර - මැතිනිය සටනේ දී පක්ෂයේ ජ්‍යෙෂ්ඨ වැඩි දෙනෙක් නිහඬ වූ හ. සූරි - මහින්ද ඇතුළු බලවත් පිරිසක් කෙළින් ම අනුරට

පක්ෂපාති වූ හ. මැතිනියට පක්ෂ ව සිටියේ සුළු පිරිසකි. මන්ත්‍රී කණ්ඩායමේ ද බහුතරයක් නිහඬ වූ හ. ප්‍රබල පිරිසක් අනුරට පක්ෂ වූ හ. ඉතා සුළු පිරිසක් මැතිනියට පක්ෂ වූ හ. මෙහි දී මම, මංගල, ජෙයරාජ්, නන්දිමිත්‍ර, නිමල් සිරිපාල, අලෙවි මවුලානා, අ.මෙ. කරුණාරත්න පමණක් එළිපිට ම මැතිනියට පක්ෂ ව සිටියෙමු. අනුරුද්ධ, ධර්මසිරි, කේ.බී., රිචඩ් පතිරණ පක්ෂ වුවත් අනුර කණ්ඩායම සමඟ ගැටුමකට සූදානම් නො වී ය.

පක්ෂයට පිටින් සිටි හේමසිරි ප්‍රනාන්දු, වික්ටර් අයිවන් ද මැතිනියට අතිවිශාල සහයෝගයක් ලබා දුනි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකත්වය අනුර බණ්ඩාරනායකට බාරදීම ගැන මට පෞද්ගලික ව ගැටලුවක් නො වී ය. කවරදා හරි ඔහු පක්ෂය බාර ගත යුතු බව මගේ ද මතය විය. එහෙත් මේ අවස්ථාවේ අනුර නායකත්වය ගත හොත් පක්ෂය විනාශ වේ යැයි අවංක බියකින් මම පසු වීමි. එසේ ම අනුර වමේ පක්ෂ හා පෙරමුණකට ඒමට සූදානම් නැති නිසා පක්ෂයට අනාගතයේ හෝ බලය ගත නො හැකිවනු ඇතැයි මම කල්පනා කළෙමි.

එදා මගේ ප්‍රධාන උත්සාහය වූයේ මැතිනිය ගේ නායකත්වයෙන් නව පෙරමුණක් හැදීම යි. අනුර සමඟ එය කළ නො හැකි ය. අනුර ද එයට සූදානම් නැත. වමේ පක්ෂවල ද අනුර ගැන කිසිදු විශ්වාසයක් නො තිබිණි. එනිසා, මම රාජිත, රාජා කොල්ලුරේ හා තිහාල් පෙරේරා හා එක් ව පෙරමුණ ගොඩනැඟීමේ කටයුතු මෙහෙය වීමි.

## චන්ද්‍රිකා හමුවීම

පෙරමුණු සාකච්ඡා ඉදිරියට ඇදෙන අතර අනුර අපට එරෙහි විය. ඔහු අපට ප්‍රසිද්ධියේ තර්ජනය කරන මට්ටමට පැමිණියේ ය. මැතිනියට එරෙහි ව පක්ෂය තුළ ප්‍රසිද්ධියේ ම කතා කිරීමට අනුර කණ්ඩායම පටන් ගෙන තිබිණි.

මේ කාලයේ චන්ද්‍රිකා නිවාඩුවකට ශ්‍රී ලංකාවට පැමිණියා ය. චන්ද්‍රිකා මට හඳුන්වා දෙන ලද්දේ රාජිත විසිනි. ඒ 1991 අගභාගයේ දී යි. ඒ වන විට ඇයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එක් වීමට කිසිදු අදහසක් නො වුණි. ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගැනීමට මැතිනිය සූදානම් නැති බව ඇගේ මතය විය. මැතිනිය

කැමැති වුවත් අනුර එයට ඉඩ නො දෙන බව චන්ද්‍රිකා තදින් විශ්වාස කළා ය.

ජනාධිපතිවරණයේ දී ඇගේ මහජන පක්ෂය මැතිනියට හා පක්ෂයට කළ හානිය මැතිනිය හෝ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් හෝ අමතක කිරීමට සූදානම් නැති බව චන්ද්‍රිකා තේරුම් ගෙන තිබිණි. ඒ මැතිවරණයේ දී චන්ද්‍රිකාට අම්මා වෙනුවෙන් ශ්‍රී.ල.නි. ප. වේදිකාවට ඒමට කිසිදු බාධාවක් නො වී ය. ඒ වන විට ඇය සිටි අලුත් පක්ෂයේ රාජිත - කුරේ - රත්නසිරි ආදීහු චන්ද්‍රිකා, මැතිනිය ගේ වේදිකාවට ගෙන ඒමට විශාල උත්සාහයක් ද දැරූ හ. එහෙත් චන්ද්‍රිකා නො පැමිණියා ය. එනිසා අප ඇයට වහා ම ශ්‍රී.ල.නි.ප යට බැඳෙන ලෙස කියද්දීත් එයට එකඟ වීමට තරම් ආත්ම ශක්තියක් ඇය තුළ නො වී ය.

ඇයත්, රාජිතත්, කුරේත් නිතර ම කීවේ "ගොඩනැඟෙන නව පෙරමුණ හරහා ඇය දේශපාලනයට ගත යුතු බව යි."

මා හමු වූ පළමු දිනයේ ම චන්ද්‍රිකා මා හා දැඩි මිත්‍රත්වයක් ඇති කර ගත්තා ය. ඊට පසු දින අපි නැවත පාර්ලිමේන්තුවේ දී හමු වීමු. ඇය පාර්ලිමේන්තුවට ගෙන එන ලද්දේ ද රාජිත විසිනි .

එදින ඇය මහජන පක්ෂයේ සියලු දෙනාට දැඩි ලෙස පහර දුනි. මැතිනිය, ධර්මසිරි, කේ.බී., අනුරුද්ධ වැනි ශ්‍රී.ල.නි. ප. ජ්‍යෙෂ්ඨයන්ට ද විවිධ චෝදනා එල්ල කළා ය. අනුරට ඉතා මත් පහත් කතා කියමින් ඔහු ගේ පෞද්ගලික ජීවිතයට පවා පහර දෙන ලදි. මහින්ද රාජපක්ෂට ද ඇගෙන් ඊට නො දෙ වැනි ප්‍රහාරයක් එල්ල විය. ටී.බී. ඉලංගරත්න හා විජය කුමාරතුංග ද ඇගේ ප්‍රහාරයට හසු වූ හ.

## අනුරට පක්ෂය භාරදීම හා පෙරමුණු සාකච්ඡා බිඳ වැටීම

අපේ පෙරමුණු සාකච්ඡා යන අතරේ කේ. බී. රත්නායක හා අනිල් මූණසිංහ ගේ මෙහෙයවීමෙන් තවත් සාකච්ඡාවක් රහසිගත ව දියත් ව තිබිණි. සාකච්ඡා කෙරුණේ මැතිනිය හා අනුර සමඟ වෙන් වෙන් ව ය. අරමුණ අනුර-මැතිනි අර්බුදය විසඳීම යි.

මැතිනිය මේ ගැන අප සමඟ ද කිසිවක් ප්‍රකාශ නො කිරීමට පරිස්සම් වූවා ය.

සාම සාකච්ඡා සාර්ථක විය. වහා ම පක්ෂ සම්මේලනයක් කැඳවීමටත් එය සංවිධාන කිරීම අනුරට බාරදීමටත් සම්මේලනයේ දී මැතිනිය සභාපති තනතුරින් ඉවත් වීමටත් එකඟ වී තිබිණි. මැතිනිය තව දුරටත් නාමික පක්ෂ නායිකාව වන අතර සියලු වගකීම් හා බලතල අනුරට භාර දේ. නමුත් මී ළඟ ජනාධිපතිවරණයේ ජනාධිපති අපේක්ෂිකාව මැතිනිය යි. එයට අනුර එකඟ වී තිබිණි.

මැතිනිය සියලු දෑ තීරණය කිරීමෙන් පසු ඇයට ළඟින් ම සිටි අය කුඩා කණ්ඩායම් වශයෙන් කැඳවා තත්ත්වය පැහැදිලි කිරීමට පටන් ගත්තා ය. ඇය මා, මංගල, අලෙවි මවුලානා, අ.ම. කරුණාරත්න, නන්දිමිත්‍ර, ජෙයරාජ්, නිමල් සිරිපාල එකට කැඳවා මුලින් ම මේ තත්ත්වය පැහැදිලි කළා ය.

අපි ඇගෙන් පෙරමුණ ගැන විමසුවෙමු. එවිට ඇය කීවේ එය අනුර සමඟ කතා කර ගත යුතු බව යි. ඒ සමඟ ම අනුර පෙරමුණට එකඟ නොවනු ඇති බව ද ඇය කීවා ය. එහි දී මම එහි අනතුර ඇයට පැහැදිලි කිරීමට උත්සාහ කළෙමි. එහි දී මැතිනිය අපට ප්‍රකාශ කළේ "මට තව දුරටත් දරුවෝ සමඟ සණ්ඩුවෙන්න බැහැ එස්.බී" යනුවෙනි. මම නැවතත් "මැතිනිය ඔබ පක්ෂයේ වගකීම් සියල්ල අනුරට බාරදුන් පසු ලබන ජනාධිපතිවරණයේ දී ඔබතුමියට අපේක්ෂකත්වය දෙයි කියා තියෙන විශ්වාසය කුමක් ද?" යනුවෙන් ඇගෙන් ඇසීමි. එවිට මැතිනිය කීවේ "එහෙම කරන්න ඔහු පොරොන්දු වූ බව යි."

අනුර සංවිධාන කටයුතු ඇරැඹුවේ ය. පෙරමුණු සාකච්ඡා බිඳ වැටුණි. මහජන එක්සත් පෙරමුණ හා මහජන පක්ෂය අනුරට සමීප විය. සමසමාජ කොමියුනිස්ට් මහජන හා දේශ විමුක්ති පක්ෂ විසින් සාකච්ඡා අතහැර දමන ලදි.

අනුර දිස්ත්‍රික් මට්ටමේ රැස්වීම් මාලාවක් ආරම්භ කළේ ය. ඒ කිසිවක මැතිනිය ගැන මතක් කළේ වත් නැත. අනාගත ජනාධිපති අනුර ලෙස කථිකයෝ කවුරුත් අනුර හඳුන්වා දුන් හ. මහින්ද, හේමකුමාර, දි.මූ, අනිල් බර්ටි දිසානායක වැනි අය ඔහු ගේ රැස්වීම්වල ප්‍රධාන කථිකයෝ වූ හ.

දිසා රැස්වීම් 3-4ක් පවත් වන විට රට පුරා පාක්ෂිකයෝ අනුරට විරුද්ධ ව මැතිනියට පැමිණිලි කිරීම ආරම්භ කළ හ. අනුර-මැතිනි අර්බුදය සමථයට පත් කිරීමට කතා කළ කේ. බී. සහ අනිල්

ද අනුර ගේ ව්‍යාපාරය තුළ මැතිනියට කිසි ම තැනක් නැති බව තේරුම් ගත් හ. කේ. බී. මේ ගැන අනුර සමඟ කතා කරන්නට ගොස් ප්‍රතිඵලය වූයේ ඔහු ගෙන් හොඳ හැටි බැණුම් ඇසීම යි.

අනිල් හා කේ.බී. මැතිනිය හමුවී තත්ත්වයේ භයානකකම පැහැදිලි කළ හ.

මැතිනිය තදින් කිපුණා ය. ඇය වහා ම පක්ෂයේ මධ්‍යම කාරක සභාව කැඳවා අනුර-මැතිනි ගිවිසුම අහෝසි කරන බව දැන්වූවා ය. අනුර කණ්ඩායම ගෙන යන කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ හා රැස්වීම් වහා ම නතර කරන ලෙස මැතිනිය ගෙන් නියෝග යැවිණි.

## නැවත පෙරමුණු සාකච්ඡා සහ චන්ද්‍රිකා පක්ෂයට ගැනීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම

අනුර-මැතිනි අතර නැවත ගැටුම් උත්සන්න වී ගෙන එන විට මා, අලෙවි මවුලානා, අ.ම කරුණාරත්න, හේමසිරි ප්‍රනාන්දු පෙරමුණ ගොඩනැගීමේ ව්‍යාපාරයත් චන්ද්‍රිකා පක්ෂයට ගැනීමේ ව්‍යාපාරයත් ආරම්භ කළෙමු. මංගල, නන්දිමිත්‍ර, නිමල්, ජෙයරාජ් ද සටනට එක් වූ හ. අනුරුද්ධ, කේ.බී., ධර්මසිරි, රිචඩ් පතිරණ, අනිල් ද අපේ සහායට එක් වූ හ.

නැවත සියලු වමේ පක්ෂ කැඳවා පෙරමුණ ගොඩනැගීමට සාකච්ඡා ඇරැඹී ය. මහජන එක්සත් පෙරමුණ සාකච්ඡාවලට සහභාගී නො වී ය.

අනුර බණ්ඩාරනායක හා මහලේකම් සූරියප්පෙරුම චන්ද්‍රිකා ගැනීමට තදින් විරුද්ධ වූ හ.

මැතිනිය විශාල කැපවීමකින් පෙරමුණ හැදීමට උනන්දු වූ අතර චන්ද්‍රිකා පක්ෂයට ගැනීමට ඇය ද විරුද්ධ වූවා ය. ඒ සඳහා මැතිනිය ප්‍රධාන කරුණු 6ක් ඉදිරිපත් කළා ය.

1. චන්ද්‍රිකා විජය සමඟ එකතු වී පක්ෂය කැඩීම.
2. චන්ද්‍රිකා පක්ෂයට අයත් ව තිබූ මුද්‍රණාලයේ මැෂින් සොරකම් කිරීම.
3. චන්ද්‍රිකා නිතර ම බොරු කීම.

4. වේලාවට වැඩක් කළ නො හැකි වීම.
5. චන්ද්‍රිකා 88 ජනාධිපතිවරණයට උදවු නො කිරීම.
6. චන්ද්‍රිකා පක්ෂයට ආවොත් අනුර සමඟ විශාල ගැටුමක් ඇති වන බව කීම.

මේ අතර මගේ මතය වූයේ චන්ද්‍රිකා ඉතා ඉක්මනින් පක්ෂයට ගත යුතු බව ය. එයට හේතු කිහිපයක් විය.

1. වේගයෙන් පක්ෂය තුළ මැතිනිය ගේ ශක්තිය දුර්වල වීම.
2. පක්ෂය තුළ අනුර පිල වේගයෙන් ශක්තිමත් වීම.
3. අනුර ශක්තිමත් වීම තුළ වමේ පෙරමුණ සිහිනයක් වීම.
4. පෙරමුණ ගොඩනැඟීමට මැතිනිය ශක්තිමත් ලෙස නායකත්වයේ සිටීම අත්‍යවශ්‍ය වීම.
5. පෙරමුණක් නොමැතිව එක්සත් ජාතික පක්ෂය පරාජය කළ නො හැකි බව මා තදින් විශ්වාස කිරීම.
6. චන්ද්‍රිකා පක්ෂයට ගැනීමෙන් මැතිනිය ශක්තිමත් කිරීමේ හා අනුර දුර්වල කිරීමේ ව්‍යාපාරය ශක්තිමත් කිරීමට හැකි වීම.

මගේ මතය දැරූ විශාල පිරිසක් පක්ෂය තුළ වූ හ. එහෙත් අනුරට එරෙහි ව ප්‍රසිද්ධියේ කතා කිරීමට ඔවුහු බිය වූ හ.

අපේ මතය මැතිනියට ඒත්තු ගැන්වීම පහසු කටයුත්තක් නො වී ය. මැතිනියට අවශ්‍ය වී තිබුණේ චන්ද්‍රිකා නො ගෙන අනුර පිල දුර්වල කිරීමට යි. ඒ සඳහා ඇය සියලු උත්සාහයන් දැරුවා ය. එහෙත් ඒ කිසිවකින් අප බලාපොරොත්තු වන ප්‍රතිඵල ලබා ගත නො හැකි විය.

අනුර හා ඔහු ගේ කණ්ඩායම දුර්වල කිරීමට මැතිනියට තිබුණ ශක්තිය හොඳට ම ප්‍රමාණ වත් විය. එහෙත් ඒ සඳහා බණ්ඩාරනායක මැතිනියට පාවිච්චි කිරීමට තිබූ හොඳම ආයුධය ඇය පාවිච්චි නො කළා ය. අනුර තම සියලු ශක්තින් ගොඩනගා ගත්තේ මැතිනිය ගෙන් පසු තමාට පක්ෂ නායකත්වය අනිවාර්යයෙන් හිමි වන බව පෙන්වීමෙනි. මැතිනිය ද ඒ මතය එලෙස ම නො සැලී සනාථ

කළා ය. මැතිනිය "මගෙන් පසු මටත්, මගේ පක්ෂයටත් මෙතරම් හතුරුකම් කරන අනුරට මේ පක්ෂය භාර දෙන්න මම සූදානම් නැහැ" යැයි කීවා නම් අනුර ගේ ශක්තිය නිමේෂයකින් බිංදුවට වැටෙනු ඇත. එහෙත් මැතිනිය නො කඩවා ම කීවේ "මගෙන් පසු මේ ළමයාට මේ පක්ෂය ලැබෙනවා. එයා කලබල වෙන්න හොඳ නැහැ. හදිසි වෙන්න හොඳ නැහැ" යන්න ම ය.

මැතිනිය විසින් පක්ෂ මධ්‍යම කාරක සභාව තුළ තම ශක්තිය වැඩි කර ගැනීමට මාත්, නිමල් සිරිපාලත්, මංගලත් මධ්‍යම කාරක සභාවට පත් කෙරිණි. මටත්, නිමල්ටත් පක්ෂයේ උපලේකම් තනතුරු දෙකක් ම පිරිනැමිනි.

පක්ෂයේ මහලේකම් සූරියප්පෙරුම අනුර පිලේ සියලු විරෝධතා නො තකා ඉවත් කළේ ය. ඒ වෙනුවට මහින්ද රාජපක්ෂ හා හලීම් ඉෂාක් අනුර ගේ නම යෝජනා කළ හ. මැතිනිය එයට තදින් විරුද්ධ වූවා ය. ඇය ගේ අදහස වූයේ සූරි ඉවත් කළ වහා ම ධර්මසිරි ගේ නම යෝජනා කිරීම ය. ඊට කේ. බී. රත්නායක එකඟ වී සිටියත් අනුර ගේ නම යෝජනා වූ නිසා ඔහු නිහඬ වූයේ ය. ඒ අවස්ථාවේ මම ධර්මසිරි සේනානායක ගේ නම යෝජනා කළෙමි. අලෙවි මවුලානා එය ස්ථිර කළේ ය.

අනුර ඡන්දයක් පවත්වන ලෙස ඉල්ලී ය. ඒ අවස්ථාවේ ඡන්දය පැවැත් වූයේ නම් අනුර ස්ථිර ලෙස ජය ගනු ඇත. එහෙත් ඒ සමඟ ම නැඟී සිටි ධර්මසිරි මට බණ්ඩාරනායකලා සමඟ තරග කරන්න බැහැ යැයි කියමින් ඉල්ලා අස් වෙනවා යනුවෙන් කීවේ ය. එහි දී ද මැතිනිය අනුර ලේකම් වනවාට තමන් කිසි සේත් එකඟ නැති බව කියමින් තම ස්ථාවරයේ තදින් සිටියා ය. අවසානයේ පැය ගණනක උණුසුම් වාදයකින් පසු රිචඩ් පතිරණ ගේ යෝජනාවක් අනුව සතියකට ධර්මසිරි මහ ලේකම් කිරීමට අනුර කණ්ඩායමේ ද අනුමැතිය ලැබුණි. ධර්මසිරි මිය යන තුරු ම ඒ තනතුර දැරී ය. ඔහු ගෙන් පසු ඒ තනතුරට මම පත් වීමි.

මැතිනිය ක්‍රමයෙන් තම බලය පක්ෂය තුළ තහවුරු කර ගනිමින් සිටියා ය. සූරි ඉවත් කර ධර්මසිරි පත් කර ගැනීම අනුර පිලේ විශාල පරාජයකි.

මේ අතර වමේ පක්ෂවල නායකයන් ගේ මතය වුණේත් චන්ද්‍රිකා වහා ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පැමිණිය යුතු බව යි.

කේ. පී., ඩිව්, බර්නාඩ්, බැටී, නිහාල් පෙරේරා වැනි අය මේ ගැන මැතිනියට ද කතා කර තිබිණි. එහෙත් ඇය එයට එකඟ වූයේ නැත.

මේ අවස්ථාවේ චන්ද්‍රිකා පිළිබඳ මැතිනිය ගේ දැඩි මතය වෙනස් කිරීමට හේමසිරි ප්‍රනාන්දු හා වික්ටර් අයිවන් ද අමිල මෙහෙයක් සිදු කළ හ. "ලංකාදීප" යේ චූලවංශ සිරිලාල් ද "බී.බී.සී" සේවයේ වරුණ කරුණාතිලක ද මේ වෙනුවෙන් කැප වූ හ.

අවසානයේ මැතිනිය, චන්ද්‍රිකා පක්ෂයට ගැනීමට ඇය සමඟ සාකච්ඡා කිරීමට එකඟ වූවා ය. ඒ වන විට මැතිනිය හා චන්ද්‍රිකා අතර මව හා දියණිය ගේ සම්බන්ධතා පැවතුණත් කිසිදු දේශපාලන සම්බන්ධයක් නො වී ය.

චන්ද්‍රිකා රොස්මිඩ් ඉඩමේ ම පැත්තක ජීවත් වුවත් මැතිනිය චන්ද්‍රිකා සමඟ සාකච්ඡාවට තෝරා ගත්තේ නුවරඑළිය යි. මැතිනිය ගේ උපදෙස් පරිදි මම නුවරඑළියේ සෙන්පති නිවෙස දින තුනකට සම්පූර්ණයෙන් වෙන් කරවා ගතිමි. සාකච්ඡාවට කේ. බී., අනුරුද්ධ, ධර්මසිරි හා මංගලටත් ආරාධනා කරන ලෙස මට උපදෙස් ලැබුණි.

මමත්, මගේ බිරිඳ තමරාත් මැතිනිය සමඟ නියමිත දින උදේ ම නුවරඑළිය බලා පිටත් වීමු. අපි දිවා ආහාරයට නුවරඑළියට ළඟා වීමු. ටික වේලාවකින් මංගල ද පැමිණියේ ය. සාකච්ඡාව යොදා ගෙන තිබුණේ එදා සවස හතරට යි. චන්ද්‍රිකාට එම සාකච්ඡාවට ඇගේ බහුජන නිදහස් පෙරමුණේ කිහිපදෙනකුට ආරාධනා කිරීමට අවශ්‍ය විය. චන්ද්‍රිකා එය මට දැන්වූවා ය. මම මැතිනිය ගෙන් විමසුවෙමි. චන්ද්‍රිකා හැර ඇය ගේ පක්ෂයේ වෙන කිසිවකු එම සාකච්ඡාවට සහභාගි කර ගැනීමට මැතිනිය එකඟ කරගත නො හැකි විය.

සාකච්ඡාව හතරට තිබුණත් චන්ද්‍රිකා නුවරඑළියේ සෙන්පති නිවෙසට පැමිණියේ රාත්‍රී 11 1/2ට යි. රාත්‍රී 9.30 වන තුරු බලා සිටි මැතිනිය අප සමඟ රාත්‍රී භෝජනයට වාඩි වූවා ය.

කෑම මේසයේ ඉඳගනිමින් බණ්ඩාරනායක මැතිනිය සිනාසෙමින් කියූ දේ මට අදත් මැවී පෙනේ. "එස්. බී. මම ඔයාට කිව්වා නේ ද චන්ද්‍රිකා එක්ක වැඩ කරන්න බැහැ කියා. බලන්න, දැන් වේලාව කීය ද කියලා. දැන් ඇවිත් ලොකු බොරුවක් කියයි. කොහොම ද මෙයත් එක්ක වැඩ කරන්නේ" එසේ කියූ මැතිනිය හයියෙන් සිනාසුණා ය.

මේ වන විටත් මට චන්ද්‍රිකා ගැන එතරම් අවබෝධයක් නො වී ය. රාත්‍රි කෑමෙන් පසු මම රාජිතට කතා කර මේ ප්‍රමාදය ගැන කීවෙමි. ඒ වන විටත් රාජිත අපෙන් වෙන් වී සිටිය හ. රාජිත හයියෙන් සිනාසී මට කිව්වේ "එස්. බී. උඹ චන්ද්‍රිකා ගැන දන්නේ නැහැනේ. එයා සමඟ වැඩ කරන කොට ඔය දුක විඳින්න ඕන. විජයට තිබුණ ලොකු ම ප්‍රශ්නයත් ඕක තමයි. ඔය කැත පුරුද්ද නිසා එයත් නැති වෙනවා. එයා ඉන්න පක්ෂයත් නැති වෙනවා." යනුවෙනි. චන්ද්‍රිකා ගේ නිවෙසේ දුරකථනයට කතා කළත් කිසිවකු එයට පිළිතුරු දුන්නේ නැත. පසු ව මම මැතිනිය ගේ ගෙදරට කතා කර තොරතුරු සොයා බැලුවෙමි. එහි දී දැනගන්නට ලැබුණේ චන්ද්‍රිකා ගෙදරින් පිටවුණේ රාත්‍රී 7.30ට පමණ බව ය. ඒ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා සවස 4.00ට සංවිධාන කළ තීරණාත්මක සාකච්ඡාව යි. එම සාකච්ඡාවට කේ. බී., අනුරුද්ධ, ධර්මසිරි පැමිණ ආපසු යෑමට සිදු වූයේ නම් තත්ත්වය කුමක් ද?

චන්ද්‍රිකා ගේ මේ අරුම පුදුම පිළිකුල් සහගත ප්‍රමාදය ගැන පළමුවරට මා දැන ගත්තේ එදා ය. මහ ඇමැතිනිය, අගමැතිනිය ජනාධිපතිනිය, සාක් සභාපතිනිය වුවත් කිසි දා මේ කැත පුරුද්ද නැති කර ගැනීමට ඇය අසමත් වූවා ය. අදටත් ඇය අසමත් ය. මේ නිසා ම ඇය අපේ රට ලෝකය ඉදිරියේ, රාජ්‍ය නායකයන් ඉදිරියේ නින්දාවට ලක් කළ අවස්ථා අනන්ත අප්‍රමාණ ය.

## චන්ද්‍රිකා හා බහුජන නිදහස් පෙරමුණේ අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගැනීම

චන්ද්‍රිකා එදින නුවරඑළියට ආවේ රාත්‍රී .11 1/2 ට පමණ ය. පසු දින උදේ 10ට මැතිනිය, මම, මංගල හා තමරා එක් ව චන්ද්‍රිකා සමඟ සාකච්ඡාව ඇරැඹුවෙමු.

සාකච්ඡාව ආරම්භයේ මැතිනිය චන්ද්‍රිකාට පසු ගිය සිදු වීම් මතක් කරමින් දිගින් දිගට ම දෝෂාරෝපණය කළා ය. පක්ෂයේ මුද්‍රණාලය සොරකම් කිරීම ගැන තදින් දොස් පැවරුවා ය. ඇය පක්ෂයට කළ හානිය එකින් එක විස්තර කළා ය. 88 ජනාධිපතිවරණයේ දී ඇය ගේ යුතුකම් පැහැර හැරිය බව ද කීවා ය.

අවසානයේ මැතිනිය චන්ද්‍රිකා අත්තනගල්ලෙන් පක්ෂයට ගැනීමට එකඟ වූවා ය. ඇය සමඟ එන වෙනත් කිසිවෙක් කෙළින් ම පක්ෂයට ගත නො හැකි බව කීවා ය. ඒ සියලු දෙනාට තම තමන් ගේ ආසනවලින් පක්ෂයට එකතු වන ලෙස උපදෙස් දුන්නා ය. මැතිනිය මේ සියල්ලට එකඟ වූයේ එක් කොන්දේසියක් මත යි. මැතිනිය ගෙන් පසු අනුර ගේ නායකත්වය පිළිගත යුතු බවටත් අනුරට උදවු කරමින් පක්ෂයේ වැඩ කටයුතු කළ යුතු බවටත් ඇය චන්ද්‍රිකා ගෙන් පොරොන්දුවක් ලබා ගත්තා ය. චන්ද්‍රිකා එදා එයට සම්පූර්ණයෙන් එකඟ වූවා ය.

මටත්, මංගලටත් ඊ ළඟ ප්‍රශ්නය මතු වූයේ චන්ද්‍රිකා ගේ හිතවතුන් පක්ෂයට ගැනීම යි. ශාන්ත ප්‍රේමරත්න අනුරාධපුරයෙන් ගැනීමට බර්ටි එකඟ විය. අනෙක් බොහෝ දෙනෙකු අදාළ ආසනවලින්, දිස්ත්‍රික්කවලින් බඳවා ගැනීමට සංවිධායකයන් එකඟ කර ගැනීමට නො හැකි විය. ඒ සියලු දෙනා කීවේ අනුර අමනාප වන නිසා එය කළ නො හැකි බව යි. එනමුත් සැබෑ කරුණ චන්ද්‍රිකා සමඟ එන පිරිසට එවකට සිටි ශ්‍රී.ල.නි.ප. සංවිධායකයන් බිය වීම යි.

මේ නිසා බහුජන නිදහස් පෙරමුණේ චන්ද්‍රිකා සමඟ පක්ෂයට පැමිණි අනෙක් අය මංගල ගේ හා මගේ ආසනවලින් බඳවා ගැනීමට අපි තීරණය කෙළෙමු. ඒ අනුව රෙජිනෝල්ඩ් කුරේ, ඩිලාන් පෙරේරා, ජීවන් කුමාරණතුංග, ගුණසිරි සූරියප්පෙරුම වැනි අය හඟුරන්කෙතින් පක්ෂයට එකතු වූ හ. තවත් පිරිසක් මාතර ආසනයෙන් ඇතුළු කර ගැනීමට මංගල විසින් කටයුතු කරන ලදි.

චන්ද්‍රිකා ඇතුළු පිරිස මෙසේ 1992 වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් වුණත් ඇය පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ගැනීමටවත් මැතිනිය පෙළඹුණේ නැත. ඇයට පක්ෂයේ වෙනත් වගකීමක් පැවරුවේ ද නැත.

චන්ද්‍රිකා පක්ෂයට බැඳී මාසයකට පමණ පසු දිනෙක මංගල, ජෙයරාජ් සමඟ මම චන්ද්‍රිකා මැතිනිය හමු වූයෙමි. එහි දී මම චන්ද්‍රිකාට කිසි යම් වගකීමක් පවරන ලෙස මැතිනිය ගෙන් ඉල්ලීමි. ඒ අනුව ඇයට මැතිනිය ගේ ආසනය වන අත්තනගල්ල ලබා දීමට එකඟ වූවා ය.

පසු පසට තල්ලු වෙමින් ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයෝ පෙරමුණට පැමිණිය හ. ඒ සෑම දිස්ත්‍රික්කයක ම සන්ධානයෙන් පළමු තැනට ආවේ ජ.වි.පෙ. අපේක්ෂකයන් ය.

චන්ද්‍රිකා ජ.වි.පෙ. සියලු කොන්දේසිවලට යටත් වී සන්ධාන රජයක් පිහිටෙව්වා ය. ජ.වි.පෙ. මන්ත්‍රීවරු තිදෙනකුට බලවත් අමාත්‍යාංශ තුනක් ලබා දුණි. ජනතා විමුක්ති පෙරමුණේ නියෝගය මත ඇයට මුදල් ඇමැති තනතුර අත හැරීමට සිදු විය. ගිවිසුමට වැඩියෙන් එක් අමාත්‍යාංශයක් දීම නිසා මංගලට ඇමැති තනතුර අතහැර නියෝජ්‍ය ඇමැති වීමට සිදු විය.

## තමන් ගේ බල වියරුවෙන් තමන් ම බැට කන චන්ද්‍රිකා

බල වියරුව නිසා චන්ද්‍රිකාට තම සැමියා මැරූ ජනතා විමුක්ති පෙරමුණ හා සන්ධානගත වීමට සිදු විය. එය ඇයට මානසික පීඩාවකි. ඇගේ දරුවන්ට එය වේදනාවකි.

දෙවනුව චන්ද්‍රිකාට ජනතා විමුක්ති පෙරමුණේ සියලු කොන්දේසිවලට එකඟ වීමට සිදු විය. එය ඇයට ඉවසුම් නො දෙන වේදනාවකි.

චන්ද්‍රිකා රජයක් පිහිටෙව්වා ය. ඒත් ඇයට ඇගේ ආර්ථික දර්ශනයට පිටුපා ඇය කිසි සේත් එකඟ නො වන සංවෘත ආර්ථිකයකට එකඟ වීමට සිදු විය. ඒ ප්‍රශ්නය ඇයට කොතරම් තදින් බලපෑවා දැයි කිව හොත් ජ.වි.පෙ. හා එකඟ වූ ප්‍රතිපත්ති ප්‍රකාශයට අමතර ව තවත් මැතිවරණ ප්‍රකාශනයක් ද එළිදැක්වීමට ඇය පෙලඹුණි. එහෙත් ජ.වි.පෙ. විරෝධතා හා තර්ජන හමුවේ එය හකුලා ගැනීමට සිදු විය. එයත් ඇයට විශාල මානසික පීඩාවක් විය.

ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට ඇය ගේ දැක්ම නිවැරැදි ය. ඇය බලය බෙදා හදා ගැනීමට පක්ෂ ය. එහෙත් චන්ද්‍රිකාට මෙහි දී ජනතා විමුක්ති පෙරමුණේ වර්ගවාදී ගෝත්‍රවාදී මතයට යට වීමට සිදු විය.

චන්ද්‍රිකාට අගමැතිකම මහින්ද රාජපක්ෂ මහතාට දීමට සිදු විය. ඇය ගේ බලාපොරොත්තුව තිබුණේ කදිරගාමර් අගමැති කිරීමට යි. ජ.වි.පෙ. ද එයට පක්ෂ වී තිබිණි. එහෙත් නො සිතූ ලෙස හෙළ උරුමයෙන් හාමුදුරුවරු නවදෙනෙක් පාර්ලිමේන්තුවට පැමිණි නිසා

ඇයට අගමැති තනතුර මහින්දට දීමට සිදු විය. එය චන්ද්‍රිකා මැරි මැරී උපදින තවත් කාරණයකි.

සන්ධාන රජයේ ආණ්ඩු පක්ෂයට ජෙයරාජ් නැති ව ම බැරි චරිතයකි. ඔහු රජය වෙනුවෙන් විශාල බරක් ඇදී. එහෙත් ජෙයරාජ්ට ආණ්ඩු පක්ෂ සංවිධායකකම හා වෙළෙඳ ඇමතිකම දීමට ඇය එකඟ නැත. ඒ සඳහා වෙනත් පිළියමක් ද ඇයට නැත. එනිසා ඊර්ෂ්‍යාවෙන් හා ක්‍රෝධයෙන් ජෙයරාජ්ට ඒ තනතුරු දීමට සිදු වී ඇත.

ජනාධිපතිනිය ෆවුසිට ඇමැතිකම දුන්නේ ද කපන්න බැරි අත ඉඹින න්‍යායයෙනි.

චන්ද්‍රිකා මුදල් ඇමැතිකම තමා ගේ අතේ තබා ගැනීමට නො කළ උත්සාහයක් නැත. එහෙත් ජ.වි.පෙ. එයට කිසි සේත් එකඟ නො වී ය. මුදල් ඇමැතිකම අතහැරීමට වීම ඇයට ජනාධිපතිකම නැති වීමටත් වඩා වේදනාකාරී ය.

## බලකාමයේ නිර්ලජ්ජිත බව

ඇය මුදල් ඇමැති තනතුර සරත් අමුණුගමට ලබා දී මුදල් අමාත්‍යාංශ ලේකම් හරහා එහි පාලනය තමා යටතට ගෙන තිබේ. ලේකම්වරයා සරත් කියන කිසිවක් නො කරයි. ඔහු ජනාධිපති මන්දිරයේ පදිංචි ව සිටිමින් චන්ද්‍රිකා සමඟ මුදල් අමාත්‍යාංශය පාලනය කරයි. අනෙකුත් අමාත්‍යාංශවලට ද ඇය තමන් ගේ ලේකම්වරු පත් කර ගත්තා ය.

රාජ්‍ය දේපළ, විදේශ ආයෝජන, මහා පරිමාණ ටෙන්ඩර් වැනි දේ පිළිබඳ තීන්දු ගැනීමේ බලය චන්ද්‍රිකා ඇය පත් කළ මණ්ඩල කිහිපයකට භාර දී ඇත. ඒ තුළින් ඇය සුපුරුදු ලෙස මුදල් කොමිස් හා අල්ලස් ව්‍යාපාරය කරගෙන ගියා ය.

චන්ද්‍රිකා බලය ගත්තේ 6 මාසයෙන් ජනධිපති ක්‍රමය අහෝසි කරන බවට ජ.වි.පෙ සමඟ ගිවිසුමක් අත්සන් කිරීමෙනි. එහෙත් ගිවිසුම අමු අමුවේ ම කඩ කර ඇය දිගට ම ජනධිපති තනතුර හෙබ වී ය.

අපි 2000 දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළෙමු. එය පුළුල් බලතල බෙදීමක් සහිත ව්‍යවස්ථාවකි. එයට එ.ජා.ප. යේ

සහයෝගය ද ලැබුණි. එහෙත් අවසාන මොහොතේ ඇය ඇගේ මුළු කාලයේ ම විධායක ජනාධිපති ක්‍රමය පවතින ලෙස වගන්තියක් ඇතුළත් කළා ය. එයට ජී. එල්. ද අනෙකුත් පක්ෂ ද එකඟ නො වූ හ. එම ව්‍යවස්ථාවට අප බලාපොරොත්තු වූ සහාය ලබාගැනීමට බැරි වූයේ ඒ නිසා ය.

දැන් සන්ධාන රජයෙන් නැවත ජනාධිපති ක්‍රමය අහෝසි කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට යයි. එයට එක ම හේතුව ජනාධිපතිකම අහෝසි කරන මුවාවෙන් ඇගේ දෙ වැනි වාරයෙන් පසු විධායක අගමැතිනිය ලෙස බලයේ සිටීම යි.

වයස අවුරුදු 60 වූ පසු එක දවසක් බලයේ සිටීමට සූදානම් නැහැ කියූ චන්ද්‍රිකා දැන් ඇගේ දෙ වැනි වාරයෙන් පසු වත් බලයේ සිටීමට උපක්‍රම ගණනාවක් ගැන සිත යි.

1. ඇයට 3 වරක් තරග කිරීමට හැකි ලෙස ව්‍යවස්ථාව වෙනස් කර ගැනීම.
2. ජනාධිපති ක්‍රමය අහෝසි කර විධායක අගමැති තනතුරක් හදාගෙන දිගට ම බලයේ සිටීම.
3. පාර්ලිමේන්තුවේ 2/3 බලයක් නැති ව නීති විරෝධී ලෙස නව ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම.

මේ මොනවා කරන්නත් ඇය ජ.වි.පෙ. සමඟ මේ ආණ්ඩුව දිගට ගෙන යා යුතු ය. මොනවා කරන්නත් ඇය මහාමැතිවරණයකින් හෝ ජනමත විචාරණයකින් හෝ නැවත ජනවරමක් ලබා ගත යුතු ය.

මේ කිසිවක් මේ අවස්ථාවේ ඇයට කළ නො හැකි ය. කිසි දින අප මාතෘ භූමියේ ජනතාව ඇයට තවත් වරක් බලයේ රැඳී සිටීමට ඉඩ නො දෙනු ඇත.

# 07

# චන්ද්‍රිකා ගේ ඒකාධිපති වියරුව හා යෝජිත ජනමත විචාරණය

මේ ජනමත විචාරණය පටන් ගත්තේ චන්ද්‍රිකා රජයට පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති වීම නිසා ය. චන්ද්‍රිකා බහුතරයක කැමැත්ත ඇති වෙනත් පක්ෂයකට රජයක් පිහිටු වීමට ඉඩ දීමට සූදානම් නැත. චන්ද්‍රිකා ජාතික රජයක් හැදෙනවට කැමැති නැත. ඇය සර්ව පාක්ෂික රජයක් හැදෙනවාට ද කැමැති නැත. චන්ද්‍රිකා මේ සියල්ල කරන්නේ රටට හා ජනතාවට තියෙන ආදරයට කියා කියන්න තරම් එයාට ලැජ්ජා බයක් අද නැත. ඒත් ඇත්ත හේතුව රටේ කවුරුත් දනිති. චන්ද්‍රිකා අගමැති තුමාට ඇමැති මණ්ඩලයට කියන්නේ මම මගේ අගමැතිතුමා මගේ ඇමැති මණ්ඩලය වෙනස් කරන්න කැමැති නැති නිසා ජාතික රජයක් හැදෙනවට විරුද්ධ බව යි. පොදු පෙරමුණේ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයට කියන්නේ පෙරමුණට හා පක්ෂයට තියෙන ආදරය නිසා ජාතික රජයක් හැදෙනවට අකැමැති බව යි.

ජාතික රජයක් හදන්න යෝජනා පැමිණි ප්‍රථම අවස්ථාව හෝ අවසාන අවස්ථාව මෙය වේ. මෑත කාලයේ මේ යෝජනාව පළමුවෙන් මතු කරන ලද්දේ මා විසිනි. අද රටේ පවතින සමාජ ආර්ථික දේශපාලන වියවුල්කාරී තත්ත්වය තුළ ප්‍රධාන දේශපාලන පක්ෂවල ඒකමතිකත්වයක් වහා අවශ්‍ය බවත් ප්‍රධාන පක්ෂ එකතු වී ජාතික රජයක් පිහිටු වීම අද කළ හැකි උතුම් ම කාර්ය බවත් මේ රටේ ප්‍රධාන ආගමික නායකයෝ, බුද්ධිමත්තු, ව්‍යාපාරික ප්‍රජාව දැන් කලෙක සිට රජයෙනුත් විපක්ෂයෙනුත් ඉල්ලමින් සිටිති. රටේ වගකිව යුතු සියලු දේශපාලන පක්ෂවලට එක් වී විසඳීමට ප්‍රධාන ප්‍රශ්න ගණනාවක් අද රටේ ඇත. උතුරේ යුද්ධය, ආර්ථික

අස්ථාවරත්වය, නීතිය හා සාමය බිඳවැටීම, දූෂණය හා අකාර්යක්ෂමතාව මේ අතර ප්‍රධාන වේ. මේ කිසිවක් චන්ද්‍රිකාට ප්‍රශ්න නො වේ.

චන්ද්‍රිකා කුමාරතුංග ඒකාධිපතිවරියට ඇති ප්‍රධාන ප්‍රශ්නය ඇය දරන ඇමැති තනතුරු හතර හා රාජ්‍ය ආයතන සියයකට ආසන්න ගණනක බලය අතහැරීමට සූදානම් නොමැතිකම යි. මේ කිසි ම ආයතනයක හරියට වැඩක් නො කෙරේ. මේ සෑම ආයතනයක ම කිසි ම නිලධරයකුට තමුන් ගේ දැනුම පළපුරුද්ද අත්දැකීම් අනුව තීරණ ගන්න ඉඩක් නැත. මේ ආයතන සියල්ල තුළ දූෂණය අකාර්යක්ෂමතාව කිරුළු පළඳා ඇත. ඒ කිසි දෙයක් චන්ද්‍රිකා

පිළිගන්න සූදානම් නැත. මුළු රට ම චන්ද්‍රිකා යටතේ ඇති අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතනවල තියෙන අකාර්යක්ෂමතාව හා දූෂණය ඉතා හොඳින් දනී. ඒත් චන්ද්‍රිකා කිසි ම හිරිකිතයක් නැති ව තමන් ගේ ආයතනවල කටයුතු පිළිබඳ බොරු සංඛ්‍යාලේඛන බොරු සමීක්ෂණ ගැන කියමින් වර්ණනා කරයි.

චන්ද්‍රිකා කිසි ම අමාත්‍යාංශයකට, අමාත්‍යවරයකුට නිදහසේ වැඩ කරන්න දෙන්නේ නැත. විශේෂයෙන් ලොකු ටෙන්ඩර් සියල්ල කරන්නේ මුදල් අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලයෙනි. විෂයය මොන ඇමැතිවරයකුට, මොන අමාත්‍යාංශයකට අයත් වුණත් ඒ සියල්ල බලහත්කාරයෙන් චන්ද්‍රිකා පාලනයට යටත් කර ගෙන ඇති අතර එම ටෙන්ඩර් පිළිබඳ දේශීය නියෝජිතයන් හැටියට කටයුතු කරන්නේ චන්ද්‍රිකා ගේ ඉතා ම කිට්ටු හිතවතුන් ය. මේ අයට කොමිස් මුදල් ලෙස කෝටි ගණන් ලැබෙන බව අද රට ම දනී.

පොදුජන එක්සත් පෙරමුණු රජයේ සිටින අය අතරින් ආර්ථික විද්‍යාව වැඩියෙන් ම දන්නේ චන්ද්‍රිකා ය. දේශපාලන විද්‍යාව වැඩියෙන් ම දන්නේ ද චන්ද්‍රිකා ය. ඇය කියන විදිහට ඇය නීති විශාරදවරියකි. කෘෂිකර්ම විද්‍යාව උපාධියක් ද ඇයට ඇත. මනෝ විද්‍යාඥවරියකි. ඇය සෝබෝන් විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත් බව ද කියන්නී ය. එහෙත් සෝබෝන් ආදි ශිෂ්‍යයන් සියලු දෙනා ම කියන්නේ ඇය සෝබෝන් නො ගිය බවකි. කොහොම වුණත් මැය ගේ අධ්‍යාපන සුදුසුකම් කීප අවස්ථාවක ම අභියෝගයකට ලක්

විය. කිසි අවස්ථාවක උපාධිය කෙසේ වෙතත් සාමාන්‍ය පෙළ සහතිකයක් වත් ඉදිරිපත් කරන්න ඇය අසමත් වූවා ය. එහෙත් දන්නෝ ඇය ගේ සාමාන්‍ය පෙළ සුදුසුකම් පිළිබඳ ව ද දනිති. චන්ද්‍රිකා ඇය අතැති මේ මහා බලය අතහරින්න කිසි සේත් සූදානම් නැත. ප්‍රධාන පක්ෂ සමඟ එකතු වී ශක්තිමත් රජයක් හදන්න උත්සාහ කරන අය සතුරන් හැටියට ඇය සලකන්නේ ඒ නිසා ය. චන්ද්‍රිකා තවත් කලක් බලයේ රැඳී සිටීමට නම් අනිවාර්යයෙන් ම අනුගමනය කළ යුතු විකල්ප දෙකක් ඇත.

1. ප්‍රජාතන්ත්‍රවාදයෙන් ඉවතට පැන හිතුවක්කාර ලෙස හා නීති විරෝධී ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම හා එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළින් තමන් ගේ බලය නව කාලයකට තහවුරු කර ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදා ගැනීම.
2. වගකීමක් ඇති ප්‍රධාන දේශපාලන පක්ෂ හා එක් ව පුළුල් ජාතික රජයක් කිසි යම් නියමිත කාර්ය භාරයකට පිහිටුවා ගැනීම.

චන්ද්‍රිකා අද උත්සාහ කරන්නේ මෙයින් පළමු වැනි විකල්පය තෝරා ගැනීමට යි. එයට හේතුව දෙ වැනි විකල්පය තුළ ඇගේ බලය අඩු වීම අනිවාර්ය ය වීම යි. මේ අතරට ම චන්ද්‍රිකා මේ නව ව්‍යවස්ථා සංශෝධනයෙන් නැවත වතාවක් විධායක අගමැතිනිය ලෙස රටේ බලය තවත් කාලයකට තහවුරු කර ගැනීමේ කූට උත්සාහයක ද යෙදී සිටින්නී ය. ඇය නිතර ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරයි. ඇය නිතර ම සත්‍යය කතා කරන බව කිය යි. එහෙත් ඇය හැසිරෙන්නේ ඊට හාත්පසින් ම වෙනස් ආකාරයකට යි.

1964 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ රජය හදිසියේ පාර්ලිමේන්තු කුමන්ත්‍රණයකින් පරාජය විය. ඒත් ඉන් පසු ද සිරිමාවෝ රජයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගේ බහුතර බලයක් තිබිණි. වමේ පක්ෂ ඇයට විශ්වාසය තහවුරු කරන යෝජනාවක් නැවැත පාර්ලිමේන්තුවට ගෙන එන ලෙස බල කළ හ. ඒත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තම රජය විසුරුවා හැරියා ය.

අද චන්ද්‍රිකා රජයට පැහැදිලි ව ම පාර්ලිමේන්තුවේ බහුතර බලයක් නැත. අද පොදුජන එක්සත් පෙරමුණට මන්ත්‍රීවරු 109ක්

සිටිති. විපක්ෂයට මන්ත්‍රීවරු 115ක් සිටිති. පොදුජන එක්සත් පෙරමුණු මන්ත්‍රීවරු 109 දෙනාගෙන් 4 දෙනෙක් අයත් වන වතු කම්කරු කොංග්‍රසයේ තත්ත්වය භයානක ය. තීරණාත්මක මොහොතක දී ඔවුන් පොදු පෙරමුණෙන් ඉවත් වීමට සූදානම් බව පෙනේ. මීටත් අමතර ව චන්ද්‍රිකා ගේ පක්ෂයේ ම පිරිසක් පොදු පෙරමුණින් ඉවත් වීමට සූදානමින් සිටින බව රහසක් නො වේ.

පාර්ලිමේන්තුව කල්තැබීම, ජනමත විචාරණයක් කැඳවීම මේ සියල්ල ජනාධිපති බලයට මුවා වී බලයේ ඉන්න දඟලන ප්‍රජාතන්ත්‍ර විරෝධී සදාචාර විරෝධී ක්‍රියාවන් ය. ප්‍රතිඵලයක් නැත. එහෙත් විශාල ධන හානියක් කරන වැඩක් බවට මේ ජනමත විචාරණය පත් වෙන බව දැන් ඉතා පැහැදිලි ය.

අද උතුරේ යුද්ධය නිමාකිරීමට යුරෝපීයයන්ට ඇති වුවමනාව මේ රජයට නැත. අද යුරෝපීයයෝ නෝර්වේ රජය ඉදිරියට එවමින් අපේ උතුරේ යුද්ධය සාමකාමී ලෙස නිමකර ලීමට උත්සාහ දරති. මේ සඳහා කැනඩාව, බ්‍රිතාන්‍යය හා ඇමෙරිකාව ද විශේෂ උනන්දුවක් දක්වති. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ උතුරේ යුද්ධය නිසා අනාථ වූවෝ දෙලක්ෂ අනූදහසක් පමණ මේ වන විට යුරෝපීය රටවල ජීවත් වෙති. ඔවුනට අනාථ දීමනා වශයෙන් මසකට ඇමරිකානු ඩොලර් මිලියන 350ක් පමණ වැය කිරීමට සිදුව ඇත. අද පවතින ලෝක ආර්ථික අර්බුදය හමුවේ මෙතරම් විශාල මුදලක් අප රටේ පවතින යුද්ධයකට වැය කිරීම බරපතළ මුදල් නාස්තියක් බව ඔවුහු අද කල්පනා කරති. යුරෝපීයන් අපේ යුද්ධය නිම කරලීමට දක්වන විශේෂ උනන්දුවේ ප්‍රධාන රහස මෙය යි.

එසේ ම ඉන්දියාවට ද අද අපේ මේ ප්‍රශ්නය අවසන් කරලීමට විශේෂ වුවමනාවක් ඇත. එයට හේතුව එල්. ටී. ටී. ඊ. බලපෑම් ක්‍රමානුකූල ව තමිල්නාඩුව හරහා ඉන්දියාවට ද කාන්දුවෙමින් පැවතීම යි.

කාට යුද්ධය ඉක්මනින් නිමකරලීමට වුවමනා වුවත් ශ්‍රී ලංකා ජනාධිපතිනියට තව ම එහෙම වුවමනාවක් මතු වී නැත. විශේෂයෙන් යුද්ධය නිම කරන්න චන්ද්‍රිකාට වුවමනාවක් ඇත්තේ ම නැත. එවැනි වුවමනාවක් ඇති නම් ජානක පෙරේරා වැනි රටක් වටින විරෝදාර යුද සෙන්පතියකු හමුදාපති තනතුරට පත් නොකර විශ්‍රාම යැවීමට තීරණය කළේ ඇයි? ජානක පෙරේරා විශ්‍රාම හැරියේ

ඔහුට යුද හමුදාපති තනතුර දීමට සිදු වන නිසා ය. යාපනය බේරා ගැනීමට චන්ද්‍රිකාට, ජානක පෙරේරා හොඳ ය. අපේ හමුදා යාපනයෙන් මුහුදට විසිවෙන්න යන විට ජානක පෙරේරා චන්ද්‍රිකාට හොඳ ය. නමුත් ඔහු ගේ ඊ ළඟට තිබුණ උසස්වීම වන හමුදාපති තනතුරට ඔහු නුසුදුසු ය. ජානක පෙරේරාට හමුදාපතිකම නො දුන්නේ යුද්ධය නිමවෙනවාට ඇගේ තියෙන අකැමැත්ත නිසා ම ය. සැබෑ සාම වුවමනාවක් තිබුණා නම් මේ අවස්ථාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ එකමුතු වීමට දරන කැමැත්තට අකුල් හෙළන්නේ ඇයි? අද යුද්ධය කාට කාටත් විශාල ජාවාරමක් වී ඇත. එයින් බලවත්තු කෝටි ප්‍රකෝටි ගණනින් හම්බ කරති. එනිසා ම තවෙකකු ගේ හොරකම් අනෙකෙකු විසින් වසන් කරමින් යුද්ධය ජයට ම වවාගෙන කයි.

ගුවන් හමුදා මූලස්ථානයට කොටි තරුණයන් 15 දෙනකු කළ හානිය ගුවන් හමුදාවට පමණක් නො ව ශ්‍රී ලංකාවට ම විශාල නින්දාවකි. අපහාසයකි. එසේ ම එය බරපතළ පරාජයකි. හරි නම් චන්ද්‍රිකා ඉල්ලා අස් විය යුතු ය. එත් අද වන විටත් ගුවන් හමුදාපති වත් අස් වී නැත. බ්‍රිතාන්‍ය අගමැති නෙවිල් චෙම්බලේන් දෙ වැනි ලෝක යුද්ධ සමයේ අගමැති තනතුරින් ඉල්ලා අස් වූයේ හිට්ලර් සමඟ ඇති කර ගත් ගිවිසුම හිට්ලර් කඩ කළ නිසා ය. 1981 මාග්‍රට් තැචර් රජයේ ආරක්ෂක ලේකම් කැරින්ටන් සාමිවරයා ඉල්ලා අස් වූයේ එංගලන්ත යටත් විජිතයක් වූ පෝක්ලන්ත දිවයින ආජෙන්ටිනාව ආක්‍රමණය කළ හේතුවෙනි. නිසි ලෙස පෝක්ලන්ත දූපත තමන්ට රැක ගැනීමට බැරි වූ බව කියමින් කැරින්ටන් සාමිවරයා ඉල්ලා අස් වූයේ ය. වරක් දුම්රිය ඇමැතිවරයා ව සිටි ඉන්දියාවේ ලාල් බහදූර් ශාස්ත්‍රී දුම්රියක් පෙරළීම නිසා ඉල්ලා අස් වූයේ ය. ඒ අනුව අද චන්ද්‍රිකා ඉල්ලා අස් විය යුතු ම ය. ඒත් ඇයට එවැනි ශීලාචාරකමක් නැති බව අපි හැමෝ ම දනිමු.

චන්ද්‍රිකාට අද අවශ්‍යව ඇත්තේ ප්‍රධාන කාරණා දෙකකි.

එනම්:

1. ඇමැතිකම් ටික බදා ගෙන සිටීම.

2. ලබන වරත් පාර්ලිමේන්තුවට විධායක අගමැතිනිය ලෙස පත් වීම.

මේවා කවරදා වත් ඉටුකර ගත නො හැකි විකෘති ආශාවන් බව අද රට ම දනී. එසේ ම අපේ පක්ෂයේ සියලු දෙනා මෙය වඩාත් හොඳින් දනිති. නො දන්නේ චන්ද්‍රිකා යි, මංගල යි, කදිරගාමර් යි පමණ ය.

කොහොම වුණත් චන්ද්‍රිකා ගේ මේ යෝජිත පිස්සු ජනමත විචාරණයට ලක්ෂ 6000ක් පමණ වියදම් වෙනු ඇත. පක්ෂයේ වැඩි දෙනකු ගේ මතය වන්නේ මේ ජනමත විචාරණය නො තැබිය යුතු බව යි. අද ජනමත විචාරණයට විරුද්ධ ව සිටින ප්‍රධාන දේශපාලන පක්ෂ, 2000 මහ මැතිවරණයේ දී ලබා ගත් ඡන්ද ගණනත් පොදුජන එක්සත් පෙරමුණ ලබා ගත් ඡන්ද ගණනත් බලන විට අපි ලක්ෂ 5ක් පමණ පසු පසින් සිටිමු. මේ ජනමත විචාරණය නිසා මේ රජයේ නියමිත කාලය ගෙවෙන්නට කලින් ආණ්ඩුව පෙරළෙන්න තියෙන ඉඩකඩ ඉතා වැඩි ය. ජනමත විචාරණය පරාජය වී ඉන් පසු මහා මැතිවරණයකට ගියොත් එයින් පොදු පෙරමුණට අන්ත පරාජයක් ලැබෙන එක කිසිකෙනකුට වැළැක්විය නො හැකි ය.

## මහාචාර්ය ජී. එල්. පීරිස්

චන්ද්‍රිකා කැඳ වූ ජනමත විචාරණය ගැන අපගේ ම රජයේ ව්‍යවස්ථා කටයුතු භාර ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා කියන දේ බලන්න. ඔහු නිකම් ම නිකම් ඇමැති කෙනෙකු නො වේ. එතුමා අපේ රටේ මෙන් ම මුළු ලෝකයේ ම ඉතා ඉහළින් පිළිගත් නීති මහාචාර්යවරයෙකි. එතුමා ලියා ඇති නීති පොත් ලෝකයේ හැම විශ්වවිද්‍යාලයක ම උපාධි පශ්චාත් උපාධි සඳහා පාවිච්චි කෙරේ. ඒ මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා ජනමත විචාරණය ගැන මෙසේ කියයි. "මේ ජනමත විචාරණය නීති විරෝධී යි. සදාචාර විරෝධී යි. කළ ආකාරය වැරැදි යි. වාක්‍ය ගැළපීම වැරැදි යි. ඒ වගේ ම මෙය වංචනික යි."

මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා මේ ගැන තව දුරටත් කියන්නේ මොනවා ද? මේ තීරණය ගැන ජනාධිපතිනිය ඔහු ගෙන් කිසිවක් විමසුවේ නැති බව ඔහු කියයි. ඒ විතරක් නො වේ මේ තීරණය ගැන ජනාධිපති නීතිඥ එච්. එල්. ද සිල්වා ගෙන් උපදෙස් ගත් බව කියමින් ජනාධිපතිනිය තමාට බොරු කියූ බව එතුමා ඇමැති මණ්ඩලයටත් රටටත් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරයි.

චන්ද්‍රිකා ගේ නීති උපදේශකයන් ඉතිහාසයේ දුන් සියලු ම උපදෙස් වැරැදී ඇත. මේ උපදෙස් පසු පස බොහෝ විට ඉන්නේ එතුමිය ගේ ලේකම් බාලපටබැඳි යි. වයඹ සහ උතුරු මැද පළාත් සභා විසුරු වීමට උපදෙස් දී රජය අමාරුවේ දැම්මේ ඔහු යි. සිරිසේන කුරේ අත්අඩංගුවට ගන්න උපදෙස් දී රජයේ පස්ස බිම ඇන්නුවේ ද මොහු ය. එසේ ම පළාත් සභා කල් දැමීමට ගොස් එයින් රජය ජනතාව ගේ උපහාසයට ලක් විය. මෙවරත් ජී. එල්. පීරිස් වැනි මහාචාර්යවරයකු පැත්තකට දමා චන්ද්‍රිකා මේ මෝඩ තීරණ ගත්තේ බාලපටබැඳි ඇතුළු කණ්ඩායම සමඟ බව ඉතා පැහැදිලි ය.

දැන් මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා මේ කියන ගැඹුරු කථාවේ හරය කුමක් දැයි බලන්න. එහි සරල හරය වන්නේ චන්ද්‍රිකා පිස්සු නටන බව යි.

## ආර් ප්‍රේමදාස

ප්‍රේමදාස ජනාධිපතිවරයාට එරෙහි ව දෝෂාභියෝගයක් පැමිණි අවස්ථාවේ ඔහු හැසුරුණු ආකාරයත් අද චන්ද්‍රිකා හැසිරෙන ආකාරයත් සන්සන්දනය කර බලන්න.

ප්‍රේමදාස විසින් මන්ත්‍රීවරුන් ගෙන් සමාව ගන්නා ලදී.. කනගාටුව ප්‍රකාශ කරන ලදී. සිදු වූ වැරැදි අමතක කරන ලෙස කීවේ ය. ප්‍රේමදාස ජනාධිපතිතුමා පසු පෙළ මන්ත්‍රීවරුන් සමඟ බිම වාඩි විය. ප්‍රේමදාස මහතා සමඟ දැඩි කේන්තියකින් සිටි කථානායකවරයා හමු වී අමනාපකම් මඟහැර ගත්තේ ය. අවසානයේ ඔහු දෝෂාභියෝගය ජය ගත්තේ ය.

## චන්ද්‍රිකා අද හැසිරෙන්නේ එසේ ද?

ඇය පක්ෂයේ මැති ඇමැතිවරුන්ට නින්දනීය ලෙස දොස් පවරන්නී ය. අලුත් මන්ත්‍රීවරුන්ට පරණ කෝන්තර හිතේ තබාගෙන ටෙලිෆෝනයෙන් පැය ගණන් බැණ වදින්නී ය. ඇය ගේ ඇමැතිවරු, උප ඇමැතිවරු, මන්ත්‍රීවරු සියලු දෙනා හොරු යැයි ප්‍රසිද්ධියේ පවසන්නී ය. පළාත් සභා හා ප්‍රාදේශීය සභා මැති ඇමැතිවරුන් ද හොරකම් කරන බව ඇය ප්‍රසිද්ධියේ ම කියන්නී ය.

චන්ද්‍රිකා තමන් ගේ පක්ෂයේ මහ ලේකම් වන මට ඉතා මත් පහත් කතා කියමින් අපහාස කරන්නී ය. ඔහු හොරෙකු කුමන්ත්‍රණකරුවකු බව දැන් ප්‍රසිද්ධියේ ම කියන්නී ය. මහින්ද රාජපක්ෂ ඇමැතිවරයා පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උපසභාපතිවරයෙකි. ඔහුටත් හොරා, මිනීමරුවා යනුවෙන් පවසන්නී ය. ෆවුසි ඇමැතිතුමාටත් ඔහු ගේ පුතාටත් කියන කතා අද මුළු රට ම දනී. අනුරුද්ධ රත්වත්ත ඇමැතිවරයාට හමුදා ප්‍රධානයන් හා නිලධරයන් ඉදිරියේ කියන අමන කතා පිළිකුල් සහගත ය. නිමල් සිරිපාල ද සිල්වා, මහින්ද විජේසේකර, ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ වැනි දක්ෂ ඇමැතිවරුන්ටත් හොරුන් යැයි කියන්නී ය. චන්ද්‍රිකා මේ සියල්ලට ම අමතර ව අග්‍රාමාත්‍යතුමාටත් අපහාස කරන්නී ය. පවිත්‍රා වන්නිආරච්චි අමාත්‍යතුමිය ගේ චරිතයට කරන අපහාස උපහාස අද රාජ්‍ය නිලධරයන් ගේ සැඳෑ සාදවල සිනා බයිට් බවට පත් වී ඇත.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ගේ විග්‍රහය අනුව මංගල, කදිර්ගාමර්, බාලපටබැඳි, චන්ද්‍රානන්ද සිල්වා, ජේ. එස්. ජයවර්ධන හැර ලංකාවේ සියලු මැති ඇමැතිවරු සහ සියලු රජයේ නිලධරයෝ හොරු සහ වංචාකාරයෝ ය.

මේ මොනවා කීවත් අද මුළු රට ම චන්ද්‍රිකා සුද්ද කරන අය ගේ පැටිකිරිය ඉතා හොඳින් දනී. මොවුන් ගේ වත්කම් ගැන සොයන්න එංගලන්තයට, ඕස්ට්‍රේලියාවට හා ප්‍රංශයට යා යුතු ය.

## මා ගැන

මීට මාස 4කට පෙර මා, අගමැතිතුමා හා ජී. එල්. පීරිස් මැතිතුමා සමඟ චන්ද්‍රිකා මුණගැසී දීර්ඝ සාකච්ඡාවක් කළ බව අද මුළු රට ම දනී. අද මේ රජය මුහුණ දී ඇති ප්‍රශ්න සියල්ල ම ඉදිරියේ දී මතු වන බව එදා අප ජනාධිපතිනියට පැහැදිලි කළ බව පුවත්පත්වල ද පළ විය. එහෙත් ඒ කිසිවක් ඇය නො පිළිගත් බව ද මාධ්‍යවලින් ම හෙළි විය.

මගේ ජාතික රජය පිළිබඳ යෝජනාව මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයෙන් තරමක් බැහැර වී කරන ව්‍යවස්ථා වෙනසක් පිළිබඳ යෝජනාව ද එදා නැවැත චන්ද්‍රිකා ඉදිරියේ තැබූ බව ද හෙළිදරවු විය. මා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තදින් අවවාද ලැබුවේ මේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැර කිරීමට සැලසුම් කළ ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ යෝජනාව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ නිසාවෙනි. එසේ ම ජාතික ආණ්ඩුව පිළිබඳ යෝජනාව මා ප්‍රකාශ කිරීමත් සමඟ ම ඒ යෝජනාවට පක්ෂ ව රටේ විවධ බහුජන සංවිධාන පක්ෂපාතීත්වය දැක්වූ බව රහසක් නො වේ.

අද චන්ද්‍රිකා මගේ ජාතික ආණ්ඩු යෝජනාවට බණින්නී ය. එහෙත් පුළුල් ජාතික සන්ධානයක් ගැන කතා කරන්නී ය. රනිල් සමඟ නැවැත නැවැතත් ජාතික ආණ්ඩුවක් හදන්න සාකච්ඡා කරන්නී ය. එයින් නො නවතින චන්ද්‍රිකා සිහල උරුමයටත් ජවිපෙටත් ජාතික ආණ්ඩුවකට ඇරියුම් කරන්නී ය. මම එදා ජාතික ආණ්ඩුවක් පිළිබඳ අදහස ඉදිරිපත් කරමින් එයට හේතු දැක්වීමි. එනම් ශක්තිමත් ආණ්ඩුවක අවශ්‍යතාව, ව්‍යාපාරිකයන්ට හා ආයෝජකයන්ට හිතකර වාතාවරණයක් ගොඩනැඟීමේ අවශ්‍යතාව, ජාතිවාදී ආගම්වාදී සටන් පාඨ හා ඉල්ලීම්වලට යට නො වීමේ අවශ්‍යතාව යන කරුණු ඉදිරිපත් කළ මම පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කිරීමේ අවශ්‍යතාව හා උසස් අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයට හැරවීමේ අවශ්‍යතාව ගැන ද කතා කළෙමි. ඒ සැමට එරෙහි වූ චන්ද්‍රිකා අද ජාතික රජයක් හදන්න උත්සාහ ගන්නේ කුමකට ද? ඇය ගේ එක ම වුවමනාව තමා ගේ ජනාධිපතිකම හා ඇමැතිකම් ටික රැකගැනීම යි. මීට කලින් පැවැති චන්ද්‍රිකා රනිල් සාකච්ඡාව බිඳ වැටුණේ චන්ද්‍රිකාට ඇමැතිකම් තබා ගැනීමට ඉඩදිය නො හැකි යයි රනිල් කී නිසා බව කිසිවකුට රහසක් නො වේ.

චන්ද්‍රිකා අද ජනමත විචාරණයක් පවත්වා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට උත්සාහ කරන්නේ ද මා මීට වසරකට පෙර කී ආකාරයට නො වේ ද? ඒත් මා එදා කී දේ අද කරන්න යන චන්ද්‍රිකා එදා මා ඇයට ඒකාධිපති වෙන්නට බල කළ බව කියමින් දෝෂාරෝපණය කරන්නී ය.

අද චන්ද්‍රිකා ගේ ගෙළ හිර වී ඇත.

ඇය බිත්තියට හේත්තු වී ඇති බව පෙනේ.

නහයට උඩින් වතුර ගලා ඇති බව පැහැදිලි ය.

එනමුත් තව ම ඇය ගේ කට වැහිලා නැත.

තව ම දහවල් 12.00 වන තුරු උඩ තට්ටුවෙන් පහළ බහින්නේ ද නැත. මා මේ ලියන දේ සියල්ල පසු ගිය කාලයේ විටින් විට

පත්තරවල ගිය බව කවුරුත් දනිති. එනිසා නඩු දාන්න, මට එරෙහි ව අධිකරණයට යෑමට ඇයට නො හැකි ය. චන්ද්‍රිකා රටට හා ජනතාවට කරන මේ මහා අපරාධය ලොවට කියා උසාවි යන්නත් මම ඉතා කැමැත්තෙන් සිටිමි.

## පච මල්ල නොහොත් පච සාගරය

මේ අතුරු මාතෘකාව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ලොබියේ පසු ගිය දිනවල නිතර රැවූ පිළිරැවූ දූනි. මේ කතා කියන්නේ අපේ ම පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන් අපේ ම නායිකාව ගැන යි. මට මේ පච කතා ගැන ලියන්න වෙලාවක් නැත. එහෙත් චන්ද්‍රිකා මේ ජනමත විචාරණය පටන් ගත්තේ ම තමන් ගේ මන්ත්‍රීවරුන්ට පච ගම්මානයක් කියල යි. මේ බොරු අහලා උඩපනින, අත්පුඩි ගහන මන්ත්‍රීවරුන්ට මම එකක් කීමට කැමැත්තෙමි. කරුණාකර ජනමත විචාරණයෙන් පසු ව ගන්න පියවර ගැන නායිකාව ගෙන් විමසන්න. එවිට තමන් ගේ සැක බිය දුරුකර ගන්න හැකි වනු ඇත. චන්ද්‍රිකා කියන්නේ කිසි ම හේතුවකින් නියමිත වෙලාවට පෙර මහ මැතිවරණයක් තියන්නේ නැති බව යි. එය පැහැදිලි බොරුවක් මෙන් ම වංචාවකි. චන්ද්‍රිකාට නියමිත වේලාවට පෙර ඡන්දයක් නො පවත්වා සිටීමට අවශ්‍ය නම් පුළුල් ජාතික ආණ්ඩුවකට යන්න සිදු වේ. එයට මොන නම කීවත් ප්‍රශ්නයක් නැත. ජනාධිපතිනිය ගේ ම වචනවලින් කියන පුළුල් ජාතික සන්ධානයක් බිහි වුවහොත් හැර ඡන්දයකට යෑම මඟහරින්න ඇයට හැකියාවක් නොමැත. චන්ද්‍රිකා ජනමත විචාරණය දිනුවත් ඒ ළඟට කළ යුතු නිත්‍යනුකූල කිසිවක් කරන්න අවශ්‍ය පාර්ලිමේන්තු බලය අප සතු නො වේ. බැටී වීරකෝන් අමාත්‍යවරයා කියන විදිහට ම නව ව්‍යවස්ථා කෙටුම්පත පාර්ලිමේන්තුවේ 2/3ක බලයෙන් සම්මත වෙන්න අවශ්‍ය ය. ඒ සඳහා මන්ත්‍රීවරුන් 150 දෙනකු ගේ ඡන්දය අවශ්‍ය ය. අද චන්ද්‍රිකාට ඇත්තේ ඡන්ද 109කි. එයිනුත් 20ක් පමණ අවශ්‍ය විටෙක අනෙක් පැත්තට යන්නට බලාගෙන සිටිති.

මේ තත්ත්වය යටතේ ජනමත විචාරණයෙන් පසුවත් චන්ද්‍රිකාට පාර්ලිමේන්තුව කැඳවිය නො හැකි ය. නව ව්‍යවස්ථාවක් ගෙන එන්නේ නම් ජී.එල්., බැටී කියන ලෙසට නීති විරෝධී මැතිවරණයකින් හැර වෙනත් මාර්ගයක් ඇයට නැත.

මේ තත්ත්වය යටතේ කිසි යම් ලෙසකින් නව ව්‍යවස්ථාවක් සම්මත කළත් චන්ද්‍රිකාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සිදු වේ. ඒ අනුව නැවත ඡන්දයක් තියන්න සිදු වෙයි. එසේ නැති නම් ව්‍යවස්ථා කොමිසමක් පත්කර කොමිසමේ තීරණය අනුව සැප්තැම්බර් 7 වැනිදා පාර්ලිමේන්තුව රැස් නොකර ම නැවත කල් තැබීමට සිදු වේ. ඉන් පසු ඔක්තෝබර් 17 වැනි දා පසු වී (පාර්ලිමේන්තුව වසරක් සම්පූර්ණ වූ පසු) ජනාධිපති බලතල පාවිච්චි කර පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සිදු වේ. ඇයට පාර්ලිමේන්තුව විසුරුවා නො හැර වෙන කිසි ම කෙන්ගෙඩියක් කරන්න ඉතුරු වෙලා නැති බව සක්සුදක් සේ පැහැදිලි ය. එහෙත් මේ ළමාතැනී තම පසු පෙළ මන්ත්‍රීවරුන් රවටන්න ඡන්දයක් නියමිත කාලයට පෙර නො තබන බව පවසන්නී ය.

මම ගරු මන්ත්‍රීවරුන්ට කියන්නේ කරුණාකර මේ මහ රාජිනිය ගෙන් ඔබ විමසිය යුතු සරල ප්‍රශ්න දෙකක් තිබේ. ජනමත විචාරණය දිනුවොත් ඊට පස්සේ මොක ද කරන්නේ? පාර්ලිමේන්තුවේ බල තුලනය තමාට වාසි දායක කර ගන්නේ කෙසේ ද? යන්න යි.

ජනමතය පරාජය වුවහොත් චන්ද්‍රිකාට කළ හැක්කේ කුමක් ද? එයාට කිරීමට ඉතුරුවන්නේ රනිල් වික්‍රමසිංහට රට බාරදෙන එක පමණ ය. දැන් චන්ද්‍රිකා පුළුල් ජාතික සන්ධානයක් ගැන කථා කරයි. එදා මම කී දේත් මෙය ම නේ ද? මහින්ද රාජපක්ෂ කිවේත් ඒක ම නේ ද? ඒ විතරක් නෙවෙයි. චන්ද්‍රිකා රනිල් සමඟ රහසේ කතා කළේ මේ ගැන ම නේ ද?

## චන්ද්‍රිකාට ජනමත විචාරණය ජයගත හැකි ද ?

කවරදා පැවැත් වුවත් මේ ජනමත විචාරණය චන්ද්‍රිකාට කිසි සේත් ජයගත නො හැකි ය. 2000 මහ මැතිවරණ ප්‍රතිඵල අනුවත් මේ ජනමත විචාරණ උඩින් ම පරාජය වනු ඇත. මේ ජනමත විචාරණය චන්ද්‍රිකා සිතන ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ ද? එපා ද? විමසන ඡන්දයක් වෙන්නේ නැත. ස්ථිර ලෙසට විපක්ෂය මෙය රජය පෙරලන ඡන්දයකට පෙරළා ගනු ඇත.

චන්ද්‍රිකාට විරෝධය පළකරන්න චන්ද්‍රිකා රජයේ බොරු හා දූෂණවලට විරෝධය පළකරන්න චන්ද්‍රිකා රජයේ අකාර්යක්ෂමතාවට විරෝධය පළකරන්න. මේ ඡන්දය රජයට විරුද්ධ

ව ප්‍රකාශ කරන ලෙස සමස්ත විපක්ෂය ම දැනට මත් ජනතාව ගෙන් ඉල්ලා ඇත. ඒ අනුව මේ ඡන්දයේ දී ජනතාව අවසානයේ දෙ පිලකට බෙදේ. එනම් රජයට පක්ෂ කණ්ඩායම හා රජයට විපක්ෂ කණ්ඩායම වශයෙනි.

මෙහි දී අපි මොහොතකට 1982 ජනමත විචාරණයේ පසුබිම බලමු. ඒ ජනමත විචාරණය පාර්ලිමේන්තුවේ 2/3ක ඡන්දයෙන් අනුමත කර ජනතාව ඉදිරියේ තැබූ එකකි. එය ව්‍යවස්ථානුකූල ජනමත විචාරණයකි. ඒ ජනමත විචාරණයෙන් ඉල්ලුවේ පවතින පාර්ලිමේන්තුවට තව වසර හයක කාලයක් දෙන ලෙස යි. ඒ අවස්ථාවේ එක්සත් ජාතික පක්ෂයට පාර්ලිමේන්තුවේ 5/6ක බලයක් තිබිණි. විපක්ෂයට සිටියේ මන්ත්‍රීවරු හය දෙනෙකි. ඒ හයදෙනා ගෙනුත් මෛත්‍රිපාල සේනානායක, හලීම් ඉෂාක් වගේ මන්ත්‍රීවරු ජනමත විචාරණයකට පක්ෂපාතී වූ හ. අනුර බණ්ඩාරනායකත් රහසේ පක්ෂපාතී විය.

රජයේ මැති ඇමැතිවරු සියලු දෙනා ම එකා මෙන් ඒ ජනමත විචාරණයේ දී ලාම්පුව දිනවන්න කැප වූ හ. ඒ ජනමත විචාරණය පැවැත් වූයේ ජනාධිපති මැතිවරණය ජය ගැනීමෙන් පසු ව යි. ජේ. ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක ඇතුළු සමස්ත රජයේ සම්පූර්ණ ශක්තිය ජනමත විචාරණය ජය ගැනීමට යෙදවිණි. ඒ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කැඩී ශ්‍රී.ල.නි.ප. ලේකම්වරයා විජය කුමාරතුංග ඇතුළු විශාල පිරිසක් අත්අඩංගුවට ගෙන තිබිණි. ආණ්ඩුවට විරුද්ධ අය එළියට බහින්නේ නැති තත්ත්වයක් රටේ මතු වී තිබිණි. ඒ ජනමත විචාරණය විශාල ඡන්ද මංකොල්ලයක් විය. ඒත් ඒ මැතිවරණයේ ප්‍රතිඵලය කුමක් ද? ජනමත විචාරණය ජයගත්තේ ලක්ෂ පහකිනි.

ඒ අනුව අද තත්ත්වය කුමක් ද? මේ ජනමත විචාරණය පැවැත්වෙන්නේ ආණ්ඩුව ඉතා අවාසනාවන්ත ලෙස ජනතා අප්‍රසාදයට පත් ව ඇති මොහොතක යි. අද ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතර බලය අහිමි වී ඇත. අතිශක්තිමත් එකාබද්ධ විපක්ෂයක් ජනමත විචාරණයට එරෙහි ව සිටිනු ඇත. ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලය තුළත් මේ ජනමත විචාරණය පිළිබඳ බරපතළ මතභේද ඇත. ආණ්ඩුව තුළත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළත්

චන්ද්‍රිකා විරෝධය එළිපිට මතු වී ඇත. රජයේ නිලධරයන් රජය ගැන අන්තයට ම කලකිරී ඇත. පොලීසිය රජය ගැන අන්තයට ම කලකිරී ඇත. ව්‍යාපාරික ප්‍රජාව චන්ද්‍රිකා රජය පෙරළන්න කළ හැකි සියලු දේ කරනු ඇත. මේ තත්ත්වය යටතේ මේ ජනමත විචාරණයත් චන්ද්‍රිකා රජයත් ලබන 21 දා පරාජය වන එක වළක්වන්න කිසිවකුට නො හැකි ය.

මී ළඟට අපි 2000 මහ මැතිවරණ ප්‍රතිඵල ගෙන බලමු. ඒ මැතිවරණයේ දී පොදුජන එක්සත් පෙරමුණ ගත් ඡන්ද හා අනෙක් පක්ෂ ගත් ඡන්ද ගෙන බැලුවොත් මධ්‍යම පළාත, සබරගමුව පළාත හැරෙන්නට අනෙක් සියලු ම පළාත් පරාජය වී ඇත. ඒ මැතිවරණ ප්‍රතිඵල දිස්ත්‍රික් වශයෙන් ගෙන බැලුවොත් ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, කුරුණෑගල, පුත්තලම, රත්නපුරය, කෑගල්ල, මාතලේ, නුවර, නුවරඑළිය, මොනරාගල, අනුරාධපුරය, අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 16ක් පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කර ඇත. මෙම දිස්ත්‍රික්ක 16න් අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය ජයග්‍රහණය කළේ මුස්ලිම් කොංග්‍රසයයි. ඒ අනුව ජනමත විචාරණයේ දී මේ දිස්ත්‍රික් තුන ම පරාජය වීම වැළැක්විය නො හැකි යි. මුස්ලිම් කොංග්‍රසය විපක්ෂයට එක් නො වුවත් මඩකළපුව හා ත්‍රිකුණාමලයේ අනෙකුත් ද්‍රවිඩ පක්ෂ හා එජාපය එක් වූ විට පොදුජන එක්සත් පෙරමුණට පසු ගිය මැතිවරණයේ දී ද අන්ත පරාජයක් ලැබී ඇත. එනම් මඩකළපුව 68,233කිනුත් ත්‍රිකුණාමලය 13,113කිනුත් පරාජය වී ඇත. එවිට පොදු පෙරමුණේ ජයග්‍රාහී දිස්ත්‍රික්ක ගණන 13ක් වේ. මේ 13න් කුරුණෑගල පුත්තලම, කෑගල්ල, නුවර, අනුරාධපුරය යන දිස්ත්‍රික්ක පහේ එක්සත් ජාතික පක්ෂය මුස්ලිම් කොංග්‍රසය හා ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද එකතු කළ විට පොදුජන එක්සත් පෙරමුණ පරාජය වන බව පෙනේ. ඒ මෙසේ ය.

- කුරුණෑගල ඡන්ද 24,762කින් පොදුජන එක්සත් පෙරමුණ පරාජය වී ඇත.
- නුවර ඡන්ද 14,929කි. පොදුජන එක්සත් පෙරමුණ පරාජය වී ඇත.
- පුත්තලම ඡන්ද 3392කින් පොදුජන එක්සත් පෙරමුණ පරාජය වී ඇත.

- අනුරාධපුර ඡන්ද 5881කින් පොදුජන එක්සත් පෙරමුණ පරාජය වී ඇත.
- කෑගල්ල ඡන්ද 1338කින් පොදුජන එක්සත් පෙරමුණ පරාජය වී ඇත.

මීට අමතර ව පසු ගිය මැතිවරණයේ දී කොළඹ හම්බන්තොට, බදුල්ල පොළොන්නරුව, වන්නිය හා යාපනය පොදු පෙරමුණ විශාල ලෙස පරාජයට පත් වී ඇත. පොදු විපක්ෂය එක් වූ විට මේ පරාජය දෙ ගුණ තෙ ගුණ වන බව පෙනේ.

ඒ මෙලෙස යි.

- කොළඹ පොදුජන එක්සත් පෙරමුණ ඡන්ද 15,1738කින් පරාජය වේ.
- බදුල්ල පොදුජන එක්සත් පෙරමුණ ඡන්ද 34,645කින් පරාජය වේ.
- හම්බන්තොට පොදුජන එක්සත් පෙරමුණ ඡන්ද 50,808කින් පරාජය වේ.
- පොළොන්නරුව පොදුජන එක්සත් පෙරමුණ ඡන්ද 15,514කින් පරාජය වේ.
- යාපනය පොදුජන එක්සත් පෙරමුණ ඡන්ද 18,084කින් පරාජය වේ.
- වන්නි පොදුජන එක්සත් පෙරමුණ ඡන්ද 38,124කින් පරාජය වේ.

ඉහත ප්‍රතිඵල අනුව දිස්ත්‍රික් 11ක් පොදුජන එක්සත් පෙරමුණ පරාජය වන අතර එය මුස්ලිම් කොංග්‍රසය ජයග්‍රහණය කළ දිගාමඩුල්ල ත්‍රිකුණාමලය හා මඩකළපුව එක් වූ විට පරාජය වන දිස්ත්‍රික්ක ගණන 14ක් වේ.

ඒ අනුව පොදුජන එක්සත් පෙරමුණ ජනමත විචාරණයේ දී අන්ත පරාජයක් ලබන බව ස්ථිර ය. එක්සත් ජාතික පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ හා මුස්ලිම් කොංග්‍රසය එකට ගත් කල පොදු පෙරමුණ ජයගත් දිස්ත්‍රික්ක ජය ගෙන ඇත්තේ පහත සඳහන් ආකාරයට යි.

- ගාල්ල ජය ගත්තේ 10,172කිනි.
- මාතර ජය ගත්තේ 18,020කිනි.
- පොදුජන එක්සත් පෙරමුණු බලකොටුව වන ගම්පහ ජය ගත්තේ 5516කිනි.
- මාතලේ ජය ගත්තේ 7704කිනි.
- නුවරඑළිය 25,233කිනි.
- මොනරාගල යන්තමින් 2309කින් ජය ගති.
- රත්නපුරය ජය ගත්තේ 17,903කිනි.

මෙයින් නුවරඑළිය තත්ත්වය අවදානම් ය. දිස්ත්‍රික්ක නායකයා ලෙස මම කළකිරීමෙන් සිටිමි. තොණ්ඩමන් ජනමත විචාරණයකට බොහෝ විට විරුද්ධ වීමට ඉඩ ඇත. එසේ වුව හොත් නුවරඑළිය ස්ථිර වශයෙන් පරාජය වේ. තොණ්ඩමන් ගේ තීරණය අනුව රත්නපුරය පරාජය වීම ද වැළැක්විය නො හැකි ය.

මේ සියල්ල පසු ගිය මහා මැතිවරණ ප්‍රතිඵල පදනම් කර ගෙන කළ විග්‍රහයකි. ගත වූ වසරෙහි මේ රජයෙන් ජනතාවට යහපතක් වුණා ද? කාගේත් මතය වන්නේ මේ වසරේ කිසිදු සංවර්ධන ක්‍රියාවක් සිදු නො වූ බව යි. එක රැකියාවක්වත් දීමට නො හැකි වූ බව රජයේ මන්ත්‍රීවරු කියති. මේ වසරේ තව ම මුදල් ලැබී නැති බව රජයේ පළාත් සභා මන්ත්‍රීවරු කියති.

ගත වූ වසරෙහි බඩු මිල වේගයෙන් ඉහළ යෑම ඇරැඹුණි. ගොවියා නැවත නැවතත් අමාරුවේ වැටුණි. සිය ගණන් කර්මාන්ත ශාලා වැසුණි. විදුලි ගාස්තු ඉහළ ගියේ ය. ජල බිල්පත් ඉහළ ගියේ ය. ගෑස් මිල ඉහළ ගියේ ය. බස් ගාස්තු ඉහළ ගියේ ය. රජයේ ඉහළ අයට හොරකම් දූෂණ චෝදනා විශාල වශයෙන් එල්ල විය.

රජයේ ම මන්ත්‍රීවරු කියන්නේ පසු ගිය මහ ඡන්දයට වඩා මෙවර සෑම ආසනයකින් ම ඡන්ද 3000-4000කින් පමණ ඡන්ද අඩු වන බව යි. එක ආසනයකින් ඡන්ද 250ක් අඩු වුව හොත් ගම්පහ දිස්ත්‍රික්කය පරාද වේ. ආසනයකින් ඡන්ද 500ක් අනෙක් පැත්තට ගියොත් ගාල්ල හා මාතලේ පරාද වෙයි. ඡන්ද 1500ක් අනෙක් පැත්තට ගියොත් මාතර හා රත්නපුරයත් පරාද වෙයි.

ඉහත විස්තර අනුව බලන විට මෙදා ජනමත විචාරණයෙන් පොදු ජන එක්සත් පෙරමුණ මුළු ලංකාවෙන් ම අතුගෑවී යෑම වැළැක්විය නො හැකි ය.

නමුත් අද මේ තත්ත්වය තවත් අවුල් සහගත තත්ත්වයට පත් වී ඇත. එනම් ජනාධිපතිනිය දැන් ජනමත විචාරණය කල් තබා ඇත. ජනමත විචාරණය පැවැත්වෙන්නේ ඔක්තෝබර් 18 වැනි දින යි. හේතුව එදිනට පාර්ලිමේන්තුවට වසරක් සම්පූර්ණ වෙයි. ඒ දිනය ද අතිවිශේෂ දිනයකි. එදින අවශ්‍ය නම් ජනාධිපතිනියට ජනමත විචාරණයක් නො පවත්වා ම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පුළුවන.

දැන් චන්ද්‍රිකාගේ අලුත් ම උත්සාහය කුමක් දැයි තේරුම් ගැනීම අපහසු නැත. ඇය ගේ උත්සාහයන් කීපයක් වේ.

1. පළමු උත්සාහය පාර්ලිමේන්තුව නො කැඳවා මේ ප්‍රශ්න තව දුරටත් දිග්ගස්වමින් මුස්ලිම් කොංග්‍රසයෙන් කිපදෙනකු නැවත ආණ්ඩුව පැත්තට ඇද ගැනීම.
2. එසේ නො හැකි නම් මුස්ලිම් කොංග්‍රස් මන්ත්‍රීවරුන් පොදු පෙරමුණෙන් ඉවත්කර මන්ත්‍රීකම් අහෝසි කර නව මන්ත්‍රීවරුන් පිරිසක් බඳවා ගැනීම.
3. සතාසිවම් සෙල්ලසාමි වැනි මන්ත්‍රීවරු ආණ්ඩුව පැත්තට බිළිබා ගැනීම.
4. එක්සත් ජාතික පක්ෂයෙන් දෙ වැනි පෙළ හෝ තුන් වැනි පෙළ පිරිසක් එකතු කරගෙන රජයක් පිහිටු වීම.
5. එක්සත් ජාතික පක්ෂයට ඇමැතිකම් දහයක් ලබා දෙමින් ජාතික රජයක් පිහිටු වීම.
6. මේ කිසිවක් හරි නො යන්නේ නම් රනිල්ට අගමැතිකම දී ඔහුට ආණ්ඩුව පිහිටු වීමට ඉඩහැර එ.ජා.ප. යෙන් කැබිනට් මණ්ඩලයට රනිල් ගැනීමට බලාපොරොත්තු වන පොදු පෙරමුණේ අය ගේ නම් චන්ද්‍රිකා විසින් නම් කරනු ලැබීම හා තව දුරටත් මුදල් ඇමැතිකමේ සිටීම.

7. ජනතා විමුක්ති පෙරමුණේ එකඟත්වය මත ආණ්ඩුව ඉදිරියට ගෙන යෑම.

8. මේ සියල්ල ඉටු කරගත නො හැකි නම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම.

බලයෙන් මත් වී වියරුවෙන් දඟලන චන්ද්‍රිකා බණ්ඩාරනායකට මේ කිසිවක් කර ගැනීමට නො හැකි ය. ඇයට මුස්ලිම් කොංග්‍රසයෙන් කිසිවකු නැවත ලබා ගත නො හැකිවනු ඇත. එයට ප්‍රධාන ම හේතුව මේ වන විටත් චන්ද්‍රිකා ගේ පක්ෂයේ ප්‍රබල පිරිසක් ඇයට එරෙහි ව කුමන ක්‍රියාමාර්ගයක් ගැනීමට යන්නේ දැයි කිසිවකුට අද නිගමනය කළ නො හැකි වීම ය.

චන්ද්‍රිකාට අද අවශ්‍ය වී ඇති ප්‍රධාන ම දේ මගෙන් හා ජී.එල්. පීරිස්, මහින්ද විජේසේකර, ජෙයරාජ් වැනි අයගෙන් පලිගැනීම යි. මේ තත්ත්වය තුළ ඔවුන් ආණ්ඩුවෙන් ඉවත් වුව හොත් මුස්ලිම් කොංග්‍රසයේ කිහිපදෙනකු පැමිණීමෙන් ප්‍රශ්නය නො විසඳෙන බව පැහැදිලි ය. එනිසා එය චන්ද්‍රිකා ගේ වියරු සිහිනයක් පමණි.

එසේ ම මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරුන් ගේ මන්ත්‍රීධුර අහෝසි කිරීමට ද කිසිදු නීතිමය ඉඩකඩක් නොමැත. දි. මු. ජයරත්න කැඳවූ විනය පරීක්ෂණය කල් ගියේ ඒ නිසා යි. එනිසා එම උත්සාහය තුළ ඇත්තේ මෝඩකම පමණි.

සතාසිවම්, සෙල්ලසාමි වැනි ද්‍රවිඩ මන්ත්‍රීවරුන් ගැනීමේ උත්සාහය ද මේ වන විට අසාර්ථක වී ඇත. දැන් ඔවුන් චන්ද්‍රිකාට යෝජනා කරන්නේත් වහා තම පක්ෂයේ අභ්‍යන්තර ගැටලුව විසඳා ගෙන එක්සත් ජාතික පක්ෂය සමඟ ජාතික ආණ්ඩුවකට එන ලෙස යි. කොහොමටත් සෙල්ලසාමි හා සතාසිවම් සමඟ මා ඉතා සමීප මිත්‍රත්වයකින් පසු වන බව කිසිවකුට රහසක් නො වේ.

එක්සත් ජාතික පක්ෂයෙන් දෙ වැනි - තුන් වැනි පෙළ මන්ත්‍රීවරුන් පිරිසක් බිලිබා ගැනීමේ උත්සාහය ප්‍රධාන වශයෙන් කළේ අගමැතිවරයා යි. මේ සඳහා ඔහු කළුතර දිස්ත්‍රික්කයේ හිටපු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන් වන සරත් රණවකත් මනෝ විජේරත්නත් යොදා ගත්තේ ය. අගමැතිවරයා ගේ ඉලක්කය වූයේ රුක්මන් සේනානායක සමඟ පිරිසක් රජයට ගැනීමත් ඔවුනට ඇමැතිකම් ගණනාවක් හා රුක්මන්ට නියෝජ්‍ය අගමැති තනතුරක්

පිරිනැමීම යි. රුක්මන් සාකච්ඡාවට ඉතා උනන්දුවෙන් සහභාගී වුවත් ඔහු උත්සාහ කළේ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතාත් සමඟ ජාතික රජයක් සඳහා යෑම යි. එනිසා අගමැති ගේ උත්සාහය වල්වැදුණි.

මේ අතර ටිරෝන් ප්‍රනාන්දු හා මිලින්ද මොරගොඩ බෝගොල්ලාගම වැනි ඉංග්‍රීසි කතා කරන චන්ද්‍රිකා පලවා හැරීමේ වීදි සටන්වලට කිසි සේත් අකැමැති සර්ව පිත්තලයන් කීපදෙනකු ගැනීමේ උත්සාහයක ද නිරත විය. චන්ද්‍රිකා ස්වභාවයෙන් ම ඉංග්‍රීසියෙන් කතා කරන සිංහල හරියට උච්චාරණය නො කරන ඉහළ පැලැන්තියේ උදවියට විශේෂ ළැදිකමක් දක්වයි. චන්ද්‍රිකා ඒ අයට කියන්නේ "මහත්තුරු" කියල යි. සිංහලයෙන් කතා කරන උගත් බුද්ධිමත් අයට චන්ද්‍රිකා කියන්නේ "තුට්ටු දෙකේ උන්" කියල යි. එනිසා චන්ද්‍රිකා මේ උත්සාහය පසු පස සිටියේත් බලාපොරොත්තු සහගත ව ය. නමුත් එක්සත් ජාතික පක්ෂය තුළ සිටින ගාමිණී අතුකෝරාල, රාජිත සේනාරත්න, රවි කරුණානායක වැනි ඉදිරි පෙළේ සටන්කාමී මන්ත්‍රීවරුන් විසින් මේ පුස්ලෝඩම් උත්සාහය උපන් ගෙයි ම පරාජය කර දමන ලදි.

මී ළඟට චන්ද්‍රිකා සිතුවේ ඇමැතිකම් දහයක් ලබා දී එක්සත් ජාතික පක්ෂය ජාතික රාජ්‍යයකට යෑමට යි. එ.ජා.ප ය මේ වන විටත් ජාතික ආණ්ඩුවකට යන්නේ නම් රනිල්ට අගමැතිකම අවශ්‍ය බව තීන්දු කර ඇත. ඒ අනුව ඇමැතිකම් දහයකින් චන්ද්‍රිකා ගේ අවශ්‍යතාව ඉටුකර ගත නො හැකි ය. එපමණක් නො ව මේ වන විට එක්සත් ජාතික පක්ෂය ජාතික ආණ්ඩුවකට යන්නේ නම් එම රජයේ ඇමැති මණ්ඩලය විසිපහකට (25) සීමා විය යුතු බවත් ඉන් දහයක් (10) එක්සත් ජාතික පක්ෂයටත් තව දහයක් (10) පොදු පෙරමුණටත් ඉතිරි පහ (5) කුඩා පක්ෂවලටත් ලබාදිය යුතු බවට ද තීරණය කර ඇත.

මා දකින ලෙස චන්ද්‍රිකා අවසානයේ මේ සියල්ලට ම එකඟ වීමට ඉඩ ඇත. ඒ ඇය ජනමත විචාරණයක ඡන්දයට ගියොත් අත්වන ප්‍රතිඵලය හොඳාකාර ව දන්නා නිසා ය. පසු ගිය ජනාධිපති මැතිවරණ ජය ගැනීමේ දී තීරණාත්මක සාධකයක් ලෙස සිටි කිහිපදෙනකු ම අද චන්ද්‍රිකාට නැත. කොළඹ දිස්ත්‍රික්කයේ පොදු පෙරමුණේ පළමු වැනියා වූ ජී.එල්. පීරිස් ද අද චන්ද්‍රිකාට නැත. ජෙයරාජ්, මහින්ද යෝධයන් දෙදෙනෙකි. මේ අය සමඟ ඇති

ප්‍රශ්න නිරාකරණය නොකර ගෙන චන්ද්‍රිකාට ඡන්දයකට යෑමට අද ශක්තියක් නොමැත. මතු වී ඇති ආර්ථික හා සමාජ ව්‍යසනය ඉදිරියේ අද ජනතාව ඉදිරියට ඡන්දය ඉල්ලා ගෙන යෑම පරාජය වැළඳ ගැනීමකි.

පසු ගිය දිනවල චන්ද්‍රිකා ජේ.වී.පී. ය සමඟ සාකච්ඡා කළා ය. එය කාගේ දෝ දිරව්ව ලණුවකි. බොහෝ විට මංගලගේ විය හැකි ය. ඇය ජනතා විමුක්ති පෙරමුණ සමඟ සාකච්ඡා කළා පමණක් නො ව ඒ පක්ෂය වර්ණනා කරන්නටත් පටන් ගත්තා ය. බලය රැකගන්න තියෙන වියරුව නිසා දැන් ඇයට තම ස්වාමියා විජය කුමාරතුංග මැරුවේ කවුරු ද යන්නත් අමතක වී ඇත. විජය මරපු ජේ. වී. පී. කාරයා ගේ කට උත්තරය අප ළඟ තිබේ. එය චන්ද්‍රිකාටත් ලැබුණ බව අපි දනිමු. එහෙත් මගේ විශ්වාසය චන්ද්‍රිකා ඒක කියවලා නොමැති බව යි. ඒ කියවන පුරුද්ද ඇයට නැති නිසා ය. කොහොම නමුත් ජේ. වී. පී. සමඟ කළ සාකච්ඡාවත් උපන් ගෙයි ම බිඳ වැටී ඇත. දැන් ඇය ප්‍රසිද්ධියේ ම ජනතා විමුක්ති පෙරමුණට චෝදනා කරන්නී ය.

මේ තත්ත්වය යටතේ චන්ද්‍රිකාට දැන් විකල්ප දෙකක් ඉතිරි ව ඇත.

- එක රනිල්ට පොදු පෙරමුණේ අයත් සමඟ ජාතික රජයක් පිහිටු වීමට ආරාධනය කිරීම. එසේ කළොත් ඇයට ඉතිරි වසර හතර හමාරක කාලයේ දී ජනාධිපතිනිය ලෙස සිටිය හැකි ය. ඒත් ඇයට මුදල් ඇමැතිකම හෝ වෙනත් ඇමැතිකමක් දැරීමට ඉඩ නො ලැබෙනු ඇත.
- චන්ද්‍රිකා මෙය නො කළොත් ඊ ළඟට කළ හැකි එක ම දේ මහා මැතිවරණයක් පැවැත්වීම යි. එහි ප්‍රතිඵලය වන්නේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ඒකාබද්ධ පෙරමුණ අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගැනීම යි.

චන්ද්‍රිකා මේ කොයි දේ තීරණය කළත් අපට ප්‍රශ්නයක් නැත. අපේ මවුබිමත් ශ්‍රී ලංකාවාසී ජනතාවත් වෙනුවෙන් ඇය හැකි ඉක්මනින් බලයෙන් ඉවත් කිරීම අද පොදු ජනතාව ගේ එක ම අවශ්‍යතාව වී ඇත.

එය පොදු ජන එක්සත් පෙරමුණ නිර්මාණය කළ හා බලයට ගෙනා වැඩි දෙනකු ගේ ද පැතුම යි.

# 08

## ජනාධිපතිනිය වෙත . . .

*(මේ ලිපිය මා විසින් කෙටුම්පත් කළේ 2001 වසරේ අවසාන භාගයේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය රජයෙන් ඉවත් වීමෙන් පසු ව යි. ඒ වන විට මා හා චන්ද්‍රිකා මැතිනිය අතර මතභේද උග්‍ර වී තිබිණි. මා රජය ගැන හා චන්ද්‍රිකා ගැන දැරූ අදහස් යම්තාක් දුරකට පිළිගනිමින් සිටි පෙරමුණු රජයේ මැති ඇමැතිවරුනට මේ ලිපිය මා විසින් බෙදා දෙනු ලැබිණි.)*

අතිගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය,
ජනාධිපති මන්දිරය,
කොළඹ.

අතිගරු ජනාධිපතිනියනි,

ඔබතුමිය සමෘද්ධි සංවර්ධන නිලධාරී සමුළුවේ කරන ලද කතාවක් පිළිබඳ ප්‍රවෘත්තියක් 2002 සැප්තැම්බර් 17/18 යන දිනවල පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රකාශ කෙරිණි. ඉන් මටත්, මගේ බිරිඳටත්, රජයටත්, අගමැතිතුමාටත් ඔබතුමියගේ ම වචනවලින් කියතොත් "කාක්" භාෂාවෙන් කතා කර තිබිණි.

ඔබේ මුළු කතාව තුළ ම ඇත්තේ ඔබට හුරුපුරුදු ඔබ කවුදැයි තව දුරටත් හෙළිදරවු වන වංචාකාරී, නිර්මාණාත්මක, හාස්‍ය ජනක අසත්‍ය කයිවාරුවක් පමණි. ඒ ගැන මම පුදුම නො වෙමි. ඒ සියල්ල ඔබේ චරිතයට හා අධ්‍යාපන මට්ටමට ඉතා හොඳින් ගැළපේ.

ඔබේ කතාවට පිළිතුරු දීමට ප්‍රථම සමුළුව ගැන වචනයක් කිව යුතු ය. එහි සමෘද්ධි නිලධරයන් 200ක් වත් නො සිටි බව

මුලින් ම කිව යුතු ය. එනිසා එය තවත් පොදු පෙරමුණේ සමුළුවක් මිස සමෘද්ධි නිලධර සමුළුවක් නොවන බව ඔබ මෙන් ම රටත් දැනගත යුතු ය.

දැන් මම ඔබේ කතාවට පිළිතුරු දීමට බලාපොරොත්තු වෙමි.

## 1994 මැතිවරණ ප්‍රකාශනය

1994 මැතිවරණ ප්‍රකාශනය සකස් කිරීමේ වගකීම ඔබට භාරදුන් බව කීම සම්පූර්ණ අසත්‍යයකි. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සිය පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනය සැදීම ආරම්භ කළේ 1990 සිට යි. මේ සඳහා මුල් කාලයේ මහාචාර්ය කරුණාතිලක, මහාචාර්ය ලක්ෂ්මන් හා මැතිනිය ගේ පෞද්ගලික ලේකම් ව සිටි උනන්තැන්න මහතාත්, මමත් සම්බන්ධ වී කටයුතු කළෙමු. ඒ දිනවල සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඔබ ගැන මතක් කරන විටත් කේන්ති යන බව කිසිවකුටත් රහසක් නො වේ.

## මැතිවරණ ප්‍රකාශනයේ ආර්ථික කොටස

මැතිවරණ ප්‍රකාශනයේ ආර්ථිකය පිළිබඳ කොටස ඔබ කියන විට මා ලියාගත් බව ඔබ කියා ඇත. එය ද අමූලික බොරුවකි. ඒ මැතිවරණ ප්‍රකාශනය හැදීමට ආර්ථික විද්‍යාව පිළිබඳ හසළ දැනුමක් ඇති ඉහත මා කිවූ දෙපළ හැරෙන්නට තවත් ආචාර්ය, මහාචාර්යවරු ගණනාවක් සහභාගි වූ හ. ඒ වැඩි දෙනෙක් තව ම ජීවතුන් අතර සිටිති.

ඔබ ඒ කතාව කීමෙන් උත්සාහ කළේ ඔබතුමිය ආර්ථික විද්‍යාව පිළිබඳ විශාල දැනුමක් ඇති තැනැත්තියක යැයි හැඟවීමට බව ඉතා ම පැහැදිලි ය.

එහෙත් ඇත්ත තත්ත්වය එය නො වේ. ඔබ අඩු ම වශයෙන් උසස් පෙළ මට්ටමටවත් ආර්ථික විද්‍යාව හදාරා හෝ විෂයයක් හැටියට සමත් වී හෝ නැති බව අද රටට රහසක් නො වේ. ඔබ ප්‍රංශයේ සෝබෝන් විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියක නොවන බවත්, එය ඔබ විසින් ලෝකයට ම මවා ඇති බොරුවක් බවත් හෙළි වී හමාර ය.

## සමෘද්ධි වැඩ සටහන

සමෘද්ධි වැඩ සටහන මා සමග නිර්මාණය කළ ලාංකික උගතුන් පිරිස ගැන ඔබ ද මා මෙන් ම හොඳින් දන්නෙහි ය. "සමෘද්ධි වැඩ සටහන එස්. බී.ට භාරදුන්නේ එය එයා ගේ නිර්මාණයක් නිසයි" යනුවෙන් ඔබතුමිය අගමැති වූ අලුත කළ ප්‍රකාශයක් පුවත්පත්වල ද පළ විය. එහෙත් එය මගේ තනි නිර්මාණයක් නො වේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගත් අපේ පරපුරේ උගතුන් විසින් සමෘද්ධි සංකල්පය පෝෂණය කළ බව සත්‍යයකි. සමෘද්ධි දර්ශනයේ හරි අඩක් තව ම ක්‍රියාත්මක කර නැත. ඔබතුමිය ගේ නොදැනීම නිසාත්, සමෘද්ධිය වෙළාගත් දේශපාලන කුණාටුව නිසාත් සමෘද්ධි ව්‍යාපාරයටත් සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කළමනාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් විශාල ප්‍රශ්න, අර්බුද හා පසුබැසීම්වලට මුහුණ දීමට සිදු විය. එය අභාග්‍යයකි.

එහෙත් කුණාටු, ගංවතුර, භූමිකම්පා සියල්ල මැදින් වැටී වැටී නැඟිටින සමෘද්ධි ව්‍යාපාරය ඉදිරියට ඇදෙන බව මම ඔබතුමියට මතක් කිරීමට කැමැත්තෙමි.

## සමෘද්ධිය විනාශ කිරීමට ඔබ දැරූ තැත

සමෘද්ධි නිලධරයන් 30,000ක් දෙනා 1000කට අඩු කිරීමට ඔබ මට බල කළා මතක නැද්ද? අත්තනගල්ලේ හා ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන රැස්වීම් දෙකක දී ඔබ මෙය නැවත නැවත කීවා මතක නැද්ද? සමෘද්ධි නිලධරයන්ට ත්‍රීවීලර්, අත් ට්‍රැක්ටර්, ස්වයං රැකියා ණය දී ගෙදර යැවීමට ඔබ අපේ අමාත්‍යංශයට මුදල් වෙන් කළා මතක නැද්ද?

අතිගරු ජනාධිපතිනියනි, මේ සියල්ල පුවත්පත්වල මෙන් ම විද්‍යුත් මාධ්‍යවල ද විකාශනය විය. අපි ඒ සියල්ල පරිස්සමින් එක්රැස් කර ඇත්තෙමු.

ඔබතුමිය සමෘද්ධි බැංකු හැදීමට විරුද්ධ වූ සැටි මතක් කර ගන්න. සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩ සටහන රක්ෂණ සංස්ථාවට භාර දී අහිංසක සමෘද්ධි නිලධාරීන් අමාරුවේ දැමූ හැටි ඔවුහු හොඳට දනිති.

මැතිවරණ ඉලක්ක කර වහා දුප්පතුන්ට ණය දීමට බල කරමින් අප ගොඩනඟමින් සිටි සමෘද්ධි ණය සංස්කෘතිය විනාශ කිරීමට තැත් කළ අයුරු මට වඩා හොඳින් සමෘද්ධි නිලධරයෝ දනිති.

සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදයෙන් සමෘද්ධි ව්‍යාපාරය කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති පොදු පෙරමුණේ මන්ත්‍රීවරුන්ට දීමට ඔබතුමිය උත්සාහ දැරූ හැටි සමෘද්ධි ව්‍යාපාරයේ කාටවත් රහසක් නො වේ. සමෘද්ධි ඉතිරි කිරීම් වැඩි වන විට අප සමෘද්ධි වාණිජ බැංකුවක් හැදීමට ගත් උත්සාහයත්, එය ඔබතුමිය විසින් වැළකූ ආකාරයත් කරුණාකර සිහිපත් කර ගන්න. මේ සියල්ල ඔබ කළේ සමෘද්ධි වැඩ සටහන ගැන මෙන් ම ලෝකයේ විවිධ රටවල ක්‍රියාත්මක වූ දුප්පත්කම නැති කිරීමේ ව්‍යාපාර ගැන ද ඔබට කිසිදු දැනුමක් හෝ අවබෝධයක් හෝ නොතිබුණු නිසා යි. එවැනි දැනුමක් ලබා ගැනීමට කියැවීමේ පුරුද්දක් ද ඔබට නැත. එය ද අපේ අවාසියට හේතු විය.

## සමෘද්ධි මුදල් වංචා කිරීම ගැන කරන චෝදනාව

මේ භයානක චෝදනාව කරන විට සිදු වී ඇති දේ ඔබට නො තේරුණත්, සමෘද්ධි නිලධාරීන්ට හොඳින් තේරේ. ඔබට බැංකු හා මූල්‍ය පරිපාලනය, ගණකාධිකරණය, පොත් තැබීම ගැන අල්ප මාත්‍ර අවබෝධයක් නැත. ආර්ථික විද්‍යාව, පරිපාලනය, කළමනාකරණය වාණිජවේදී වැනි උපාධි කළ අයටත්, අවම වශයෙන් උසස් පෙළට ආර්ථික විද්‍යාව හදාරා ඇති අයටත් මේවා ගැන මූලික වැටහීමක් ඇත.

සමෘද්ධි මුදල් වංචාව ගැන, ඔබ ඉහළින් වර්ණනා කළ අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම ම මටත්, මගේ නිලධරයන්ටත් එරෙහි ව පරීක්ෂණ කටයුතු ආරම්භ කළේ රනිල් යුගයේ නො ව, ඔබේ රජය යටතේ යි. මාත්, මගේ නිලධරයනුත් ඒ සියලු චෝදනාවලින් නිදහස් වූයේත් ඔබේ රජය කාලයේ දී ම යි. ඒ වින විට සමෘද්ධි අමාත්‍යවරිය වූයේ ද ඔබ ම යි.

අල්ලස්, දූෂණ පනත යටතේ අපට දඬුවම් කිරීමට නො හැකි වුවත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපට දඬුවම් කළ හැකි බව ඔබ කියයි.

ජනාධිපතිනියනි, මෙය සත්‍ය නම් ඔබට හෝ ඔබේ ඕනෑ ම ගෝලබාලයකුට හෝ අපට එරෙහි ව නඩු දැමීමේ අයිතිය ඇත. ඇයි එය නොකරන්නේ? කරුණාකර නඩු දාන්න. මම ඔබට අභියෝග කරමි.

අවුරුදු 8ක් ජනාධිපතිකම් කරලත්, මූලික නීතිය ගැන ඔබේ ඇති නොදැනීම, පරිපාලනය ගැන ඔබේ ඇති හිස් බව මේ සියලු කතාන්තර මඟින් ලෝකයට ම පෙන්නුම් කරන බව මතක තබා ගන්න.

සමෘද්ධි බැංකුවලින් ලබාගත් මුදල් ප්‍රමාණ පිළිබඳ ව ඔබ සංඛ්‍යා ලේඛන කිහිපයක් ද ඉදිරිපත් කර ඇත. ඒ ගණන් වැරැදි ය. කියා ඇති තොරතුරුත් වැරැදි ය. එහෙත් ඔබ ඔය කියන්නේ පෑන් ඒෂියා බැංකුවෙන් සමෘද්ධි ව්‍යාපාරය මිල දී ගත් කොටස් ගැන බව මම දනිමි. මිලියන 300ක් නො ව මිලියන 100කට කොටස් ගත් බව සත්‍යයකි. එය පැහැදිලි, නීත්‍යනුකූල, නිවැරැදි ආයෝජනයකි. එය අදට වඩා අනාගතයට එලදායි වන ආයෝජනයක් වන අතර, ඒ සඳහා නීත්‍යනුකූල ව සමෘද්ධි බැංකු ගණනාවක් නමින් කොටස් මිල දී ගෙන ඇති බව සත්‍යයකි.

මේ ගැන මැතිවරණ කාලයේ දීත් අපි වාද විවාද කර ගතිමු. අපේ සමෘද්ධි අමාත්‍යාංශය හා අධිකාරියේ සියලු නිලධාරීහු මේ විවාදයට පැටලුණ හ. ඒ සියලු ම දෙනා තව ම සිටිති. රහස් පොලීසිය ලවා ද අපරාධ විමර්ශන ඒකකය ලවා ද, අල්ලස් කොමිසම ලවා ද, විගණකාධිපති දෙපාර්තමේන්තුව ලවා ද ඔබ කෙසේ හෝ මට හා මගේ නිලධාරීන්ට නඩු පැවරීමට උත්සාහ ගත් බව රහසක් නො වේ. අල්ලස් හා දූෂණ කොමිසමේ පොලිස් නිලධාරීන් ඔබ හමුවට කැඳවා මට කෙසේ හෝ නඩු දැමීමට කියූ බව ද අප කාටවත් රහසක් නො වේ.

මේ සියල්ල කළේ ඔබේ රජය යටතේ යි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා විපක්ෂ නායකවරයා වශයෙන් සිටියදී යි. මම ඔබේ රජයේ අමාත්‍ය තනතුරෙන් ඉවත් වූ පසු ව යි. එදා රහස් පොලීසියේ සහ අපරාධ විමර්ශන ඒකකයේ ප්‍රධානීන් වූයේ, ඔබ කියන ඕනෑ ම වැඩක් කර ප්‍රශංසා ලබන්න සැදී පැහැදී සිටි අයයි. ඒත් ඒ කිසිවකුට වත් මට හෝ මගේ නිලධාරියකුට හෝ නඩු දැමීමට නො හැකි විය.

## මගේ බිරිඳ ගේ ඉඩම් නඩුව

මගේ බිරිඳ ගේ ඉඩම රජයේ හෝ වෙනත් අයකු ගේ නොවන බව ඔබ හොඳටම දනී. එය ඇය කුඩා කල සිට හැදුණු වැඩුණු ගෙදරක ඥාති මාමා කෙනකු විසින් ලියනු ලැබූ ඉඩමකි. ඔහු ගේ එක ම පුතා සාක්ෂියට ඉදිරිපත් වූ බව නීතිපති දෙපාර්තමේන්තුව, උසාවිය, රහස් පොලීසිය හොඳට ම දනී. ඒ ඉඩම ලියූ අය ගේ එක ම පුතා ගේ එක ම සහෝදරිය ලෙස අද සිටින්නේත් මගේ බිරිඳ යි. ඒ නිසා දැන් ඔබ ගෙතූ ඒ බොරු නඩුවේ සියලු චෝදනාවලින් මගේ බිරිඳ නිදහස් වී ඇත.

1980 ගණන්වල සිට එම ඉඩමේ අනවසර පදිංචිකරුවන් වන්දි ගෙවා ඉවත් කරමින් ඒ ඉඩම ඉතා අමාරුවෙන් නිදහස් කරගත් බව ඔබත් හොඳින් දනී.

වැදගත් ලියවිලි සඟවා, බොරු සාක්ෂි ගොනුකර, අයිතිකරුවන් නැති ඉඩමක් මගේ බිරිඳ ලියාගෙන ඇති බව ඔබේ පොලිස් ගෝලයන් කිහිප දෙනකු ලවා ඔප්පු කිරීමට ඔබ දැරූ උත්සාහය රටට රහසක් නො වේ. ඒ අවස්ථාවේ ඔබ අවුරුදු 19 හා 17 වයසැති මගේ දරුවන් දෙදෙනාටත් හිරිහැර කිරීමට ගත් උත්සාහ මවකට නො ගැළපේ. මා මරා දැමීමට ඔබේ ආරක්ෂක භටයන් කිහිප දෙනකු සමඟ මිනීමරුවන් හඟුරන්කෙත එවූ හැටිත් අප උන් අත්අඩංගුවට ගත් සැටිත් ඔබ පොලීසියට අසභ්‍ය වචනවලින් බැන වදිමින් උන් නිදහස් කිරීමට උත්සාහ කළ සැටිත් අපේ රටේ බුද්ධිමත් ජනතාවට අමතක නැති බව සිතට ගන්න.

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔබට කිසිදු බොරුවක් කර නැත. එතුමා මට සමෘද්ධි අමාත්‍ය තනතුර දිය යුතු යයි ඔබතුමියට බලකර සිටියේ මා සියලු චෝදනාවලින් නිදහස් වූ පසු යි. මට එරෙහි ව තවත් පරීක්ෂණ පැවැත්වෙන බව කියමින් අගමැතිතුමා රැවටීමට උත්සාහ කළේ ඔබතුමිය යි. අගමැතිතුමා බොරුකාරයෙක් නො වේ. එහෙත් ඔබතුමිය මුළු ලෝකය ම දන්නා, ලෝකයේ ම රාජ්‍ය නායකයන් අතර පිළිකුලට පත් වූ බොරුකාරියකි. ඔබ ගේ ම මව ඔබ ගැන එදා කීවේ "කට ඇරියොත් බොරු කියන, කිසි දාක වෙලාවට වැඩක් කරන්න බැරි, මගේ මුද්‍රණාලයේ මැෂින් හොරකම් කළ, චන්ද්‍රිකා සමඟ මට දේශපාලනය කරන්න බැහැ. කරුණාකර එයා පක්ෂයට ගන්න කියලා මට බලකරන්න එපා" යනුවෙනි.

අතිගරු ජනාධිපතිනියනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් තනතුර දැරූ මා පමණක් නො ව ජේ. ආර්. පී. සූරියප්පෙරුමත් තව ම ජීවතුන් අතර සිටී. මැතිනිය ගේ පෞද්ගලික ලේකම් තනතුර දැරූ කීර්ති මාවැල්ලගේත් තව ම ඔබ පක්ෂයේ සිටී. මැතිනිය ගේ කැත කුණු පවා අදිමින් ඇය රැකගත් එස්.එස්.ජී. ජයසිංහත් තව ම සිටී. මැතිනිය ළඟින් ම සිටි දාස මුදලාලිත් තව ම ජීවත් වේ.

මට ඔබට මෙන් නීතිමය රැකවරණයක් නැත. කරුණාකර මේ කියන දේවලට හැකි නම් නඩු දාන්න. උසාවියේ දී මා කියන මේ සියලු දේ ඔප්පු කර පෙන්වීමට සූදානම් වී සිටිමි.

අතිගරු ජනාධිපතිතුමනි, හොරා අනෙක් සියලු දෙනා හොරුන් යැයි සිතයි. බොරුකාරයා අනෙක් සියලු දෙනා බොරුකාරයින් යැයි සිතයි. වංචාකාරයෝ අන් සියලු දෙනා වංචාකාරයෝ යැයි සිතති. මෙය පිළිගත් මනෝ විද්‍යාත්මක සිද්ධාන්තයකි. ඔබට වැළඳී ඇත්තේ මේ රෝගය යි.

සොරකම් ගැන ජනාධිපතිනියට

මේ රටේ, ඔබේ මව, පියා ඇතුළු රාජ්‍ය නායකයෝ විශාල ගණනක් සිටිය හ. ඒ කිසිවකුට ඔබට තරම් වංචා දූෂණ චෝදනා එල්ල වී නැත. ඒ කිසිවකුට ඔබට මෙන් බොරුකාරී, වංචාකාරී කියා චෝදනා එල්ල වී නැත.

පැරීසියේ ගෙවල්, එංගලන්තයේ ගෙවල්, නයිල් ගංගා තීරයේ ගෙවල් ගත්තේ කවුදැයි ජනතාව ප්‍රශ්න නැඟුවේ ඔබගෙනි.

ඔබම කියන පරිදි අවිආයුධ ගනුදෙනුවල දී කෝටි ගණන් කොමිස් ලැබේ. ඉතින් ඒ සියලු ගනුදෙනු කළේ බාලපටබැඳි, චන්ද්‍රානන්ද හා පී. බී. ජයසුන්දර සමඟ තනි ව ම නො වේ ද?

කෝටි ප්‍රකෝටි ගණන් වටිනාකම් ඇති මේ ගනුදෙනුවල කැබිනට් පත්‍රිකා අතේ ගෙනැවිත් කැබිනට් එකට නො පෙන්වා. පොඩි බොරු විස්තරයක් කර අනුමත කරගත් හැටි අමතක ද?

- තවක්කාල් ගනුදෙනුව කොහොම ද?
- එයාර් ලංකා ගනුදෙනුව සිදුවුණ හැටි ලංකාවේ මිනිස්සු නො දනිත් ද?

- ගෑස් ඒකාධිකාරය දීර්ඝ කර කෝටිගණන් තෑගි ගත්තැයි චෝදනා ආවේ ඔබට නො වේ ද? චැනල් නයින් අමතකද?
- හෙලිකොප්ටර් මිල දී ගැනීම.
- අහස් යාත්‍රා මිල දී ගැනීම.

අද රටේ ඇති ජනප්‍රිය හෑන්ඩ් බෑග් එක ඔබතුමිය මිල දී ගත්තේ නැද්ද? ඒකට රජයේ මුදල් ලක්ෂ 60 - 70 ක් වැය කළේ නැද්ද? එය වංචාවක් නො වේද? ඇයි උත්තර නො දී මඟ හරින්නේ?

- ඔබතුමිය ගේ කැබිනට් පත්‍රයකින්. හදිසියේ ම රබර් පර්යේෂණ ආයතනයට මිලියන 940 දුන්නේ ඇයි? එයින් මිලියන 500ක් අතුරුදන් වුණේ කොහොම ද ? කවුරු ද මේ මුදල් හොරකම් කළේ ?
- සමදරා රණතුංග ගේ බෙන්ස් රථය බදු රහිත ව නිදහස් කිරීමේ වංචාව.
- ටෙලිකොම් මගඩිය.

අතිගරු ජනාධිපතිනියනි,

මේ සියල්ල පැහැදිලි ව එල්ල වී ඇත්තේ ඔබට යි.

ඔබට ඇති නීතිමය රැකවරණයෙන් මිදී ඔබ උසාවි එන්නට සූදානම් නම් මේවා ඔප්පු කරන්නට දස දහස් ගණන් ජනතාව ඔබට එරෙහි ව නඩු පවරනු ඇත.

ඔබතුමිය මා කෙරෙහි ඇති වෛරය මට තේරුම් ගැනීමට අපහසු නැත.

අද ඔබ රටින්, ගම්පහෙන් පමණක් නොව අත්තනගල්ලෙන් ද ජනතාව ප්‍රතික්ෂේප කර හමාර ය. ඔබගේ වංචනික කඩතුරා ඉවත් කර ඔබ කවුදැයි රටට හෙළිදරවු කළ අය අතර මමත් ඉදිරියෙන් සිටිමි. ඒ ගැන මම සතුටු වෙමි.

ඔබතුමිය රට අගාධයෙන් අගාධයට ගෙන යන බවත්, ඔබ රටේ ආර්ථිකය විනාශ කරන බවත්, ඔබ දූෂිතයන් හොරුන් රකින බවත්, ඔබ රටේ සංවර්ධනය ඍණ කරන බවත්, ඔබ කට ඇරියොත් කියන්නේ බොරු බවත්, ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පෙරමුණත් විනාශ කරන බවත් අපි එදා කීවෙමු.

එහෙත් බලයෙන් ආරූඪ වී, සිහිය විකල් කරගෙන සිටි ඔබට ඒ කිසිවක් නෑසිණි.

ඔබේ ස්වාමියා මැරූ, ඔබ ම මිනීමරුවන් යැයි කියන ජේ.වී.පී. එකට මුවා වී බලය රැකගන්නට තරම් ඔබ නිර්ලජ්ජිත විය.

එහෙත් ජනපතිනියනි,

අපි ඔබ පරාජය කළෙමු. ඔබේ පක්ෂය පරාජය කළෙමු. ඔබේ පෙරමුණ පරාජය කළෙමු.

## එල්.ටී.ටී.ඊ. මිනීමරුවා, ජේ.වී.පී. මිනීමරුවා

ඔබ මේ අය මිනීමරුවන් යැයි කියමින් බැද්දගානේ සංජීව නමැති පාතාලේ මිනීමරුවාට පොලිස් සාජන්ට් පදවියක් ලබා දී ජනාධිපති මන්දිරයේ තබාගෙන සිටියේ නැද්ද?

ඒ මිනීමරුවා ලවා ඔබේ දේශපාලන හතුරන් විනාශ කිරීමට උත්සාහ කළේ නැද්ද? ලසන්තට, වික්ටර් අයිවන්ට කරන්ට ගිය දේ අමතක ද?

බැද්දගාන සංජීව ගේ මිනීමැරුම්වලට ඔබ වග කිවයුතු නැද්ද?

රට ම භීතියට පත් කළ දස දහස් ගණන් මිනිසුන් මැරුණ තවත් ලක්ෂ ගණන් අංග විකල කළ තවත් ලක්ෂ ගණනක් අනාථ කළ, රටේ ධනය කෝටි ගණනක් විනාශ කළ මේ කුරිරු යුද්ධය ජාවාරමක් කරගැනීම තරම් තවත් අපරාධයක් වේ ද?

යුද්ධය ජාවාරමක් කරගෙන හම්බ කිරීම මිහිකත නො උසුලන අපරාධයකි.

## අම්මා පාවා දීම : අපේ දරුවන්ට අවමාන කරන්න එපා

අම්මා හෝ පාවා දී බලය ලබාගැනීමට අපේක්ෂා කරන තරුණ පරපුරක් 17 වසරක යූ.ඇන්.පී. පාලන කාලය තුළ බිහි කළ බව ඔබ කියා ඇත.

ලාංකික සංස්කෘතිය තුළ හැදුණු, අපේ සිරිත් විරිත්වලට අනුව වැඩුණු අපේ තරුණයන් අම්මා පාවා දීමට තරම් අවලම් වී නැත.

ශ්‍රී ලංකා දරුවන්ට එසේ අපහාස කරන්නට ඔබට අයිතියක් නැත.

මා දන්නා අම්මා රැවටූ, අම්මා මුළා කළ, අම්මා පාවා දුන් එක ම කාන්තාව ඔබ යි.

ඔබ මහජන පක්ෂය හදාගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හා අම්මාට කළ හැකි සියලු හානි කළා මතක නැද්ද? ඉන් පසු ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එරෙහි ව නැවත බහුජන නිදහස් පෙරමුණ හැදුවා මතක නැද්ද?

ඉන් පසු නැවත ඔබ ශ්‍රී ලංකා පක්ෂයට ගැනීමට නුවරඑළියේ "ජෙනරල් හවුස්"වල සිරිමාවෝ මැතිනිය සමඟ පැවැත් වූ සාකච්ඡා මතක ද? ඒ සාකච්ඡාව සංවිධානය කරන ලද්දේ මා විසිනි.

එදා ඔබ මැතිනිය ගේ නායකත්වය පමණක් නො ව ඉන් පසු අනුර බණ්ඩාරනායක ගේ නායකත්වය භාර ගැනීමට ද අම්මා ඉදිරියේ එකඟ වුණා මතක ද?

1994 මහ මැතිවරණ ප්‍රතිඵල නිකුත් වන විට ඔබ ජේ. ආර්. ඇතුළු දන්න දන්න සියලු දෙනා අතේ විජේතුංග ජනාධිපතිවරයාට යැවූ පණිවුඩය කුමක් ද? "අම්මාට අගමැතිකම දෙන්න එපා. මට දෙන්න" කියන එක නො වෙයි ද?

ඔබ ජනාධිපති අපේක්ෂිකාව වුණේ ද සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ විරෝධය මත බව අමතක කරන්න එපා.

ඔබ ජනාධිපතිනිය වන විට සිරිමාවෝ මැතිනියට අගමැතිකම දෙන්න ඔබ විරුද්ධ වූ හැටි අමතක ද? මාත් මංගල සමරවීරත් එදා මැතිනියට අගමැතිකම දෙන ලෙස මන්ත්‍රීවරුන් ගෙන් පෙත්සමක් අත්සන් කර ඔබ අතට දුන්නා අමතක ද?

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනතාව කවදත් ඔබතුමියට වඩා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ආදරය කළ හ. ඒ අය ඔබ තෝරා ගත්තේ ඔබේ දක්ෂතාවලට නො වේ. ඔබේ අදක්ෂතා, නපුරු අදම්වුකම් හොඳ හැටි දැනගෙන යි. එහෙත් එදා සිරිමාවෝ මැතිනිය අසනීප වූ විට විපක්ෂයට අකැමැත්තෙන් හරි ඔබ තෝරා ගැනීමට සිදු වූ බව මතක තබා ගන්න.

මේ අනුව අම්මා පාවා දුන්නෝ මේ රටේ තරුණයෝ නොවෙති. අම්මා පාවා දෙන තරුණයන් එක්සත් ජාතික පක්ෂය විසින් නිර්මාණය කරනු ලැබ නොමැත.

ඔබ බලය ගත්දා සිට අම්මා ගෙන් පලිගත් කාන්තාවකි. අම්මාට වධ දුන් කාන්තාවකි. ඔබ අම්මා ළඟ සිටි, අම්මා රැක්ක, සියලු දෙනා ගෙන් නො කඩවා පලිගත් කාන්තාවකි.

අම්මා පාවා දුන්නේ ඔබ යි.

## අගමැතිතුමන් ගේ සාම වෑයම

මෙම රැස්වීමේ දී, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත්, සාම වෑයමටත් ඔබතුමිය දෝෂාරෝපණය කර තිබිණි. සාම වෑයම සාර්ථක ලෙස ඉදිරියට යන විට එය ඔබතුමිය ඊට ද දෝෂාරෝපණය කළා ය. සාම වෑයම සාර්ථක ලෙස ඉදිරියට යන විට එය ඔබතුමියට දරාගැනීමට අපහසු බව මම දනිමි. හේතුව ඉතා පැහැදිලි ය. එනම් ඒ ඊර්ෂ්‍යාව හැර අන් කිසිවක් නො වේ.

දැන් ඔබ න්‍යාය පත්‍ර ගැන අසයි. කැබිනට් එකට දැන්වූවා දැයි අසයි.

කරුණාකර එදා ඔබතුමිය හැසුරුණු ආකාරය ගැන හිතන්න. ඔබ ප්‍රභාකරන්ට ලියුම් 21ක් ලිව්වා. කවරදා වත් ඒ ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, පෙරමුණට, ආණ්ඩු පක්ෂයට හෝ කැබිනට් එකට වචනයක් කිව්වා ද?

සාමය වෙනුවෙන් කැපවීමට කැමැත්තෙන් සිටි කිසිවකුට හෝ ඒ සඳහා ඉඩකඩ දුන්නා ද?

එදා ඔබතුමිය උත්සාහ කළේ කුමක් ද? අප රැවටූ ලෙස ම ප්‍රභාකරන් ද රැවටීමට යි. සෞම්‍යමූර්ති තොණ්ඩමන්ට බොරු පොරොන්දු දුන් ලෙස ම ප්‍රභාකරන්නට බොරු පොරොන්දු දෙන්නට යි. අශ්රොෆ් අමාරුවේ දැමූ ලෙස ප්‍රභාකරන් වත් අමාරුවේ දාන්න යි. ජේ.වී.පී. එකට දුන් ලණුව එල්.ටී.ටී.ඊ. එකටත් දෙන්න යි.

දැන් ඔබට සාම වෑයම සාර්ථක වන ලකුණු පෙනෙන විට යකා වැහෙන බව අපි දනිමු. උත්සාහය තුළින් ජනතාව ඔබ නිවැරැදි ව හඳුනා ගෙන ඇත.

## වයස අවුරුදු 60න් පසු විශ්‍රාම යෑම

නාකි වෙවී දේශපාලනය නො කරන බවත්, 60 ලැබූ ගමන් ඔබ දේශපාලනයෙන් ඉවත්වන බවත්, ඒ රැස්වීමේ ඔබ මහා උජාරුවට කියා තිබුණි.

ජනාධිපතිනියනි, එය තවත් ඔබේ අතේ පැළවෙන බොරුවකි.

දැන් ඔබට වයස අවුරුදු 57කි. ඔබේ ජනාධිපති තනතුරේ කාලය අවසාන වන විට ඔබට 60 පිරේ. ඊට පසු ඔබට ජනාධිපතිකමට තරග කිරීමට නොහැකි වේ. ඒ අනුව සිදු විය යුත්තේ ඔබ විශ්‍රාම යෑම යි.

ගොනා හැරෙන කොට ම වෙන්න යන්නේ කුමක් දැයි අපේ මිනිසුන්ට වැටහේ. දැන් ඔබ කරන්නට යන්නේ දේශපාලනයෙන් විශ්‍රාම ගැනීම ද?

දැන් ඔබ ජනාධිපතිකම අහෝසි කරන්නට උත්සාහ දරන්නේ පාර්ලිමේන්තුවට එන්න නේ ද? ජනාධිපතිකම අහෝසි කිරීමට බැරි වුණොත් ඔබ පාර්ලිමේන්තුවට ඇවිත්, රත්නසිරි ජනාධිපති කර දිගට ම දේශපාලනයේ ඉන්න සැලසුම් කළ හැටි මට හොඳට මතක යි.

අද ඔබ උත්සාහ කරන්නෙත් පාර්ලිමේන්තුවට ඇවිත් දිගට ම දේශපාලනයේ ඉන්න යි. ඒක මේ රටේ පාසල් යන දරුවන්ටත් තේරෙනවා.

ඔබ මහින්ද රාජපක්ෂට පහර ගහන්නේත්, අනුර - මහින්ද ගැටුම උත්සන්න කරවන්නේත්, පක්ෂයේ බලය තහවුරු කරගෙන දිගට ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, පෙරමුණත්, පක්ෂයේ අහිංසක ජනතාවත් අගාධයෙන් අගාධයට දැමීමට යි.

රිචඩ් පතිරණට බනින්න ඔබ කවුරු ද? රිචඩ්ලා මේ පක්ෂය ගොඩනගපු බලයට ගෙනාපු අය. ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කාපු, පෙරමුණ කාපු ගැහැනියක්.

තව වසර හයක් ඉදිරියට බලයේ ඉන්න තිබුණු ඔය පක්ෂය විපක්ෂයට තල්ලු වුණේ කවුරුන් නිසා ද?

බොරු කියන්න එපා. මිනිසුන් ඔබ ගැන දන්නවා. ඔබ කවරදා වත් 60 දී විශ්‍රාම නො යන බව පැහැදිලි යි.

## පියන්කමක් බඳු අගමැති ධූරය

ඔබ එදා කතාවේ දී අගමැති තනතුර පියන්කමකට උපමා කර ඇත. ඔබ සතු බලතල ටිකක් තාවකාලික ව රනිල්ට දී ඇති බව ද එදා ඔබ කියා ඇත.

ජනාධිපතිනියනි, මතක තබා ගන්න මේ රටේ ජනතාව පසු ගිය මැතිවරණයේ දී මේ රටේ පාලනය රනිල් වික්‍රමසිංහ මහතාට භාරදුන්නේ ඔබත්, ඔබේ පෙරමුණත් ප්‍රතික්ෂේප කරමිනි.

දැන් ගම්පහ ජනතාව මෙන් ම අත්තනගල්ල ජනතාව ද ඔබ ප්‍රතික්ෂේප කර ඇති බව අමතක නො කරන්න. අද ජනතා පරමාධිපත්‍ය බලය ඇත්තේ ඔබ ළඟ නො වේ. එය පැහැදිලි ව ජනතාව විසින් අග්‍රාමාත්‍යතුමාට භාර දී හමාර ය.

පියන් කෙනෙකු නො ව අද ව්‍යවස්ථාපිත බලයක් පමණක් ඇති කඩදාසියක් වී ඇත්තේ ඔබ යි. බලයක් නැත්තේ ඔබටයි. ජනතාව පිළිකුලෙන් ප්‍රතික්ෂේප කර ඇත්තේ ඔබ යි.

ඔබ අද ඔය ජනාධිපති තනතුරේ ඉන්නේ අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගේ අනුකම්පාව හා උතුම් ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග නිසා ය. එසේ නො වන්නට ජනතාව ඔබතුමිය මේ වන විට රටින් ම පන්නා හමාර බව සිතට ගන්න.

ජනතාව ඔබත්, ඔබ නිසා පක්ෂයත්, ඔබ නිසා ම පෙරමුණත් පන්නා හමාර ය. ඒ නිසා සිහි කල්පනාවෙන් කතා කරන්න. ඔබේ එංගලන්ත මනෝ වෛද්‍යවරයා ඉක්මනින් නැවත හමුවීම ඔබේ සෞඛ්‍යයට හිතකර බව පෙනේ.

# 09

# ජනපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ, ඔහුගේ ආර්ථික හා සාම ව්‍යායාමය සහ මගේ අනාගත යෝජනා

එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා අප පක්ෂයේ මීළඟ ජනාධිපති අපේක්ෂක ලෙස පසුගිය 4 දා පැවැති එක්සත් ජාතික පක්ෂයේ 50 වැනි ජාතික මහා සම්මේලනයේ දී ඒකච්ඡන්දයෙන් තෝරා පත්කරගන්නා ලදී.

## කවුද මේ රනිල් වික්‍රමසිංහ කියන්නේ?

ඔහු - ආකර්ෂණීය චරිතයක් නොවේ.

ඔහු - ජනාදරයට පත් චරිතයක් නොවේ.

ඔහු - සිය ඇඳුමෙන් දේශපාලකයෙක් වී නැත.

ඔහු - සිය හැසිරීමෙන් දේශපාලකයෙක් වී නැත.

ඔහු - සිය සිනාවෙන් දේශපාලකයෙක් වී නැත.

ඔහු - සිය කථාවෙන් දේශපාලකයෙක් වී නැත.

ඔහු - ආගමෙන් දේශපාලකයෙක් වී නැත.

## එසේනම් කවුද මේ රනිල්

ඔහුගේ පියා ලංකාවේ ඉහළ පෙළේ පුවත්පත් කලාවේදියෙක් මෙන්ම ප්‍රධාන පුවත්පත් සමාගමක් වූ ලේක් හවුස් ආයතනයේ ප්‍රධාන හිමිකරුවා ද විය. ඒ සියල්ලට අමතරව ඔහු ලංකාවේ සිටි ඉහළ පෙළේ බුද්ධිමතෙකු බව කවුරුත් අවිවාදයෙන් පිලිගනිති.

## ඒ පියායි. කවුද මේ රනිල් ?

ශ්‍රී ලංකාවේ තම වයසේ දරුවන් සමග කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙන ගත් පාසල් දරුවෙකි. සැකයක් නැතිව ඉතා ඉහළින් ලංකාවේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් අයෙකි. එම විද්‍යාලයෙන්ම උසස් පෙළ සමත් අයෙකි. කොළඹින් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට තිබෙන මහා තරඟය ජයගත් අයෙකි. කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිපීඨයට ඇතුළත් වූවෙකි. අද ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂවල නායකයෙක් වීමට, කල්පනා කරන වැඩි දෙනකුගේ අධ්‍යාපන ඉතිහාසය මෙසේ පැහැදිලි නැත.

බලයේ සිටින නිදහස් සංධානයේ ද මෙවැන්නෙක් නැත.

## විශ්වවිද්‍යාල ජීවිතයේ ඔහු

ඔහු නිහඬ, හුදකලා චරිතයක් නොවී ය. ඔහු නීති පීඨයේ ශිෂ්‍ය සංගම් සභාපති විය. මහා ශිෂ්‍ය සංගමයේ උප සභාපතිවරයෙක් විය. එදා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ සිසුන් විසින් ඔහු සිය නායකයා ලෙස තෝරා ගන්නා ලදී.

## රනිල් වික්‍රමසිංහ නමැති දේශපාලනඥයා

ඔහු දේශපාලනඥයකු, නායකයකු වීමට ඇඳුම් අඳින්නේ නැත. නායකයකු ලෙස හිතාගෙන කොණ්ඩය විශේෂ ලෙස කපන්නේ, පීරන්නේ හෝ ඩයි කරන්නේ හෝ නැත. ඔහු ඔහුට හුරුපුරුදු ලෙස අඳී, කොන්ඩය, රැවුල කපයි.

ඒ නිසා රනිල් අපේ සිත් සතන්වල ඇඳී තිබෙන, ජාතික ඇඳුම අඳින උත්තර සාටකයක් කර දෙපැත්තෙන් දමාගත්, ලතාවට අභිමානයක් මවා ගෙන ඇවිදින කෙනෙක් නොවේ. කොණ්ඩය ඩයි දමා හොඳ හැටි කළු කර හිස් තැන් අමාරුවෙන් වසා ගෙන තෙල් ගා නොසෙල් වෙන ලෙස පීරාගෙන සිටින්නෙක් ද නොවේ.

මේ නිසාම රනිල් පෙනුමට ආකර්ෂණීය දේශපාලන නායකයෙක් නොවේ. ඔහු සාමාන්‍ය මිනිසෙකි. ඔහු ආරූඪ කරගත් චරිතයක් ඇත්තෙක් නොවේ. ඔහුට හුරු පුරුදු සාමාන්‍ය විධියට ජීවත් වන්නෙකි. හැසිරෙන්නෙකි.

## කථිකයෙකු ලෙස රනිල්

ඔහු කථා කරන විට වැදගත් යමක් සරල භාෂාවෙන් කියයි. තම පාක්ෂිකයන් උද්‍යෝගිමත් කරන හැඟීම්බර කතා පැවැත්වීමට ඔහු නොවෙහෙසෙයි. එහෙත් ඔහු හැමවිටම කතාකරන දේ හරියට ම දැනගෙන කතා කරයි. කොතරම් අමිහිරි වුව ද, අප්‍රසන්න වුව ද ඔහු ඇත්ත කියයි.

රනිල්ට බොරු කීමට නොහැක. ඔහු සත්‍යයම කියා අලාභ කර ගනී. ඒ නිසා චන්ද්‍රිකා ඉදිරියේ ඇතැම් විට මොහු අසරණ වේ. ඒ ඔහුට බොරු කීමට බැරි නිසයි.

රනිල් උත්සාහ කරන්නේ මිනිසුන්ට සත්‍යයම කියා. සත්‍යයම කරන්නයි. තාවකාලික දේශපාලන සටන් පාඨ ඔහුට නුහුරුය.

වසර 50ක් තිස්සේ මේ රටේ ජනතාව රැවටූ, රැවටිලිකාර, බල ලෝභී දේශපාලනයට විරාමයක් දීමට ඔහුට අවශ්‍යව තිබේ. ඔහු ඒ සත්‍යයේ කතාන්තරය කලබලයක් නැතිව ජනතාව ඉදිරියේ තැබීමට උත්සාහ ගනී.

මා දන්නා දේශපාලනඥයන් අතර, ඔහු රට ගැන, ලෝකය ගැන, රටේ ලෝකයේ සමාජ, දේශපාලන පරිවර්තනය ගැන හොඳින් දන්නා, ඒවා ගැන තාර්කිකව සිතන අයෙකි.

ඔහු ලංකා ලෝක ඉතිහාසය කියවා ඇත. රටේ ලෝකයේ තීරණාත්මක දේශපාලන සිදුවීම් හා මර්මස්ථාන ගැන ඔහුට ඔහුගේම මතයක්, තර්කයක් ඇත. ඒවා ජනප්‍රිය සටන්පාඨවලට වඩා සත්‍යයට නැඹුරු වූ ඒවායි.

## සිනා නොවන රනිල්

රනිල් සිනා වෙනවා අඩුය. අපේ සිත්වල ජීවත් වන දේශපාලනඥයා හමුවන හැම දෙනාට ම සිනාසේ. දකින, නොදකින අයටත් සිනාසේ. හතර වටේටම සිනා සේ. අපේ හිතේ ඇති දේශපාලනඥයා ගස් ගල්වලටත් සිනාසේ.

රනිල් නිතර සිනාසෙන කෙනෙක් නොවේ. තම දේශපාලන සගයන්ට සිනාසෙන්නේම නැති තරම්ය. දකින දකින අයට සිනා සීමේ පුරුද්දක් රනිල්ට නැත. තම පාක්ෂිකයන් හමු වූ විට ඔවුන්,

සමඟ විනෝද කතා, රස කතා කියමින් විනෝද වීමේ ගතියක් ඔහුට නැත.

එහෙත් ඔහු අවශ්‍ය අය සමඟ, අවශ්‍ය දේ කතා කරයි. වාද විවාද කරයි. කලාතුරකින් ඇතැම් සිදුවීම් මතක් කරමින් සිනාසේ.

රනිල් කටපුරා සිනාසෙමින්, කරවටා අත දමමින් රැවටිලි බස් කියන්නෙක් නොවේ. මිනිසුන් සිනා ගස්සවා ප්‍රශ්න යට ගසන්නෙක් නොවේ. කිසි දින කළ නොහැකි, නොකරන දේ කරන බවට පොරොන්දු දී ජනතාව මුරුංගා ගස්වල යවන්නෙක් ද නොවේ.

එහෙත් ගැටලු ප්‍රශ්න අධ්‍යයනය කරන්නට, ඒවා නිවැරදිව තේරුම් ගන්නට, නොපැහැදිලි තැන් තෝරා බේරා ගන්නට, නොදන්නා දේ අහගන්නට ඔහුට සහජ වුවමනාවක් ඇත.

ඇතැම් විට තමා සිටිනා මතයේ නොසැලී සිටින්නට උත්සාහ ගනී. කවුරුන් කීවත් තම අදහස වෙනස් නොකර සිටීමට බලයි. නිවැරදි දේ කර විශාල දේශපාලන අවදානම් දරයි.

මේවා රනිල්ගේ වෙනස් විය යුතු චරිත ලක්ෂණ යැයි මම සිතමි.

## ජාතික දේශපාලනයේ දී රනිල්

ඔහු නීතිඥයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු එවකට එ.ජා.ප. නායක හා විපක්ෂ නායක ලෙස සිටි ජේ. ආර්. ජයවර්ධන මහතා ළඟ සිටිමින් සිය දේශපාලන කටයුතු ඇරඹීය.

ජේ. ආර්. ජයවර්ධන වැනි මහා ප්‍රාඥයෙක් හා ඔහු වැනි දේශපාලනඥයෙක් ළඟ ඔහුගේද දුෂ්කර වකවානුවක වැඩ කිරීමට ලැබීම රනිල් ලැබූ අති දුර්ලභ වාසනාවකි.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් දේශපාලනයෙන් ඉදිරියට ආ රනිල්, ජේ.ආර්. යුගයේ එක්සත් ජාතික පක්ෂයේ තරුණ සමිති ව්‍යාපාරයට නායකත්වය සැපයී ය.

ඔහු බියගම ආසනයේ එ.ජා.ප. සංවිධායකවරයා ලෙසින් 1977 මැතිවරණයට එම ආසනය තරග කර පාර්ලිමේන්තුවට ආවේය.

මන්ත්‍රීවරයෙකු, උප ඇමැතිවරයෙකු හා ඇමැතිවරයෙක් ලෙස ජේ. ආර්. යුගයේ ඔහු ඉදිරියට ආවේය. මෙකල එක්සත් ජාතික පක්ෂයේ මීළඟ නායකත්වය සඳහා සටනක් විය. ඒ, ආර්.ප්‍රේමදාස, ලලිත් ඇතුලත්මුදලි හා ගාමිණී දිසානායක මහත්වරුන් අතරයි. මේ තිදෙනාට ම නායකත්වයට යෑම සඳහා ම සකස් කළ විශේෂ න්‍යාය පත්‍ර විය. ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා මේ තරගයට ඉඩ හැර තිබුණි.

ජේ.ආර්. ජයවර්ධන මහතාගේ පරපුරේ අයෙකු වූ රනිල් වික්‍රමසිංහයන්ට මේ තරගයට එක්වීමට හොඳටම ඉඩ ප්‍රස්ථා තිබුණි. එහෙත් ඔහු ඒ සටනේ නොවීය. ඔහුට එවැනි විශේෂ න්‍යාය පත්‍රයක් නොවීය. ඔහු සිය අමාත්‍යාංශයේ කටයුතු හා පක්ෂයේ ඔහුට පැවරුණු වගකීම් ඉටුකරමින් කටයුතු කළේය. රනිල් වික්‍රමසිංහ, පාර්ලිමේන්තුවේ සභා නායක තනතුරට පත් වූයේ ජේ.ආර්.ගෙන් පසුව ආර්.ප්‍රේමදාස මැතිතුමා පක්ෂයේ හා රටේ නායකාය වීමෙන් පසුවයි.

ප්‍රේමදාස ජනාධිපතිවරයාට එරෙහිව ගෙනා දෝෂාභියෝගය අවස්ථාවේත්, උතුරේ හා දකුණේ මහා භීෂණයක් මතු වූ 87-90 කාලය තුළත්, 88-89 ජනපතිවරණයේදී හා මහා මැතිවරණයේදීත් රනිල් වික්‍රමසිංහ මහතා නිහඬව කළ සේවය විපක්ෂයේ සිටි අපි හොඳින් දැන සිටියෙමු. ඔහුට එතරම් විශාල කාර්ය භාරයක් කිරීමට හැකි වූයේ ප්‍රේමදාස රජයේ අගමැති පොරයේ ඔහු නොසිටි නිසාය. ප්‍රේමදාස ජනාධිපතිවරයාට දෝෂාභියෝගය පැමිණි අවස්ථාවේ සභානායක ලෙස රනිල් වික්‍රමසිංහට පාර්ලිමේන්තුවේ මුළු බර කරට ගැනීමට විය. එදා ඔහුට සහායට ප්‍රධාන වශයෙන් සිරිසේන කුරේ අමාත්‍යවරයා සිදුවිය.

ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ හදිසි අභාවය නිසා එකවිටම රටත්, රජයත්, එක්සත් ජාතික පක්ෂයත් අනාථ විය. සියලු දෙනා කරකියාගත හැකි දෙයක් ගැන හිතාගන්නට බැරිව වික්ෂිප්තව සිටි මොහොතේ වහා අග්‍රාමාත්‍ය විජේතුංග මැතිතුමා ජනාධිපති ලෙස දිවුරවා, තත්ත්වය තරමක් සන්සුන් කළේ රනිල් වික්‍රමසිංහයන් බව එදා අපට රහසක් නොවීය. ඒ සමගම ඔහු අග්‍රාමාත්‍ය තනතුරට පත් විය.

94 පොදුජන එක්සත් පෙරමුණු ජයග්‍රහණයත්, ගාමිණී දිසානායක මැතිතුමා ඇතුළු එ.ජා.ප. ප්‍රධානීන් ගණනාවකගේ

මරණයත්, 94 දී ගාමිණී දිසානායක මැතිනිය ජනාධිපති තරගයට ඉදිරිපත් කිරීමෙන් ඇති වූ මහා කඩා වැටීමත්, සමග එක්සත් ජාතික පක්ෂය රනිල්ට භාරගැනීමට සිදුවිය.

1998 වන විට එක්සත් ජාතික පක්ෂය නැවත පොදුජන එක්සත් පෙරමුණ පරාජය කිරීමට තරම් ශක්තිමත් විය. මෙය තේරුම් ගත් පොදුජන එක්සත් පෙරමුණේ සිටි අපි මැතිවරණ කිහිපයක් කල් දමමින් සිට වයඹ පළාත් සභා ඡන්දයට මුහුණ දීමට තීරණය කළෙමු. එදා පොදුජන එක්සත් පෙරමුණු මැතිවරණය මෙහෙය වූ මම ඒ පළාත් සභා මැතිවරණය එ.ජා. ප ය ජය ගන්නා බව දැන සිටියෙමි. එසේම එය එ.ජා.ප යට ජයගැනීමට හැරියොත් එතැන් සිට සියලුම පළාත් සභා ඇතුළු සියලු මැතිවරණ පොදුජන එක්සත් පෙරමුණට ජයගත නොහැකි බවත් පොදුජන එක්සත් පෙරමුණු පාලනය එතැනින් අවසාන වන බවත් මම හොඳින් ම දැන සිටියෙමි. ඒ නිසා ඒ වයඹ මැතිවරණය සියලු රාජ්‍ය බලය යොදවා කෙසේ හෝ ජයගැනීමේ තීරණය ගත්තේ ජනාධිපතිනිය යි. ඉතාමත් වනචාරී ලෙස බලය යෙදූ අපි ඒ මැතිවරණයෙන් එදා එක්සත් ජාතික පක්ෂය පරාජය කළෙමු. ඉන් පසු එ.ජා. ප. යේ නැවත තීරණාත්මක පසු බෑමක් සිදුවිය. එහෙත් 1999 වන විට නැවත එක්සත් ජාතික පක්ෂය වේගයෙන් ශක්තිමත් වන බව මට වැටහිණි. ඒ නිසා කලින් ජනාධිපතිවරණයක් පැවැත්වීමේ යෝජනාව මම පොදු පෙරමුණු රජයට ගෙනාවෙමි.

එදා මගේ තර්කය වූයේ ජනාධිපති මැතිවරණය නියමිත කාලයේ පැවැත්වුවහොත් (2000 අවසානයේ) ස්ථිර වශයෙන් පරදින නිසා කලින් ජනාධිපති මැතිවරණය පැවැත්විය යුතු බවය. නියමිත කාලයේ ජනාධිපතිවරණය පැවැත්වුවහොත් රාජ්‍ය බලය මැර බලය ඇතුළු සියලු අකටයුතුකම් කළද එය ජය ගත නොහැකි බව මම තරයේ ප්‍රකාශ කළෙමි.

එදා චන්ද්‍රිකා, මංගල, කිංස්ලි, සී.වී. ගුණරත්න වැනි අය සිතුවේ ඔවුනට 65% ඡන්දයක් ලබාගත හැකි ය කියායි. 1999 ද සාධාරණ ඡන්දයක් පැවැත් වුවහොත් රනිල් දිනන බව මා කී විට චන්ද්‍රිකා මැතිණියට දැඩි කේන්තියක් හා ලැජ්ජාවක් ඇති විය . එහෙත් එදා නන්දිමිත්‍ර, බර්ටි, ජෙයරාජ් හා රත්නසිරි වික්‍රමනායක වැනි අය ද මගේ මතය අනුමත කළ නිසා ඉක්මන් ජනාධිපතිවරණයකට යෑමට චන්ද්‍රිකා මැතිනිය විසින් තීරණය කරන ලදී.

කලින් ජනාධිපතිවරණය පැවැත්වීම ගැන තීරණය ගත් ඒ තීරණාත්මක රැස්වීමට චන්ද්‍රිකා මැතිනිය විසින් රත්නසිරි, කිංස්ලි, සී.වී. මංගල, අනුරුද්ධ, බර්ටි, නන්දිමිත්‍ර, ජෙයරාජ්, නිමල් සිරිපාල යන අය මමද කැඳවන ලද්දෙමි. එදා මා ඇයට කීවේ 1999 ජනාධිපතිවරණය තිබ්බත් සියලු රාජ්‍ය බලය යොදා, අකටයුතුකම් කර වුව ද චන්ද්‍රිකාට 51% ගැනීම අපහසු බවත්, එහෙත් ඇයට ජයගත හැකි බවත්ය. මේ මතය එදා සිටි කිසිකේ පිළිගැනීමට සූදානම් නොවී ය. බර්ටි, ජෙයරාජ්, නන්දිමිත්‍ර මගේ මතය විශ්වාස කළත් එය ප්‍රසිද්ධියේ චන්ද්‍රිකා ඉදිරියේ කීමට බිය වූහ.

1999 ජනාධිපති මැතිවරණයට දින කිහිපයකට කලින් චන්ද්‍රිකා මැතිනිය මැතිවරණ බෝම්බ ප්‍රහාරයකට ගොදුරු වූවාය. එනිසා ඇයට එක් ඇසක් සදාකාලිකව අහිමි විය. මේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය නිසා ඒ ජනාධිපතිවරණයේදී අපට නොසිතූ අලුත් අනුකම්පාවක් හා එයින් අලුත් ශක්තියක් ලැබුණි. අවසාන මොහොතේ පොදුජන එක්සත් පෙරමුණට එක් වූ ඒ මහා ශක්තිය මැතිවරණ ප්‍රතිඵලයට විශාල ලෙස වාසි සහගත විය. එසේම, අප කළ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සාධාරණීය කරගැනීමටත්, එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් පසු බැස්සවීමටත් මේ බෝම්බ ප්‍රහාරයෙන් අපට එක් වූ අනුකම්පාව ප්‍රබල ලෙස ආධාර විය.

මේ සියල්ල අවසානයේත් චන්ද්‍රිකාට ලබාගත හැකිවූයේ 51% කි. ඇත්තවශයෙන්ම ඒ මැතිවරණයේ ජයග්‍රාහකයා එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමායි.

අදත් චන්ද්‍රිකා මැතිනිය බලයේ ඉන්නේත් 2001දී අප ලබාගත් බලය නැවත උදුරාගත හැකි වූයේ ත්, එලව එලවා මට පහරදීම ට කටයුතු කරන්නේ ත්, අධිකරණ ඇතුළු සියලු ස්වාධීන රාජ්‍ය ආයතන ඇයගේ විකෘති වුවමනා සඳහා පාවිච්චි කිරීමට හැකිවී ඇත්තේ ත්, අදත් ඇයට ජීවිතාන්තය දක්වා බලයේ සිටීමට න්‍යාය පත්‍ර හැදීමට හැකිවී ඇත්තේ ත්, එදා මගේ ම වුවමනාවට කලින් තැබූ ජනාධිපතිවරණය හා මගේ මෙහෙයවීමෙන් එය ජයගැනීමටද පොදුජන එක්සත් පෙරමුණ ශක්තිමත් වූ නිසාය.

ඇත්ත වශයෙන්ම තිබූ තත්ත්වය නම් රනිල් වික්‍රමසිංහ මැතිතුමා 1999 ජනාධිපති මැතිවරණයෙන් සැබෑ ලෙස ජයගැනීමට තරම් ජන බලයක්, ඡන්ද බලයක් හා ජනතා කැමැත්තක්ද එදා හිමිව සිටීමයි.

ඉතා අමාරුවෙන් වංචනිකව ජයගත් 99 ජනාධිපතිවරණයෙන් පසු චන්ද්‍රිකා මැතිනිය කළ යුතු ව තිබුණේ වහාම මහා මැතිවරණය පැවැත්වීමයි. ඒ සඳහා ඇය පොලඹවා ගැනීමට මුළු පක්ෂයම උත්සාහ දැරීය. එහෙත් ඇය එයට කිසිසේත් එකඟ නොවූවා. එයට එකම හේතුව වූයේ සිය පෙරමුණ හා පක්ෂය තමන්ට වඩා ඡන්ද ගන්නවා දකින්නට ඇය කීයටවත් කැමති නොවීමයි.

එය චන්ද්‍රිකා මැතිනියගේ භාෂාවෙන් මෙසේයි ''මගේ මැතිවරණයේ දී අපේ පක්ෂයේ හුඟාක් අය මට හරියට වැඩ කළේ නැහැ. උන් බොරු කළා. මම දුන්න සල්ලි උන් තමන්ගේ මැතිවරණයට වියදම් කරන්න තියා ගත්තා. කොටින්ම මම යැවූ පෝස්ටර් වත් වැඩි දෙනෙක් ඇලෙව්වේ නැහැ. දැන් උන් මගේ කර උඩින් මටත් වඩා ඡන්ද අරගෙන පාර්ලිමේන්තුවට එන්න ලෑස්තියි. ආණ්ඩුව නැති වුණාවේ. මගේ කර උඩින් මට වඩා ඡන්ද ගන්න මම ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා මම දැන්ම මහා ඡන්දය තියන්නේ නැහැ.'' ඇත්ත වශයෙන්ම එදා ජනාධිපතිවරණය අවසන් වූ වහාම මහා මැතිවරණය පැවැත්වූවා නම් පොදු පෙරමුණට විශිෂ්ට ජයග්‍රහණයක් ගැනීමට ඉඩ තිබුණු අතර පෙරමුණේ විශාල පිරිසකට. පාර්ලිමේන්තු ඒමට හැකි වනු ඇත. එසේම ලංකාවේ සෑම ආසනයකම පොදු අපේක්ෂකයන් ඡන්ද ලබාගැනීමට යි. මේ දැඩි ආත්මාර්ථකාමී පටු මානසික තත්ත්වය නිසා එදා පොදුජන එක්සත් පෙරමුණේ විශාල පිරිසකට 2000 මහා මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට ඒමට නොහැකි විය.

තමාගේ පුහු ආත්ම අභිමානය වෙනුවෙන් තම පක්ෂය, පෙරමුණ හා පාක්ෂිකයා කිසිම පැකිලීමකින් තොරව පාවා දීමට චන්ද්‍රිකාට ඇති ශක්තිය මෙයින් මොනවට පැහැදිලි වික්‍රමසිංහ සමත් විය.

ඒ සඳහා එදා, පොදුජන එක්සත් පෙරමුණු රජයේ සිටි මුස්ලිම් කොංග්‍රස් පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මා ඇතුළු ප්‍රබල මැති ඇමැතිවරුන් පිරිසකුත් එක්සත් ජාතික පෙරමුණට ගැනීමට රනිල් වික්‍රමසිංහයන් පෞද්ගලිකව මැදිහත් වී වැඩපිළිවෙළක් දියත් කළේය.

රටේ පාලිකාව ලෙස චන්ද්‍රිකා මැතිනිය දැක් වූ අදක්ෂකම, අකාර්යක්ෂමතාවය, අසංවිධානාත්මක බවත්, පෞද්ගලිකව ඇගේ මැදිහත්වීමෙන් සිදු වූ සැකකටයුතු කෝටි ප්‍රකෝටි ගණන් ගනුදෙනු

පිළිබඳවත් චන්ද්‍රිකා මැතිනිය තුළ වේගයෙන් ඉස්මතු වෙමින් පැමිණි ප්‍රබු අහංකාරකම, උද්ධච්චකම හා අධි ආත්ම තක්සේරුවට එරෙහිව පොදුජන එක්සත් පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ තිබූ විරෝධතාව, බෙදීමක්, වෙන්වීමක් බවට පත්කර ගැනීමට රනිල් වික්‍රමසිංහ සමත් විය. චන්ද්‍රිකා මැතිනියගේ විකෘති ධන තණ්හාවට හා බල තණ්හාවට ඇඟිල්ල දිගුකර රනිල් ඒ පක්ෂය, ඒ පෙරමුණ දෙකට කැඩීය.

වසර 7කට පසු 2001 දෙසැම්බර් මහා මැතිවරණයෙන් නැවත එක්සත් ජාතික පක්ෂය බලයට ගෙන ඒමට රනිල් වික්‍රමසිංහ සමත් විය.

රනිල් රට භාර ගන්නා විට එහි තත්ත්වය සෝචනීය විය. එනම්;

01. පළමු වතාවට ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධන වේගය ඍණ අගයක් ගැනීම.

02. උතුරේ යුද්ධයෙන් ශ්‍රී ලංකා හමුදාව පසු බෑමකට හා කලකිරීමකට පත්ව තිබූ අතර රට නිල නොවන ලෙස දෙකට කැඩී තිබුණි.

තමන්ට ඉහළින් චන්ද්‍රිකා විධායක ජනාධිපතිනිය ලෙස සිටිමින්, ලද පළමු අවස්ථාවේම තමා හා තම රජය පෙරළන බව ද රනිල් තේරුම් ගෙන තිබුණි. එය අප කාටවත් රහසක් නොවීය.

නිදහසින් පසු බලයට පත්වුණු 11වැනි රජයේ අග්‍රාමාත්‍ය වූ රනිල් වික්‍රමසිංහයන්ට ඉතිහාසයේ කිසිම රාජ්‍ය නායකයකුට නොතිබූ පැහැදිලි දර්ශනයක්, මෙහෙවරක් තිබුණි. රටේ ආර්ථිකය ගොඩනැඟීමට, රට සංවර්ධිත රටක් කරගැනීමට, විරැකියා ප්‍රශ්නය සදාකාලිකව අවසන් කරගැනීමට තාර්කිකව නිර්මාණය කරගත් මාර්ගයක් ඔහු තුළ විය.

යුද්ධය අවසන් කිරීමට හා රට නොබෙදා උතුරේ ප්‍රශ්නය විසඳාගැනීමට ද ඔහුගේ ම වූ වැඩපිළිවෙළක් ඔහු සතු විය.

බලයට පත් රනිල්ට ආර්ථිකය වහා ගොඩනැඟීමටත්, රටට සාමය උදාකිරීමටත් හදිස්සියක් විය. එනිසාම තමාට හතුරුකම් කරන්නට සූදානමින් චන්ද්‍රිකා උඩින් ඉන්න බව නොසලකා ඔහු තම ආර්ථික වැඩපිළිවෙළ හා සාම සැලැස්ම ක්‍රියාවට නැඟීය.

මුලින්ම ඔහු අපේ රජය විසිරවීමට චන්ද්‍රිකාට ඇති බලය අහෝසි කිරීමට උත්සාහ කළේය. ඒ අනුව පාර්ලිමේන්තුවේ 2/3 බලයෙන් නීත්‍යානුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදි.

එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකින් එම අවස්ථාව වැළකිණ. එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව නිවැරදි යැයි මම අදත් නොසිතමි.

එය අධිකරණ තීන්දුවකට වඩා දේශපාලන තීන්දුවක් ලෙස මට පෙනේ.

එදා, විපක්ෂයේ සිටි පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරු විසිදෙදෙනෙක් එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය දීමට සූදානම්ව සිටියහ.

එහෙත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් එම ඉඩකඩ ඇහිරිණි.

ඒ අනුව අප රජයට වසරක් ගතවීමෙන් පසුව එය විසිරුරවීමේ බලය චන්ද්‍රිකා අත රැඳිණි.

එහෙත් රනිල් වික්‍රමසිංහ තම වැඩපිළිවෙළ මේ තීරණය නිසා වෙනස් කිරීමට සූදානම් නොවී ය. ඔහු අති දුෂ්කර තීරස මාවතක තම ආර්ථික වැඩසටහන හා සාම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේය.

චන්ද්‍රිකා රජයට වසර 6ක් යාමට කිසිදා ඉඩ නොදෙන බව ඔහු තේරුම් ගෙන සිටියහ. එහෙත් අවම වශයෙන් වසර 3ක් ගතවන තුරු ඇය තම රජය නොවිසරනු ඇතැයි ඔහු තුළ විශ්වාසයක් තිබිණි. හේතුව ඒ පොරොන්දුව ඇය පාර්ලිමේන්තුවේ කථානායකතුමාටත්, ඉන්දීය හා එංගලන්ත අගමැතිවරුන්ටත්, සියලු යුරෝපීය තානාපතිවරුන්ටත් දී තිබුණ හෙයිනි. ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් ඇය ඒ පොරොන්දුව දී තිබුණි.

ඒ නිසා රනිල් වික්‍රමසිංහ හිතුවේ පළමු වසර 2ක සම්පූර්ණයෙන්ම රටේ ආර්ථික වෙනස්කිරීම සඳහා වෙන්කර, 3 වැනි වසරේ වැටුප් වැඩිකිරීම්, සහනාධාර වැඩිකිරීම්, ග්‍රාමීය සංවර්ධන වැඩ හා නව රැකියා ලබාදීම් ආදී සියල්ල කිරීමටයි. ඒ නිසා චන්ද්‍රිකා රනිල් 3 වැනි වසරේ කටයුතු ඇරඹීමට, පෙර රජය විසුරුවා හැරියාය.

2001 දෙසැම්බර් බලය ගත් රනිල් කැපිය හැකි හැම අංශයෙන්ම වියදම් කපා හළේය. සහනාධාර අඩු කළහ. ඉදිකිරීම් නැවැත්වීය. අමාත්‍යාංශ වියදම් අඩු කළේය. පළාත් සභාවලට හා ප්‍රාදේශීය සභාවලට වෙන් කරන මුදල් අඩු කළේ ය.

ඔහු මේ සියල්ල කළේ ඉතිහාසයේ පළමු වතාවට සෘණ තත්ත්වයක් ගත් ආර්ථිකයේ තීරණාත්මක පෙරළියක් කිරීමට යි.

වසර 50ක් තිස්සේ රජයන් 10ට ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් කරගැනීමට තිබුණු ඉඩ කඩ මග හැරුණු බව අන් කාටත් වඩා හොඳින් රනිල් දනී. තම පක්ෂයේ රජයන් කිහිපයකට ද ඒ අවස්ථාව නැතිවූ හැටි, රනිල් ඉතා ගැඹුරින් අධ්‍යයනය කර ඇත. තමන් ද නියෝජනය වූ තමන් ද වගකිව යුතු තනාතුරු දරූ රජයන් කිහිපයකට ද වැරදුණු තැන් හා හරිගිය තැන් ඔහු හොඳාකාරව දනී. මේ සියල්ල හිතේ තබා ගෙන රනිල් ඒ දුෂ්කර දෙවසර ඉදිරියට ගිය බව එදාට වඩා අද ජනතාවට පැහැදිලිය.

## මොනවද රනිල් දෙවසර තුළ කළේ?

01 යුද්ධය නතර කළේය.

02. සාම ගිවිසුමක් අත්සන් කළේය.

03. සාම සාකච්ඡා ආරම්භ කළේය.

04. ලෝකයේ මහා බලවතුන්ගේ සහාය සාම වැඩපිළිවෙළ වෙත එකතු කළා.

05. ඇමෙරිකාවේ, ජපානයේ සහායත් ලබාගත්තා.

## මොනවාද ඔහු ආර්ථිකයට කළේ?

01. වියදම් හැකි තරම් අඩු කළේය.

02. දේශීය ණය සියල්ල ගෙව්වේය.

03. බැංකු පොළිය 28% සිට 8-10% අතරට ගෙනාවේය.

04. උද්ධමනය 22% සිට 3-4% අතරට ගෙනාවේය.

05. ලංකා ඉතිහාසයේ පළමු වතාවට රුපියලේ අගය වැඩි කළේය.

06. 1.4%ක ඍණ අගයක තිබූ සංවර්ධනය 6.4%ක සංවර්ධන තත්ත්වයකට ගෙනාවේය.

07. විදේශ සංචිත වැඩිකරගත්තේය.

08. භාණ්ඩ මිල බොහෝ දුරට ස්ථාවර කරගත්තේය.

09. අත්‍යවශ්‍ය බඩු මිල ඉහළ යෑම නැවැත්වූ අතර එවැනි භාණ්ඩවල හිඟයක් ඇතිවීමත් වැළැක් වීය.

10. පෞද්ගලික දේශීය ආයෝජකයන්ට විශාල සහන දෙමින් ආයෝජන දිරිමත් කළේය.

11. විදේශීය ආයෝජකයන්ට වාසිදායක වාතාවරණයක් ඇති කරමින් විදේශ ආයෝජන වැඩි කළේය.

12. රනිල්ගේ ආර්ථික වැඩසටහන ලෝකයේ ආධාර දෙන රටවල් පිළිගන්නා තත්ත්වයකට ගෙනාවේය.

13. පෞද්ගලීකරණ වැඩපිළිවෙළ හරහා නාස්තිය, අකාර්යක්ෂමතාවය අඩුකර දේශීය සම්පත් නිෂ්පාදන කාර්යයන්ට යොමු කිරීමේ කටයුතු පටන් ගත්තේය.

14. කිසි දිනක ලංකාවට නොලැබුණු තරම් ආධාර හා ණය ආධාර තොගයක් ලබාගැනීමට කටයුතු කළේය.

15. පළමු වසර 3කට කෝටි 45,000ක්ද, ඊළඟ වසර 3ට කෝටි 20,000ක්ද වශයෙන් මහා ණය හා ආධාර තොගයක් ගත්තේය.

16. වරායවල් හතරකට, ගුවන් තොටුපොළවල් 3කට හා අධිවේගී මාර්ග හතරකට මුදල් සොයා ගත්තේය.

17. ඒ ණය හා ආධාර තොගය හරහා අප රටේ නැවත රැකියා ප්‍රශ්නයක් ඇති නොවන තත්ත්වයකට සංවර්ධන වේගය වැඩි කරගැනීමට සැලසුම් කළේය.

18. බැංකු පොළිය 2004 අවසන් වන විට 5%ක තත්ත්වයට ගෙන ඒමට සැලසුම් කළේය.

19. 2002, 2003 මග හැරුණු සංවර්ධන කටයුතු සුබ සාධන කටයුතු, රැකියා දීම් ආදිය 2004 වසරේ කිරීමට මුදල් සොයා ගත්තේය.

20. 2004 දී සියලු දේශපාලන පලිගැනීම්වලට වන්දි ගෙවීමට හා ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය මුදල් වෙන් කළේය.

**අභාග්‍යයක මහත...**

ගත වූ දෙවසරේ අපට, මොකුත් වුණේ නැහැ කියන කාරණය උඩ අපේම පාක්ෂිකයෝ අප සමග අමනාප වූහ.

කල්යල් බලා, චන්ද්‍රිකා මැතිනිය විසින් රජය විසුරුවා හරින ලදී. මැතිවරණ ප්‍රතිඵලය වුණේ නිදහස් සන්ධානයට මන්ත්‍රීවරු 106යි. එක්සත් ජාතික පෙරමුණට හා එයට උපකාර කරන අයට ආසන 110යි.

තත්ත්වය මෙසේ ජීවත් වූ සිංහල බෞද්ධ, එ.ජා.ප. ප්‍රබල ආධාරකරුවන් ලක්ෂ 2 1/2ක් හෙළ උරුමයට ඡන්දය දුන්හ. ඒ ඡන්ද ටික එ.ජා.පයට ලැබුණේ නම් අපි ආසන 114ක් පමණ ගනිමු. එසේ වූවා නම් අපි ස්ථිර ලෙස රජය පිහිටුවමු.

එ.ජා.පයේ ප්‍රබල සිංහල බෞද්ධ ගම්බද පාක්ෂිකයන් ලක්ෂ හතරක් මෙවර ඡන්දයේ දී ඡන්දය දීමෙන් වැළකී සිටියහ. මහියංගණය වැනි ආසන පවා අපි පරාජය වූයේ ඒ නිසයි.

මේ ඡන්ද වලින් අඩක් හෝ එ.ජා.පයට වැටුණා නම් අපට ආසන 117ක් ලැබෙනු ඇත. එසේම නම් අපි ස්ථිර ලෙස අපේ රජයක් පිහිටුවමු.

දැන් අපි නැවත එක්සත් ජාතික පක්ෂ රජයක් බිහිකළ යුතු වෙමු. ඒ සඳහා වහා පක්ෂය හා අනුබද්ධ සංවිධාන ප්‍රතිසංවිධානය කරගත යුතුය. ශක්තිමත් කළ යුතුය. අනාගතයේ බිහිවන එ.ජා.ප රජයේ මූල්‍ය කාර්ය භාරයන් පිළිබඳව පසුගිය කාලය තුළ අපි ගැඹුරින් සාකච්ඡා කරමින් සිටියෙමු. එහෙත් දැන් මට ඒ සාකච්ඡාවලට සහභාගිවිය නොහැක. එනමුත් ඒ ගැන මගේ අදහස් මම විටින් විට දේශපාලන මණ්ඩලයට යැවීමට අදහස් කරමි.

මේ පිළිබඳව නායකතුමාටත්, දේශපාලන මණ්ඩලයටත් මා දුන්වූ කරුණුවල සම්පිණ්ඩනයක් මම මෙසේ ඔබ වෙතද ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

## මීළඟ අපේ රජය

01. රජයේ රැකියා ලක්ෂ 2ක් ලබාදෙන ශීඝ්‍රගාමී ජාතික සංවර්ධන වැඩසටහනින් අපි අපේ නව රජයේ කටයුතු ආරම්භ කළ යුතු වෙමු. කෘෂිකර්ම, සත්ව පාලන, නාගරික සංවර්ධන හා මාර්ග සංවර්ධන නිවාස හා යටිතල පහසුකම්, ග්‍රාම සංවර්ධන හා දුගී දුප්පත්කම නැතිකිරීම, කුඩා කර්මාන්ත යන ක්ෂේත්‍රවල මේ නව ජාතික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු ය.

02. දැනට අපි දේශපාලන පලිගැනීම්වලට ලක් වූ අය ගැන කොමිෂන් 6කින් පරීක්ෂා කර ගෙන යන්නෙමු. ඒ සියලු දෙනාට යෝජිත වන්දි රැකියා, උසස්වීම් හා අනිත් අදාළ සියලු දේ පළමු 6 මාසය තුළ ලබාදීමට කටයුතු කළ යුතුය.

03. ග්‍රාමීය සංවර්ධනය හා එක්ව ආරම්භ කෙරෙන දුප්පත්කම නැති කිරීමේ, පරිසරය රැකීමේ නව ජාතික වැඩසටහනක් ආරම්භ කෙරෙනු ඇත.

04. හැම පවුලකටම නිවසක් ලබාදෙන, එහි වියදම කුඩා වාරිකවලින් ගෙවිය හැකි වන ලෙස නිවැසියකුට ආදායම් මාර්ගයක් ලබාදෙන නව ජාතික නිවාස වැඩසටහනක් හා නාගරික සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරනු ඇත.

05. වෘත්තීය සමිති ශක්තිමත් කෙරෙන ඔවුන් පරිපාලනයට, සම්බන්ධ කෙරෙන නව කළමනාකරණ හා පරිපාලන ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත.

06. යෞවනයන්ගේ සැඟවුණු දක්ෂකම් සොයාගැනීමේ හා ඔවුනට තම දක්ෂකම් වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය සියලු ආධාර නිර්ලෝභීව ලබාදෙන, නව ලොවට ගැළපෙන දරුපරපුරක් බිහිකිරීමේ නව ජාතික තරුණ සේවා, ක්‍රීඩා, වෘත්තීය පුහුණු වැඩසටහනක් ආරම්භ කෙරෙනු ඇත.

07. දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන්ට හිතකර

පරිසරයක් රට තුළ වහා ගොඩනගමින් සංවර්ධන වේගය 8% ඉක්මවන මට්ටමට ගෙන ඒමේ එ.ජා.ප වැඩසටහන කඩිනම් කරනු ඇත.

08. අපේ රජයක් තුළත් අපේ පාක්ෂිකයන් හා ආධාරකරුවන් ආරක්ෂා කිරීමේ දේශපාලන වැඩසටහනක් පක්ෂය විසින් නොකඩවා ක්‍රියාත්මක කරනු ඇත. ඒ සඳහා අපේ පක්ෂය ඉහළම ප්‍රමුඛත්වයක් දෙනු ඇත.

09. අපේ පක්ෂ නායකතුමාත්, පක්ෂයත්, අපේ ආර්ථික වැඩසටහනත් ගැන විශ්වාසය තැබූ ලෝකයේ ධනවත්, බලවත් ආධාර දෙන රටවල් හා සංවිධානවල ආධාර හා ණය ආධාර ලබාගෙන දූනට හඳුනාගෙන ඇති මහා වාරිමාර්ග ව්‍යාපෘති, වරායවල්, ගුවන්තොටුපොළවල්, තෙල් පිරිපහදු මධ්‍යස්ථාන සියල්ල වහා ආරම්භ කර රැකියා ප්‍රශ්නය සදාකාලිකව අවසන් කිරීමේ දැවැන්ත සංවර්ධන වැඩසටහන කඩිනම් කරනු ඇත.

10. අව්‍යාජ ලෙස බලය බෙදා දෙන සියලු ජන කොටස් සමානයන් ලෙස පිළිගන්නා, ෆෙඩරල් විසඳුමකින් උතුරේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳාගැනීමට කටයුතු කරනු ඇත. ඒ තුළින් ශ්‍රී ලංකා ද්වීපය දෙකඩ වීමේ තර්ජනයත්, යුද්ධයත් සදාකාලිකව අවසන් කරනු ඇත.

මේ මා ලීවේ එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශයේ කොටසක් නොවේ. නමුත් අපේම ජනතාව තුළ ඇති සැකසංකා දුරුකිරීමට අපේ අනාගත රජයක මූලික ඉලක්ක කිහිපයක් ඔබ වෙත ඉදිරිපත් කිරිම කාලෝචිත යැයි සිතුවෙමි.

මේ පිළිබඳව අපේ පක්ෂ නායකතුමාත් දේශපාලන මෙහෙයුම් කමිටුවත්, පක්ෂයට සම්බන්ධ විද්වතුනුත් මේ වන විටත් මූලික සැලසුම් සකස් කරමින් සිටිති.

ඒ නිසා මා අපේ සියලු පාක්ෂිකයන්ගෙන්, හිතවතුන්ගෙන් ඉල්ලා සිටිනුයේ වහා සූදානම් වන ලෙසයි.

අප සමග අමනාප වී සිටින, සිත් වේදනාවෙන් සිටින සියලුදෙනාට කියන්නේ වහා සියල්ල අමතක කර පක්ෂය හා එක්වන ලෙසයි. අපේ වෘත්තිය සමිති අනුබද්ධ සංවිධාන වහා ප්‍රතිසංවිධානය වී ශක්තිමත් විය යුතුය.

# 10

# මේ ලක් දෙරණේ උරුමය ලද ඔබටයි මේ ආයාචනය...

2001 දෙසැම්බර් 05දා

ජීවිතයත්, මරණයත් අතර සටනක් කර

චන්ද්‍රිකා මැතිනියත්, එතුමියගේ පෙරමුණ හා පක්ෂයත්

පරාජය කර,

අපේ රට එක්සත් ජාතික පෙරමුණට,

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට,

භාර දෙන ලද්දේ අපේ රටේ උරුමකරුවන් වන ඔබ විසිනි.

චන්ද්‍රිකා මැතිනිය රටින් පමණක් නොව

ගම්පහින් ද

අත්තනගල්ලෙන් ද පරාජය වූවා ය.

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන ·

ව්‍යවස්ථාව හදපු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා

වරක් කී දෙයක් මට සිහි වේ.

ආචාර්ය නිහාල් ජයවික්‍රම නමැති

නීති විශාරදයාණන්,

ජේ. ආර්. ගෙන් ප්‍රශ්න කළේ

ජනාධිපතිට එරෙහි කණ්ඩායමක්

පාර්ලිමේන්තුවේ බලය ගත් විටෙක

ඇතිවිය හැකි තත්ත්වය ගැනයි.

ජේ. ආර්. ජයවර්ධනයන් ගේ

ක්ෂණික පිළිතුර වූයේ,

''එහෙම විටෙක මම ජනාධිපති නම්

වහාම විධායක බලය අතහැර

පාර්ලිමේන්තුවට, අගමැතිවරයාට

සියලු බලය ලබාදී

මම නාමිකව ජනාධිපති තනතුර හොබවමි'' යන්නයි.

හිටපු ජනාධිපති ඩී. බී. විජේතුංග

තව ම ජීවතුන් අතර සිටී.

එතුමාගේ කාලයේ පොදුජන එක්සත් පෙරමුණ

ලබා ගත්තේ ආසන 112යි.

ස්වාධීනව තරගකර ජයගත්

චන්ද්‍රසේකරන් මන්ත්‍රීතුමා එකතුකර ගෙන

113ක් හදා ගත්තේ ඉතා අමාරුවෙන්.

එදා ඩී. බී. විජේතුංග ජනාධිපතිතුමාට

අවශ්‍ය නම්,

113ක් හදා ගන්නට තිබුණා.

එහෙම වුවමනා වූ පිරිසකුත් එදා හිටියා.

එහෙත් එදා අගමැතිව සිටි රනිල් වික්‍රමසිංහයන්

වහා ම ඉල්ලා අස්වුණා.

ඩී. බී. විජේතුංග ජනාධිපතිතුමා

වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම

නාමික ජනාධිපතිවරයකු බවට පත්වුණා.

ඔහු කැබිනට් රැස්වීම්වලට
වෙලාවට ආවා, මූලාසනය ගත්තා.
ඒත්, වචනයක් කතා කළේ නැහැ.
ඔහු ආරක්ෂක ඇමැති ලෙස සිටියා.
ඒත්, නියෝජ්‍ය ඇමැති අනුරුද්ධ රත්වත්තට
සම්පූර්ණ බලය පැවරුවා.
ඊට පසු එතුමා,
තමන්ට ඕන දෙයක් කළ හැකි
ජනාධිපති අරමුදලට
අත තිබ්බේ නැහැ.
අගමැතිව සිටි චන්ද්‍රිකා
ජනාධිපති බලතලත් අතට අරගෙන
රට පාලනය කළා.
එහෙත් චන්ද්‍රිකා මැතිනිය මොකද කළේ?
ඇ ලැබූ අන්ත පරාජය අමතක කර
විධායක බලය ගැන කතා කළා.
තමා රාජ්‍ය නායිකා, කැබිනට් නායිකා,
සේනාධිනායිකා බව නිතර කිව්වා.
ඇමැතිවරුන් පත්කිරීමේ සිට බලපෑම් කරන්නට
පටන් ගත්තා.
පාර්ලිමේන්තු ලේකම් පත් නොකර හිටියා.
ඇතැම් හමුදා ප්‍රධානීන්ට උසස්වීම් දෙමින්,
සේවය දීර්ඝ කරමින්,
තවත් අය ගෙදර යැව්වා.
අවසානයේ දී ඇය ඇමැතිකම් තුනක්,

ඊට පසු තව දෙකක්,
රජයෙන් උදුරා ගත්තා.
පොලීසිය, ත්‍රිවිධ හමුදාව,
තමන්ගේ දේශපාලන අතකොලු කරගන්නට
තව ම දඟලනවා.
මැතිවරණ කොමිසම පත් නොකර සිටියා.
අල්ලස් දූෂණ කොමිසමට
දිගින් දිගට ම බලපෑම් කළා.
මුළු රටට ම කෝටියක් බොරු කීවා.
රජයේ හැම දේ ම විවේචනය කළා.
කෝටි ප්‍රකෝටි ගණන් ඇයගේ වංචා
ජනාධිපති බලයෙන් යට කළා.
උතුරේ ජනතාව තුළ දකුණේ ජනතාව ගැන
අවිශ්වාසය වැඩි කළා.
හමුදාවේ ඇතැමුන් පාවිච්චි කරමින්
උතුරේ සාමය අවුල් කළා.
බලය නැවත ලබා ගැනීම සඳහා
කළ හැකි සියලු කැත වැඩ කළා.
අවසානයේ තම සැමියා මැරූ,
තම දරුවන්ගේ පියා මැරූ
ජනතා විමුක්ති පෙරමුණ සමඟත් එකතු වුණා.
මරා දැමූ තම පියා,
තම ස්වාමියා,
තම සහෝදරයා
කරපිටින් ගෙන ගොස් වළ දමන්න

ඉඩ නොදුන්
ජනතා විමුක්ති පෙරමුණ චන්ද්‍රිකාගේ
හොඳ ම හුරතලුන් බවට පත් වුණා.
මේ චන්ද්‍රිකා . . .
රජය විසිරුවේ ඔබට බොරු කියලයි.
ඉන්දියානු රජයට බොරු කියලයි.
නෝර්වේ රටට, ඇමෙරිකාවට, ජපානයට බොරු කියලයි.
තම පක්ෂයටත් බොරු කියලයි.

මේ චන්ද්‍රිකා දූත්
ඕනෑ ම
නීති විරෝධී වැඩක් කරලා
බලය ගන්නට දඟලනවා.
චන්ද්‍රිකාට විරුද්ධ අය
මරන්නට දඟලනවා.
හිරේ දාන්නට දඟලනවා.
භය කරන්නට දඟලනවා.
උතුරෙන් පැනලා සිටින සමහරුන්
හමුදාවට සම්බන්ධ කරගෙන,
උන් ලවා
ඇයගේ විරුද්ධවාදීන්
මරවන්නට දඟලනවා.
දැන් දැන් බල වියරුවෙන්
මහින්ද රාජපක්ෂ රවටනවා.
අනුර බණ්ඩරනායක රවටනවා.
ජනතා විමුක්ති පෙරමුණට ලණු දෙනවා.

දි. මු. ජයරත්නට හා

රත්නසිරි වික්‍රමනායකට ලණු දෙනවා.

චන්ද්‍රිකා දූත්

අඩසිහියෙන් ද

සිහි විකාරයෙන් ද

පිස්සුවෙන් ද

මේ දඟලන්නේ . . . ?

අපි වරක් අප ගැන සිතමු.

දෙවරක් අපේ අනාගත දරුවන් ගැන සිතමු.

අපි තෙවරක් ම

අපේ මාතෘ භූමිය ගැන සිතමු.

28 SEP 2009

REFERENCE

නිමි

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය




ශ්‍රී ලාංකේය දේශපාලනයේ

# බණ්ඩාරනායක ත්‍රිත්වය

සහ වෙනත් ලිපි

එස්. බී. දිසානායක

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගැන මා දැක්වූ භක්තිය හා අදත් පවතින ගෞරවයත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග කෙරෙහි එදා මා තුළ පැවැති පිළිකුලත් මා මේ පොත ලිවීමට පොළොඹවාලූ බව කිව යුතු ය. පොත සම්පූර්ණ කිරීම සඳහා දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ගැන ද මම ගැඹුරු අධ්‍යයනයක යෙදුණෙමි.

මෑත කාලීන ශ්‍රී ලංකා ඉතිහාසය සාධනීය හෝ නිෂේධනීය හෝ ලෙස සැකැසූ එම චරිත තුන දෙස මා බලන දෘෂ්ටිය මේ ග්‍රන්ථයෙන් හෙළි වේ.

සුප්‍රකට දේශපාලන චරිතවල යථාර්ථය හෙළි කිරීම ඇතැම් විට ආන්දෝලනාත්මක විය හැකි ය. ඇතැමකු කුපිත කරන සුලු ද විය හැකි ය. කෙසේ වෙතත් එම චරිත පිළිබඳ මගේ විග්‍රහය දෙස විචාරාත්මකව බලන ලෙස මම මගේ දයාබර පාඨකයන්ට ඇරැයුම් කරමි.

ISBN 978-955-0211-02-9

9789550211029

සුරකථා ප්‍රකාශන

SB 10783
VYB 01100
Rs 260.00